



# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ



ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බක් අව අමාවක ලත් කුජ දින | කාණ්ඩය 112 | පත්‍රය 123 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 11 අඟහරුවාදා

# එන්නත්කරණය කඩිනම් කරන්න



## ජනපති ඇමැතිනියට උපදෙස් දෙයි

ධනුෂ්ක ගොඩකුඹුර

කොවිඩ් වසංගතය මර්දනය කිරීම සඳහා එන්නත්කරණ වැඩපිළිවෙළ විධිමත් සහ කඩිනම් අයුරින් ක්‍රියාවට නැංවීමට පියවර ගන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය වෙත ඊයේ (10) පැවැති කැබිනට් හමුවේදී උපදෙස් දී තිබේ. පිට 06



# ප්‍රදේශයක් ලොක්ඩවුන් කළොත් අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩවම

## ජනාධිපති කාර්යසාධක බළකායෙන් වැඩපිළිවෙළක්

මහින්ද අලුත්ගෙදර

යම්කිසි ප්‍රදේශයක් හෝ දිස්ත්‍රික්කයක් හෝ ආවරණය වන පරිදි නිරෝධායන ඇඳිරි නීතිය පැනවීම හෝ හුදෙකලා කිරීම හෝ සිදු කරන්නේ නම් එම ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම අඛණ්ඩව පවත්වාගෙන යෑමට ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක ජනාධිපති කාර්යසාධක බළකාය තීරණය කරයි. පිට 06

## පොල් වගා කිරීමේ මණ්ඩලයේ ලක්ෂ 700ක වංචාව ගැන වාර්තාව අමාත්‍යාංශයේ ලේකම් අතට

පිට 03

## රට වසා දැමීමේ කිසිම අදහසක් නෑ

අවශ්‍ය වුණොත් සංචරණ සීමා පනවනවා

නුවන් කොඩිකාර

සමස්ත රටම වසා දැමීමේ කිසිදු අදහසක් නොමැති බවත් ඉදිරි දින කිහිපයේදී පළාත් අතර සංචරණ සීමා පැනවීමක් සිදු කරනු ඇති බවත් කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාවිත මධ්‍යස්ථානයේ ප්‍රධානි, යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය. පිට 06

## කොවිඩ් ප්‍රතිකාරවලට ඇඳන් 10,000ක වාට්ටු සංකීර්ණ භාර දීම අද

පිට 06

## එන්නත්කරණ මධ්‍යස්ථාන ගණන දෙගුණ කරන්න ඇමැති උපදෙස්



සන්ධ්‍යා කරුණාරත්න

ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශයන්හි දැනට ක්‍රියාත්මක එන්නත්කරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව දෙගුණයක් දක්වා වැඩි කිරීමට සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය තීරණය කරයි. පිට 06

## විභාග කල් යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් මැයි මාසය තුළ දී පැවැත්වීමට නියමිතව තිබූ ආයතනික විභාග දින නියමක් නොමැතිව කල් දමා තිබේ. පිට 06

## කෝටි 9,750ක සහන ණයක් කොරියාවෙන්

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාව සමඟ පවත්නා ආර්ථික සහයෝගිතාව තව දුරටත් ශක්තිමත් කර ගැනීමේ අපේක්ෂාවෙන් රුපියල් කෝටි 9,750ක (ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 500ක) සහනදායි ණය ආධාරයක් ශ්‍රී ලංකාවට සැපයීම සඳහා කොරියානු ජනරජය එකඟතාව පළ කරයි. පිට 06

## සංචරණ සීමා ප්‍රදේශවල සිටින සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට සේවා ස්ථානයට යෑමට ඉඩ දෙන්න

පිට 09

## රසායනික පොහොර තහනමෙන් ගොවියා පීඩාවට ලක් වෙලා



පිට 06

## දිස්ත්‍රික් 5ක තවත් ග්‍රාම නිලධාරි වසම් 16ක් හුදෙකලා කෙරේ

පිට 09

## රියැදුරු බලපත් අලුත් කරන්න සහන කාලයක්

සුභාෂිණී සේනානායක

අප්‍රේල් මස 01 වැනිදා සහ සැප්තැම්බර් 30 වැනිදා අතර කාලය තුළදී කල් ඉකුත් වන සියලු රියැදුරු බලපත්‍ර සඳහා සහනයක් සැලසීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ. පිට 06

## කොරෝනාවෙන් රට බේරා ගන්න



කැබිනට් මණ්ඩලයට පූර්ණ බලය පවරා ගන්න පිට 06

## රන්ජන් රාමනායකට වෙනම රූපවාහිනියක්

පිට 09

## 9 වැනිදා කොරෝනා රෝගීහු 2672ක්

පිට 06



ගෙදර සිටම ඔබත් සුරක්ෂිතව ඉගෙන ගන්න, වැඩ කරන්න.

MS Teams, Zoom, Office 365, m-Learning, SLT Lynked සහ SLT eSiphala සඳහා අදාළ SLTMobitel මොබයිල් වෙතින් ලැබෙන හොඳම ඩේටා ප්ලෑන් ඔබ අතට.

25GB පැකේජය රු. 150/- +බදු

50GB පැකේජය රු. 590/- +බදු

100GB පැකේජය රු. 990/- +බදු

පැකේජ activate කර ගැනීමට #170# අමතන්න. නැත්නම් Datamart App එකට log වෙන්න.

අනෙකුත් ඩේටා අවශ්‍යතා සඳහා Data Quota අනුමත කරනු ලබන අතර ඒ සඳහා Datamart App එකට log වෙන්න.



අංක 1 වේගවත්ම ජංගම දුරකථන ජාලය Ookla විසින් සහතික කරන ලදී

වේගවත්ම INTERNET පුළුල්තම ආවරණය 4G LTE

කොන්දේසි සහිතයි.

TRC/M/Promo/20/02

www.sltmobitel.lk

SLTMOBITEL එකම එක සබැඳියාව

# යාපනයේ අනලතීව්-ඩෙල්ෆ්ට්-එළුවතීව් දූපත්වල ගමනාගමනය සීමා වෙයි


**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ අනලතීව් ඩෙල්ෆ්ට් සහ එළුවතීව් දූපත්වලට ගමනාගමන කටයුතුවල නිරත වීම ඊයේ (10) සිට අත්‍යවශ්‍ය කටයුතු සඳහා පමණක් සීමා කිරීමට කයිට්ස් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පියවර ගෙන තිබේ.

මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කරමින් කයිට්ස් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී එස්. නන්දකුමාර් මහතා මෙසේ පැවැසීය.

'මේ දූපත් තුනට ගමන් කිරීමට විශාල කාලයක් ගත වීමත් එම දූපත්වල දැනට පිහිටුවා ඇති රෝහල්වල ඇති පහසුකම් ඉතා අල්පවීමත් නිසා මේ තීරණය ගත්තා. නාගදීපයට මේ ගමනාගමන සීමා කිරීම අදාළ වන්නේ නෑ. නාගදීපයේ සිට කයිට්ස් ඇතුළු රෝහල්වලට ඉතා ඉක්මනින් ළඟා විය හැකියි.

යාපනයේ දූපත් ප්‍රදේශවල වැසියන්ට කොරෝනා රෝගය ආසාදිත වුවහොත් විශාල ප්‍රශ්නයක් පැන නගින නිසා දූපත් ප්‍රදේශවල ජනතාව ආරක්ෂා කර ගැනීමට සෞඛ්‍ය අංශ සහ නාවික හමුදාව වැඩපිළිවෙළ රැසක් අනුගමනය කර තිබෙනවා.'



# කොවිඩ් ආසාදිතව කොහුල්වල ගංගාරාම විහාරයේ හිමිනමක් අපවත් වෙති

**දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ**

ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි හිමිනමකට කොවිඩ් ආසාදනයවී අපවත්ව ඇති බව කරන ලද පීසීආර් පරීක්ෂණයෙන් අනාවරණයවී ඇත.

මිය ගිය හිමිනම කිරිබත්ගොඩ, කොහුල්වල ගංගාරාම විහාරස්ථානයේ වැඩ සිටි බව ද වාර්තාවේ. උන් වහන්සේ ශල්‍යකර්මයකට කරාපිටිය ශික්ෂණ රෝහලට ඇතුළත්ව ප්‍රතිකාර ලබමින් සිටියදී මෙලෙස අපවත්වී ඇත. හිමිනම 73 හැවිරිදි වියේ පසුවිය.

පශ්චාත් මරණ පරීක්ෂණ ඊයේ (10) ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේදී පැවැත්වීමට නියමිතව තිබුණි.



අක්මීමණ විද්‍යා පීඨයේ කොවිඩ් සත්කාරක මධ්‍යස්ථානයට පැමිණෙන රෝගීන්ට අවශ්‍ය උපකරණ ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතා මැදිහත්වී භාර දුන් අයුරු.

**ඡායාරූපය - හිනිඳුම සමූහ**

# නෝර්වුඩ් ඇඟලුම් ශාලාවක 9කට කොවිඩ්

මස්කෙළිය, නෝර්වුඩ් ප්‍රදේශයේ පිහිටි ඇඟලුම් කර්මාන්ත ශාලාවක 9 දෙනකුට කොවිඩ් ආසාදිත බව හඳුනාගෙන තිබේ.

එම කර්මාන්ත ශාලාවේ සේවකයන් පිරිසක් හදිසියේ රෝගීවීම හේතුවෙන් සිදු කළ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණවලදී මේ ආසාදිතයන් හඳුනාගත් බව මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

මේ හේතුවෙන් ඔවුන්ගේ ආශ්‍රිතයන් 280ක් පමණ ස්වයං නිරෝධායනයට ලක් කිරීමට මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පියවර ගෙන තිබේ.



ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරල මහතා ත්‍රිකුණාමලයේ කෝමරන්ගඩවල පිහිටි කොවිඩ් රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථානයේ පහසුකම් පරීක්ෂා කළ අයුරු.

**ඡායාරූපය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් විශේෂ**

# අත්‍යවශ්‍ය ආහාර ගන්න වැඩපිළිවෙළක් නැති කමින් හුදෙකලා වූ ජනතාව අසීරුවේ

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

කොරෝනා ව්‍යාප්තිය වැළැක්වීමට රජය විසින් මාතලේ දිස්ත්‍රික්කයේ හුදෙකලා කරන ලද පොලිස් බල ප්‍රදේශවල ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා ගැනීම ඉතා අපහසුවී ඇති නමුත් ඒ සඳහා සහන වැඩපිළිවෙළක් මෙතෙක් අදාළ අංශ විසින් ක්‍රියාත්මක නොකිරීමෙන් මොවුහු දැඩි අපහසුතාවට මුහුණපා සිටිති.

දඹුල්ල, ගලේවෙල, නාඋල සහ මාතලේ පොලිස් බල ප්‍රදේශ මෙසේ හුදෙකලා කර සතියක් ඉක්ම ගොස් ඇති බැවින් මෙවැනි තත්ත්වයක් උදාවී ඇති අතර, සියලු වෙළෙඳසල් ද වසා දැමීම මේ තත්ත්වයට සෘජුව බලපා ඇත.

මේ අතර ඇතැම් වෙළෙඳසල් හිමියන් සිය වෙළෙඳසලේ ඉදිරිපස වසා දමා පිටුපස දොර විවෘත කර වෙළෙඳාම් කටයුතු සිදු කරන බව සඳහන් කරන ප්‍රදේශවාසීන් මේ ස්ථානවලට යෑම පවා පවතින තත්ත්වය යටතේ දුෂ්කරවී ඇතැයි ද කියා සිටී.

තත්ත්වය මෙසේ බැවින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හෝ පහසුවෙන් ගැනීමට අවස්ථාව සලසන ලෙස මොවුහු රජයෙන් ඉල්ලා සිටිති.

# අම්බලන්තොට නිරෝධායන පවුල්වලට ඇති ගැටලු දැන්වීමට විශේෂ දුරකථන අංකයක්

**ලුනම සමූහ - සනත් ගමගේ**

අම්බලන්තොට කොට්ඨාසයේ නිරෝධායනයට ලක් කර සිටින පවුල්වල විශේෂිත ගැටලු ඇත්නම් එය දැන්වීමට පැය විසි හතර පුරා ක්‍රියාත්මක දුරකථන අංකයක් හඳුන්වා දී ඇති බව අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති දර්ශන සංජීව මහතා කීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ සභාපතිවරයා මෙසේ ද කීය.

'පැය විසි හතර පුරාම ක්‍රියාත්මක එම දුරකථන අංකය 047-3129226යි. අම්බලන්තොට කොවිඩ් මර්දන කමිටුවෙන් ගත් තීරණයක් අනුව අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ දුරකථන අංකය ක්‍රියාත්මක කරනවා. කොවිඩ් ආසාදිතයන් ඇසුරු කිරීම හෝ වෙනත් හේතු මත නිරෝධායනයට ලක් කර ඇති පවුල් මුහුණ දී ඇති ප්‍රායෝගික ගැටලු සම්බන්ධයෙන් මේ දුරකථන අංකයට දැනුම් දිය හැකියි.'

# කොග්ගල නිදහස් වෙළෙඳ කලාපයේ තවත් කොවිඩ් රෝගීහු 65ක්

**දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ**

කොග්ගල නිදහස් වෙළෙඳ කලාපයේ ඇඟලුම් කම්හල් 05කින් තවත් කොරෝනා ආසාදිතයන් 65 දෙනකු පසුගිය 08 වැනි දින වාර්තාවී ඇති බව හබරාදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය ප්‍රමෝද සිරිවර්ධන මහතා පවසයි.

රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණවලදී මේ ඇඟලුම් කම්හල් සේවක සේවිකාවන්ට කොරෝනා ආසාදනයවී ඇති බවට තහවුරුව ඇත. මේ වෙළෙඳ කලාපයේ ඇඟලුම් කම්හල් 10කින් මේ වන විට සේවක සේවිකාවන් 400 දෙනකුට කොරෝනා ආසාදනයවී ඇති බවට තහවුරුව ඇත.

# වැලිසර ආර්ථික මධ්‍යස්ථානයේ 28කට කොවිඩ්

**රාගම සමූහ**

වැලිසර විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයන් සහ සේවකයන් 170කට සිදු කළ පීසීආර් පරීක්ෂණයෙන් ආසාදිතයන් 28 දෙනකු හඳුනාගෙන ඇතැයි වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් වාර්තා වේ.

එම හේතුව මත වැලිසර ආර්ථික මධ්‍යස්ථානය දින දහයක් වසා තැබීමට වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් පියවර ගෙන ඇත. වෙළෙඳසල් 22ක් මුද්‍රා තැබීම ද සිදු කර ඇත. දින දහයකට පසුව ආර්ථික මධ්‍යස්ථානයේ සියලුම ව්‍යාපාරිකයන් සහ වෙළෙඳුන් පීසීආර් පරීක්ෂණයට ලක් කිරීමෙන් පසුව එම පරිශ්‍රය යළි විවෘත කිරීමට සලකා බලන බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීහු පැවැසූහ.

# ඇල්පිටියේ කොවිඩ් ආසාදිතයෝ 221ක්

**ඇල්පිටිය සමූහ**

ඇල්පිටිය සෞඛ්‍ය බල ප්‍රදේශයේ මේ වන විට කොරෝනා ආසාදිතයන් 221ක් පමණ හමුවී ඇති අතර, ඔවුන්ගේ ළඟම ආශ්‍රිතයන් ලෙස හඳුනාගත් පවුල් 800ක් පමණ නිරෝධායනයට යොමු කර ඇති බව ඇල්පිටිය සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී කාර්යාලය පවසයි.

ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෑම ග්‍රාම නිලධාරී වසමකින්ම මේ වන විට කොරෝනා ආසාදිතයන් හමුවී ඇති අතර, වැඩිම ආසාදිතයන් වාර්තාවී ඇත්තේ අංක 25, ඩී. බටුවන්හේන ග්‍රාම නිලධාරී වසමෙනි. එහි කොරෝනා ආසාදිතයන් ගණන 14කි. ඒ පොල්ගස්වත්ත, අක්කර 16, අක්කර 37, බටුවන්හේන කෝට්ටවත්ත පාර, රතනසිරි මාවත සහ කිඹුලාවල ප්‍රදේශවලිනි.


## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
## SRI LANKA EXPORT DEVELOPMENT BOARD

**වෙළඳ අමාත්‍යාංශය**

# ජනාධිපති අපනයන සම්මාන - 2019/2020 සහ 2020/2021

අපනයන ක්ෂේත්‍රය තුළින් මෙරට ආර්ථික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයන්නා වූ ශ්‍රී ලාංකේය අපනයනකරුවන් ඇගයීම උදෙසා වාර්ෂිකව අතිගරු ජනාධිපතිතුමන් විසින් පිරිනමනු ලබන ජනාධිපති අපනයන සම්මාන, අපනයනකරුවකුට මෙරටදී ලද හැකි ඉහළම හා විශිෂ්ටතම ඇගයීමයි.

2019/2020 සහ 2020/2021 යන ගිණුම් වර්ෂයන් සඳහා ජනාධිපති අපනයන සම්මානලාභීන් තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අයදුම්පත් කැඳවනු ලැබේ.

ජනාධිපති අපනයන සම්මානලාභීන් පහත දැක්වෙන කාණ්ඩ යටතේ තෝරා ගනු ලැබේ. (එක් එක් ගිණුම් වර්ෂයක් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.)

**ආ) සමස්ත සම්මාන**

ශ්‍රී ලංකාවේ හොඳම අපනයන සමාගම ඇගයීම සඳහා පහත සඳහන් පරිදි සමස්ත සම්මාන 12 ක් ගිණුම් වර්ෂ දෙක සඳහාම පිරිනමනු ලැබේ.

01. වසරේ අපනයනකරු
02. ගෝලීය වශයෙන් වඩාත් ව්‍යාප්ත ශ්‍රී ලාංකීය සන්නාමය
03. වෙළඳපොළ විවිධාංගීකරණයක් ඇති අපනයකරු
04. නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා හොඳම අපනයනකරු
05. වසරේ හොඳම අගය එකතු කළ අපනයනකරු
06. අපනයන ක්ෂේත්‍රය තුළ තිරසාර සංවර්ධනය සඳහා දායකත්වය සපයන්නා
07. වසරේ නවෝත්පාදන අපනයන නිෂ්පාදිතය
08. අපනයන සැපයුම් දාමයට ප්‍රාදේශීය මට්ටමින් දායකත්වයක් දක්වන අපනයනකරු
09. නැගී එන වෙළඳපොළවල ක්‍රියාකාරී අපනයකරු
10. ගෝලීය අගය දාමයට වඩාත් දායකත්වයක් දක්වන අපනයකරු
11. වසරේ කාන්තා අපනයනකරු
12. වසරේ නැගී එන අපනයනකරු

**ආ) භාණ්ඩ / සේවා අංශ සම්මාන**

මතු දැක්වෙන එක් එක් භාණ්ඩ/ සේවා අංශ යටතේ **"හොඳම අපනයනකරු"** සම්මානය එම සමාගම් විසින් අපනයන ක්ෂේත්‍රය උදෙසා දැක්වූ දායකත්වය අගයනු වස් ප්‍රදානය කරනු ඇත.

**1. කාර්මික නිෂ්පාදන**

01. ඇඟලුම් - විශාල පරිමාණ
   - මධ්‍ය පරිමාණ
   - කුඩා පරිමාණ
02. මේස් සහ ආශ්‍රිත ඇඳුම් (Hosiery)
03. ගොතන ලද රෙදි
04. වියන ලද රෙදි
05. නූල්
06. වියළි රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ
07. රබර් කිරි ආශ්‍රිත නිමි භාණ්ඩ
08. නැව් තිපැයුම්
09. බෝට්ටු සහ විනෝද යාත්‍රා නිපැයුම්
10. මැණික්
11. දියමන්ති
12. ස්වර්ණාභරණ
13. පිඟන් මැටි සහ පෝසිලේන් ආශ්‍රිත නිෂ්පාදන
14. වීදුරු ආශ්‍රිත නිෂ්පාදන
15. ප්ලාස්ටික් නිෂ්පාදන
16. ලුහු ඉංජිනේරු
17. සම්භාණ්ඩ
18. ගෘහ භාණ්ඩ සහ ලී නිෂ්පාදන
19. රසායනික ද්‍රව්‍ය සහ තීන්ත නිෂ්පාදන
20. අත්යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදන, සෙල්ලම් බඩු, ශිල්පීය සහ ජීවන රටා නිෂ්පාදන
21. පාවහන්
22. මෝටර් රථ සංරචක
23. අගය එකතු කළ ඛනිජ
24. ඉලෙක්ට්‍රොනික සහ විදුලි නිෂ්පාදන
25. මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය
26. ඇසුරුම්

**2. කෘෂිකාර්මික සහ ධීවර නිෂ්පාදන**

01. තේ - විශාල පරිමාණ
   කුඩා හා මධ්‍ය පරිමාණ
02. සැකසූ ආහාර
03. පාන වර්ග
04. කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන
05. නැවුම් පලතුරු, ඇට වර්ග (nuts) සහ එළවළු
06. සැකසූ පලතුරු, ඇට වර්ග (nuts) සහ එළවළු
07. මල් සහ විසිතුරු ශාක පත්‍ර
08. පොල් මද ආශ්‍රිත නිෂ්පාදන
09. පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන
10. පොල් උපස්ථර නිෂ්පාදන (Substrates)
11. පොල් කෙඳි පදනම් කරගත් නිෂ්පාදන
12. මුහුදු ආහාර
13. ජලජීවී වගා නිෂ්පාදන (Aquaculture)
14. විසිතුරු මසුන්
15. කුළු බඩු සහ නිස්සාරක
16. ශාකසාර හා ආයුර්වේද

**3. අපනයන සේවා**

01. තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT)
02. ව්‍යාපාර සැකසුම් කළමනාකරණය/ දැනුම සැකසුම් කළමනාකරණය (BPM/KPM)
03. ප්‍රවාහන, සැපයුම් ජාල සේවා (Logistic Services)
04. වාණිජ කේන්ද්‍රීය මෙහෙයුම් (Hub Operations)
05. අන්තරාල වෙළඳාම (Entrepot Trade)
06. සමුද්‍ර හා අක්වෙරළ ඉංජිනේරු සේවා (Marine & Offshore Engineering Services)
07. ස්වස්ථතා සේවා (Wellness Services)
08. ඉදිකිරීම් සේවා (Construction Services)

**අයදුම් කිරීමේ ක්‍රමය**

අයදුම්පත්, උපදෙස් සහ ඇගයීම් නිර්ණායක අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳපොළ සංවර්ධන අංශය වෙතින් ලබාගැනීමට හෝ www.srilankabusiness.com යන අපනයන සංවර්ධන මණ්ඩල වෙබ් අඩවියේ "Announcements" යටතේ බාගත කර ගත හැකිය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ ලිපි ලේඛන සමග **2021 ජූනි මස 30** වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ ප්‍රධාන විධායක වෙත එවිය යුතුය.

**විමසීම් : අප්සරා අරම්පත් - 011-2300722 හෝ 011-2300705 - 11, දිගුව : 271**
**යෂිකා මල්වත්ත - 011-2300721 හෝ 011-2300705 - 11, දිගුව : 268**

**විද්‍යුත් තැපෑල :** awards@edb.gov.lk/apsara@edb.gov.lk/yashika@edb.gov.lk

**සභාපති සහ ප්‍රධාන විධායක**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB – EDB කුළුන,**
**අංක 42, නවම් මාවත,**
**කොළඹ 02.**

**දුරකථන: 011-2300705-11 ෆැක්ස්: 011-2300715**
**www.srilankabusiness.com**

# පොල් වගා කිරීමේ මණ්ඩලයේ ලක්ෂ 700ක වංචාව ගැන වාර්තාව අමාත්‍යාංශයේ ලේකම් අතට

පොල් වගා කිරීමේ මණ්ඩලයේ සිදු වූ බව කියන රුපියල් ලක්ෂ 700ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයේ වාර්තාව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට භාරදී තිබේ.

පොල් වගා කිරීමේ මණ්ඩලයේ මූල්‍ය කළමනාකාරවරයා, ගණකාධිකාරිවරයා ඇතුළු පිරිසකගේ වැඩ තහනම් කළ යුතු බවට අදාළ කමිටුව නිර්දේශ කර ඇත.

එමෙන්ම මේ වංචාව පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ යුතු බවටත්, රජයේ විගණකාධිපති සහ ආයතනයේ අභ්‍යන්තර විගණක ලවා විගණනයට ලක් කළ යුතු බවටත් නිර්දේශ කර තිබේ.

## සායි බාබා දේවස්ථානයේ රාජගෝපුරම් මුල්ගල් තැබීමේ උත්සවයෙන්...



කොළඹ නව චෙට්ටි වීදියේ පිහිටි ෂර්ඩි සායි බාබා දේවස්ථානයේ රාජගෝපුරම් මුල්ගල් තැබීමේ උත්සවය පසුගියදා පැවැත්විණි. ආර්ථික පුණර්ජීවන හා දරිද්‍රතාව පිටුදැකීමේ ජනාධිපති කාර්යසාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතාගේ බිරිය පුෂ්පා රාජපක්ෂ මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණ මුල්ගල් තැබීය.

අග්‍රාමාත්‍යතුමාගේ හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධීකාරක බාබු ෂර්මා රාමචන්ද්‍රන් කුරුක්කල්තුමා ඇතුළු විශ්‍රාමලත් විනිසුරු සී. වී. විග්නේශ්වරන්, හිටපු ඉන්දීය සංස්කෘතික ස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය රේවන්ට් වික්‍රම් සිං සහ දේවස්ථානයේ භාරකරු එස්. එන්. උදයනායගන් මහත්වරු මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය : රුසෙයික් ෆාරුක්

## අද දිනයේත් බොහෝ ප්‍රදේශවලට වැසි හෝ ගිගුරුම් සහිත වැසි

**උපාලි කරුණාරත්න**

අද (11) දිනයේ ද දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කාලගුණ අනාවැකිය නිකුත් කරමින් කියා සිටී.

බස්නාහිර, සබරගමුව, වයඹ, දකුණු පළාත්වල උදේ කාලයේදීත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවලට මිලි මීටර් 75ට වැඩි තරමක් තද වැසි ඇති විය හැකිය.

පුත්තලම සිට කොළඹ, ගාල්ල, හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකිය. සෙසු මුහුදු ප්‍රදේශ මඳ වශයෙන් රළු වේ.

# හගුරන්කෙත - කොට්ටල මාර්ගයට ගල් පර්වතයක් පෙරළීමෙන් ගමනාගමනයට බාධා

**ගලහ සමූහ - සී. කේ. වික්‍රම**

මේ දිනවල හඟුරන්කෙත ප්‍රදේශයට ඇද හැලෙන ධාරානිපාත වර්ෂාවත් සමඟ හඟුරන්කෙත සිට කොට්ටල දක්වා දිවෙන මාර්ගයට ඊයේ (09) උදෑසන විශාල ගල් පර්වතයක් පෙරළීමෙන් ගමනාගමනය සම්පූර්ණයෙන් ඇන හිට ඇත.

මේ ගල් පර්වතය පෙරළීමෙන් මාර්ගයේ ගමන් ගත් රථවාහන හෝ පුද්ගලයන් කිසිවකුටත් හානියක් සිදුවී නොමැත.

මේ හේතුව නිසා හඟුරන්කෙත-කොට්ටල මාර්ගය ඔස්සේ ඈත ගම්වල සිට තම අවශ්‍යතා සඳහා නගරයට පැමිණෙන්නන් දැඩි අපහසුතාවට පත්වී සිටින අතර, ගල් පර්වතය ඉවත් කිරීමට ද දින කිහිපයක් ගත වේ.



ඡායාරූපය - ගලහා සමූහ

## ටී ෂර්ට්වල එල්.ටී.ටී.ඊ. ලාංඡනය - ප්‍රභාකරන්ගේ ඡායාරූපය තිබීමේ සිද්ධිය ගැන පරීක්ෂණ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

ඉන්දියාවේ තමිල්නාඩුවේ සිට පැමිණි ධීවරයන් හතර දෙනකු ඇඳ සිටි ටී ෂර්ට්වල එල්. ටී.ටී.ඊ. ලාංඡන සහ ප්‍රභාකරන්ගේ ඡායාරූප මුද්‍රණය කර තිබීමේ සිද්ධියක් සම්බන්ධයෙන් නාවික හමුදාව පරීක්ෂණ ආරම්භ කර තිබේ.

නාවික හමුදාව විසින් ඉන්දිය ධීවරයන්ගේ පැමිණීම වැළැක්වීමට කළ මුර සංචාරයකදී බෝට්ටුවක සිටි තරුණයන්ගේ ටී ෂර්ට්වල මේ ලකුණු නාවික හමුදාව විසින් දැක තිබේ.

නාවික හමුදාව එම ධීවරයන් වීඩියෝ ගත කර ඇති අතර, ඔවුන්ගේ විස්තර ද සටහන් කරගෙන ඇත. ඒ ඔස්සේ නාවික හමුදාව පරීක්ෂණ ආරම්භ කර තිබේ.

නාවික හමුදාව සැක කරන්නේ එල්. ටී. ටී. ඊ. සංවිධානය ව්‍යාප්ත කරවීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ දෙමළ ධීවරයන් විසින් මේ ටී ෂර්ට් ඉන්දීය ධීවරයන්ටෙ දෙන්නට ඇති බවයි.

ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

## තද සුළඟින් ඉංගිරිය පෝරුවදණ්ඩ නිවාස 40කට හානි

**ඉංගිරිය සමූහ - කුමාරි ගමගේ**

ඉකුත් 7 වැනිදා රාත්‍රියේදී හමා ගිය තද සුළඟක් හේතුවෙන් ඉංගිරිය පෝරුවදණ්ඩ ප්‍රදේශයේ නිවාස 40කට පමණ අලාභ හානි සිදුව ඇතැයි ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහන් කරයි.

වැඩි වශයෙන් හානි සිදුව ඇත්තේ පෝරුවදණ්ඩ බටහිර ග්‍රාම සේවා වසමේ නිවාසවලට බව ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් අයිරංගනී විරසිංහ මහත්මිය සඳහන් කළාය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය මෙසේද කීවාය.

'පෝරුවදණ්ඩ බටහිර සහ නැගෙනහිර නිවාස 40කට පමණ සුළු සහ මධ්‍ය ප්‍රමාණයේ හානි සිදුව තිබෙනවා. බටහිර ග්‍රාම සේවා වසමේ නිවාස දෙකක වහල සම්පූර්ණයෙන්ම විනාශව තිබෙනවා. බොහෝ නිවෙස් මතට ගස් කඩා වැටී තිබෙනවා. පෝරුවදණ්ඩ කනිෂ්ඨ විද්‍යාලයේ ගොඩනැගිලි දෙකකට ද හානි සිදුව තිබෙනවා.

මේ හේතුවෙන් ප්‍රදේශයේ නිවාස රැසකට තවමත් විදුලිය දීමට නොහැකිව තිබෙනවා. හොරණ ප්‍රාදේශීය සභාව සහ විදුලි බල මණ්ඩලය එක්ව අවහිර වී ඇති ගස් කපා ඉවත් කිරීම මෙන්ම රැහැන් පද්ධතිය සකස් කිරීමේ කටයුතු සිදු කරනවා.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් සිටිනවා. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් මුදල් ලැබුණු වහාම වන්දි මුදල් දීමට කටයුතු කරනවා.'

## මාලිගාවත්ත වකුගඩු රෝහල ඉදිරිපිට කළු පාලම හදන්නේ කවදාද



**අනුර ප්‍රේමලාල්**

මාලිගාවත්ත වකුගඩු රෝහල ඉදිරිපිටින් දෙමටගොඩ දෙසට දිවෙන කළු පාලම (උමං මාර්ගය) මාස ගණනාවකට පෙර සිට ඉතාමත් අබලන් තත්ත්වයෙන් පවතින බැවින් ඒ පිළිබඳ බලධාරීන් අවධානය යොමු කරන ලෙස එම ප්‍රදේශවාසීහු ඉල්ලා සිටිති.

දිරාපත් වූ මේ පාලම සුදු අධිරාජ්‍ය සමයේ දී ඉදිවූවක් වන අතර, එහි මේ වන විට ආධාරකයක් වශයෙන් සිල්පර කොට විශාල ප්‍රමාණයක් තබා තිබෙන බව ද ප්‍රදේශවාසීහු පවසති. මේ උමං මාර්ගයට ඉහළින් දුම්රිය මාර්ග 6ක් පමණ පිහිටා ඇති අතර, දුම්රිය වාර 200කට වඩා දිනකට ගමන් කරයි. එබැවින් විශාල අනතුරක් වීමට පෙර දිරාපත් ව අබලන් තත්ත්වයෙන් පවතින මේ උමං මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ඉතාමත් ඉක්මනින් සිදු නොකළහොත් බරපතළ අනතුරක් වීම නොවැළැක්විය හැකි බවයි.





## වවුනියාව කනගරායන්කුලම තම්පනේ රක්ෂිතයෙන් නව පුරාවිද්‍යා ස්ථානයක් සොයා ගැනේ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

වවුනියාව කනගරායන්කුලම තම්පනේ රක්ෂිතයේ කාලාන්තරයක් පුරා පස්වලින් වැසී තිබූ නව පුරාවිද්‍යා ස්ථානයක් යුද හමුදාව විසින් සොයාගෙන එම ස්ථානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වවුනියාව කාර්යාලයට පෙරේදා (09) භාරදී තිබේ.

මේ ස්ථානය සොයා ගත් 16 වැනි ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් නිලධාරීන් වහාම ඒ පිළිබඳව සිය බළ සේනා මුලස්ථානය වන 561 බලසේනා මුලස්ථානයට දැනුම් දීමෙන් පසුව පුරා විද්‍යා නිලධාරීන් දැනුම්වත් කර තිබේ.

පුරාවිද්‍යා නිලධාරීන් පැවැසුවේ මේ ස්ථානය වවුනියාවෙන් හමු වූ ඉපැරණි පුරාවිද්‍යා ස්ථානයක් බවත්, එය තහවුරු කිරීමට කොළඹ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කර ඇති බවත්ය.



ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

### ගිනිකොණ

ගණනය කරන විදියට මින් ඉදිරියට
තව තව භයානක තැනකට යයි ද රට
කොයි එකටත් පරිස්සම ගැන ගෙන හිතට
නිතරම වසා ගමු තද කර නහය කට

ගැස්මන් තෝනා

### අපනැත්ත

සංචරණය නොවේ ගම්වල වැසේ ඩෝර්
ඕනෑ පදම් රට හැම තැන ඇරේ බාර්
කොරෝනා පැතිර යයි පෙන්නලා සූර්
පහු පහු වෙද්දි කොහු කොහු වෙයි වැඩේ සෑර්

සිගරැට්ටුව රැගෙන බොයි තුන් හතර දෙනා
බයිට් එක බුදිති වට වී සිතැඟි මනා
බත් කති! සූර් පිට ඔක්කොම එකට අනා
තුන් වැනි රැල්ලෙ කෝවිඩ් යකු නගති හිනා!

රටේමුල්ලේ මුදන්නායක

## මුල්ලිවයික්කාල් ප්‍රදේශයෙන් පුපුරන ද්‍රව්‍ය පිරවූ බෑග් හතරක් හමු වේ



**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

මුලතිව් මුල්ලිවයික්කාල් ප්‍රදේශයේ ඉඩමක් බැකෝ යන්ත්‍රයක් යොදා ශුද්ධ පවිත්‍ර කරමින් සිටි ඉඩම් හිමියකුට පෙරේදා (09) බෝම්බ පුපුරන ද්‍රව්‍ය පුරවන ලද බෑග් හතරක් හමු වී තිබේ.

ඔහු මේ බව මුලතිව් පොලිසියට දැනුම් දීමෙන් පසුව පොලිසිය පැමිණ එම ස්ථානය ආරක්ෂා කර ඇති අතර, පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් බෝම්බ ඇතුළු පුපුරන ද්‍රව්‍ය ඔවුන් භාරයට ගෙන තිබේ.

මුලතිව් පොලිසිය සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වයි.


ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

## ටිපර් රථයේ ගැටුණු හඳුන් දිවියාට ප්‍රථමාධාර දී කැලයට මුදා හැරේ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

කිලිනොච්චිය, ධර්මපුරම් ප්‍රදේශයේදී ටිපර් රථයක ගැටුණු දුර්ලභ ගණයේ හඳුන් දිවියකුට ප්‍රථමාධාර දී එම හඳුන් දිවියා කැලයට මුදා හැරීමට කිලිනොච්චිය ධර්මපුරම් පොලිසියේ නිලධාරීන් පියවර ගෙන තිබේ.

මීට මාස දෙකකට පමණ ඉහතදී මේ ප්‍රදේශයේදීම ටිපර් රථයකට හසු වූ හඳුන් දිවියකු මරුමුවට පත්ව තිබිණි.



ඡායාරූප- උතුරු පළාත් විශේෂ



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මැයි 11 අඟහරුවාදා

# මාස්ක් දෙකයි! මීටර දෙකයි!

**කො**රෝනා තත්ත්වය දිනෙන් - දින උග්‍ර අතට හැරෙයි. සෞඛ්‍ය අංශ මීට පෙර පෙන්වා දී තිබුණේ දෛනික ආසාදිතයන්ගේ ගණන 8000 – 10,000 අතර විය හැකි අවස්ථාවක් උදාවන්නට ඉඩ ඇති බවය. එය සනාථ කරමින් පෙරේදා නව ආසාදිතයන් දෙදහස් හයසිය ගණනක් වාර්තා වී ඇත. කොරෝනා මරණ ගණන ද කෙමෙන් ඉහළ යයි. මේ තත්ත්වය පිළිබඳ විවරණයක යෙදෙන රාජ්‍ය ඇමැතිනි සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සඳහන් කර සිටින්නේ ජනතාව සිය වගකීම් හරි හැටි ඉටු නොකරන්නේ නම්: ඉන්දියාවේ තත්ත්වයට පත් වීම නොවැළැක්විය හැකි බවය. රෝහල් පහසුකම් වැඩි කිරීමටත් වඩා වැදගත් වන්නේ නව ආසාදිතයන් හමුවීම වළක්වා ගැනීමය. එහි වගකීම ඇත්තේ ජනතාව අතේය.

සෞඛ්‍ය උපදේශන අමතක කොට අවුරුදු කෑමේ ප්‍රතිඵලයක් හැටියට කොවිඩ් තෙවන රැල්ල මතු විය. එය සිදු වී අවසන් බැවින් දැන් කළ යුත්තේ මින් ඔබ්බට රෝගය පැතිරීම වළක්වා ගැනීමය. වෛද්‍ය සංගම් හතරක් රජයෙන් ඉල්ලා සිටින්නේ සංචරණ සීමා වහාම පැනවීම කළ යුතු බවය. එම සංගම්වල තවත් ඉල්ලීමක් වන්නේ රට ‘ලොක්ඩවුන්’ තත්ත්වයට යා යුතු බවය. ඉල්ලීම් දෙකම පහසුවෙන් ඉටු කළ හැකිය. එහෙත් ඉන් පසු ඇතිවන ප්‍රතිඵලය සුබදායක වන්නේ නැත. ‘ලොක්ඩවුන්’ තත්ත්වයක් තුළ අති විශාල පිරිසකට ජීවන මාර්ග ඇහිරෙයි. ජීවන මාර්ග ඇහිරීම මහජන කැළඹීමක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කරයි. මහජන කැළඹීමක් තුළ කොරෝනා වසංගතය තවත් උග්‍රවිය හැකිය. මෙය කල්පනාවෙන් තීන්දු - තීරණ ගත යුතු කාලයකි.

සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය හා වසංගත රෝග අංශය මහජන සෞඛ්‍ය අධ්‍යාපනයට අදාළ විශේෂ වැඩ කොටසක් ඉටු කරයි. කොවිඩ් - 19 වයිරසයේ ස්වභාවය, එහි පැතිරීම මෙන්ම කොරෝනා වසංගතයේ භයානක ස්වරූපය ද ඉහත අංශ විසින් දිනපතාම දැනුම්වත් කරනු ලැබේ. කොරෝනා පිළිබඳ හොඳ වැටහීමක් ඇති කිසිවකු සෞඛ්‍ය උපදේශන නොසලකා හරී යැයි සිතිය නොහැකිය. මෙය අතිශය භයානක වසංගත රෝගයක් වන අතර ආසාදිතයකු මරණයට පත් වන්නේ අතිශය වේදනාකාරී ලෙසය. වයිරසය ශ්වසන පද්ධතියට බලපෑම් කරන බැවින් රෝගියා මරණයට පත්වන්නේ හුස්ම ගත නොහැකිවය. අවසන් අවස්ථාව වන විට ඔක්සිජන්වලින් රෝගියා බේරා ගත නොහැකිය.

අපේ වෛද්‍ය අංශ පෙන්වා දෙන අන්දමට රටේ ජනගහනයෙන් බහුතරය රෝගය ගැනත් වයිරසය ගැනත් හොඳින් දනිති. රෝගය පිළිබඳ කරුණු හරිහැටි නොදන්නේ ද, සෞඛ්‍ය උපදේශන නොසලකා හරින්නේ ද ඉතා සුළු පිරිසක බව වෛද්‍යවරු පෙන්වා දෙති. එහෙත් රෝගයේ ස්වභාවයට අනුව එම සුළු පිරිසට මුළු රටම විනාශ කළ හැකිය. අප වළක්වා ගත යුත්තේ එම තත්ත්වයයි. අපගේ නිරීක්ෂණවලට අනුව ඇතැම් ආසාදිතයෝ නිවෙස්වල සැඟවී සිටිති. ඇතැම් ආසාදිතයෝ රෝගය සඟවමින් සමාජ ගනුදෙනුවල යෙදෙති. කළ යුත්තේ රෝගීන් සැඟවීම නොව; ඔවුන් හඳුනාගෙන වහාම වෛද්‍ය - ප්‍රතිකාර වෙත යොමු කිරීමය. ආසාදිතයන් හැමවිටම හුදෙකලා කළ යුතු බව වෛද්‍ය උපදේශනය වෙයි.

ආසාදිතයකු හුදෙකලා කිරීම යනු රෝගියා මැරෙන්නට හැර බලා සිටීම නොවේ. රෝගියාට අවශ්‍ය පහසුකම් හා ආරක්ෂාව සපයමින් ඔහු සමග ඇති සමීප ඇසුර තාවකාලික ලෙස නවතා දැමීම හුදෙකලා කිරීමේ සැබෑ අර්ථය වෙයි. ගෙවී ගිය ඉතිහාසය තුළ ලාදුරු නමින් වසංගතයකට ද, මැලේරියා නමින් වසංගතයකට ද අපි මුහුණ දී ඇත්තෙමු. ලාදුරු වසංගතයේදී රෝගීන් සඟවා තබා ගැනීමට අපේ සමාජය උත්සුක විය. එයින් වසංගතය පැතිර ගියේය. මැලේරියාව මදුරුවකුගෙන් ආසාදනය වන අතර මදුරුවන් බෝවීම වළක්වා ගැනීමෙන් ද ප්‍රතිශක්තිකරණ එන්නතක් ලබා දීමෙන් ද රෝගය වළක්වා ගත හැකි විය. එම වසංගත දෙකම රටෙන් අතුගා දැමීමට ශ්‍රී ලංකාව සමත් විය. නිසි සෞඛ්‍ය උපදේශන අනුගමනය කිරීමෙන් හා බුද්ධිමත් තීන්දු - තීරණ ගැනීමෙන් කොරෝනා වසංගතය ද රටෙන් අතුගා දැමිය හැකිය.

සෞඛ්‍ය උපදේශන පිළිපැදීම පිළිබඳ සම්පූර්ණ වගකීම ඇත්තේ ජනතාව අතේය. මේ උපදේශන පිළිපැදීම නීතියකට රීතියකට යටත්ව නොව; අවබෝධයකින් යුතුව අනුගමනය කිරීම ඉතා වැදගත්ය. සමාජ ගනුදෙනුවල නිරත ඇතැම් ප්‍රජා කණ්ඩායම් එකම මුඛ ආවරණය සති ගණනක් පාවිච්චි කරති. ඇතැම්හු නිලධාරීන් දුටු විට පමණක් මුඛ ආවරණය පැළඳ ගනිති. එහෙත් එම ආවරණ පවතින්නේ බෙල්ලේ හෝ නිකටේය. මුඛ ආවරණ පැළඳගෙන වැඩෙහි යෙදීම අපහසු කාරණයක් විය හැකිය. එහෙත් පවතින තත්ත්වයට මුහුණ දීම සඳහා එය අනිවාර්යයෙන්ම කළ යුතු වේ. අලුත් නිර්දේශය වන්නේ ප්‍රසිද්ධ තැන්වල හැසිරීමේදී මුඛ ආවරණ දෙකක් පැලඳීම වඩා සුදුසු බවය. එයට ද අප හුරුවිය යුතුය.

බැංකුවට යන තැනැත්තාට පුද්ගල දුරස්ථභාවය අමතක වෙයි.රෝහලේ සායනවලට යන තැනැත්තාට ද එය අමතක වෙයි. කඩ - සාප්පුවලට යන අයට මීටරයේ දුර සිහියට එන්නේ නැත. අලුත් තත්ත්වයට මුහුණ දීම සඳහා මීටරයක දුර නොව: මීටර දෙකක දුර තබා ගත යුතු යැයි සෞඛ්‍ය අංශ අවධාරණය කර තිබේ. අපහසුතා ඇතිවන්නේ වුව අප මේ අලුත් තත්ත්වයට හුරු විය යුතුය. එසේ නොවුණ හොත් ඉන්දියාවට වඩා බරපතළ තත්ත්වයකට මුහුණ දීමට අපට සිදු වනු ඇත. තවත් වැදගත් කාරණයක් වන්නේ කොවිඩ් එන්නත ලබා ගැනීමය. කොවිඩ් වසංගතය සඳහා දැනට ඇති විශ්වාසවන්ත ප්‍රතිකාර ක්‍රමය වන්නේ එන්නත පමණි. එන්නත් වර්ග තුනක් දැනට. ශ්‍රී ලංකාවේ භාවිත වෙයි. අමෙරිකාවේ නිෂ්පාදිත ‘ෆයිසර්’ එන්නත ද ගෙන්වීමට නියමිතය. මේ එන්නත් ලබාගෙන කොරෝනා වැළැක්වීමට සහයෝගය ලබා දීම පුරවැසි යුතුකමකි.

දිල්රුගෙ සීවිදි

බලාත්මක කරගන්නට ඕන නිසා රටේ ජීවෙ
සෘණාත්මක වෙන්න එපා කියලයි හැම විටම කීවෙ
හුඟාක් දුක හිතෙන දවස් ගෙවෙමින් ඇති මේ වතාවෙ
ධනාත්මක නොවිය යුතුය එන ප්‍රතිඵල කොරෝනාවෙ

# ඊළඟ ප්‍රශ්නය: වතුර



ආචාර්ය
සුරතිස්ස දිසානායක
පරිසර විද්‍යා හා සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

**ශ්‍රී** ලංකාවේ ගංගා, ඇළ, දොළ විශාල ලෙස දූෂණය වෙමින් ජලය අපවිත්‍ර වීමක් වර්තමානය වන විට පෙනෙන්නට තිබෙන අතර මේ නිසා ජනතාව අධික ලෙස ලෙඩ රෝගවලට ගොදුරු වන තත්ත්වයක් දක්නට ලැබේ.

ඉන්දියන් සාගරයේ තෙත් සහිත ඊශාන දිග සහ නිරිත දිග සුළංවලට ශ්‍රී ලංකාව නිරාවරණය වී තිබේ. ශ්‍රී ලංකාවේ දකුණු මැද භාගයේ පිහිටා ඇති උස් කඳු වැටි මෝසම් සුළං හමා යන මාර්ගය හරහා පිහිටා ඇති හෙයින් එය ජල සම්පත් නිර්ණය කරනු ලබන උච්ඡතම භූගෝලීය සාධකය ලෙස ද හැඳින්විය හැකිය. එමගින් නිරිත දිගින් අධික වර්ෂාපතනයක් ඇති වන අතර මේ නිසා මුළු භූමි ප්‍රමාණයෙන් 2/3 ක් පමණ උතුරු හා නැගෙනහිර පළාත් සාපේක්ෂව වියළි ප්‍රදේශ බවට පත් වෙමින් තිබේ.

වර්ෂාපතනයත් සමග ජල සම්පත් ඇති වන්නේ කෙසේ දැයි සලකා බැලූ විට ඉහළ ජල දහරා ප්‍රදේශවල සිට පහළ ප්‍රදේශවලට ජලය ගෙන එන ප්‍රධාන අරීය ජලවහන පද්ධති රාශියක් මෙරට තුළ දක්නට ලැබේ. මේ ජලවහන පද්ධතිය 90%ක පමණ භූමි ප්‍රදේශයක් ආවරණය කරමින් විහිදෙන අතර එය ගංගා ද්‍රෝනි 103ක් මගින් සිදු වේ. මෙම ගංගා ද්‍රෝනිවලට අමතරව වෙරළාසන්න ද්‍රෝනි 94ක් ද මෙරට දක්නට දක්නට ලැබේ. මින් රටේ ජල සම්පත සඳහා ප්‍රධාන වශයෙන් දායක වනුයේ ප්‍රධාන ගංගා 103ක් මගින් ලබා දෙන ජල සම්පතය.

තෙත් කඳුකර ප්‍රදේශවලින් පැන නගින ගංගා වර්ෂය පුරාම නොසිඳෙන අතර වියළි ප්‍රදේශවල ගංගා බොහෝමයක් වර්ෂයේ කිසියම් කාලයකට සිඳී යයි. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් 16%ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබන්නේ මහවැලි ගඟ මගිනි. එය තෙත් කලාපයේ සිට වියළි කලාපය දක්වා විහිදේ. මතු පිට හා භූගත ජලය බොහෝ දුරට ඇති වන්නේ වර්ෂාපතනයෙනි. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය ගත් විට එය මි.මී. 2000ක් පමණ වේ. එම ජලයෙන් වාෂ්පීකරණය නොවන ජල ප්‍රමාණය පොළොව මතු පිටින් ගලා ගෙන ගොස් මෝය කටවල් ඔස්සේ මුහුදට වැටේ. එම ජල ප්‍රමාණය වාර්ෂිකව 31%කි.

ලැබෙන වර්ෂාපතනය හා උෂ්ණත්වය අනුව ශ්‍රී ලංකාව තෙත් කලාපය, වියළි කලාපය අතරමැදි කලාපය යනුවෙන් ප්‍රධාන දේශගුණික කලාප කිහිපයකට බෙදේ. එම දේශගුණික කලාපයන්ට ලැබෙන වර්ෂාපතනය සහ උෂ්ණත්වය අනුව ඒවා තුළ විහිදී පවතින ශාක ප්‍රජාව නොහොත් වනාන්තර දර්ශ එකිනෙකට වෙනස් ලක්ෂණ දරනු ලබයි.

## මහවැලි ගඟ

මහවැලි ගංගාව පිළිබඳව සලකා බැලීමේදී කිලෝමීටර් 325ක් පමණ දිගින් යුතු ශ්‍රී ලංකාවේ දිගම ගංගාව මෙය වේ. එහි පවතින ජල පෝෂක ප්‍රමාණය ගත් විට වර්ග කිලෝමීටර් 10,327ක් වන අතර දිවයිනෙන් 1/6ක භූමි ප්‍රදේශයක් මින් ආවරණය වේ. වගාවන් සඳහා ජලය සැපයීම මෙමගින් ප්‍රධාන වශයෙන් සිදු කෙරේ. අධික ජනගහනයක් ජීවත් වන මහනුවර සහ මාතලේ නගර හරහා මහවැලි ගඟ දිගින් අඩක් පමණ විහිදී ගලා යයි. මේ නිසා එම ප්‍රදේශවල කර්මාන්ත ශාලා ආදිය මගින් විවිධ දූෂක ද්‍රව්‍ය 'මැද ඇළ සහ හාලි ඇළ' යන ප්‍රධාන ඇළ මාර්ග දෙකක් හරහා මහවැලි ගඟට එකතු කරනු ලබයි. මෙම දූෂක ද්‍රව්‍යයන්හි එකතුව හේතුවෙන් ගඟ ගලා යන නයිට්‍රේට් අයන සාන්ද්‍රණය වැඩි වීමක් දක්නට ලැබේ. මෙය බහුලවම කෘෂිකාර්මික පොහොර භාවිතය හේතුවෙන් ඇති වන තත්ත්වයක් බව ද සොයා ගෙන තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලම ගංගාව ලෙස සැලකෙන කැලණි ගංගාව දිගින් කිලෝමීටර් 144.3කි. මෙමගින් බස්නාහිර පළාතේ දිස්ත්‍රික්කයන්හි වර්ග කිලෝමීටර් 2278ක භූමි ප්‍රමාණයකට ජල පෝෂණය සපයනු ලබයි. මෙම ගංගාව මුහුදට ගලා බැසීමට කිලෝමීටර් 50කට පෙර සිටම කාබනික අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් එයට එකතු වේ. කොළඹ නගරයේ ප්‍රධානම පානීය ජල මධ්‍යස්ථානය වන්නේ මෙම ජලය ඇතුළත් අඹතලේ ජල පොම්පාගාරයය. මෙතුළට ගලා එන ජලය ඉතා දූෂිතය. එම දූෂිත ජලය පිරිසුදු කොට මිනිස් පාරිභෝජනය සඳහා යොදා ගැනෙන අතර ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට ද රජයට සිදු වේ. එමෙන්ම කැලණි ගංගාවේ පහළ ප්‍රදේශයන්හි සිදු වන අනවසර වැලි ගොඩ දැමීම් වැනි ක්‍රියාකාරකම් හේතුවෙන් එම ප්‍රදේශවල ගැඹුර වැඩි වී තිබේ. මේ නිසා මුහුදු ජලය නිරන්තරයෙන් මෝය කට මගින් කැලණි ගංගාවට එකතු වේ. මෙය පානීය ජලය නිපදවීම සඳහා ඇති වන විශාල ගැටලුවක් ලෙස පෙන්වා දිය හැකිය.



හයිඩ්‍රිල්ලාවලින් වැසී ගිය ගංගාවක්

නාගරික ජල පද්ධති තුළට එකතු වන කැළි කසළ හා අපද්‍රව්‍ය පිරියම් කොට ජලාශවලට එකතු කළ යුතු වේ. කාර්මික අපසන්දන මගින් බැර ලෝහ පිටවීම වැළැක්විය යුතුය. තවද ව්‍යවසායකත්වය සඳහා එම කර්මාන්ත වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන ඇතැම් සම්පත් උදාහරණ ලෙස උණ ගස් වැනි ශාක ගංගා ආශ්‍රිතව රෝපණය කිරීමෙන් උණ ශාකයෙන් කළ හැකි ව්‍යවසායකත්ව නිෂ්පාදන ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සිදු කළ හැකිය.

තවද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා 103 අතරින් ගංගා කිහිපයක් ආශ්‍රිතව විශාල ගංවතුර තර්ජනයන් ද ඇති වේ. කැලණි සහ මහවැලි ගංගා ආශ්‍රිතව සෑම වර්ෂයකම ඇති වන බරපතළ ජල ගැලීම් හඳුනාගත හැකි වේ. මීට ප්‍රධානම හේතුව වන්නේ මෙම ගංගා ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශයන්හි සිදු වන මානව ක්‍රියාකාරකම්ය. ජල පෝෂක ප්‍රදේශයන්හි ශාක වැස්ම මිනිසුන් විසින් ඉවත් කර තිබේ. එම ප්‍රදේශවල නිවාස ඉදි කිරීම, කර්මාන්ත ශාලා ගොඩනැඟීම වැනි ක්‍රියාවන් හේතුවෙන් ද මෙම ශාක වැස්ම ඉවත් වී තිබේ.

එමෙන්ම මෙම ජල පෝෂක ප්‍රදේශ බොහොමයක අයිතිය 99 අවුරුදු බදු ක්‍රමයට ඇතැම් පුද්ගලයන්ට පවරා දී තිබේ. මේ නිසා එම පුද්ගලයන් එම ප්‍රදේශ තුළ විවිධ ගොඩනැගිලි සහ කර්මාන්ත ශාලා ගොඩනගා තිබේ. එමෙන්ම ජල ගැලීම්වලට බලපානු ලබන තවත් ප්‍රධාන කරුණක් ලෙස ජල පෝෂක ප්‍රදේශවලට අමතර ඒ ආශ්‍රිතව කිලෝමීටර් 5ක පමණ වපසරියක ස්වාභාවික ජල අවශෝෂක ප්‍රදේශ එනම් වගුරු බිම් වැනි ප්‍රදේශ මානවයන් විසින් කෘෂිකර්මාන්තය, ගොඩනැගිලි ඉදිකිරීම සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා ගොඩ කිරීමට ලක් කොට තිබේ. මේ හේතුව නිසා ද ගංවතුර තර්ජන තවත් දරුණු වී තිබේ. රත්නපුර, කොළඹ, කළුතර සහ ගම්පහ යන ප්‍රධාන නගර ආශ්‍රිතව බහුලව ගංවතුර තර්ජන ඇති වීම මේ සඳහා පෙන්වා දිය හැකි නිදසුන් වේ.

## අපද්‍රව්‍ය එකතු වීම

ජලය දූෂණය සිදු වන අනෙක් ප්‍රධාන මාර්ගය වන්නේ සතුන් මරන ස්ථාන ජලාශ ආශ්‍රිතව පිහිටා තිබීමය. මස් කර්මාන්තයේදී පිටවන සතුන්ගේ රුධිරය සහ ප්‍රයෝජනයට ගත නොහැකි ඇට කැබලි ජලයට බැහැර කිරීම මෙහිදී සිදු කරනු ලබයි. මෙහිදී එම ද්‍රව්‍ය ඔස්සේ ජලයට ෆොස්පේට් එකතු වේ. එමෙන්ම රෙදි සෝදනු ලබන කුඩුවල ද බහුලව ඇත්තේ ෆොස්පේට්ය. බොහෝ නිවාසවල රෙදි සෝදන ජලය නිදහස් කරනු ලබන්නේ බාහිර පරිසරයටය. මෙම අපිරිසුදු ජලය සියල්ල කානු ඔස්සේ ගලා ගොස් ගංගා, ඇළ, දොළවලට එකතු වේ.

මේ නිසා ද ජලාශයන්හි ෆොස්පේට් ප්‍රමාණය වැඩි වී ඇල්ගීවල ගහණ ඝනත්වය වැඩි වී ජලාශය තුළට සූර්ය කිරණ පතිත වීම ඇනහිටී. සූර්ය කිරණ නොවැටීම නිසා ජලාශ තුළ වැඩෙන වැලිස්නේරියා සහ හයිඩ්‍රිල්ලා වැනි ශාකවලට ප්‍රභාසංස්ලේෂණය කළ නොහැකි වීමෙන් ජලාශ තුළම මිය යයි. මේ ආකාරයෙන් මිය යන ශාක ජලාශ පතුලෙහි තැන්පත් වීම නිසා ජලාශ තුළ කාබනික ද්‍රව්‍ය වැඩි වේ. කිසියම් ස්ථානයක කාබනික ද්‍රව්‍ය වැඩි වීම නිසා එම කාබනික ද්‍රව්‍යයන් ජීර්ණය කිරීම සඳහා නියෝජිතයන් එම ස්ථානයන්ට පැමිණේ.


නියෝජිතයන් ලෙස මෙම ස්ථානයන්ට ප්‍රථමයෙන්ම පැමිණෙනුයේ ස්වායු බැක්ටීරියාවන්ය. එනම් ඔක්සිජන් භාවිත කොට ජීවත් වන බැක්ටීරියාවන්ය. ජීර්ණ ක්‍රියාවලියේදී එම බැක්ටීරියා ශ්වසනයට ඔක්සිජන් භාවිත කිරීම නිසා ජලයේ ඇති ඔක්සිජන් ප්‍රමාණය ද ක්ෂය වී යයි. ජලජ ශාක සියල්ල මිය ගොස් ඇති හෙයින් ප්‍රභාසංස්ලේෂණයක් සිදු නොවීමෙන් ජලාශ තුළට නැවත ඔක්සිජන් එකතු වීමක් සිදු නොවේ. අවසානයේදී ස්වායු බැක්ටීරියාවන් ද මිය යෑමට ලක් වේ.

එහෙත් කාබනික ද්‍රව්‍ය එළෙසම පවතී. එම කාබනික ද්‍රව්‍යයන් ජීර්ණය කිරීම සඳහ නැවතත් එතැනට පැමිණෙනුයේ නිර්වායු බැක්ටීරියාවන්ය. මෙහිදී මෙම බැක්ටීරියාවන්ගේ පරිවෘත්තීය ක්‍රියාකාරකම් හේතුවෙන් විවිධ අප්‍රසන්න ගන්ධයන් සහිත වායු වර්ග නිපදවනු ලබයි. මේ නිසා බාහිර පරිසරයට අප්‍රසන්න ගන්ධයන් සහිත වායූන් පැතිරීමට පටන් ගනී. මෙවැනි ජලාශ අපවිත්‍ර ජලාශ ලෙස හැඳින්වේ. මෙම ජලාශවල ජෛවීය ඔක්සිජන් ඉල්ලුම නැතහොත් BOD අගය ඉතා වැඩි වේ. එවැනි ජලාශවල ජලය පානයට සහ මානවයන්ගේ මෙන්ම සතුන්ගේ භාවිතයට ද නුසුදුසු වේ. එවැනි ජලාශයන් සුපෝෂණයට ලක් වුණු ජලාශ ලෙස හැඳින් වේ. වසර සිය ගණනක් ගිය තැන මෙවැනි ජලාශ ගොඩබිමක් බවට පත් වීම නොවැළැක්විය හැකිය. ජලයට එකතු වෙනු ලබන කෘමිනාශක වර්ග ද ආහාර දාම ඔස්සේ මිනිසා සමීපයට ද පැමිණි පසු කැඩ්මියම් වැනි බැර ලෝහ ශරීරගත වීම නිසා හඳුනා නොගත් වකුගඩු රෝගයන්ට ගොදුරු වීම සිදු වේ. තවද මිනිසුන් වඳ භාවයට ද පත් වේ.

එමෙන්ම නාගරික ජල පද්ධති තුළට එකතු වන කැළි කසළ හා අපද්‍රව්‍ය පිරියම් කොට ජලාශවලට එකතු කළ යුතු වේ. කාර්මික අපසන්දන මගින් බැර ලෝහ පිටවීම වැළැක්විය යුතුය. තවද ව්‍යවසායකත්වය සඳහා එම කර්මාන්ත වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන ඇතැම් සම්පත් උදාහරණ ලෙස උණ ගස් වැනි ශාක ගංගා ආශ්‍රිතව රෝපණය කිරීමෙන් උණ ශාකයෙන් කළ හැකි ව්‍යවසායකත්ව නිෂ්පාදන ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සිදු කළ හැකිය.

මෙවැනි සංකල්පයන්ට අනුකූල වෙමින් සුරකිමු ගංගා ව්‍යාපෘතිය සාර්ථක කර ගත හොත් පරම්පරා ගණනක් යන තෙක් මෙරට අනාගත පරම්පරාවලට මෙම ජල පෝෂකයන්ගෙන් උපරිම ප්‍රයෝජන ගෙන ඉතා නීරෝගි සෞඛ්‍ය සම්පන්න ජීවිත ගත කිරීමට හැකි වනු ඇත.

**චතුමී පිටිපන**



# පීඩාකාරී කොරෝනා මැද ඩෙංගුත් හිස ඔසවයි ද?



## ජාතික ඩෙංගු මර්දන ඒකකයේ අධ්‍යක්ෂ වෛද්‍ය අරුණ ජයසේකර



මහජන සෞඛ්‍ය පරික්ෂකවරු කොරෝනා වසංගතය හේතුවෙන් වැඩ රාජකාරි බහුලව සිටින මේ කාලයේදී වාර්ෂිකව වැඩි ඩෙංගු රෝගීන් ගණනක් වාර්තා වීමේ ප්‍රවණතාවක් පවතී. ඒ, මෙරට මැයි සිට ජූලි පමණ වන තෙක් පවතින නිරිත දිග මෝසම් වර්ෂාව නිසාය. ඉනික්බිතිව ඔක්තෝබරයේ සිට ජනවාරිය දක්වාම යෙදෙන ඊසාන දිග මෝසම් වැසි සමය ද එසේම පවතී.

එහෙත්, ඉකුත් වර්ෂයේදී ගෙවත්ත හා ඒ අවට පිරිසුදුව තබා ගැනීමෙන් ඩෙංගු තුරන් කිරීමට වැඩි දායකත්වයක් ජනතාවගෙන් ලැබිණි. වැඩි කාලයක් නිවෙසටම වී ගත කිරීම හා ඒ අතරතුර බොහෝ දෙනකු වටපිටාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ඊට බලපෑම් කරන්නට ඇත.

එමෙන්ම, මේ වසරේ ද එම දායකත්වය නොඅඩුව මහජනතාවගෙන් ලද හොත් ඩෙංගු වයිරසයට මිනිසුන් බිලි ගන්නට ඉඩක් නැත. මේ කතාබහ එහි අගය මතු කරනු පිණිසය. මේ ජාතික ඩෙංගු මර්දන ඒකකයේ අධ්‍යක්ෂ, වෛද්‍ය අරුණ ජයසේකර මහතා සමඟ කළ සාකච්ඡාවකි.

**● ඩෙංගු තවත් මාරාන්තික වයිරසයක්. ඒ අතින් ලෝකයා හමුවේ අප කොහොම තැනක ද ඉන්නේ?**

ඉකුත් දශකය පිළිබඳව සලකා බැලුව හොත් වේගයෙන් ලොව පුරා ඩෙංගු වයිරසයේ පැතිරීමක් දැක ගැනීමට පුළුවන්. සර්ම කලාපීය රටවලට ඒ අවදානම වැඩි බවක් පෙනෙනවා.

එසේම, දකුණු හා ගිනිකොන දිග රටවල් 100ක පමණ, විශේෂයෙන් නාගරික හා අර්ධ නාගරික ජනතාව අතර ඩෙංගු උණ පැතිරීමේ වැඩි ප්‍රවණතාවක් පිළිබඳ ඊට අදාළ දත්ත වාර්තා මඟින් හෙළි වෙනවා. ඒ අනුව මෙරට ද ඒ අවදානමට නිසි සූදානම ඉතා වැදගත්.

**● මෙරට ජනතාවගෙන් ඊට ප්‍රමාණවත් තරම් ප්‍රතිචාර ලැබෙනවා ද?**

ඒ පිළිබඳ සෑහීමකට පත්වෙන්න පුළුවන්. ජනතාවගේ ආකල්ප ඒ කෙරෙහි සුබදායක අන්දමින් වෙනස් වෙමින් පවතින බවක් පෙනෙනවා. කලෙකට පෙර මෙන් නොවෙයි, දැන් තැඹිලි කෝම්බයක් වුණත් ඔහේ තැනින් තැන වීසි කරන්නට හුඟ දෙනෙක් පෙළඹෙන්නේ නැහැ. ඒ, එයින් සමාජයට සිදු වන අවැඩ ගැන සැලකිලිමත් වෙමින්.

අප අපම අපේ මරණ වරෙන්තු ලියා ගැනීමට එවැනි අකටයුතුකම්වලින් දායක වන බවක් සමාජගත වී ඇති බවක් කුඩා උදාහරණ ඇසුරෙන් මතු කර දක්වන්න පුළුවන්. එහිදී පොලිතීන් හා ප්ලාස්ටික් කඳු ගොඩ ගැසෙන්නට ඉඩ නොදෙමින් විධිමත්ව නිසි වේලාවට කසළ ගොඩ නොගැසෙන්නට රාජකාරි කරන පළාත් පාලන ආයතනවලට ස්තුති කළ යුතු වෙනවා. නැතිනම් වැසි කාලයේදී ඒ මතුපිට වතුර පිරීම ඩෙංගු පැතිරීමට කොළ එළියක්.

**● ඒත් මේ තවත් වසංගතයක් නිසා ලෝකයම බියෙන් ඇළලී සිටින කාලයක්?**

ඇත්ත. මෙරටටත් එය දැනෙනවා. වෙනදා මෙන් ගෙයින් ගෙට ඇවිදිමින්, ගෙවත්ත පුරා ඇවිද යමින් ගෙවත්ත මෙන්ම ඒ අවට කුණු ගොඩවල් හාරා අවුස්සා මදුරු කීටයන් වනසා දමන්නට රාජ්‍ය නිලධාරීන්ට මේ අවස්ථාවේ අපහසුයි. කලින් වහල මතට පවා නැඟ මහජන සුබසිද්ධිය වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් ඒ මෙහෙවර ඉටුකළානේ.

ඉකුත් කාලයේදී මහජන සෞඛ්‍ය පරික්ෂකවරු පොලිසිය හා හමුදාවේ සහාය ඇතිව එතරම්ම කැපකිරීමකින් තමයි කර්තව්‍යයේ නියැළුණේ. එහෙත් එය ප්‍රායෝගිකව මේ අවස්ථාවේදී කිරීම අපහසුයි. මේ නිසා මින් පෙර අත්දැකීම් සිහිපත් කරමින්, වැඩි වර්ෂාවක් ලැබෙතැයි අපේක්ෂා කරන මේ කාලයේදී තමාගේ ගෙවත්තේ තැනින් තැන මදුරුවන් බෝ නොවන්නට පියවර ගැනීමට හැම කෙනකුම දිනපතා සැලකිය යුතු වේලාවක් වෙන් කිරීමට කටයුතු කළ යුතු වෙනවා.

එවිට ලෝකයේ රටවල් රැසක්ම නොපෙනෙන මාරාන්තික වයිරසයක් සමඟ සටන් වැදී සිටින මේ කාලයේදී අපට ඇසට පෙනෙන මාරාන්තික ඩෙංගු මදුරුවාගේ අවදානමෙන් මිදීම අපහසු නැහැ. එසේම එය රජයේ නිලධාරීන්ගේවත් පළාත් පාලන ආයතනවලවත් තනි වගකීමක් නෙවෙයි. පොදුවේ රටවැසියන් වශයෙන් අපි හැමෝම ඊට ඇප කැප වී සිටිය යුතුමයි.

**● ඩෙංගු උණටත් ලෝකයා තවම නිශ්චිත ප්‍රතිකාරයක් සොයා ගෙන නැහැ නේ ද?**

ඒත් එහිදී වෛද්‍ය උපදෙස් අනුව කටයුතු කිරීමෙන් අපට දැඩි අවදානම් තත්ත්වයට පත්වන්නට කලින් එයින් මිදෙන්න පුළුවන්. ඒ සඳහා දැනුවත් වීම ඉතා වැදගත්. රජයේ රෝහල් මඟින් ඒ සඳහා නිසි වෛද්‍ය උපදෙස් මෙන්ම ප්‍රතිකාර ලබා දෙනවා. ඒ නිසා කිසිවකු බිය විය යුතු නැහැ.

**● කොරෝනා වයිරසය ශරීරගත වුවකු සහ ඩෙංගු රෝග ලක්ෂණ පෙන්වන්නකු අතර වෙනස අපැහැදිලි වුණොත්?**

එවැනි බියක් ඇතිකර ගත යුතු නැහැ. ඒ පිළිබඳ හරිහැටි හඳුනා ගැනීම වෛද්‍යවරුන්ට එතරම්ම ගැටලුකාරී වන්නේත් නැහැ. ඩෙංගුවලදී උණත් සමඟ එක දිගට දින දෙකක් පමණ ඔක්කාරය, තදින් පවතින උදරාබාධ ස්වභාවය, හිසරදය, සන්ධි සහ මස්පිඩු වේදනා මෙන්ම සම මතුපිට රතු පැහැති ලප ඇති වීමේ ඉඩකඩ ආදියෙන් ඒ වෙනස මතුපිටින් සරලව හඳුනා ගත හැකි වෙනවා.

එසේම, ප්ලාස්මා තරලය පිටතට කාන්දු වීම වැනි රෝග ලක්ෂණ වෛද්‍ය පර්යේෂණවලින් තවදුරටත් හෙළි කර ගැනීමට පුළුවන්. ඩෙංගුවලට එන්නතක්වත් විශේෂ ඖෂධයක්වත් නැති බව කවුරුත් දන්නා තවත් කරුණක්. ඒත් සේලයින් වැනි අන්තර් ශිරා ද්‍රාවණ ලබා දීමත් දිගින් දිගට සිදු කෙරෙන රුධිර පරීක්ෂණ ආදියත් මඟින් විවිධ සංකූලතා ඇතිවීම වළක්වා ගැනීමට පුළුවන්.

එහිදී වැදගත්ම කරුණක් වෙන්නේ ඉක්මණින් රජයේ රෝහලකට ප්‍රතිකාර කරා යොමු වීමයි. ඇත්තෙන්ම අපට අකාලයේ ඩෙංගු නිසා අහිමි වුණු ජීවිත හුඟක් ගලවා ගැනීමට අපහසු වී තිබුණේ එය එසේ නොවීමෙන්. නොඑසේ නම් මෙරට ක්‍රියාශීලීම වයස අවුරුදු 15-45ත් අතර හුඟ දෙනකු ඩෙංගු රක්තපාත තත්ත්වයට පත් වන්නටත් කලින්ම ඉන් ගලවා ගැනීමට රජයේ රෝහල් හරහා අපට පුළුවන්කම තිබුණා.



**හුඟ දෙනකු ඩෙංගු රක්තපාතයට පත් වන්නට පෙර ඉන් ගලවා ගැනීමට රජයේ රෝහල්වලට හැකි වුණා**

**ලොව පුරා ඩෙංගු වයිරසයේ පැතිරීමක් දැක ගැනීමට පුළුවන්**

**ගෙවත්තේ තැනින් තැන මදුරුවන් බෝ නොවන්නට පියවර ගැනීම වැදගත්**

**● ඒ අනුව මහජනතාව දැනුවත්වීමයි ඉතා වැදගත්?**

ඇත්තෙන්ම. අප හැකි උපරිමයෙන් ජනමාධ්‍ය සහාය ද ලබා ගනිමින් ඒ කර්තව්‍යයේ නියැළෙනවා. එහෙත් එහිදී රජයේ ආයතනයක් වශයෙන් අති විශාල වියදමක් දැරීමට අපට අපහසුයි. එහෙත් නවීන සන්නිවේදන තාක්ෂණය උපරිම වශයෙන් ඒ පණිවුඩය මහජනතාව අතරට ගෙන යෑමේදී අප යොදා ගන්නවා. ඊට වෙනමම ඇප් ( Apps) එකක් හඳුන්වා දීමටත් අප කටයුතු කළා. ඒ හරහා ද සැලකිය යුතු ප්‍රතිචාර ලැබුණත් සමහරු තවම ඉන් වැඩ ගන්නේ නැහැ.

ඒත් මුළුමහත් සමාජයටම ඩෙංගු තුරන් කිරීමට තම තමන්ගේ දායකත්වය ලබා දිය යුතුයි කියන පණිවුඩය ගෙන යා යුතුමයි. ඒ කෙරෙහි මහජනතාවගේ කැපවීමත් අත්‍යවශ්‍යයි. එවිටයි, රටක් වශයෙන් අපට සතුටුවෙන්න පුළුවන් වෙන්නේ. එතෙක් රාජ්‍ය නිලධාරින් ගෙයින් ගෙට යමින් කෙතරම් අවධාරණයෙන් පරිසරය මදුරුවන් බෝ නොවන ලෙස තබා ගන්නා ලෙස කියා සිටියත් අපට නිසි ප්‍රතිඵල නොලැබේවි. ජනතාව කොරෝන රෝගය කෙරෙහිම අවධානය යොමු කර ගෙන සිටීම නිසා ඩෙංගු වසංගතය ඔවුනට අමතකව ගොස්. එහෙත් මේ වසංගත දෙකම මාරාන්තිකයි. ජනතාව සෑම දෙයකින්ම පරිස්සම් වීම අත්‍යවශ්‍යයි. කොරෝනාවෙන් පරිස්සම් වීම සඳහා අදාළ සෞඛ්‍ය නීතිරීති රකින ගමන්ම තමන්ගේ වත්ත පිටිය ගැනත් අවධානය යොමු කළ යුතුමයි. සතියතට වතාවක් හෝ වත්ත පිටිය පිරිසුදුව තබා ගත හොත් ඩෙංගු මදුරුවන්ට නවාතැන්පොළවල් හැදෙන්නේ නැහැ. ඒ පිළිබඳව සියල්ලක්ම සැලකිලිමත් විය යුතුමයි.

**මහජනතාවගේ කැපවීමත් අත්‍යවශ්‍යයි**

**● ඔබ ඩෙංගු මර්දනයේදී රාජ්‍ය නිලධාරින්ගේ දායකත්වය පිළිබඳ කතා කළා. ඒත් අවුරුදු 4ක් තිස්සේ පත්වීම් නොලද බවක් තමයි ඩෙංගු මර්දනය සඳහාම බඳවා ගත් ඇතැම් නිලධාරීන් කියන්නේ?**

ඒක මෙහෙමයි. පසුගිය ආණ්ඩුව කාලයේදී සුදුසුකම් පිළිබඳ නිසි සැලකිල්ලක් නොදක්වා එම 1500 දෙනකුගෙන් යුතු කණ්ඩායම බඳවා ගෙන තිබෙන්නේ. එයින් ඇතැමුන් රැකියාව හැර ගිහින්. ඒ කෙසේ වෙතත්, වත්මන් ආණ්ඩුව ඒ අයට රජයේ රැකියාවලට බඳවා ගැනීමේ මූලික සුදුසුකම්වලට යටත්ව සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරමින් සිටිනවා.

ඒ අනුව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේ ඉදිරියේදී මූලික සුදුසුකම් සහිත ඒ තැනැත්තන්ගේ රැකියා නුදුරේදීම ස්ථිර කරන බවත් අපට දැන ගැනීමට ලැබුණා. අනෙක් අයටත් ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව අඩු ආදායම්ලාභින් ලක්ෂයකට රැකියා ලබා දීමේ වැඩපිළිවෙළ යටතේ රැකියා ස්ථිර කර දීමටත් කටයුතු කෙරෙන බවත් පැවසිය හැකියි.

**නුවන් මහේෂ් ජයවික්‍රම**
**ඡායාරූප - සුදත් මලවීර**




## වසංගත කාලයක පුරවැසි වගකීම

කොවිඩ් වසංගතය තමන්ගේ රුදුරු මුහුණ ලාගෙන යළිත් පැමිණ තිබේ. පළමු, දෙවැනි වතාවල මෙන් නොව මේ පැමිණි තෙවැනි වතාවේ තත්ත්වය සිතුවාට වඩා බරපතළ වී ඇත. මේ තත්ත්වයට මුහුණ දීමට තනිව මෙන්ම සාමූහිකව ද ක්‍රියාත්මක වීමේ කාලය පැමිණ තිබේ. සරල පුරවැසි වගකීම් ඉෂ්ට කරමින් ඒ තනි වගකීම ඔබට පටන් ගත හැකිය.

නියාමාකාරයෙන් මුව ආවරණ පැලඳීම, සබන් යොදා අත් සේදීමෙන් පටන් ගැනෙන මේ තනි වගකීම අන්‍යයන් විෂයෙහි ද බෝ කළ හැකිය. ඒ, තමන් මෙන්ම අන් අය ද මේ කාරණා නිසි ලෙස ඉටු කරන්නේදැයි විමසිල්ලෙන් සිටීමෙනි. නිසි ලෙස මුව ආවරණ නොපැලැඳ පොදු ප්‍රවාහන මාධ්‍යයක හෝ පොදු ස්ථානයක යම් අයකු සිටියි නම් ඒ වෙනුවෙන් විරුද්ධ වීමේ අයිතිය පුරවැසියකු සතුය. මන්ද යත් ඒ පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායම විසින් අන් අයව අනතුරේ හෙළන හෙයිනි.

මේ සියල්ලටම වඩා වැදගත් ආසාදිතයකු බවට හෝ ආශ්‍රිතයකු බවට ඔබ තුළ යම් සැකයක් ඇත්නම් ස්වයං විනයක් සහිතව හැසිරීමය. සෞඛ්‍ය නිලධාරීන් විසින් ස්වයං නිරෝධායන වීමට හෝ පීසීආර් පරීක්ෂණයකට යොමු කළ අයෙක් නම් ඔබේ වගකීම සිය දහස් ගුණයකින් වැඩි බව සිහියේ තබා ගත යුතුමය. අනෙකාව ප්‍රවේසම් කිරීමේ භාරදූර රාජකාරිය ඔබේ පිට වැටී ඇති බව මතකයේ තබා ගෙන කටයුතු කළ මනාය.

ස්වයං නිරෝධායනයේ යෙදෙන්නේ නම් කම්මැලියි කියා හෝ නිවෙසටම වී සිටි පීඩනයෙන් පසු වේ යැයි කියා සුපුරුදු ලෙස එළිමහනේ ඇවිදිමින්, සාද කතා පැවැත්වීම යුතු නැත. පීසීආර් පරීක්ෂණයේ ප්‍රතිඵල පැමිණෙන තෙක් තම දෛනික ජීවිතයේ කලින් ගිය ගමන් සියල්ල යෑමට තීරණය කරන්නේ නම් ඒ අමනෝඥකමකටත් වඩා අතිශය අවදානම් සහගත ක්‍රියාවකි. එහෙත් දිනපතා පුවත් අසන, දකින, කියවන විට එවන් සිදුවීම් සුලබ බව පෙනෙන්නට තිබේ. මේ වගකීම් විරහිත ක්‍රියා පිළිවෙත්වලට වගකීමට සිදු වන්නේ ඔබ කිසිසේත්ම බලාපොරොත්තු නොවන ආගන්තුකයකුට විය හැකිය. එසේත් නැත්නම් ඔබේම ආදරණීයයකුට විය හැකිය.

බරපතළ වසංගතයක් පැමිණ මිනිසුන්ව ආක්‍රමණය කළ පසු මිනිසා විසින්ම ඒ ආක්‍රමණයට අවි, ආයුධ සපයා යුතු නොවේ. ඔහු කළ යුත්තේ අතිශය බුද්ධිමත්ව සහ සංවිධානාත්මකව එය පරාජය කිරීමය. එවන් වසංගත පරාජය කිරීම අතීතය පුරාම දක්නට ඇත. මේ සියලු සටන් කර ඇත්තේ මිනිසා විසින්මය. තනි පුද්ගලයාගේ සිට සමූහ තෙක් යම් එකඟතාවයකට පැමිණීමෙන්ය.

දැන් නව එන්නත් තොග ලැබෙමින් පවතී. ක්‍රමානුකූලව මහජනතාවට එකී එන්නත් ලබා දීමේ වැඩසටහන් ද ක්‍රියාත්මකය. සෑම ක්‍රියාවලියකම අඩුලුහුඬුකම් තිබිය හැකිය. එහෙත් මේ එකිනෙකා තරග කළ යුතු, ප්‍රතිවාදියා පරාජය කළ යුතු, දේශපාලන සටන් මුලට ගත යුතු කාලයක් නොවේ. සියල්ල එක්ව එකම සටනකට අවතීර්ණ විය යුතු කාලයකි. තවත් අවුරුදු සිය ගණනක ඉතිහාසය වෙනස් කිරීමට මේ මොහොතේ ඔබ ගන්නා තීරණ අතිශය වැදගත් විය හැකිය. ඒවා පෞද්ගලික තීරණ සේ හැඟී යා හැකිය. එමෙන්ම ඒවා පොදු යහපතට ගන්නා තීරණ ලෙස ද නිර්වචනය කළ හැකිය. කෙසේ වෙතත් මේ මොහොතේ ගත යුත්තේ නිවැරදි තීරණයයි.

නොදැනුවත් වසංගත වාහකයකු බවට පත් නොවීමට වග බලා ගැනීම එවන් වැදගත් තීරණයකි. කාර්යාලයට යන අතරතුර, පොදු ප්‍රවාහනයේ හෝ පොදු ස්ථානයක සිටින විට අනාරක්ෂාකාරී ලෙස මුව ආවරණ ඉවත් නොකිරීම, වෙනත් අයකු භාවිත කෝප්ප ආදිය හවුලේ භාවිතයට නොගැනීම මෙන්ම ආරක්ෂාකාරී දුරක් නොපවත්වා ගැනීම මේ අතර වැදගත්ය. පොදු ප්‍රවාහනයේ සුලභ වේලාවල ගමන් නොකොට සේවා මුරවල සුළු වෙනස්කම් සිදු කරවා ගැනීම, පෞද්ගලික වාහනයක ගමන් කිරීම ආදිය සිදු කිරීමට හැකියාව ඇත්තන් ඒ කළ හොත් යම් වෙනසක් ඇති වේ. මේ වෙනස නොපෙනෙන තරම් කුඩා එකක් වුවත් ඉන් සමාජයට අත්වන ප්‍රතිලාභය ඔබ සිතනවාට වඩා වැඩිය. එය පෞද්ගලික ප්‍රතිලාභයකින් පටන්ගෙන පොදු ප්‍රතිලාභයක් තෙක් පැතිරී යයි.

දැනුවත්ව සිටීම අනෙක් කාරණයයි. ආසාදිතයකු යැයි දැන ගත් මොහොතේ සිය ක්‍රියා කළ යුත්තේ කෙසේ ද, ආශ්‍රිතයකු බවට පත් වුව හොත් කුමක් කළ යුතු ද යන කාරණා පිළිබඳ දැනුවත් වීම පුරවැසියකු ලෙස ඔබට කළ හැකි අල්ප යුතුකමකි. පැය විසිහතර පුරාම තොරතුරු ලැබෙන කාලයක එය එතරම් අපහසු කාරණාවක් නොවනු ඇත. එමෙන්ම වැරැදි තොරතුරු කරා නොපිවිසීමටත් ඔබට අයිතියක් ඇත. තොරතුරු විකෘතිව ඇත්නම් නිවැරැදි තොරතුරු ඉල්ලා සිටීමේ අයිතිය ඔබ සතුය.

සෞඛ්‍ය උපදෙස් පිළිපැදීමට මැළි වීම අනෙක් භයානක කාරණාවයි. ඔබ විසින් තීරණය කළ යම් ක්‍රමෝපායක් අනුගමනය කරමින් සෞඛ්‍ය තීරණ අභියෝගයට ලක් කර අවදානමට පැනීම නොකළ යුත්තකි.

කොරෝනා වසංගතය යනු කුමන වෙලාවක, කවරකුට ආසාදනය විය හැකිදැයි කිව නොහැක්කක් බවට දැන් පත්ව ඇත. ඒ වයිරසයේ මුල් ස්වභාවය වෙනස් වීම හේතුවෙනි; රෝග ලක්ෂණ වෙනස්වීම හේතුවෙනි. පෙර ඇඟවුම් නොමැතිව ශරීරය ආක්‍රමණය කරන මේ නව ප්‍රභේදය සමඟ හැංගිමුත්තන් කළ නොහැක. නියමිත සෞඛ්‍ය උපදෙස් සහ වෛද්‍ය සහාය නොලබා මේ ව්‍යසනයෙන් ගැලවී ගත නොහැකිය.

සාද, ප්‍රීති සම්භාෂණ පැවැත්වීමේ ලාලසාව මහජනයා විසින් කල් නොතැබුව හොත් එහි ප්‍රතිඵල එතරම් සුබදායක නොවනු ඇත. මෙවන් කාලයක සාංකාව, අධික මානසික පීඩනය සහ වෙනත් ගැටලු පැන නැඟිය හැකිය. එහෙත් සියලු ඒකරාශීවීම් ආදියෙන් ඒ සාංකාව තාවකාලිකව සමනය කළත් අනෙකාව අනතුරේ හෙළීමේ පසුතැවීමෙන් ජීවිත කාලයටම ගැලවීගත නොහැකි වනු ඇත. තීරණය ඇත්තේ තනි පුද්ගලයන් මතය. ඒ තනි පුද්ගල තීරණ සමාජයක පැවැත්මට සෘජුවම විශාල බලපෑමක් කරනු නියතය.

බුද්ධිමත්ව කටයුතු කරන්න. මොළයට මිස හැඟීම්වලට අවනත නොවන්න. ආසන්නයේ ඇති සිල්ලර බඩු කඩයට මුව ආවරණයක් නොමැතිව ගමන් කිරීමට ගන්නා තීරණයේ පටන් ආසාදිතයකු යැයි දැනගෙන වෙනදා මෙන් සෙසු ජනතාව සමඟ හැසිරෙන්නට ගන්නා තීරණය තෙක් ඇති දීර්ඝ ගමනේ අතරමඟ බොහෝ පිරිසක් මහත් කරදරයකට පත් වනු ඇත. ඒ ව්‍යසනය වසංගතය පැතිරීමට වඩා බරපතළය. වසංගතයක් පැතිරවීමේ මුග්ධ ක්‍රියාවට කිසිම විට කිසිවකු දායක විය යුතු නොවේ. යථා සිහියෙන් කටයුතු කරන්න. ඒ ඔබේ මෙන්ම අනෙකාගේත් ජීවිතය රැකෙන පරාර්ථකාමී දහමක් වනු ඇත.

**කාංචනා අම්ලානි**

# රසායනික පොහොර තහනමෙන් ගොවියා පීඩාවට ලක් වෙලා

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස**

**පහන් විජේසේකර**

රසායනික පොහොර තහනම් කිරීමට ආණ්ඩුව ගනු ලැබූ ක්ෂණික තීන්දුව හේතුකොට ගෙන අපේ රටේ සමස්ත ගොවි ජනතාවත් පොදුවේ මුළු මහත් ජනතාවත් බරපතළ පීඩාවකට ලක්වන බවත්, මෙය ආණ්ඩුව විසින් ගනු ලැබූ අත්තනෝමතික අඥාන තීන්දුවක් බවත් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඊයේ (10) පැවසීය.

විපක්ෂ නායක කාර්යාලයේ දී මාධ්‍ය අමතා විශේෂ ප්‍රකාශයක් කළ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ප්‍රකාශ කළේ ආණ්ඩුවේ මෙම තීන්දුව හේතුවෙන් රටතුළ තුන් බියක් ඇතිවීමේ අවදානමට ලක් වන බවයි.

කාබනික පොහොර භාවිතය ක්ෂණිකව කළ හැක්කක් නොවන බව පැවසූ විපක්ෂ නායකතුමා වැඩිදුරටත් පවසා සිටියේ ක්‍රමානුකූලව කාබනික පොහොර කෙරෙහි ගොවිජනතාව යොමුකර,එය සාර්ථක වූ පසු රසායනික පොහොර නවතා දැමීම ප්‍රායෝගික බවයි.

එතෙක් ගුණාත්මක රසායනික පොහොර සහනාධාරය ලබා දිය යුතු බවද හෙතෙම පැවසීය.

# 9 වැනිදා කොරෝනා රෝගීහු 2672ක්

**සන්ධ්‍යා කරුණාරත්න**

එක් දිනකදී කොවිඩ්-19 ආසාදිතයන් 2672ක් ලෙස වැඩිපුරම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වීම පසුගිය පැය 24 තුළදී සිදු වූ බව වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි.

සමස්ත ආසාදිතයන්ගේ සංඛ්‍යාව 125,906ක් බවත් ඉන් 104,463ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් සහ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පිටව ගොස් ඇති බවත් එම අංශය පවසයි.

ආසාදිතයන් 20,642ක් මේ වන විට රෝහල්වල සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් මරණ 801ක් සිදුව ඇතැයි ද එම අංශය ප්‍රකාශ කරයි.

කොවිඩ් ආසාදිතයන්ගෙන් මේ වන විට රෝහල් ධාරිතාව ඉක්මවා ගොස් ඇති අතර හැකි තරම් ස්වයං පාලනයකින් යුක්තව සමාජය තුළ හැසිරිය යුතු බවට මහජනතාව වෙත වසංගත රෝග විද්‍යා අංශය දැනුම් දීමක් සිදු කරයි.

අවශ්‍යම කාරණාවකට හැර සංචරණය සිදු නොකළ යුතු බවත් අවශ්‍යතාවන්ට අනුව සංචරණයන් සිදු කළත් කොවිඩ් මර්දන සෞඛ්‍ය උපදෙස් අනුගමනය කිරීම තරයේ සිතට ගත යුතු බවත් එම අංශය මහජනතාවට පවසයි.

# පොලිස් ඩ්‍රෝන ඒකකය අද සිට වැඩ

**සුභාෂිණී සේනානායක**

කොළඹ නගරයේ රථවාහන තදබදය මැඩලීමටත් මාර්ග නීති උල්ලංඝනය කරමින් රිය ධාවනය කරන රියදුරන් නීතියේ රැහැනට හසුකර දෙන්නටත් පොලිස් විශේෂ කාර්ය බළකායේ ඩ්‍රෝන් කැමරා ඒකකය අද (11) සිට මෙහෙයුම් ආරම්භ කරන බව පොලිස් විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරී නියෝජ්‍ය පොලිස්පති නීතිඥ වරුණ ජයසුන්දර මහතා 'දිනමිණ'ට පැවසීය.

කොළඹ ගාලු පාර, හයිලෙවල් මාර්ගය, පාර්ලිමේන්තු මාර්ගය, පෑලියගොඩින් නුවර පාර සහ මීගමුව පාර යන මාර්ගත් කොළඹ නගරය ඇතුළත් ඩ්‍රෝන් මෙහෙයුම ක්‍රියාත්මක කෙරෙන අතර ස්ථාන 05ක උස් ගොඩනැගිලිවල සිට කිලෝ මීටර් 05ක පමණ වපසරියක් එක් ඩ්‍රෝන් කැමරාවකින් නිරීක්ෂණය කෙරෙන බවද වරුණ ජයසුන්දර මහතා සඳහන් කළේය.

# දිස්ත්‍රික් මට්ටමින්වත් සංචරණ සීමා පනවන්න

**විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු**

**සන්ධ්‍යා කරුණාරත්න**

දිස්ත්‍රික් මට්ටමින්වත් සංචරණ සීමා පැනවීම සිදු නොකළොත් වසංගතය ව්‍යාප්තිය අඩු කර ගත නොහැකි බව විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු මහතා පැවසුවේය.

රට වෙනුවෙන් කොවිඩ් - 19 වසංගතය පරාජය කර ජනතාවක් ලෙස අප ජයග්‍රහණය කළ යුතුය යන එකම පරමාර්ථය සැමදෙනාගේ සිත් තුළ තිබිය යුතු බව ද ඒ මහතා ප්‍රකාශ කළේය.

# කොරෝනාවෙන් රට බේරා ගන්න කැබිනට් මණ්ඩලයට පූර්ණ බලය පවරා ගන්න

**එජාප නායක රනිල් වික්‍රමසිංහ**

**ශිරෝමි අබයසිංහ**

කොරෝනා වසංගත තත්ත්වයෙන් රටත් ජනතාවත් බේරා ගැනීමට නම් ඒ පිළිබඳ කටයුතු සිදු කිරීමට කැබිනට් මණ්ඩලය වහාම පූර්ණ බලතල ගෙන ක්‍රියා කළ යුතු බව හිටපු අග්‍රාමාත්‍ය එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

කොරෝනා මර්දනයට පත් කර ඇති කමිටු අසාර්ථක බව සඳහන් කළ ඒ මහතා කැබිනට් මණ්ඩලයේ පළපුරුද්ද ඇති අය සිටින බවත් කැබිනට් මණ්ඩලය වහාම වගකීම ගෙන ක්‍රියා නොකළහොත් ජීවිත ගණනාවක් අහිමි විය හැකි බවත් සඳහන් කෙළේය.

මාධ්‍ය වෙත ඊයේ විශේෂ ප්‍රකාශයක් කරමින් වික්‍රමසිංහ මහතා මෙසේද පැවසීය.

කොවිඩ් 19 රෝගයේ උග්‍ර තත්ත්වයකට අපි අද මුහුණ දීලා තියෙනවා. ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව කඩා වැටෙනවා. කොවිඩ් 19 ව්‍යසනය දැන් ලංකාව පුරාම පැතිරෙනවා. එන්නත් , ඔක්සිජන් සහ වෙන්ටිලේටර් හිඟයක් තියෙනවා. රෝහල්වල ඇඳන් හිඟයක් තියෙනවා. රෝහල් රෝගීන්පි ගෙන් පිරිලා. දිනෙන් දින මේ කොවිඩ් රෝගය වැඩි වෙනවා. දැන් අපි ඉන්නේ තීරණාත්මක අවස්ථාවක.

# කොවිඩ් ප්‍රතිකාරවලට ඇඳන් 10,000ක වාට්ටු සංකීර්ණය භාර දීම අද

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ්-19 ව්‍යාප්තියේ ශීඝ්‍ර ව්‍යාප්තියත් සමඟ රෝහල් පද්ධතියේ පහසුකම් තවදුරටත් ඉහළ නැංවීමේ වැඩපිළිවෙළ යටතේ ක්‍රියාත්මක කළ ඇඳන් 10,000කින් සමන්විත වාට්ටු සංකීර්ණ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නිල වශයෙන් භාර දීම අද (11) සිදුකෙරේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නිර්මාතෘ බැසිල් රෝහණ රාජපක්ෂ මහතාගේ සංකල්පයකට අනුව කොවිඩ් ප්‍රතිකාර රෝහල් ආශ්‍රිතව පහසුකම් පුළුල් කිරීමේ කඩිනම් වැඩසටහන යටතේ මෙම රෝහල් ආශ්‍රිතව නව තාවකාලික වාට්ටු සංකීර්ණ දින 02ක් ඇතුළත ඉදිකර අවසන් කිරීමේ ව්‍යාපෘතිය රට පුරා ආරම්භ කර තිබෙන අතර ඒ අනුව මුල් පියවර යටතේ වතුපිටිවල මූලික රෝහල, මිනුවන්ගොඩ මූලික රෝහල, කහවත්ත මූලික රෝහල, මීරිගම මූලික රෝහල, දඹදෙණිය මහ රෝහල, අම්බලන්ගොඩ දිසා රෝහල, නාගොඩ ජාතික රෝහල, කොස්ගම දිසා රෝහල, පිඹුර දිසා රෝහල, නවගමුව දිසා රෝහල, මාතර කොටවිල දිසා රෝහල, මුල්ලේරියාව ශික්ෂණ රෝහල සහ පානදුර මූලික රෝහල් යන රෝහල් ආශ්‍රිතව මෙම වාට්ටු සංකීර්ණ ඉදිකිරීම් පෙරේදා (09) ආරම්භ කෙරිණ.

කොවිඩ් රෝගීන් බහුලව ව්‍යාප්තවීමත් සමග ප්‍රතිකාර රෝහල් ආශ්‍රිතව මතු විය හැකි ඉඩකඩ සීමා වීමේ ගැටලුකාරි තත්ත්වයන් අවම කර ගැනීම සඳහා සියලු පහසුකම්වලින් සමන්විත මෙම වාට්ටු සංකීර්ණ ඉදකිරීම් සිදුකෙරෙන අතර ඒ සඳහා රජයේ හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කිසිදු මුදල් වියදම් කිරිමක් සිදු නොවේ.

ශ්‍රී ලංකාවේ දැවැන්තම සංවිධාන ශක්තියක් හෙබි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සිය දේශපාලන යන්ත්‍රණයේ ශක්තිය කොවිඩ් අර්බුදයෙන් ජනතාව බේරා ගැනීම වෙනුවෙන් සක්‍රිය දායකත්වය ලබාදීම මේ වන විට ආරම්භ කර ඇති අතර එහි මුලාරම්භයක් ලෙස දින 10 ක් ඇතුළත රෝගීන් වෙනුවෙන් ඇඳන් දස දහසක් (10,000) ඉදිකර සෞඛ්‍ය අංශය වෙත භාර දීමේ කටයුතු කෙරේ.

01 වැනි පිටුවෙන්

## රට වසා දැමීමේ ...

ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා දිගටම පවත්වාගෙන යාමට බාධාවකින් තොරව පියවර ගන්නා බවත් ඉදිරියේදී කොවිඩ් මර්ධන එන්නත ජනතාවට ලබාදීම සඳහා ත්‍රිවිධ හමුදාව එක් කරන බවයි යුද හමුදාපතිවරයා කියා සිටියේය.

බස්නාහිර මෙන්ම කොරෝනා වැඩි වශයෙන් වාර්තා වන ප්‍රදේශවලට දැඩි සංචරණ සීමා පැනවීම කෙරෙහි රජයේ අවධානය යොමු ව ඇතැයි ද හෙතෙම කීවේය.

## රියැදුරු බලපත් ...

ඒ අනුව එම කාලය අතරතුර කල් ඉකුත්වන සියලු රියැදුරු බලපත්‍ර, කල් ඉකුත්වන දිනයේ සිට තවත් මාස 6ක් සඳහා වලංගු බව එම දෙපාර්තමේන්තුව පවසයි.

පවතින කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතුවලට බාධා සිදුවීම නිසා එම පියවර ගත් බව එහි කොමසාරිස් ජනරාල් සුමිත් අලහකෝන් මහතා පැවසීය.

## විභාග කල් යයි ...

නිවේදනයක් නිකුත් කරමින් විභාග කොමසාරිස් ජනරාල් එලෙස කල් දැමූ ආයතනික විභාග පැවැත්වෙන දින පසුව දැනුම් දෙනු ලබන බව විභාග කොමසාරිස් ජනරාල් බී. සනත් පූජිත මහතා නිවේදනයක් නිකුත් කරමින් පවසයි.

කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් එම තීරණය ගත් බව ද හෙතෙම කීවේය.


"ඔබට නිවන් සුව"



උපත 1977 01 24

විපත 2021 05 09

**එච්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා**

සොයුර, ඔබ අපගේ සාර්ථකත්වයේ
කොටස්කරුවෙක් විය. ඔබගේ හදිසි වියෝව
අප කම්පා කරවීය.

අපි ඔබගේ පවුලේ සාමාජිකයන් සමඟ
සංවේගය බෙදා ගන්නෙමු.

**ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ**

**කටුනායක.**


## එන්නත්කරණ මධ්‍යස්ථාන ...

දිස්ත්‍රික්ක මට්ටමින් රසායනාගාර වැඩි කිරීම තුළින් පී.සී.ආර්. පරීක්ෂණ සංඛ්‍යාව තවදුරටත් වැඩි කිරීම සහ ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීම සිදු කරන අතර දැනට පරීක්ෂණ කටයුතු සඳහා එකතු වී ඇති සම්පලවල පරීක්ෂණ වාර්තා කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කරන බවත් පී.සී.ආර්. පරීක්ෂණවලට භාජනය වන පුද්ගලයන් නිවෙස්වලින් බැහැරට යාම වැළැක්වීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන බවත් ඇමැතිවරිය ප්‍රකාශ කළාය.

කොවිඩ් -19 ක්‍රියාකාරී කාර්යසාධන කමිටුවේ විශේෂ රැස්වීමට සහභාගී වෙමින් ඇමැතිවරිය මේ බව ඊයේ (10) පැවසුවාය. වෛද්‍ය පරිපාලකයෝ, පරිපාලන සේවයේ නිලධාරීන්, විශේෂඥ වෛද්‍යවරු, මහාචාර්යවරුන් මෙම කාර්ය සාධන කමිටුව නියෝජනය කරයි.

කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්කවලට ප්‍රමුඛතාවය ලබාදෙමින් අනෙකුත් දිස්ත්‍රික්කවල ද කොවිඩ් එන්නත්කරණ වැඩපිළිවෙල කඩිනමින් ශක්තිමත් කිරීම අරමුණ බව ඇමැතිවරිය පැවසුවාය.

ප්‍රතිකාර මධ්‍යස්ථානවලට අවශ්‍ය ඔක්සිජන් ඇතුළු අනෙකුත් පහසුකම් කඩිනමින් ලබාදීම සහ අනෙකුත් වෛද්‍ය උපකරණ ඉතාමත් කඩිනමින් මිල දී ගෙන මධ්‍යස්ථාන වෙත ලබාදීමට ද මෙම සාකච්ඡාවේදී තීරණය කර තිබේ.

තාක්ෂණ කමිටුව ගත් තීරණ පිළිබඳ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ලබාදීමට කටයුතු කරන බව ද සෞඛ්‍ය අමාත්‍යවරිය පැවසුවාය.

මෙම අවස්ථාවට රාජ්‍ය අමාත්‍යවරුන් වන විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, මහාචාර්ය චන්න ජයසුමන, සෞඛ්‍ය ලේකම් විශේෂඥ වෛද්‍ය මේජර් ජනරාල් සංජීව මුණසිංහ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

## ප්‍රදේශයක් ලොක්ඩවුන් ...

ඒ අනුව පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන අත්‍යවශ්‍ය සේවා හා පාරිභෝගික ද්‍රව්‍ය අඛණ්ඩව, කාර්යක්ෂමව ජනතාවට ප්‍රාදේශීය මට්ටමින් බෙදාහැරීමේ යන්ත්‍රණයන් සකස් කිරීමට පියවර ගෙන තිබෙන අතර කොවිඩ් - 19 වසංගතයේ මුල් අවස්ථාවල දී ක්‍රමවත් සැලැස්මක් ක්‍රියාත්මක කිරීමෙන් ලත් අත්දැකීම් මේ සඳහා ප්‍රයෝජනයට ගත හැකි බව ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය ප්‍රකාශ කරයි.

මේ සම්බන්ධයෙන් ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති, බැසිල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අදාළ ඇමැතිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පැවති සාකච්ඡාවේ දී මේ තීරණවලට එළඹ තිබේ.

ඒ අනුව සේවා සැපයීම යටතේ ජලය, විදුලිය, ගෑස්, ඉන්ධන, පෞද්ගලික සෞඛ්‍ය සේවා, සන්නිවේදන, අපද්‍රව්‍ය කළමනාකරණය සහ හදිසි ආපදා තත්ත්ව කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමුකර තිබෙන අතර භාණ්ඩ බෙදාහැරීමේ දී සහල්, එළවළු, පලතුරු, අර්තාපල්, පරිප්පු, ළූණු, මිරිස්, කරවල, පොල්, පොල්තෙල්, කුකුල් මස්, මාළු, බිත්තර, කිරිපිටි, ඖෂධ හා සනීපාරක්ෂක ද්‍රව්‍ය යනාදී අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය නිවෙස්වලටම සැපයීම සඳහා වූ සැලැස්ම අදාළ ආයතන, බෙදාහැරීම් ජාල සහ ග්‍රාමීයව බෙදාහරින්නන් සමඟ එක්ව සකස් කොට මූලික සාකච්ඡා කඩිනමින් නිමකිරීම ඉතා ප්‍රයෝජනවත් වන බව පෙන්වාදෙයි. සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව අවම ජංගම වෙළඳුන් ප්‍රමාණයක් සඳහා බලපත්‍ර ලබාදිය යුතු වන අතර එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජංගම වෙළඳාම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ජංගම වෙළඳ බලපත්‍ර ලබාදිය යුතු අතර දිස්ත්‍රික්කය තුළ හෝ දිස්ත්‍රික්කයෙන් පිටත ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම් සිදුකිරීමට අවශ්‍ය වූ විටක දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් එම බලපත්‍ර ලබා දියයුතු වේ. නිරෝධායන ඇඳිරි නීතිය පැනවීම හෝ හුදෙකලා කිරීම හෝ සිදුකළ හොත්, භාණ්ඩ හා සේවා බෙදාහැරීමේ නිරත වන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන, සැපයුම්කරුවන්, පළමු කාණ්ඩයේ බෙදාහරින්නන්, දෙවන කාණ්ඩයේ බෙදාහරින්නන් කල්තියා හඳුනා ගැනීමෙන් ජංගම වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු පුද්ගලයින් ඒකරාශී වීමෙන් වැළකී කඩිනමින් සිදුකළ යුතු බවද ජනාධිපති කාර්යසාධන බලකාය පෙන්වාදෙයි. රජයේ බැංකු, ස.තො.ස. අලෙවි සැල් ජාල, සමූපකාර තොග වෙළඳ සංස්ථාව, ආර්ථික මධ්‍යස්ථාන, නිෂ්පාදන කර්මාන්ත, බෙදාහැරීමේ ජාල හා සමූපකාර තොග ගබඩා සෑම විටකම සෞඛ්‍ය ආරක්ෂක නීති රීති අනුගමනය කරමින් විවෘතව තැබීමට කටයුතු කිරීම අවශ්‍ය වන අතර රාජ්‍ය ආයතනවල සේවයට වාර්තා කළයුතු අත්‍යවශ්‍ය සේවා සඳහා අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය පමණක් ගෙන්වීමට ආයතන ප්‍රධානියා විසින් තීන්දු කිරීමට අවසරය ලබාදෙමින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවශ්‍ය නිවේදන නිකුත් කිරීමට කටයුතු කරයි.

## එන්නත්කරණය කඩිනම් ...

චීනයේ නිෂ්පාදිත සයිනොෆොම් එන්නත් මාත්‍රා ලක්ෂ තුනක් දෙන ලෙසට තමා චීන රජයෙන් ඉල්ලීමක් කළ බවත්, එම එන්නත් මාත්‍රා ප්‍රමාණය ඉදිරි දිනවලදී මෙරටට ලැබෙනු ඇති බවත් ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලය හමුවේ පැවසූ බව රජයේ ආරංචි මාර්ගයක් 'දිනමිණ'ට හෙළි කළේය.

කොවිඩ් වසංගතය පාලනය කිරීම සඳහා රජයක් වශයෙන් ක්‍රියාමාර්ග ගනු ලබන්නේ සෞඛ්‍ය අංශයේ උපදෙස් මත පමණක් බව පවසා ඇති ජනාධිපතිවරයා සෞඛ්‍ය අංශයේ උපදෙස් නොතකා කටයුතු කිරීමට රජය සූදානම් නැති බවත් පවසා ඇත.

සියලු ක්ෂේත්‍ර නිලධාරීන්ට කොවිඩ් මර්දන එන්නත් දීමේ අවශ්‍යතාව සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී පෙන්වා දී ඇති අතර, ක්ෂේත්‍ර නිලධාරීන් හැකි ඉක්මනින් එන්නත්කරණය කිරීමට කටයුතු කරන බවත් ජනාධිපතිවරයා පැවසූ බව එම ආරංචි මාර්ගය පැවසීය.

කොවිඩ් මර්දනයට ඇති එකම විසඳුම එන්නත්කරණය පමණක් බවත්, හැකි ඉක්මනින් සියලු දෙනාට කොවිඩ් මර්දන එන්නත දීම රජයේ අරමුණ බවත් ජනාධිපතිවරයා වැඩිදුරටත් පවසා තිබේ.

## කෝටි 9,750ක ...

ඒ අනුව දෙරට අතර පවත්නා ආර්ථික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කර ගැනීමේ අරමුණින් කොරියානු රජය විසින් කොරියානු අපනයන - ආනයන (එක්සිම්) බැංකුවේ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල හරහා මෙම සහනදායි ණය ආධාරය ලබාදීමට එකඟ වී තිබෙන බව මුදල් අමාත්‍යාංශය පවසයි.

ඒ අනුව, අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක ණය මුදලක් ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල හරහා ලබා ගැනීම සඳහා 2020-2022 කාල සීමාව සඳහා නව කාර්යරාමු එකඟතාවයකට අත්සන් කිරීමට කොරියානු සහ ශ්‍රී ලංකා රජයන් එකඟ වී තිබේ. මෙම සහනදායී ණය ආධාරයෙහි ණය පොලී අනුපාතය සියයට 0.15 - 0.20 වැනි අවම අගයක් ගන්නා අතර ණය ආපසු ගෙවීම සඳහා, වසර 10 සහන කාලයක් සහිතව වසර 40ක පමණ දීර්ඝ කාලයක් හිමි වන බව ද මුදල් අමාත්‍යාංශය පෙන්වා දෙයි.

ඊට අමතරව, මනා සම්බන්ධීකරණයකින් යුතුව ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම උදෙසා, එහි සභාපතිවරයා විසින් 2016 ජනවාරි මස කොළඹ දි විවෘත කරන ලද කොරියානු එක්සිම් බැංකුවේ නියෝජිත කාර්යාලය ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මෙම කාර්යරාමුව තුළින් දෙපාර්ශ්වය එකඟ වී ඇත.

මෙම කාර්යරාමු එකඟතාවය සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල සහ ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති වුන්ජින් ජියොන් මහත්වරු විසින් ඊයේ (10) අත්සන් කළහ.

# කොස්තාපල්වරුන් - වරියන් බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය කල් යයි

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

මැයි මස 8 වැනි දිනට නියමිතව තිබූ පොලිස් කොස්තාපල්වරුන් සහ කාන්තා පොලිස් කොස්තාපල්වරියන් බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් දින නියමයක් නොමැතිව කල් දැමූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

කොළඹ, අනුරාධපුර, මහනුවර අම්පාර සහ ගාල්ල යන ප්‍රදේශවල මෙම ලිඛිත පරීක්ෂණය පැවැත්වීමට නියමිතව තිබූ අතර, රටේ පවතින කොරෝනා තත්ත්වය හේතුවෙන් එය කල් දමා තිබේ.

මේ සම්බන්ධයෙන් අදාළ අයදුම්කරුවන් වෙත දැනුම් දී තිබුණද ඔවුන්ට යම් තොරතුරක් දැනගත යුතුව ඇත්නම්, දුරකතන අංක 0115811921 සහ 0115811925 යන අංකවලට ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැක.

# අප භාවිත කරන සියලු කොරෝනා එන්නත් සුදුසුයි

## විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

කොරෝනා වයිරසය වෙනුවෙන් දැනට ශ්‍රී ලංකාවේ භාවිතා කරන සියලුම එන්නත් ඒ සඳහා යෝග්‍ය බවත් ලැබෙන අවස්ථාවේදී සියලුම දෙනා එම එන්නත් ලබාගැනීමට කටයුතු කරන්නැයි තමා ජනතාවගෙන් ඉල්ලා සිටින බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසීය. මෙරට කිසිදු එන්නතක් කල්ඉකුත් වී නොමැති බවත් තමන්ට ලැබෙන හොඳම එන්නත මෙය බවත් එම නිසා එන්නත ලබාගැනීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු බවත් ඔහු පෙන්වා දෙයි.

එන්නත් ලබාදීම ඉදිරි දින කිහිපය තුළදී වේගවත් කරන බවත් තවත් එන්නත් මාත්‍රා මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ඉදිරි දින කිහිපය තුළදී මෙරටට ගෙන එන බව සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහන් කරයි.

# අත්‍යවශ්‍ය ව්‍යාපාර හැර ගාල්ලේ අනෙකුත් සියල්ල දින 14ක් වැසෙයි

**දික්වැල්ලේ තිලකරත්න**
**ගාල්ල උතුර සමූහ**

ගාල්ල නගරයේ අත්‍යවශ්‍ය ව්‍යාපාර හැර අනෙකුත් සියලුම ව්‍යාපාරික ස්ථාන මැයි 11සිට ඉදිරියට දින 14ක වසා තබන බව ගාල්ල දිස්ත්‍රික් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ උප සභාපති හේමන්ත ගමගේ මහතා ඊයේ (10) පැවසීය

ගාල්ල දක්ෂිණ ලංකා මාධ්‍ය මධ්‍යස්ථානයේ පැවති මාධ්‍ය හමුවක් අමතමින් හේමන්ත මහතා මේ බව කීවේය.

හේමන්ත මහතා මෙසේ ද කීවේය රටේ ඇති වී තිබෙන කොවිඩ් වසංගත තත්වයට මැඩපැවැත්වීම සඳහා අප ව්‍යාපාරික ස්ථාන වැසීමට කටයුතු කළා. මේ සඳහා ව්‍යාපාරික ප්‍රජාව බලකිරීමකින් තොරව ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී සිටිනවා. මෙම වැඩ සටහනේ අරමුණ කොවිඩ් වැළක්වීම සඳහා ජනතාව නගරයට පැමිණීම සීමා කිරීමයි.

# ජිණපටිසතරිය යනු කුමක්ද? පුරා විද්‍යා දේශනය හෙට

**උපාලි කරුණාරත්න**

ජිණපටිසතරිය යනු කුමක්ද? යන්න පිළිබඳ පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග මහතා පවත්වන දේශනය හෙට (12) පස්වරු 1.30ට කොළඹ පුරා විද්‍යා දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ මුහුණු පොත හරහා මෙම දේශනයට සවන්දිය හැකි අතර මතබේදයට තුඩු දී ඇති අනුරාධපුර යුගයේ ශිලා ලේඛනවල තිබෙන ජිණපටිසතරිය වචනය සඳහන් ශිලා ලේඛනය පිළිබඳ නව අර්ථකතනයක් මෙහිදී පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපත් කිරීමට නියමිතය.

# නාට්‍ය හා රංගකලා ඩිප්ලෝමාවට අයදුම්පත් භාර ගැනීම 28දා තෙක්

**උපාලි කරුණාරත්න**

ටවර් හෝල් රඟහල පදනමේ ටවර් නාට්‍ය හා රංගකලා පාසල මෙහෙයවන නාට්‍ය හා රංග කලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණකාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන වර්ෂ 2021/22 සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය මෙම 28 වැනි දින දක්වා දීර්ඝකර තිබේ.

වැඩි විස්තර www.towerhall.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.

## අත්තිඩිය ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත මහතා අභාවප්‍රාප්ත විය



අත්තිඩිය ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත

**මීමනගේ ශලී රේක්සි ෆනැන්ඩෝ මහතා**

08/05/2021 වන දින අභාවප්‍රාප්ත විය.

ඒ පිළිබඳ අවසන් කටයුතු 11/03/2021 වන දින සවස ගල්කිස්ස - දෙහිවල ආදාහනාගාරයේදී සිදු කෙරේ.

**අලෙවි දෙපාර්තමේන්තුව - ලේක්හවුස්**


# INVITATION FOR BIDS (IFB)

## UNIVERSITY OF JAFFNA

**CONSTRUCTION OF PROPOSED BUILDING, SERVICES AND RELATED STRUCTURES FOR ENGINEERING TECHNOLOGY AND BIO SYSTEMS TECHNOLOGY, UNIVERSITY OF JAFFNA AT ARIVIYAL NAGAR, KILINOCHCHI- PHASE II (Stage I)**

**BID No. YA/CWP/TECH/2020-01**

1. The **Chairman, Standing Cabinet Appointed Procurement Committee (SCAPC) on behalf of the Vice Chancellor, University of Jaffna,** now invites sealed Bids from eligible and qualified bidders for **Construction of Proposed Building, Services and related structures for Engineering Technology and Bio Systems Technology, University of Jaffna at Ariviyal Nagar, Kilinochchi - Phase II (Stage 01),** as described below and estimated cost is approximately **Rs.470.0 million** excluding VAT.

   **The Work consists of:** Excavation & Earth filling, RCC Sub-structure & Super-structure work for the total building consisting of Three Stories with the Roof and Completion of Ground Floor, First Floor, water tank and staircase area with all Finishes inclusive of Water Supply & Drainage System, Air Conditioning to Computer lab, Fire Protection System, Electrical System and Lightening Protection System, ELV system & LPG. Gross floor area is 6339 $m^2$ (excluding External corridor and terrace areas). It is **expected to obtain Green Certificate** for this building.

   The **Site is situated at** Ariviyal Nagar, Kilinochchi.

   The Construction period is 540 Days from the date of commencement of work.

2. Procurement Method is **Competitive Bidding Procedure within Sri Lanka. Contract Type is Measure & Pay.**

3. To be eligible for Contract award, the successful bidders shall not have been blacklisted and shall meet the following requirements.

   Registered with the Construction Industry Development Authority **(CIDA) as Grade C2 and C1 in the field of Building Construction.**

4. Qualification requirements to qualify for Contract award include;

   a) Average annual volume of construction works performed in last Five (5) years shall be at least **Rs.470.0 million** excluding VAT.

   b) Experience in the construction contracts of at least one RCC building (1) of similar nature, value and complexity equivalent to the proposed building work and value at least **Rs.300.0 million** excluding VAT, within the approved contract period.

   c) The minimum amount of liquid assets and/or credit facilities net of the contractual commitment and exclusive of any advance payment under this Contract shall not be less than **Rs.78.0 million** excluding VAT.

5. Interested bidders may obtain further information from **Deputy Registrar, Capital Works and Planning, University of Jaffna, Tel: 021-2219201 Fax: 021-2219201, email: drcapitalworks@gmail.com)** and inspected the Bidding documents free of charge at the same address from 10th May 2021 until 28th May 2021, from 0900 hrs to 1430 hrs during working days.

6. A complete set of bidding documents in English language may be purchased by interested bidders on the submission of a written application to the **Deputy Registrar, Capital Works and Planning, University of Jaffna** From 10th May 2021 until 28th May 2021, from 0900 hrs to 1430 hrs upon payment of a non-refundable fee of **Rs. 55,000.00** to be deposited to the Peoples Bank, University of Jaffna with the Reference No "970000060000276" should be filled in the Account Number column in the Deposit Slip.

7. Sealed Bids shall be delivered to the **Office of Director/Procurement, Ministry of Education (Higher Education), No 18, Ward Place, Colombo 07** or sent by registered post addressed to the **Director/ Procurement, Ministry of Education (Higher Education)** of the above address to reach him on or before 1100 hrs on 08th June 2021. Late Bids will not be accepted. Bids will be opened soon after closing in the presence of the bidders' representatives who choose to attend.

8. Bids shall be valid up to 5th November 2021.

9. All Bids shall be accompanied by a "Bid Security" in the form of bank guarantee of **Rupees Four Million Seven Hundred Thousand (Rs. 4.7 million) only** valid up to 3rd December 2021 obtained from a licensed commercial bank registered with the Central Bank of Sri Lanka/or Construction Guarantee Fund (CGF), using the Form of Bid Security (irrevocable unconditional and on demand guarantee) included in section 11- Standard Forms (Bid) or cash deposit slip / Bank Draft for same amount.

10. The Pre-Bid meeting will be held at 1100 hrs on **18th May 2021 at Board Room, Faculty of Agriculture, University of Jaffna, Ariviyal Nagar, Killinochchi.**

**Vice Chancellor,**
**University of Jaffna.**

06.05.2021


## දිනය 2021.05.09 ඉරිදා නිල ප්‍රතිඵල

www.nlb.lk

### මහජන සම්පත

දිනුම් වාරය : 4476
දිනා ඇති මුළු මුදල රු. 23,820,936.60

ජයග්‍රාහී අක්ෂරය M | ජයග්‍රාහී අංක 1 9 2 9 1 7

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

### ගොවිසෙත

கொவிசெத Govisetha

දිනුම් වාරය : 2771
දිනා ඇති මුළු මුදල රු. 5,204,580.00

ඉංග්‍රීසි අක්ෂරය T | ජයග්‍රාහී අංක 05 15 21 38

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 71,447,134.00

### සෙවණ

ඔබට ගෙවල් - අතට මුදල්

දිනුම් වාරය : 336
දිනා ඇති මුළු මුදල රු. 1,670,830.00

ඉංග්‍රීසි අක්ෂරය N | ජයග්‍රාහී අංක 04 08 11 58

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,000,000.00

### ධන නිධානය

දිනුම් වාරය : 513
දිනා ඇති මුළු මුදල රු. 3,529,780.00

ඉංග්‍රීසි අක්ෂරය Z | ජයග්‍රාහී අංක 11 40 46 51

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 96,621,814.40

### දරු දිරි සම්පත

දිනුම් වාරය 37
දිනා ඇති මුළු මුදල රු. 1,992,480.00

ඉංග්‍රීසි අක්ෂරය T | ජයග්‍රාහී අංක 30 46 74 92

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 7,284,260.40

2021.05.09 ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකළ මුළු ත්‍යාගලාභීන් සංඛ්‍යාව 460,863
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල රු. 36,218,606.60
මහජන සම්පත සුපිරි ත්‍යාගය රු. 17,739,636.60 සුපිරි ත්‍යාග 01
රු. 1,000,000.00 ත්‍යාග: 02 රු. 100,000.00 ත්‍යාග: 22

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දු.ක.: 011 - 4607000, 011 - 4607001 - 2
ෆැක්ස් : 011-4669475


# මහජන බැංකුව

## කොළඹ පිටත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

## බේරා නොගත් උකස් රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත දැක්වෙන ශාඛාවන්/ සේවා මධ්‍යස්ථානයන් හි 2019-12-31 දින දක්වා උකස් කරන ලදුව ඒ ඒ ශාඛාවන් ඉදිරියෙන් දැක්වෙන දිනයන්ට බේරා නොගත් රන් භාණ්ඩ / මෙම නිවේදනයේ දක්වා ඇති ස්ථානයන්හිදී පහත සඳහන් දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | ශාඛාව සහ සේවා මධ්‍යස්ථානය | පහත දැක්වෙන දිනයට බේරා නොගත් | වෙන්දේසිය පැවැත්වෙන දිනයන් | වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|---|
| 1 | **හෝමාගම** හෝමාගම නගර සේ. ම. පාදුක්ක සේ.ම. / මීගොඩ සේ.ම. ගොඩගම සේ. ම. යුධ හමුදා රෙ. මූ. - පනාගොඩ සේ.ම. | 2021-05-28 | 2021-05-29 2021-05-30 | හෝමාගම ශාඛා පරිශ්‍රයේදී |
| 2 | **බත්තරමුල්ල** තලවතුගොඩ සේ. ම. මාලබේ සේ.ම., හෝකන්දර සේ.ම. විදේශ සේවා කාර්යාංශය සේ.ම. | 2021-05-28 | 2021-05-29 2021-05-30 | බත්තරමුල්ල ශාඛා පරිශ්‍රයේදී |
| 3 | **දෙහිවල** අත්තිඩිය සේ. ම. නැදිමාල සේ. ම. | 2021-05-28 | 2021-05-29 2021-05-30 | දෙහිවල ශාඛා පරිශ්‍රයේදී |
| 4 | **ගල්කිස්ස** | | | |
| 5 | **රත්මලාන** රත්මලාන ආර්ථික සේ.ම. | | | |
| 6 | **කොලොන්නාව** වැල්ලම්පිටිය සේ.ම. | 2021-06-04 | 2021-06-05 2021-06-06 | කොටිකාවත්ත ශාඛා පරිශ්‍රයේදී |
| 7 | **කොටිකාවත්ත** ගොතටුව සේ.ම. මුල්ලේරියාව නව නගර සේ.ම. | | | |
| 8 | **මොරටුව** රාවතාවත්ත සේ. ම. කටුකුරුන්ද සේ.ම. | 2021-06-04 | 2021-06-05 2021-06-06 | මොරටුව ශාඛා පරිශ්‍රයේදී |
| 9 | **මොරටුමුල්ල** පුවක්අරඹ සේ.ම. | | | |
| 10 | **කටුබැද්ද** සොයිසාපුර සේ.ම. | | | |
| 11 | **නුගේගොඩ නගර** කොහුවල සේ.ම. | 2021-06-04 | 2021-06-05 2021-06-06 | ගංගොඩවිල ශාඛා පරිශ්‍රයේදී |
| 12 | **ගංගොඩවිල** දෙල්කඳ සේ.ම/ ජයවර්ධනපුර සේ.ම. | | | |
| 13 | **මහරගම** පන්නිපිටිය සේ. ම. පමුණුව සේ.ම. | | | |
| 14 | **අවිස්සාවේල්ල** කොස්ගම සේ. ම. තල්දූව සේ.ම. | 2021-06-11 | 2021-06-12 2021-06-13 | අවිස්සාවේල්ල ශාඛා පරිශ්‍රයේදී |
| 15 | **කැස්බෑව** කහතුඩුව සේ.ම. | 2021-06-11 | 2021-06-12 2021-06-13 | කැස්බෑව ශාඛා පරිශ්‍රයේදී |
| 16 | **පිළියන්දල** පිළියන්දල නගර සේ.ම. | | | |
| 17 | **නුගේගොඩ** ඇඹුල්දෙණිය සේ.ම/ නාවල සේ.ම. චැපල් පාර සේ.ම/ වැලිකඩ සේ.ම. | 2021-06-11 | 2021-06-12 2021-06-13 | නුගේගොඩ ශාඛා පරිශ්‍රයේදී |
| 18 | **පිටකෝට්ටේ** ඇතුල්කෝට්ටේ සේ. ම. තලපත්පිටිය සේ.ම. | | | |
| 19 | **හංවැල්ල** හංවැල්ල නගර සේ.ම. කහහේන සේ.ම. | 2021-06-18 | 2021-06-19 2021-06-20 | හංවැල්ල ශාඛා පරිශ්‍රයේදී |
| 20 | **කඩුවෙල** නවගමුව සේ. ම. බණ්ඩාරවත්ත සේ.ම. | | | |
| 21 | **දෙහිවල ගාලු පාර** කළුබෝවිල සේ.ම. | 2021-06-18 | 2021-06-19 2021-06-20 | දෙහිවල ගාලුපාර ශාඛා පරිශ්‍රයේදී |
| 22 | **බොරලැස්ගමුව** | | | |
| 23 | **කොට්ටාව** අතුරුගිරිය සේ.ම. මත්තේගොඩ සේ.ම. | 2021-06-18 | 2021-06-19 2021-06-20 | කොට්ටාව ශාඛා පරිශ්‍රයේදී |

උක්ත උකස් වෙන්දේසි දැන්වීමකින් තොරව, අවලංගු කිරීම, කල්දැමීම, ස්ථානය වෙනස් කිරීම හෝ ඒකාබද්ධ කිරීමේ අයිතිය මහජන බැංකුව සතුය.

**ප්‍රාදේශීය කළමනාකාර,**
**(කොළඹ පිටත) මහජන බැංකුව,**
**අංක 177A, හයිලෙවල් පාර, නුගේගොඩ.**
**දුරකථන අංක : 2812260/ 2854189**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk

(වැවිලි අමාත්‍යාංශය / පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

## හලාවත වැවිලි සමාගම

### පොල් ගස් සහ පොල්ලෙලි අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

| වත්ත | අලෙවිකරණ | | ප්‍රසම්පාදනය විවෘත කරන | | |
|---|---|---|---|---|---|
| | ද්‍රව්‍ය | ප්‍රමාණය | දිනය | වේලාව | ස්ථානය |
| මංගලඑළිය | පොල් ගස් (කණාටු) | 250 | 2021.05.13 | පෙ.ව. 10.30 | මංගලඑළිය වතු කොට්ඨාසය, ඩේසීලන්ඩ් වත්ත, මංගලඑළිය |
| තිකවැරටිය | පොල්ලෙලි | 37,742 | 2021.05.13 | පෙ.ව. 10.30 | තිකවැරටිය වතු කොට්ඨාසය, තුත්තිරිවැව වත්ත, කොබෙයිගනේ. |

01. අදාළ ප්‍රසම්පාදනපත් රුපියල් 500/- ක ගාස්තුවක් ගෙවා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සහ ප්‍රසම්පාදනපත් විවෘත කරන දිනයේ පෙ.ව. 10.15 දක්වා ඉහත සඳහන් ස්ථානවලින් ලබාගත හැක.
02. වැඩි විස්තර සඳහා දුරකථන අංක 032-5678398 මංගලඑළිය සහ 032-5741267 තිකවැරටිය යන වතු අධිකාරිවරුන් අමතන්න.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**හලාවත වැවිලි සමාගම,**
**165, පුත්තලම පාර, හලාවත.**

කළුතර දිස්ත්‍රික්කයේ දෙඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝම්බුවලදකුණ බටහිර 728D ග්‍රාම සේවා වසමේ පදිංචි **පොල්කිරි මුල්ලගේ සඳලාල් උදයශාන්ත** වන මම මෙතැන් පටන් **පල්ලේගොඩ මුණසිංහලාගේ සඳලාල් උදයශාන්ත අභයවර්ධන** ලෙස මින් ඉදිරියට භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයට හා මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.




# ප්‍රාදේශීය සභාව - වැලිමඩ
# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ස්කිඩ් ස්ටියර් ලෝඩරයක් (SKID STEER LOADER) සැපයීම හා ගෙනැවිත් භාරදීම

### (BD/WPS/GOODS/2021/1)

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාවේ වැලිමඩ ප්‍රාදේශීය සභාව සඳහා ස්කිඩ් ස්ටියර් ලෝඩරයක් මිලදී ගැනීමට තීරණය කොට ඇත.
2. එබැවින් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙනුවෙන් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කොට ඇති පරිදි ස්කිඩ් ස්ටියර් ලෝඩරයක් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | අවශ්‍ය ලංසු ඇපකරය (ලංකා රු.) | ලංසු ඇපකරයේ වලංගු කාලය |
|---|---|---|---|---|
| A-1 | ස්කිඩ් ස්ටියර් ලෝඩර් | 01 | 55,000.00 | 2021.09.02 |

- **ගෙනැවිත් භාරදිය යුතු ස්ථානය** : වැලිමඩ ප්‍රාදේශීය සභාව
- **ගෙනැවිත් භාරදිය යුතු දිනය** : **ලංසුව පිළිගැනීමේ ලිපිය නිකුත් කළ දිනයේ සිට දින 60 ක් ඇතුළත.**

3. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙතින් (057-2245973) ලබාගත හැකි අතර, **2021 ජුනි 02 වෙනි දින** දක්වා කාර්යාල වේලාව තුළදී (09.00 පැය හා 15.00 පැය අතර) ඉහත කී ස්ථානයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
5. ලංසුකරු රු. මිලියන 5 ට වැඩි ලංසු සඳහා අදාළ වන 1987 අංක 03 දරන රජයේ පොදු කොන්ත්‍රාත් පනත අනුව ලියාපදිංචි වී සිටිය යුතුය.
6. ආපසු ගෙවනු නොලබන රුපියල් දෙදහසක (ලංකා රු. 2000.00) ගාස්තුව ගෙවීමෙන් අනතුරුව **2021 ජුනි 2 වෙනි දින** දක්වා රාජකාරී දිනයන් හි **09.00 පැය හා 15.00 පැය අතර,** වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.
7. ලංසු, පිටපත් දෙකකින් යුතුව, **2021 ජුනි 03 වෙනි දින 14.00 පැයට** හෝ ඊට පෙර ලැබෙන පරිදි ඉහත (4 වන ඡේදයේ) සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ ඉහත (4 වන ඡේදයේ) සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ලංසුකරු වෙනුවෙන් ලිඛිතව බලය පවරන ලද ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
8. ලංසු, **2021 අගෝස්තු 05 වෙනි දින** දක්වා වලංගු විය යුතුය.
9. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවක් වෙතින් බැංකු සුරක්ෂණයක ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය 2021 **සැප්තැම්බර් 02** වෙනි දින දක්වා වලංගු විය යුතුය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**වැලිමඩ ප්‍රාදේශීය සභාව.**
057-2245973
2021.05.10

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

### පාසල් 02 ක් හා ක්‍රීඩා සංකීර්ණ 03 ක් සඳහා මී. 130 ක මංතීරු 04 ක සම්පූර්ණ PUR Synthetic පුහුණු ධාවන පථයක් සැලසුම් නිර්මාණය කොට ඉදිකිරීම සහ ඇතිරීම

**කොන්ත්‍රාත් අංකය : MOYS/PCM/PRO/10-2021**

01. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පාසල් 02 ක් සහ ක්‍රීඩා සංකීර්ණ තුනක් සඳහා මී. 130 ක මංතීරු 04 ක සම්පූර්ණ PUR Synthetic පුහුණු ධාවන පථයක් සැලසුම් නිර්මාණය කිරීම, ඉදිකිරීම සහ ඇතිරීම සඳහා දේශීය කොන්ත්‍රාත්කරුවෙකු සමග යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් සින්තටික් ධාවන පථ නිෂ්පාදකයෙකු සම්බන්ධවූ බද්ධ ව්‍යාපාරයක් වෙතින් (සැලසුම් නිර්මාණය කොට ගොඩනැගීම) මුද්‍රා තබන ලද තාක්ෂණි හා මිල ගණන් යෝජනාවන් කැඳවනු ලැබේ.

**පාසල් දෙක හා ක්‍රීඩා සංකීර්ණ තුන වනුයේ;**

- **අ. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය, අනුරාධපුරය**
- **ආ. ඩී.එස්. සේනානායක විදුහල, අම්පාර**
- **ඇ. දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය, කොටවිල, කඹුරුගමුව, මාතර.**
- **ඈ. සබරගමුව පළාත් මට්ටමේ ක්‍රීඩා සංකීර්ණය, රත්නපුර.**
- **ඉ. සිරිමාවෝ බණ්ඩාරනායක ක්‍රීඩා සංකීර්ණය, ගම්පහ.**

The Project scope includes design and laying of 4 lane, 130m Full PUR (Polyurethane) Cast Elastomers Synthetic training track and Long and Triple Jump facility with a Full PUR synthetic runaway. The major items of Work consists of design and installation of foundation base including sub base and sub grade; design and installation of new drainage system, installation of full PUR 4 lane synthetic 130m track, class I tests for synthetic track, construction of Long and Triple Jump facility with a Full PUR synthetic runaway and maintain until the completion of Defects Notification Period, Installation of general purpose lighting, Chain-link fence and Landscaping work

**මෙම කර්මාන්තය සම්පූර්ණයෙන් නිමා කිරීම සඳහා වන කාල සීමාව ලිත් දින 150 කි.**

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
03. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.
    - අ. සින්තටික් ධාවන පථ නිෂ්පාදක සතුව අවම වශයෙන් ධාවන පථ දහයක් (10) IAAF Class II හෝ IAAF Class I හෝ දෙකම. In Situ (Full PUR) ස්ථාපනය (ඇතිරීමේ) පළපුරුද්දක් තිබිය යුතුය.
    - ආ. සින්තටික් ධාවන පථ නිෂ්පාදක සතුව අවම වශයෙන් මි.මී. 13 ක් හෝ ඉහළ ඝනත්වයක් ඇති Full PUR ධාවන පථ සඳහා IAAF සහතිකය තිබිය යුතුය.
    - ඇ. සින්තටික් ධාවන පථ නිෂ්පාදක සතුව Full PUR System සින්තටික් ධාවන පථ නිෂ්පාදනය කිරීමේ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) ක පළපුරුද්දක් තිබිය යුතුය.
    - ඈ. දේශීය කොන්ත්‍රාත්කරු (බද්ධ ව්‍යාපාරය භාර හවුල්කරු) සතුව මාර්ග ඉදිකිරීම් පිළිබඳ වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.
    - ඉ. බද්ධ ව්‍යාපාරය භාර හවුල්කරු දේශීය හවුල්කරු විය යුතුය.
    - උ. දේශීය හවුල්කරු සතුව, මහා මාර්ග ඉදිකිරීම් සඳහා සී2 හෝ ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචියක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) (කලින් ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) තිබිය යුතුය. දේශීය හවුල්කරු, සින්තටික් ධාවන පථ නිෂ්පාදක සමග බද්ධ ව්‍යාපාරයක් ලෙස ලංසුව සඳහා සහභාගි විය යුතුය.
    - ඌ. බද්ධ ව්‍යාපාර ගිවිසුම බලයලත් පුද්ගලයෙකු (නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු) විසින් ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී සහතික කර තිබිය යුතු අතර, කොන්ත්‍රාත් ප්‍රදානයෙන් පසුව හා කර්මාන්තය ආරම්භ කිරීමට පෙර බද්ධ ව්‍යාපාරය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.
    - එ. සින්තටික් ධාවන පථ නිෂ්පාදක (Full PUR) සහ දේශීය හවුල්කරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු වලංගු කාලය තුළදී දේශීය හවුල්කරු සතුව CIDA යටතේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.
    - ඒ. පසුගිය වසර හත තුළදී ඉටු කරන ලද ඉදිකිරීම් කර්මාන්ත සඳහා වන වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 368 ක් විය යුතුය.
    - ඔ. අනෙකුත් කොන්ත්‍රාත්මය වගකීම් හැර සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදුකරන ලද අත්තිකාරම් ගෙවීම්ද හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් හා / හෝ ණය පහසුකම් ශ්‍රී ලංකා රුපියල් මිලියන 147 ට අඩු නොවිය යුතුය.
    - ඕ. අභිමතය ප්‍රකාශ කිරීමේ ලිපිය ලැබීමෙන් අනතුරුව ලංසු ලිපිලේඛන සමග ඉදිරිපත් කිරීම සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුව තිබිය යුතුය.
    - ඖ. බද්ධ ව්‍යාපාරයේ විදේශීය හවුල්කරු, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 39(1) උප වගන්තිය පරිදි **"විදේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා වන තාවකාලික ලියාපදිංචියක්"** ලබා තිබිය යුතුය; CIDA විසින් ලබාදී ඇති උපදෙස් යටතේ, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකමින් 0.01% තාවකාලික ලියාපදිංචිය සඳහා වන ගාස්තුව ලෙස සලකනු ලැබේ.
04. 2021.05.11 වෙනි දින සිට 2021.06.07 වෙනි දින දක්වා සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී කොළඹ 07, පිලිපි ගුණවර්ධන මාවතේ අංක 09 පිහිටි තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ 3 වන මහලේ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) වෙතින් ඔබට වැඩිදුර තොරතුරු ලබා ගැනීමට හැකි අතර, එම කාර්යාලයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. (**දුරකථන අංක 011-2680172 / 011-2670028, ෆැක්ස් : 011-2678926, ඊමේල් , procurement02@gmail.com**) සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී ඉහත ලිපිනයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.
05. ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් තිස් පත් දහසක (රු. 35,000.00) ගාස්තුවක් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2 වන මහලේ සරප් වෙත ගෙවීමෙන් අනතුරුව 2021.05.11 වෙනි දින සිට 2021.06.07 වෙනි දින දක්වා කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවතේ, අංක 09 පිහිටි තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන හා ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.
06. ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 119 ක් (2021.10.05 දක්වා) ලංසු වලංගු විය යුතුය.
07. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රුපියල් තිත් හයලක්ෂ පනස් දහසක (රු. 3,650,000.00) වටිනාකමින් යුත් කොන්දේසි රහිත සහ ඉල්ලූ විට ගෙවිය හැකි ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 147 ක් (2021.11.02 වෙනි දින දක්වා) ලංසු ඇපකරය වලංගු විය යුතුය.
08. මුද්‍රා තබන ලද ලංසු, කවර 1 (සාමාන්‍ය තොරතුරු), කවර 2 (සැලසුම් නිර්මාණය / තාක්ෂණික යෝජනා සහ කවරය 3 (මිලගණන් යෝජනාව) පිටපත් දෙකකින් යුතුව, 2021.06.08 වෙනි දින 12.30 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි, කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවත. අංක 09 පිහිටි තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ 3 වන මහලේ අතිරේක ලේකම් (පරිපාලන හා ප්‍රසම්පාදන) කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමට හෝ ඉහත ලිපිනයේ "සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව" වෙත ලියාපදිංචි තැපැල මගින් එවීමට හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
09. පූර්ව ලංසු රැස්වීම 2021.05.21 වෙනි දින පෙ.ව. 10.00 ට කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවත, අංක 09 පිහිටි තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 4 වන මහලේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. එක් ලංසුකරුවෙකු වෙනුවෙන් උපරිමයෙන් නියෝජිතයන් 05 දෙනෙකු සඳහා එම රැස්වීමට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.
10. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එක් ලංසුකරුවෙකු වෙනුවෙන් උපරිමයෙන් නියෝජිතයන් 05 දෙනෙක් එම අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය,**
**අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,**
**කොළඹ 07.**

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### උතුරු මැද පළාත

01. උතුරු මැද පළාත, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කොට ඇති ප්‍රසම්පාදන අස්තිත්වය වෙනුවෙන් එම වගුවේ සඳහන් ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකළ යුතු කාර්යයන්හි ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා වෙනත් බදු හැර) රු. මිලියන 50 ට වඩා අඩු හෙයින් ප්‍රාදේශීය ප්‍රමුඛතාව හා සීඩා (CIDA) ශ්‍රේණි ප්‍රමුඛතාවය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016(iii) හි නියම කර ඇති පරිදි අදාළ වනු ඇත.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත වගුවේ සඳහන් ක්ෂේත්‍ර සහ ශ්‍රේණිය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී සිටිය යුතුය.
04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා 'සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම්වලට පසුගිය අඛණ්ඩ වසර 5 තුළ රු. මිලියන 3.5 ක වටිනාකමට වඩා වැඩි අගයකින් යුත් NCT සිවිල් / NVQ5 තාක්ෂණික නිලධාරියකු සේවා නියුක්තියෙහි යෙදූ සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තුවක් සාර්ථකව නිම කර තිබිය යුතුය' යන්නද ඇතුළත් වේ.
05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු අනුරාධපුර, හරිස්චන්ද්‍ර මාවත, පළාත් සභා කාර්යාල සංකීර්ණයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙතින් (දුරකථන අංකය : 025-2234728 ෆැක්ස් : 025-2234728, ඊමේල් : ncplg2020@gmail.com ලබාගත හැකි අතර, පහත ලිපිනයේදී රාජකාරී දිනයන්හි 9.00 පැය සහ 15.00 පැය අතර ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
06. පහත වගුවේ සඳහන් කර ඇති ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2021 මැයි 11 දින සිට 2021 මැයි 30 දින දක්වා 09.00 පැය දක්වා 09.00 පැය හා 15.00 පැය අතර, අනුරාධපුර, හරිස්චන්ද්‍ර මාවතේ, පළාත් සභා කාර්යාල සංකීර්ණයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.
07. ලංසු අනු පිටපතකින් යුතුව 2021 ජුනි 01 දින 13.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි "කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, ධර්මපාල මාවත. අනුරාධපුර" යන ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
08. ලංසු දින 77 ක් (2021.08.17 දක්වා) වලංගු විය යුතුය.

| අංකය | ප්‍රසම්පාදන අස්තිත්වය | වැඩ විස්තරය | සම්පූර්ණ ඇස්තමේන්තු-ගත පිරිවැය (රු.) | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | අවශ්‍ය ලංසු සුරක්ෂණය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | සුරක්ෂණය වටිනාකම (රු.) | වලංගු කාලය |
| 01. | මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව | මැදිරිගිරිය සතිපතා පොළ ගොඩනැගිල්ලේ ඉහළ මහල ඉදිකිරීම | මිලියන 4.2 | දින 120 | C7-C8 ගොඩනැගිලි ඉදිකිරීම | 2,500.00 | 42,000.00 | 2021.09.14 |
| 02. | මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව | මැදිරිගිරිය සතිපතා පොළ මාළු වෙළඳපල ගොඩනැගිල්ල ඉදිකිරීම | මිලියන 5.8 | දින 120 | C6-C7 ගොඩනැගිලි ඉදිකිරීම | 2,500.00 | 58,000.00 | 2021.09.14 |
| 03. | ලංකාපුර ප්‍රාදේශීය සභාව | සුංගාවිල සතිපතා පොළ ඉදිකිරීම | මිලියන 9.8 | දින 120 | C6-C7 ගොඩනැගිලි ඉදිකිරීම | 3,500.00 | 100,000.00 | 2021.09.14 |

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් පාලන දෙපාර්තමේන්තුව (බිම් මහල)**
**පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,**
**හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුර.**

2021.05.06






# රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වා ගෙන යෑමට නව චක්‍රලේඛයක්

**මහින්ද අලුත්ගෙදර**

පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ඒ අනුව පසුගිය මාර්තු මස 05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 තාවකාලිකව අත්හිටුවමින් නිකුත් කළ 2021.04.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02.202(1) හි විධිවිධාන වෙනුවට 2021.05.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ආයතන වෙත නිලධරයන් කැඳවීමේ දී පහත විධිවිධාන පරිදි කටයුතු කළ යුතු බවද එම අමාත්‍යාංශය පවසයි.

ඒ අනුව රජයේ කාර්යයන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යෑමට අත්‍යවශ්‍ය අවම කාර්යය මණ්ඩලය සේවයට කැඳවා ගැනීමට තීරණය කිරීමේ බලය අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් /දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් වෙත පවරා තිබෙන අතර එසේ අවම සේවක සංඛ්‍යාවක් සේවයට කැඳවන අවස්ථාවේ දී වුවද සේවා මුර ක්‍රමයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම, එලෙස සේවා මුරයක් හෝ විධිමත් ක්‍රමවේදයක් සැකසීමෙන් පසු යම් නිලධරයකු ඒ අනුව සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය නිලධරයාගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතු වීම, ඉහත උපදෙස් පරිදි රජයේ ආයතන වෙත නිලධරයන් කැඳවීමේ දී ගර්භිණී නිලධාරිනියන් සේවයට නොකැඳවීමට පියවර ගතයුතු වීම හා සේවා මුර ක්‍රමයට හෝ සේවයට කැඳවීමට අනුගමනය කරන විධිමත් ක්‍රමවේදයට අනුව සේවයට නොකැඳවූ දිනයක දී වුව ද සෑම රජයේ නිලධරයකුම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරිය අදාළ කාර්යයන්හී යෙදීමට සූදානම්ව සිටිය යුතු වීම ඒ අතර වෙයි.

ඊට අමතරව කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අංශ මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ හා සමගාමීව සේවා ස්ථානවලට නිලධරයන් සහ මහජනතාව කැඳවීමේ දී පහත මාර්ගෝපදේශ ද අනුගමනය කළ යුතු බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සඳහන් කරයි.

හැකි සෑම අවස්ථාවකදීම පොදු ප්‍රවාහන සේවාවන් වෙනුවට සංචිත වාහන, වෙන් කරන ලද වාහන සහ නිලධරයන්ගේ පෞද්ගලික වාහන යොදවා ගැනීම දිරිමත් කිරීම, අත්‍යවශ්‍ය කරුණුවලට හැර මහජනතාව සේවා ස්ථාන වෙත පැමිණීම සීමා කිරීම, හැකි සෑම අවස්ථාවකදීම මාර්ගගත (Online) ක්‍රමවේදයට අනුව සේවාලාභීන්ගේ අවශ්‍යතා සපුරාදීමට ක්‍රියාකිරීම, යම් රජයේ නිලධරයකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමු කර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමු කර ඇත්තේ රජයේ නිරෝධායන නීතිරීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම නිරෝධායන කාලසීමාව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12:9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාලසීමාවක් ලෙස සැලකිය යුතු වේ.

මේ අතර කොවිඩ් 19 වයිරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය විසින් දැනටමත් නිකුත්කර ඇති සෞඛ්‍ය උපදෙස් සහ ඉදිරියේ දී නිකුත් කරනු ලබන සෞඛ්‍ය උපදෙස් අනුව තම ආයතනයන්හි නිලධරයන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කළයුතු අතර මෙමඟින් අත්‍යවශ්‍ය රජයේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යෑම, රාජ්‍ය ආයතන කොවිඩ් 19 නිදහස් කලාප වශයෙන් පවත්වාගෙන යෑම, රාජ්‍ය නිලධරයන් කොවිඩ් 19 අවදානමට ගොදුරුවීම වළක්වා ගැනීම, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආසාදිතයන් වීම වළක්වා ගැනීම සඳහා කොවිඩ් 19 වයිරස් ව්‍යාප්තිය අවම කරගැනීම යන කරුණු විශේෂිතව අපේක්ෂා කරන බවද එම අමාත්‍යාංශය කියයි.

# කොවිඩ් ව්‍යාප්තිය පාලනයට අවශ්‍ය වුව හොත් සංචරණ සීමා පැනවීමට පියවර

කොවිඩ් ව්‍යාප්තිය පාලනය සඳහා අවශ්‍ය වුවහොත් දිස්ත්‍රික්ක අතරේ හෝ පළාත් අතරේ සංචරණ සීමා යෙදීමට පියවර ගන්නා බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස් මහතා ඊයේ (10) මාධ්‍ය හමුවකට එක් වෙමින් පැවසීය.

සංචරණ සීමා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට, පළාතෙන් පළාතට අවශ්‍ය පරිදි පනවා ක්‍රියාත්මක කිරීමට රජය සූදානම්. කිසිම ක්‍රියාමාර්ගයක් සහමුලින්ම අපි ප්‍රතික්ෂේප කරලා නෑ. කොවිඩ් -19 තත්ත්වය දිනෙන් දින වෙනස් වන තත්ත්වයක්. එම නිසා ඒ වසංගතය පාලනය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැන සිතා බලා ඒ ක්‍රියාමාර්ගවලට එළඹීමට රජය සූදානම්. අවස්ථාපිත සාධක අනුව මේ තත්ත්වය දිනෙන් දින වර්ධනය වන ආකාරය ඒ ගැන සිතා බලා අවශ්‍ය තීරණය ගැනීමට රජය නිරන්තරයෙන් සූදානම් බව හෙතෙම කීවේය.

# නැඟෙනහිර දිස්ත්‍රික් අතර සංචරණ සීමා පනවන්න ආණ්ඩුකාරවරියගෙන් උපදෙස්

**මහින්ද අලුත්ගෙදර**

කොරෝනා රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීමේ අරමුණින් නැඟෙනහිර පළාතේ දිස්ත්‍රික් අතර සංචරණ සීමා පැනවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නැයි පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය ආරක්ෂක අංශ වෙත නියෝග කර තිබේ.

ඊට අමතරව පළාතේ සියලු නගරවල වෙළෙඳසල් පස්වරු හයෙන් පසුව වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද ආණ්ඩුකාරවරිය ඉල්ලීම් කරයි.

මේ අතර සවස හයෙන් පසු අත්‍යවශ්‍ය කරුණකට හැරෙන්නට ජනතාව නගරවලට ඇතුළු වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ලෙස ද ආණ්ඩුකාරවරිය ආරක්ෂක අංශ වෙත උපදෙස් ලබා දී තිබේ.

දිස්ත්‍රික් මායිම් අතර මාර්ග බාධක යොදා ගනිමින් ජනතාවගේ අනවශ්‍ය ගමන් බිමන් වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද ආණ්ඩුකාරවරිය ආරක්ෂක අංශ වෙත නියෝග කර ඇත.

# PCR වාර්තා ප්‍රමාදය කොවිඩ් පැතිරීමට හේතුවක්

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය හඳුනා ගැනීම සඳහා සිදු කරන පී.සී.ආර්. පරීක්ෂණයන්හි වාර්තා ලැබීම දින 10ක් පමණ ප්‍රමාද වීම නිසා ආසාදිතයන් නිදැල්ලේ හැසිරීමෙන් වයිරසය ව්‍යාප්ත වීම ඉහළ ගොස් ඇති බව ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා පැවසුවේය.

ආසාදිතයන් නිදැල්ලේ හැසිරීම නිසා දිනකට 8000 කට පමණ වයිරසය ව්‍යාප්ත කිරීමක් සිදු කරන බව දක්නට ලැබෙන්නේ යැයි ද ඔහු පැවසුවේය.

පී.සී.ආර්. 25,000 ක් 27,000 ක් පමණ තොගයක් පරීක්ෂණ සඳහා ගොඩගැසී ඇතැයි ද, මේ තොගයෙන් දෛනිකව පරීක්ෂා කළ හැකි සංඛ්‍යාවෙන් වාර්තා වන ආසාදිතයන් දිනකට මේ වන විට වාර්තා වීම සිදු වන්නේ යැයි ද ඒ මහතා කීය.

මේ දත්ත විශ්ලේෂණය කර තීරණය ගැනීම යන්නෙන් අදහස් කරනුයේ මීට දින නවයකට පමණ පෙර ගත යුතු තීරණ දින නවයක් ගතවීමෙන් පසුව ගන්නා බව ද ඔහු පැවසුවේය.

මීට දවස් 10 කට පෙර පී.සී.ආර්. පරීක්ෂණ සඳහා යොමු කළ සාම්පලවල වාර්තා මෙතෙක් ලැබී නොමැති බවත් පී.සී.ආර්. පරීක්ෂණ වාර්තා ප්‍රමාද වීම නිසාම කොවිඩ් වයිරසය වැඩිපුර ව්‍යාප්ත වීමක් මේ වන විට සිදු වන බවත් හෙතෙම පැවසීය.

කොවිඩ් ව්‍යාප්තියේ ඉහළ යාමක් සිදු විය හැකි බවට අලුත් අවුරුදුවලට කලින් අනතුරු ඇඟවීම සිදු කළත් බලධාරීන් එය නොතකා හැරීම නිසා අද රටට මෙවැනි තත්ත්වයක් උදා වී තිබෙන්නේ යැයි ද ඔහු කීය.

# රන්ජන් රාමනායකට වෙනම රූපවාහිනියක්

තංගල්ල අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා සිටින රන්ජන් රාමනායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වරයාගේ පාවිච්චිය සඳහා වෙනම රූපවාහිනී යන්ත්‍රයක් ලබා දීමට පියවර ගෙන තිබේ. ඔහු විසින් කරන ලද ඉල්ලීමක් සලකා බැලීමෙන් පසුව රාමනායක මහතාට රූපවාහිනී යන්ත්‍රයක් මෙසේ ලබා දුන් බව බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ රාජ්‍ය ඇමැති ලොහාන් රත්වත්තේ මහතා පැවසීය. රන්ජන් රාමනායක මහතාගේ පාවිච්චිය සඳහා වෙනම විදුලි පංකාවක්, මෙට්ටයක් හා වැසිකිළි කැසිකිළි පහසුකම්ද සලසා දී ඇති බවත් ඔහු මන්ත්‍රී ධුරය දැරූ කාලයේදී පාවිච්චි කළ මාදිවෙල මන්ත්‍රී නිල නිවාසය තවත් මාස හයක කාලයකට පාවිච්චිය සඳහා දුන් බවත් හෙතෙම සඳහන් කළේය.

# දිස්ත්‍රික් 5ක තවත් ග්‍රාම නිලධාරි වසම් 16ක් හුදෙකලා කෙරේ

**නුවන් කොඩිකාර සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය හේතුවෙන් දිස්ත්‍රික් 05ක තවත් ග්‍රාම නිලධාරි වසම් 16 ක් ඊයේ (10) සිට හුදෙකලා කළ බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

ඒ අනුව ගම්පහ, කළුතර, අම්පාර, මොනරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කවල ග්‍රාම සේවා වසම් 16ක් හුදෙකලා කළ බව හෙතෙම කීවේය. ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර පොලිස් බල ප්‍රදේශයේ ඇටිකෙහෙල්ගල්ල, බටහිර 290 ඒ, ග්‍රාම නිලධාරි වසම, කටාන පොලිස් බල ප්‍රදේශයේ කදිරාන උතුර, ග්‍රාම නිලධාරී වසමේ ඇටඹගහ වත්ත ගම්මානය, කදිරාන දකුණ ග්‍රාම නිලධාරි වසමේ පේෂකර්ම ගම්මානය, කේ සී සිල්වා ග්‍රාම නිලධාරී වසමේ 70 බී කොටස හුදෙකලා කර තිබේ.

එමෙන්ම වත්තල පොලිස් බල ප්‍රදේශයේ සේදවත්ත ග්‍රාම නිලධාරි වසමේ මහාපමුණුගම කොටස කුන්ජගහවත්ත ග්‍රාම නිලධාරී වසමේ 44 වන පටුමග, නිල්සිරිගම ග්‍රාම නිලධාරී වසමේ 03 සහ 07 වන පටුමග

අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් බල ප්‍රදේශයේ බක්මීදෙණිය ග්‍රාම නිලධාරී වසමේ රන්හෙළගම කොටස, සේරුපිටිය ග්‍රාම නිලධාරී වසමේ සේරුපිටිය උප කොටස, රත්නපුර පොලිස් බල ප්‍රදේශයේ අංගම්මන 182 සී කොටස සහ මොනරාගල පොලිස් බල ප්‍රදේශයේ බෝහිටිය ග්‍රාම නිලධාරී වසම ද හුදෙකලා කෙරිණි.

කළුතර දිස්ත්‍රික්කයේ මොරගහහේන පොලිස් බල ප්‍රදේශයේ පලන්නොරුව 604, කෝරළඉම 604 ඒ සහ කුඹුකබටහිර 607 ඒ යන ග්‍රාම නිලධාරී වසම් ද හුදෙකලා කර තිබෙනවා. එමෙන්ම හොරණ පොලිස් බල ප්‍රදේශයේ නර්ථනගල, 616 සී ග්‍රාම නිලධාරී වසම ද හුදෙකලා කර ඇති බව ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා කියා සිටියේය.

# කොවිඩ් ඉටුකම අරමුදලේ රු.1,360,922,969.24ක ශේෂය එන්නත්කරණයට යෙදවීමට පියවර

කොවිඩ්-19 (ඉටුකම) සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ මේ වනවිට පවතින රුපියල් 1,360,922,969.24ක ශේෂය එන්නත්කරණය සඳහා යෙදවීමට තීරණය කර තිබේ.

අරමුදලට බැර වූ මුළු මුදල රුපියල් 1,752,402,793.24 ක් බවත් මේ වන විට වැය කර ඇති මුදල රුපියල් 391,479,824.00 ක් වන අතර එය සමස්ත එකතු වූ මුදලින් සියයට 23කි.

ඉතිරිව ඇති ශේෂය එන්නත්කරණ සඳහා රජය වැය කිරීමට අපේක්ෂිත මුදලට සාපේක්ෂව ඉතා කුඩා ප්‍රමාණයක් බවත් එහෙත් අරමුදලේ ශේෂය එන්නත්කරණය සඳහා යෙදවීමේ වැදගත්කම අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් පෙන්වා දී තිබේ.

PCR පරීක්ෂණ ආශ්‍රිත වියදම් රුපියල් 42,605,812.00,දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් 67,543,967.00, නිරෝධායන කටයුතු සඳහා වූ ආශ්‍රිත වියදම රුපියල් 38,031,065.00, පරිපාලන වියදම් රුපියල් 3,000.00 වසංගතය වෙනුවෙන් අරමුදල මුදල් වැය කර ඇත.

ගෙවීමට ඇති බැරකම් ලෙස එන්නත්කරණය ආශ්‍රිත වියදම් රුපියල් 41,545,980.00, ගිලන් රථ 10ක් මිලදී ගැනීම සඳහා රුපියල් 194,000,000.00, ICU ඇඳන් මිලදී ගැනීම සඳහා රුපියල් 7,750,000.00 ලෙස ගෙවා ඇති සහ ගෙවීමට ඇති මුලු වියදම 391,479,824.00 කි.

මේ සියලු වියදම් දරා ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා යුද හමුදා මූලස්ථානය මඟින් සිදුකර ඇති අතර ජනතාව, දේශීය ආයතන කිහිපයක් හා විදේශයන්හි පදිංචි ශ්‍රී ලාංකිකයන් පිරිසක් ඉටුකම කොවිඩ් අරමුදලට මුදල් පරිත්‍යාග කළහ. අන්තර්ජාතික මූල්‍ය ආයතන හෝ සංවිධාන කොවිඩ්-19 අරමුදලට දායක වී නැත.

ජාත්‍යන්තර නීති අනුව විදේශ ආධාර හා පරිත්‍යාග සිදු කෙරෙනුයේ මහා භාණ්ඩාගාරය වෙතය. මේ අරමුදලත්, අන්තර්ජාතික ආයතනෙවලින් ලද පරිත්‍යාගත් අතර කිසිදු සම්බන්ධතාවයක් නැත. තවද 2020 වර්ෂය තුළ කොවිඩ් 19 අරමුදලට මහජන පරිත්‍යාග වැඩි වශයෙන් ලැබුණ ද, 2021 වර්ෂයේ අප්‍රේල් මස තෙක් ලැබී ඇති පරිත්‍යාගවල මාසික සාමාන්‍ය රුපියල් මිලියන 7ක් පමණ වේ.

# ඉතියෝපියානු ගෘහ සේවිකාවක් කුවේට්හි ශ්‍රී ලාංකික කතකගේ ගෙල සිඳ මරා දමලා

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

කුවේට් රාජ්‍යයේ සේවයේ නියුතුව සිටි ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවකගේ ගෙල ඉතියෝපියානු ජාතික ගෘහ සේවිකාවක විසින් කපා ඝාතනය කර තිබේ.

ඝාතනයට ලක්වූ කාන්තාවගේ මෘත ශරීරය කටාර් ගුවන් සේවයට අයත් ගුවන් යානයකින් පෙරේදා (09) මෙරටට ගෙනැවිත් ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

එලෙස ඝාතනය වී ඇත්තේ වයස අවුරුදු 39ක් වූ මහව ප්‍රදේශයේ පදිංචිකාරියකි.

මේ සම්බන්ධයෙන් කටුනායක ගුවන් තොටුපොළ පොලීසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇති බවත් එහිදී ඇයව පසුගිය අප්‍රේල් මස 13 වන දින කුවේට් රාජ්‍යයේ දී ඉතියෝපියානු ජාතික ගෘහ සේවිකාවක විසින් ගෙල කපා ඝාතනය කර ඇති බවට අනාවරණය වූ බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

2019 වර්ෂයේ දී අදාළ කාන්තාව කුවේට් රාජ්‍යයේ ගෘහ සේවයට ගොස් තිබේ.

මේ සම්බන්ධයෙන් පෙරේදා (09) දිනයේ දී මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් මහෙස්ත්‍රාත් පරීක්ෂණයක් සිදුකර ඇති අතර, ඊයේ (10) දිනයේ දී මීගමුව රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකිරීමට නියමිතව තිබිණි.

# කොවිඩ් එන්නතේ පළමු මාත්‍රාව ගත් අයටත් වයිරසය ආසාදනය වීමේ අවදානමක්

## වෛද්‍ය එස්. කොග්ගල

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 මර්දන එන්නතේ පළමු මාත්‍රාව ගත් පුද්ගලයන්ට ද කොවිඩ් වයිරසය ආසාදනය වීමේ අවදානමක් පවතින බව සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය එස්. කොග්ගල මහතා පැවසුවේය.

වයිරසය ආසාදනය වීමෙන් වැළකීමට නම් නිවැරැදි ලෙසම කොවිඩ් මර්දන සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදිය යුතු බවත් පළමු එන්නත් මාත්‍රාව ගත් පුද්ගලයකුට වයිරසය ආසාදනය වීමක් සිදු වුවහොත් ඒ පුද්ගලයාගෙන් දරුණු ආසාදිත තත්ත්වයක් වාර්තා නොවන අතර සාමාන්‍ය කැස්සක්, සෙම්ප්‍රතිශ්‍යායාවක් පෙන්විය හැකි බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඒ මහතා මේ බව ඊයේ (10) පැවසුවේය.

ගැබිනි කාන්තාවන්ට මේ වයිරසය ආසාදනය වුවහොත් සංකූලතා වැඩි වීමේ අවදානමක් පවතින අතර එසේ වුවහොත් වැඩි වශයෙන් දැඩි සත්කාර ඇඳන් සහ අධි සත්කාර ඇඳන් අවශ්‍ය විය හැකි යැයි ද ඔහු කීය.

ගැබිනි කාන්තාවන් අත්‍යවශ්‍ය සෞඛ්‍ය කරුණකට හැර නිවසෙන් පිටතට යෑමෙන් වැළකී සිටිය යුතු බවත් කිසියම් ගර්භිණී කාන්තාවකට කොවිඩ් රෝග ලක්ෂණයක් හෝ සංකූලතාවක් ඇති වුවහොත් "1990 සුවසැරිය" අමතා වෛද්‍ය උපදෙස් ලබාගෙන ප්‍රතිකාර සඳහා යොමු වීම වඩාත් සුදුසු බවත් ඒ මහතා පැවසුවේය.

# එජාප ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට තවමත් කෙනෙක් නෑ

## පක්ෂ ජ්‍යෙෂ්ඨයෙක් 'දිනමිණට' කියයි

**ශිරාන් රණසිංහ**

ඉකුත් මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ලැබුණු එකම ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය සම්බන්ධයෙන් පක්ෂය ඇතුළේ නිර්මාණය වී තිබෙන කඹ ඇදිල්ල නිසා තවදුරටත් එම මන්ත්‍රී ධුරයට අයකු පත් කිරීම කල් ගත වන බව පක්ෂ ජ්‍යෙෂ්ඨයෙක් 'දිනමිණට' පැවසීය.

මෙම මන්ත්‍රීධුරය සඳහා පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා පත් විය යුතු බවට පිරිසක් යෝජනා කළත් එය භාර ගැනීමට ඒ මහතා ප්‍රතික්ෂේප කරන බවද හෙතෙම කීය. එම මන්ත්‍රීධුරයට යම් යම් අයගේ නම් යෝජනා වී තිබුණත් ඒ යෝජිත අයට මන්ත්‍රීධුරය ලබාදීමට එකගතාවකට ඒමට නොහැකිව තිබේ.

ඉකුත් පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ආසනයක්වත් ජය ගැනීමට එක්සත් ජාතික පක්ෂයට නොහැකි වූ අතර ලැබුණ එකම ජාතික මන්ත්‍රීධුරයද තවදුරටත් පුරප්පාඩුවට පවතින්නේ පක්ෂයේ අය අතර කඹ ඇදිල්ල දිග්ගැස්සෙන නිසා යැයි ද එම ජ්‍යෙෂ්ඨයා හෙළි කර සිටියේය.



කොවිඩ් වසංගතය හේතුවෙන් දුම්රිය ගමනා ගමනය මදක් සීමා කර ඇති අතර කොටුව දුම්රිය ස්ථානයේ මගීන් ප්‍රවේශපත් ගන්නා කවුළු හිස්ව ගොස් ඇති අයුරුයි මේ.

ඡායා - සුදත් මලවීර

# පශ්චාද් උපාධිය හදාරන වෛද්‍යවරුන් 400ක් යළි රෝහල්වලට නිදහස් කරනවා

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

**නුවන් කොඩිකාර**

කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා දැනට පශ්චාද් උපාධිය හදාරන වෛද්‍යවරුන් 400 දෙනකු නැවත රෝහල්වලට නිදහස් කරන බව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය පවසයි.

සෞඛ්‍ය අමාත්‍යාංශය කළ ඉල්ලීමකට අනුව එම නිදහස් කිරීම සිදු කරන බව එම සංගමය සඳහන් කරයි. සෑම රෝහලකම කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර ලබාදීම සඳහා වාට්ටුවක් වෙන් කරන ලෙසට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට උපදෙස් ලබා දී ඇති බව නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කර සිටියේය.

# සංචරණ සීමා ප්‍රදේශවල සිටින සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට සේවා ස්ථානයට යෑමට ඉඩ දෙන්න

## පොලිස්පතිගෙන් උපදෙස්

**නුවන් කොඩිකාර**

සංචරණ සීමා පනවා ඇති ප්‍රදේශවල සිටින සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සේවා ස්ථාන වෙත ගමන් කිරීමට හා ආපසු පැමිණීමට ඉඩ ලබාදෙන්නැයි පොලිස්පති සී ඩී වික්‍රමරත්න මහතා පොලීසියට උපදෙස් ලබා දී තිබෙනවා.

සිය අත්සනින් යුතු ලිපියක් යොමු කරමින් පොලිස්පතිවරයා විසින් සියලු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන්, අණදෙන නිලධාරීන් හා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරීන්, දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්, මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් හා ස්ථානාධිපතිවරුන් වෙත එම උපදෙස් මාලාව නිකුත් කර තිබේ.

ඒ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් විශේෂ වෛද්‍ය අසේල ගුණවර්ධන විසින් පොලිස්පතිවරයා වෙත යොමු කළ ලිපියක පිටපතක් ද සමගිනි.

ඒ අනුව පොලිස්පතිවරයා විසින් යොමු කර ඇති ලිපියේ දැක්වෙන්නේ කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පනවා ඇති ඇතැම් ප්‍රදේශවල සිටින රෝහල් කාර්යය මණ්ඩලයට සේවයට වාර්තා කිරීම සඳහා පැමිණීමට ඉඩ ලබානොදෙන අවස්ථා සම්බන්ධයෙන් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්වරයා තමන් වෙත එවා ඇති ලිපියෙන් දැනුම් දී ඇති බවයි.

මෙවැනි අවස්ථාවක සෞඛ්‍ය සේවය යනු ඉතා අත්‍යවශ්‍ය සේවාවක් වන බැවින් සංචරණ සීමා පනවා ඇති ප්‍රදේශවල සිටින සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සේවා ස්ථාන වෙත ගමන් කිරීමට හා ආපසු පැමිණීමට ඉඩ ලබාදිය යුතු බවට පොලිස්පතිවරයා සිය ලිපිය මඟින් උපදෙස් දී තිබෙනවා. ඒ අනුව මේ සම්බන්ධයෙන් තමන් යටතේ රාජකාරී කරන සියලු පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමට පියවර ගන්නා ලෙසටයි පොලිස්පති සී ඩී වික්‍රමරත්න අදාළ ලිපිය මගින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන්ට දන්වා ඇත්තේ.

# රාමසාන් අවුරුදු යාච්ඤා මුස්ලිම් දේවස්ථානවල පවත්වන්න එපා

කොරෝනා වයිරස් ව්‍යාප්තිය හේතුවෙන් රාමසාන් අවුරුදු යාඥා මුස්ලිම් දේවස්ථානවල නොපවත් වන ලෙස මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඉල්ලීම් කරයි. රාමසාන් උත්සව දිනයේ දී සෑම මුස්ලිම් පල්ලියකම යාඥා නොපවත්වන ලෙස ශ්‍රී ලංකා වකූෆ් සභාව තීරණය කර තිබේ.

එබැවින් සියලු මුස්ලිම් දේවස්ථාන රාමසාන් උත්සව දිනයේදී වසා තැබිය යුතු බවත් එදින සංචරණ සීමා කරමින් නිවසේ සිට පවුලේ අය සමඟ යාච්ඤා කරන ඊදුල් ෆීතර් උත්සවය සමරන ලෙසට වකූෆ් සභාව ඉල්ලා සිටී.

ක්‍රීඩා SPORTS

sports.dinamina@lakehouse.lk

# නායක කෝලි සහ ෂර්මා නැති ඉන්දීය ක්‍රිකට් පිල ජූලි මාසයේ ශ්‍රී ලංකාවේ

ප්‍රින්ස් ගුණසේකර

නායක විරාත් කෝලි සහ උප නායක රෝහිත් ෂර්මා නොමැති ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම එළැඹෙන ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කරන බව ස්ථිර වෙයි. එහිදී ඔවුන් එක්දින තරග 3කට හා විස්සයි20 තරග 5කට ක්‍රීඩා කිරීමට කැමැත්ත පළ කොට ඇත.

ශිකර් ධවාන්, හාඩික් පාණ්ඩ්‍යා, බුවනේශ්වර් කුමාර්, දීපක් චහාර්, යුස්වේන්ද්‍ර චහාල්, රාහුල් තෙවේටියා, දෙවුදුත් පඩිකාල්, ෂෙර්යාස් අයියර් හා චේතාන් සකාරියා වැනි ක්‍රීඩකයින්ගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකා සංචාරයට එක්කරන බව ඉන්දීය ක්‍රිකට් සභාපති සෞරව් ගංගුලි මහතා ඉන්දීය මාධ්‍ය වෙත ඊයේ අනාවරණය කර ඇත.

නායක විරාත් කෝලි සහ උප නායක රෝහිත් ෂර්මා ශ්‍රී ලංකා සංචාරයට එක් නොවන්නේ ඉන්දීය පිල එංගලන්තයට යෑමේදී දැඩි නිරෝධායන නීති පිළිපැදීමට එකඟවී ඇති බැවිනි. ඉන්දීය පිලේ එංගලන්ත සංචාරය ලබන ජූනි මාසයේ ආරම්භ වන අතර එහිදී අයිසීසී ලෝක ටෙස්ට් ශූරතාවලියේ අවසන් මහා තරගයට නවසීලන්තය සමග මුහුණ දෙන අතර අනතුරුව එංගලන්තය සමග තරග 5කින් සමන්විත ටෙස්ට් තරගාවලිය ආරම්භ කිරීමට නියමිත වේ. එබැවින් ඉන්දීය පිලේ එංගලන්ත සංචාරයට එක්වන ටෙස්ට් සංචිතයේ කිසිදු ක්‍රීඩකයෙකුට ශ්‍රී ලංකා සංචාරයට එක්වීමේ අවස්ථා උදා නොවේ.

"ශ්‍රී ලංකාව සමග පැවැත්වෙන සුදු බෝල ක්‍රිකට් තරගාවලියට වෙනම කණ්ඩායමක් නම් කරනවා. එය වෙනස් පැත්තක් වෙයි. එංගලන්තයට යන කිසිදු ක්‍රීඩකයෙකුට ශ්‍රී ලංකා සංචාරයට එක්වන්න බෑ. මේ තරගාවලියේදී අවම වශයෙන් විස්සයි 20 අන්තර්ජාතික තරග 5 ක් එක්දින තරග 3ක් පවත්වන්න සූදානම්. අපගේ සියලුම ඉහළ ක්‍රීඩකයින් එංගලන්ත ටෙස්ට් තරගාවලිය සඳහා සූදානම් වෙනවා. ජූලි මාසය තුළ එක්දින තරග කිසිවක් අපට නෑ. ඒ නිසා ජූලි මාසය ශ්‍රී ලංකා සංචාරයේදී හොඳින් භාවිතා කළ හැකිය" යනුවෙන් ඉන්දීය ක්‍රිකට් සභාපති සෞරව් ගංගුලි මහතා ඉන්දීය මාධ්‍ය වෙත පැහැදිලි කර තිබිණි.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර එක්දින සහ විස්සයි විස්ස ක්‍රිකට් තරගාවලි පැවැත්වීමේදී ඉතා විශාල ආදායමක් රටවල් දෙකම ලබා ගන්නා හෙයින් මෙම සංචාරය ඉතා වැදගත් වේ. ඉන්දියානු කණ්ඩායමේ සෑම ශ්‍රී ලංකා සංචාරයකදීම වැඩිම අනුග්‍රහකයන් පිරිසක් ආකර්ශනයවීමෙන් ඉහළ ආදායමක් උපයා ගැනීමේ හැකියාව ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබී ඇත.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පසුගිය වසරේ ජූනි මාසයේදී එක්දින සහ විස්සයි විස්ස ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීමට නියමිතව තිබූ අතර එම තරගාවලිය කොරෝනා හේතුවෙන් අත්හැර දැමුණි. එයින් ශ්‍රී ලංකාව අපේක්ෂා කළ ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 3.5 (ශ්‍රී ලංකා රුපියල් මිලියන 644) කි.

පසුගිය වසරේදී කොරෝනා අර්බුදය ආරම්භ වෙද්දී ශ්‍රී ලංකාවේ සිටි එංගලන්ත පිල තරගාවලිය සම්පූර්ණයෙන් අත්හැර දැමීමෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදලක් (ශ්‍රී ලංකා රුපියල් මිලියන 460) අහිමි විය. මේ ආකාරයෙන් අත්හැර දැමූ ක්‍රිකට් තරගාවලි කිහිපයකින්ම ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත දරුණු ආර්ථික හානියක් සිදුව ඇති හෙයින් එළැඹෙන ජූලි මාසයේ පැවැත්වෙන තරගාවලිය ඉතා වැදගත් එකක් බවට පත් වේ.




**එක්දින 3යි: විස්සයි20 තරග 5යි**

# ලෝක ටෙස්ට් අවසන් සටනට ඉන්දීය පිල සූදානම්

පළමු වරට පැවැත්වෙන අයිසීසී ලෝක ටෙස්ට් ශූරතාවලියේ අවසන් තරගයට එක් වන ඉන්දීය සංචිතය පසුගියදා ප්‍රකාශයට පත් කිරීමට එරට ක්‍රිකට් ආයතනය කටයුතු කළේය.

ඒ අනුව විරාත් කෝලිගේ නායකත්වයෙන් යුත් මේ සංචිතයට ක්‍රීඩකයන් 20 දෙනකු ඇතුළත්ව ඇති අතර, මොහොමඩ් ෂාමි, රවින්ද්‍ර ජඩේජා සහ හනුමා විහාර යළි සංචිතයට කැඳවා තිබේ.

හර්දික් පාණ්ඩ්‍යාට මෙන්ම කුල්දීප් යාදව්ට මේ කණ්ඩායමේ ස්ථාන අහිමි වී ඇත. මේ වසර මුලදී පැවැති එංගලන්තය සමඟ තරගාවලියෙන් ඉවත් වූ පාණ්ඩ්‍යා මේ වන විට ක්‍රිකට් පිටියේ පන්දු නොයවන අතර, අයිපීඑල් තරගාවලියේ මුම්බායි පිල නියෝජන කරන ඔහු උරහිසේ ආබාධයක් හේතුවෙන් ක්‍රීඩා කළ තරගවලදී පන්දු යැවීමෙන් වැළකී සිටියේය.

කුල්දීප් මින් පෙර සංචිත රැසකට එක්ව සිටිය ද ක්‍රීඩා කිරීමේ අවස්ථාව අහිමි වී තිබිණි. ඔහු පසුගිය වසර 2 තුළ ක්‍රීඩා කර ඇත්තේ තරගයක් පමණි.

කොරෝනා වසංගතය හේතුවෙන් මේ ක්‍රීඩකයන්ට අමතරව අතිරේක ක්‍රීඩකයන් සිවුදෙනකු එක් කිරීමට ද ඉන්දීය තේරීම් කමිටුව කටයුතු කර ඇත. කෙසේ වෙතත් ඔවුන් අතුරින් අයිපීඑල් තරගාවලියේදී කොල්කාට පිල නියෝජනය කළ ප්‍රසිද් ක්‍රිෂ්ණාට කොරෝනා වයිරසය ආසාදනය වී ඇත.

ලෝක ශූරතාවලියේ අවසන් මහා තරගය ලබන ජූනි මස 18 වැනිදා ඉන්දියාව සහ නවසීලන්තය අතර, එංගලන්තයේ සදම්ප්ටන්හිදී ආරම්භ වෙයි.

අනතුරුව ඉන්දීය පිල එංගලන්තය සමඟින් තරග 5කින් සමන්විත ටෙස්ට් තරගාවලියකට එක්වන අතර, එම තරගාවලියට එක් වන්නේ ද මේ සංචිතයයි. තරගාවලිය අගෝස්තු මස 4 වැනිදා සිට සැප්තැම්බර් මස 14 වැනිදා දක්වා පැවැත්වෙනු ඇත.

ඉන්දීය සංචිතය - විරාත් කෝලි (නායක), අජින්ක්‍යා රහානේ (උප නායක), රෝහිත් ශර්මා, ශුබ්මන් ගිල්, මයාන්ක් අග්‍රවාල්, චෙටෙස්වර් පුජාරා, හනුමා විහාරි, රිෂාබ් පාන්ට්, රවිචන්ද්‍රන් අශ්වින්, රවින්ද්‍ර ජඩේජා, අක්ෂාර් පටෙල්, වොෂිංටන් සුන්දර්, ජස්ප්‍රීට් බුම්රා, ඉෂාන්ත් ශර්මා, මොහොමඩ් ශාමි, මොහොමඩ් සිරාජ්, ශර්දුල් ඨාකූර්, උමේෂ් යාදව්, ලෝකේෂ් රාහුල්, වි්‍රදිමාන් සාහා. අතිරේක - අභිමන්යු ඊශ්වරන්, ප්‍රසිද් ක්‍රිෂ්ණා, අවේෂ් ඛාන්, අර්සාන් ගාග්වස්වල්ලා.

# චව්ලාගේ පියා කොරෝනාවෙන් මියයයි



ඉන්දීය දඟ පන්දු යවන ක්‍රීඩක පියුෂ් චව්ලාගේ පියා කොරෝනා රෝගය වැලඳී ඊයේ මිය ගියේය. ප්‍රමෝද් කුමාර් චව්ලා මහතා කොරෝනා සංකූලතාවලින් පෙළෙන බව ක්‍රිකට් ක්‍රීඩකයා ඉන්ස්ටග්‍රෑම් සටහනක් මගින් අනාවරණය කර ටික වේලාවකට පසු මරණය වාර්තා විය.

මේ වන විට කල් දමා ඇති අයි.පී.එල්. 2021 තරගාවලියේදී පියුෂ් චව්ලා මුම්බායි ඉන්දියන්ස් සංචිතයට ඇතුළත් විය.

# මැඩ්රිඩ් ටෙනිස් ජය සබාලෙන්කාට



මැඩ්රිඩ් විවෘත ටෙනිස් ශූරතාව දිනා ගැනීමට බෙලරුස්හි ආර්යානා සබාලෙන්කා සමත් වෙයි. ඇය වෙතින් පරාජයට පත් වූයේ ලොව අංක එකේ ටෙනිස් ක්‍රීඩිකා ආෂ් බාර්ටි ක්‍රීඩිකාව වීම විශේෂත්වයකි.

පසුගිය මාසයේ ස්ටුට්ගාර්ට්හි පැවති අවසන් මහා තරගයේදී බාර්ටි විසින් සබාලෙන්කා පරාජය කළ අතර මැඩ්රිඩ් විවෘත ටෙනිස් තරගාවලියේදී සබාලෙන්කාගේ ජයග්‍රහණය එකට එක කිරීමක් වැනි බව විචාරකයෝ පවසති.

23 හැවිරිදි ඇය ආර්යානා සබාලෙන්කා 6-0, 3-6 හා 6-4ක් ලෙස මෙම ජයග්‍රහණය වාර්තා කළාය. පළමු වටය මිනිත්තු 25කදී ජය ගැනීමට සබාලෙන්කා සමත් වූ අතර, දෙවැනි වටයේදී පරාජය විය. එහෙත් තෙවැනි වටයේදී ආර්යානා සබාලෙන්කා ජයග්‍රාහී මාවතට පිවිසියාය.

ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය

# සති අන්ත 4කදී පැවැත්වීමට යයි



ප්‍රින්ස් ගුණසේකර

ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය අදියර 4ක් යටතේ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මලල ක්‍රීඩා විධායක කමිටුව තීරණය කරයි. මේ මස 22දා ආරම්භ වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය සෑම සති අන්තයකදීම පැවැත්වීමට කටයුතු යෙදේ. ඉතා සීමිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් මෙම ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියට එක් වන අතර ඔවුන්ට ඔලිම්පික් සුදුසුකම් ලබා ගැනීමේ අවස්ථා උදාකිරීම මෙම තරගාවලිය සංවිධානය කිරීමේ ප්‍රධාන අපේක්ෂාව වී ඇත.

කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ජවන හා පිටිය තරග සඳහා ශ්‍රී ලංකාවේ ඉදිරියෙන්ම ශ්‍රේණිගත වී සිටින ක්‍රීඩිකාවන් එක්කරන අතර එක් සති අන්තයක තරග ඉසව් 5ක් පැවැත්වීම කෙරෙහි අවධානය යොමුව පවතී. කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන මෙම තරග නැරඹීමට කිසිදු පිටස්තරයෙකුට අවසර හිමි නොවන බවත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණුකරුවන්ට පමණක් අවස්ථාව ලබාදී ඇති බවත් ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සභාපති, විශ්‍රාමික මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු මහතා 'දිනමිණ' ට පැවැසීය.

මේ අතර උස පැනීමේ පිරිමි ඉසව්වේ ශ්‍රී ලංකා වාර්තාව නැවත වරක් අලුත් කරමින් දකුණු ආසියාවේම ක්‍රීඩකයෙකු වාර්තා කළ හොදම දක්ෂතාව පෙන්වීමට සමත්වූ උෂාන් තිවංක පෙරේරා අමෙරිකාවේ සිට පැමිණ ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියට සහභාගීවීම ස්ථිර නැතැයි ද ප්‍රනාන්දු මහතා සඳහන් කළේය.

"උෂාන් තිවංක ඔලිම්පික් සුදුසුකම් ලබන්න මීටර් 2.33ක දක්ෂතාවක් ඉදිරියේදී දක්වයි කියා අප විශ්වාස කරනවා. ඇමෙරිකාවේ පැවැත්වෙන තරගාවලියකදී ඒ සුබ ආරංචිය අහන්න අපට ලැබෙයි. යම් විදිහකින් එසේ නොවුණහොත් උෂාන් තිවංක ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්න අප බලාපෙරොත්තු වෙනවා. ඔහුගේ උස පැනීමේ ඉසව්ව ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ අවසන් දිනයට යොදා තිබෙනවා. යම් අවස්ථාවක් ලබා දෙන්න අවශ්‍ය නම් එය නොපමාව ලබාදීමට මලල ක්‍රීඩා සංගමය සූදානම්" ප්‍රනාන්දු මහතා පැවැසීය.

ඉදිරියේ පැවැත්වෙන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියට සහභාගීවීම උදෙසා උෂාන් තිවංක ශ්‍රී ලංකාවට පැමිණියහොත් එම ශූරතාවලියට සහභාගී වීමෙන් ඔහුට අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීම්වලට තවත් ලකුණු 20ක් ලැබී ලෝක මට්ටමේ පියවර කිහිපයක් ඉදිරියට යෑමේ අවස්ථාව උදාවනු ඇත.

ටෙක්සාස් නගරයේ මෙයට දින දෙකකට පෙර පැවැති මලල ක්‍රීඩා තරගාවලියකදී ඔහු මීටර් 2.30ක උසක් පැන දකුණු ආසියාවේ උස පැනීමේ ඉසව්වේ හොදම දක්ෂතාව සටහන් කොට තිබූ ඉන්දියාවේ තෙජාස්වින් ෂන්කර්ගේ මීටර් 2.29කින් තබා තිබූ වාර්තාව මකා දැමීමට සමත් විය.

මෙයට මසකට පමණ පෙර ඇමෙරිකාවේ උසස් අධ්‍යාපන ආයතන අතර වාර්ෂිකව පැවැති තරගාවලියේදී මීටර් 2.28 ක දක්ෂතාවක් දැක්වූ උෂාන් තිවංක වසර 2005දී මංජුල කුමාර විජේසේකර කොරියාවේ ඉන්චියෝන් හී මීටර් 2.27 කින් පිහිටුවා තිබූ උස පැනීමේ ශ්‍රී ලංකා වාර්තාව ද තමන් සතු කරගත්තේය.

# එංගලන්ත කාන්තා පාපන්දු කිරුළ චෙල්සි පිලට



එංගලන්ත කාන්තා සුපර් ලීග් පාපන්දු ශූරතාව චෙල්සි කණ්ඩායම දිනා ගනියි. මැන්චෙස්ටර් සිටි කණ්ඩායම පරදවා එංගලන්ත පාපන්දු කිරුළ යළිත් වරක් චෙල්සි පිල දිනා ගැනීම විශේෂත්වයකි. චෙල්සි පිල දිනාගත් සිවුවැනි ලීග් ශූරතාව මෙය වන අතර, 2011 සිට ඔවුන් කිරුළ රැකගෙන සිටී. චෙල්සියා පිල එංගලන්ත කාන්තා සුපර් ලීග් පාපන්දු ශූරතාවලියේ තරග 22කට සහභාගී වී ලකුණු 57ක් රැස් කරගත් අතර දෙවැනි තැනට පත්වූ මැන්චෙස්ටර් සිටි කණ්ඩායම තරග 22කට සහභාගී වී ලකුණු 55ක් ලබා සිටියේය.

චෙල්සි කණ්ඩායම සහභාගී වූ අවසන් තරගයේදී රීඩින් පිල ගෝල් 5-0කින් පරාජය කිරීමත් සමග ලකුණු සටහනේ පෙරමුණ ගැනීමේ අවස්ථා උදා විය.

# මහනුවර ග්‍රාමීය ක්‍රීඩා පිටි 20ක් සංවර්ධනයට රුපියල් කෝටි 3ක්

ගාමිණී බී. දිසානායක
හාරිස්පත්තුව මධ්‍යම විශේෂ

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සහ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කුසලතා නැංවීම සඳහා දීපව්‍යාප්තව ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කය තුළ තෝරාගන්නා ලද ක්‍රීඩා පිටි 20ක් සඳහා රුපියල් කෝටි තුනක මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේ.

මේ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක් තුළම තෝරාගත් එක් ක්‍රීඩාංගණයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ පහළොවක් බැගින් වන මුදල් ප්‍රතිපාදන අදාළ බල ප්‍රදේශයේ සෑම ප්‍රාදේශීය සභාවක් වෙත ලබාදී ඇත.

මේ අනුව ගඟවට කෝරලේ ඔගස්ටාවත්ත ක්‍රීඩා පිටිය, කුණ්ඩසාලේ උයන් වත්ත ක්‍රීඩාපිටිය, පාතදුම්බර දොරගමුව මහා විදුහල් ක්‍රීඩා පිටිය, පන්විල දිය නිල්ලවානී ක්‍රීඩා පිටිය, යටිනුවර කිරිබත්කුඹුර ජාතික පාසල් ක්‍රීඩා පිටිය, උඩුනුවර උඩ අළුදෙණිය මහා විද්‍යාලය ක්‍රීඩාංගණය, උඩපළාත වනහපුව ක්‍රීඩා පිටිය, දොළුව ඩෙල්ටාවත්ත ක්‍රීඩාංගණය, පාතහේවාහැට පින්නගොල්ල ක්‍රීඩාංගණය, දෙල්තොට නාරංහින්න පොදු ක්‍රීඩාංගණය, මැදදුම්බර උඩිස්පත්තුව මහවැලි ක්‍රීඩාංගණය, උඩදුම්බර දඹගහපිටිය පොදු ක්‍රීඩාංගණය, මිණිපේ දැහැමිගම ක්‍රීඩාංගණය, අකුරණ දිප්පිටිය වොලිබෝල් ක්‍රීඩා පිටිය, පූජාපිටිය වෑවල ග්‍රාමීය ක්‍රීඩාංගණය, හාරිස්පත්තුව රුවන්පුර වොලිබෝල් ක්‍රීඩාංගණය, තුම්පනේ ගලගෙදර මහජන ක්‍රීඩාපිටිය, හතරලියද්ද පොල්වත්ත ඉහල නිල සෙවන අසල ක්‍රීඩාපිටිය, ගඟ ඉහළ වැටකෙදෙණිය ක්‍රීඩාංගණය, පස්බාගේ ගලබඩවත්ත පහළ කොටස වොලිබෝල් ක්‍රීඩාංගණය යන ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මහතාගේ උපදෙස් පරිදි මහනුවර දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂිකා විජේසුන්දර මහත්මිය විසින් අදාළ ප්‍රාදේශීය සභා වෙත මුදල් ප්‍රතිපාදන ලබා දුන් බව පැවසීය.

# බද්දරමල්ල

සතියේ 'තුන පහ' මඩිස්සලේ



## උඩුපෙළ සහ යටිපෙළ

# බුකර් සම්මානයට මාන බලන කිලිටි ළමයා






ආජන්ටිනාවේ දකුණුදිග සිට එන දුම්රිය බුවනෝස් අයර්ස් නගරයට ඇතුළු වූයේ කොන්ස්ටිසියෝන් නම් පෙදෙස හරහාය. දිගු කලකට ඉහත එය නගරයේ කුලීන පැලැන්තියේ උදවියගේ වාසභූමිය විය. එහෙත් 1887දී දකුණේ සිට පැතිරෙන්න වූ කහ උණ වසංගතයෙන් ගැලවෙනු පිණිස, නගරවාසී සියල්ලෝ ගෙවල් දොරවල් අත්හැර වෙනත් ප්‍රදේශයන්ට පලා ගියහ. ඔවුන්ගෙන් ආපසු පැමිණියේ පවුල් කීපයක් පමණි.

එසේ පැමිණි ඇතැම් ධනවත් වෙළෙන්දෝ අතහැරදැමූ නිවාස මිල දී ගත්හ. තවත් සමහරු පාළු මන්දිර හෝටල් බවට හැරවූහ. ඇතැම් නිවාස වැඩිහිටි නිවාස බවට පත් කෙරිණි. පැරණි තත්ත්වයට පත් නොවූ නගරයෙන් වැඩි කොටසක් පාළු වී ජරාවාස වූයේය.

මේ නගරයේ එක් මන්දිරයක් නීතිඥයන්ගේ කාර්යාල සඳහා යොදා ගැනිණි. පසුව එය දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් බවට පත් විණි. අවසානයේ මන්දිරය සංචාරක සඟරාවක කාර්යාලය සඳහා කුලියට ගැනුණ ද දෙවසරකට පසුව එය ද වැසී ගියේය.

දැන් එහි පදිංචිව සිටින්නේ කලකට පෙර මේ මන්දිරයේ විසූ ධනවත් ව්‍යාපාරිකයාගේ මිනිපිරියක වන කාන්තා විලාසිතා සඟරාවක ග්‍රැෆික් ශිල්පිනියක වශයෙන් කටයුතු කරන තරුණියකි.

මට මෙවර ඔබට එම තරුණිය හඳුන්වා දීමට සිතුණේ, 2021 බුකර් සාහිත්‍ය සම්මානය සඳහා නිර්දේශිත the danger of smoking in the bed නමැති කෙටි කතා සංග්‍රහයේ කතුවරිය වන ආර්ජන්ටිනියානු ජාතික මරියානා එන්රිකේස් (Mariana Enriquez) ගේ dirty kids (කිලිටි ළමයා) කෙටිකතාවෙනි. කතාව කියන්නිය ලෙස ඇය යොදාගෙන ඇති බැවිනි. පරිකල්පිත චරිතයක් වුව ද ඇගේ දෘෂ්ටිකෝණයෙන් අපට දක්වන්නෙ ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් හී සැබෑ සමාජයෙහි එක් පැතිකඩකි.

මේ කතාව ඇතුළත් වන්නේ මරියානා එන්රිකේස්ගේ things we lost in the fire නමැති කෙටිකතා සංග්‍රහයටය. මරියානා එන්රිකේස් යනු මහත් ප්‍රතිභාවකින් යුත් සූර කෙටිකතා කාරියක බව සනාථ කිරීමට 'කිලිටි ළමයා' පමණක් වුව ද සෑහේ.

කතිකාව හැරුණු විට මෙහි එන ප්‍රධාන චරිත තුන වන්නේ වීදි කෙළවරක දිවි ගෙවන නිවෙස් අහිමි කාන්තාවක් සහ ඇගේ පුතා යැයි හැඟවෙන කුඩා පිරිමි ළමයෙක් ද ලලා නමැති කේශ විලාසිතා ශිල්පිනියක් ද පමණි. කතාව කියන ග්‍රැෆික් ශිල්පිනිය ඇයගේ නිවෙසේ සිට දිස් වන දර්ශනයක් මෙසේ විස්තර කරයි; කෙටිකතා මාධ්‍ය තුළදී පවා මාරියා ඉතා නිර්ලෝභී ලෙස තම අවකාශය යොදාගනිමින් පරිසරය හා චරිත වර්ණනයෙහි යෙදෙයි:

"මෙම වීදියේ ජනයා බොහෝ සේ විසූ ය. එහෙත් මගේ නිවෙසේ සිට කිලෝමීටර දෙකක් පමණ දුරින් පිහිටි ප්ලාසා කොංග්‍රසේ ප්‍රදේශයෙහි තරම් විසල් ජනගහනයක් එහි නොවීය. එහි ඇති රජයේ ගොඩනැගිලි පවා නොතකා ඒවා ඉදිරිපස මිනිස්සු පදිංචිව සිටියහ.

සෑම රාත්‍රියකම කුඩා ස්වෙච්ඡා කණ්ඩායම් පැමිණ නිවාස අහිමි මේ දිළිඳු ජනයාට ආහාරපාන බෙදා දුන්හ. ඇතැම් අය ළමයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සීත සෘතුවේ පොරවන කම්බිලි බෙදා දීම ගිම්හානයේ නම් සීත ජලය ලබා දීම වැනි කටයුතුවල යෙදුණහ.

මගේ නිවෙස ඉදිරිපිට ලෑලි ගසා වසා ඇති සිල්ලර වෙළෙඳසල අසල පදිකවේදිකාවෙහි තරුණ ගැහැනියක් හා ඇයගේ පිරිමි දරුවා වාසය කළහ. මාස කීපයක ගැබිනියක වූ ගැහැනිය මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වී සිටියාය. අවුරුදු පහක් පමණ වයසැති ළමයා පාසල් නොගියේය. ඒ වෙනුවට ඔහු කළේ සාන්තුවරයකුගේ රුව සහිත කාඩ්පතක් විකිණීමය. ඉතා කිලිටි පෙනුමෙන් යුත් ළමයා වෙතින් දුගඳක් ද හැමීය. සෙම් සොටු සහිත නාසයෙන් යුතු ඔහු උමං දුම්රිය මාර්ගයේ සිටින කුඩා ළමයින් හා එක්ව දුම්පානය කරයි. නිතරම රවාගෙන සිටින ළමයා කතා කරන්නේ බැරෑඩි ගොරහැඬි හඬිනි."

ග්‍රැෆික් ශිල්පිනිය හා ඒ පිරිමි ළමයා අතර දැනහැඳුනුම්කමක් තිබුණ ද එය ඉඳහිට කෙරෙන වචනයකට දෙකකට සීමා වූවකි. ඇය ඉදිරිපස නිවෙසේ සිටින්නිය බව ළමයා දනී. එක් දිනක් අනපේක්ෂිත දෙයක් සිදු වෙයි. තරුණිය එය මෙසේ පවසයි:

"එක් රාත්‍රියක ආහාර ගෙන අවසන් වූ පසු නිවෙසේ සීනුව නාද වන්නට විය. එය මට නුහුරු දෙයක් විය. ලලා හැරණු විට වෙනත් කිසිවකු මා හමු වන්න මෙහි එන්නේ නැත. ලලාට පාළු දැනෙන ඇතැම් දිනවල රාත්‍රිය ගෙවා දැමීමට මගේ නිවෙසට පැමිණෙයි. එවන් රාත්‍රී කාලයන්හි අප විස්කි බොමින් සාම්ප්‍රදායික මෙක්සිකානු ගීතවලට සවන් දෙමින් කාලය ගෙවන්නෙමු. කෙසේ වෙතත් මධ්‍යම රාත්‍රියේ දොර සීනුව නාද කළත් කිසි කෙනකු තම දොර අරින්නේ නැත. එහෙත් ඒ කවුරුන් දැයි දැනගැනීමට ජනේලයෙන් එබී බැලූ මා දුටුවේ කුඩා කොලුවාය. මම දොර හැරියෙමි. ළමයා එතෙක් වේලා අඬමින් සිටි බව පෙනී යන්නේ ඔහුගේ අපිරිසුදු මුහුණේ ඇති වියළී ගිය කඳුළු ඉරි නිසාය.

"මොකක් ද ප්‍රශ්නෙ?"

මම ඇසුවෙමි.

"අම්ම ආවෙ නෑ."

ඔහුගේ හඬේ රළුපරළු බව මඳක් නැතිව ගොස් ඇති සෙයකි. එහෙත් එම හඬ ද අවුරුදු 5ක ළමයකුගෙ හඬට නොගැලපිණි.

"ඉතින් ඔයාට බයද?"

"මට බඩගිනියි."

ඉන් පසු තරුණිය ඔහුගේ කුස පිරෙන්නට කෑම බීම දී මැදියම් රැය තෙක් විවෘත ආපන ශාලාවකට ගොස් අයිස්ක්‍රීම් ද රැගෙන දෙයි. පිටතට යද්දී ළමයා තම අපිරිසුදු අතින් තරුණියගේ අත අල්ලා ගනියි. ඇය ඊට විරුද්ධත්වයක් නොපායි.

කිලිටි ළමයා ගත කරන ජීවිතය ගැන තරුණිය කෙරෙහි උපදින්නේ සානුකම්පිත හැඟීමකි. ඔහුව නාවා පිරිසුදු කොට පාසලකට යවා හදා-වඩා ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවීම ගැන ඇය දුක් වෙයි.

කෙසේ වෙතත් තරුණියගේ අනුකම්පාව, ළමයාගේ මත්ලෝලි මවට නම් රුස්සන්නේ නැත. ඇය තරුණියට පරුෂ වචනයෙන් බැණ වදියි; විටෙක කැඩුණු බෝතලයකින් පහර දීමට උත්සාහ කරයි. ගැහැනිය ඇය වෙත කඩා පනින්නේ කොන්ද කැඩී වේදනාවෙන් පසු වන බැල්ලියක මෙනි. එහෙත් මේ මොහොතේ ළමයා තමා නාඳුනන්නාක් මෙන් පසෙකට වී බලා සිටීම තරුණිය තුළ උපදවන්නේ අමනාපයකි.

මේ කතාව නිමා වන්නේ ළමයා සහ මවගේ අතුරුදන් වීමෙනි. විකෘති කාමුකයකුගේ අතවරයට ලක් වූ ළමයා ගෙල සිඳ මරා දමා ඇතැයි තරුණියට සැල වෙයි. එහෙත් රූපවාහිනී ප්‍රවෘත්ති නරඹන ඇයට එසේ මරා දමා ඇත්තේ වෙනත් ළමයකු බව හෙළි වෙයි. ඉන් පසු තරුණිය ළමයා සෙවීමට උත්සාහ ගනියි. මත්ලෝලි ගැහැනිය පවසන්නේ තමාට ළමයින් නොසිටි බවයි!

ගැහැනිය ගැන පොලීසියට පැමිණිලි කොට, ළමයා තම භාරයට ගෙන හදා වඩා ගැනීමට තිබුණා නොවේ දැයි තරුණිය පසුතැවිලි වෙයි. කිසියම් මොහොතක කිලිටි ළමයා තම නිවෙසේ දොර සීනුව නාද කරනු ඇතිය, යන බලාපොරොත්තුව පමණක් තරුණියට ඉතිරි වෙයි.

බුවනෝස් අයර්ස් නගරය ආසන්න කම්කරු පන්තියේ බහුලව විසූ ජනාකීර්ණ පෙදෙස්වල ළමා කාලය ගත කළ මරියානා එන්රිකේස්ට තම අත්දැකීම් මේ කතාව ලිවීමෙහි පසුබිම් වූ බව නිසැකය. අනෙක් අතට පුවත්පත් කලාවේදිනියක වශයෙන් ඇය නිතර තම සංකීර්ණ සමාජයේ තර්ක දෙස නිරීක්ෂණාක්ෂියෙන් පසු වන්නියකි. ඉතාලියේ සිට ආජන්ටිනාවට සංක්‍රමණය වූ පවුලකට අයත් තම මිත්තණිය ද හොඳ කතා කියන්නියක බව මරියානා සඳහන් කර ඇත.

නවකතා දෙකක් ද කෙටි කතාවක් ද කෙටිකතා සංග්‍රහ දෙකක් ද පළ කර ඇති මරියානා එන්රිකේස් පැජිනා (Pagina) පුවත්පතේ කලා හා සංස්කෘතික විශේෂාංග පිළිබඳ නියෝජ්‍ය කර්තෘවරිය ද වෙයි.

තම පරපුරේ සියලු ලේඛිකාවන් බිහිව ඇත්තේ ආඥාදායක පාලන කාලයක් තුළ බව පවසන මරියානා කිසිවකුට එහි බලපෑමෙන් මිදිය නොහැකි යයි කියයි. පේරු කොලම්බියා වැනි ලතින් ඇමෙරිකානු රටවල මෙන් සිවිල් යුද්ධවල අත්දැකීම් නොලැබුවත් කලාපයේ දේශපාලන ගැටුම්වල බලපෑම තම නිර්මාණ තුළට ද පිවිසෙන බව ඇය කියයි.

"මා ලතින් අමෙරිකානු ලේඛිකාවක්. ඒ නිසා මගේ කලාපයම තමා මගේ සාහිත්‍යයේ පිළිබිඹු වන්නේ. එහෙත් සන්ත්‍රාසමය ශානරයේ කතා ලිවීමට ප්‍රියකරන මා එහිදී ෂර්ලි ජැක්සන්, ස්ටෙෆාන් කින්ග්, එච්.පී. ලව් ක්‍රාෆ්ට් වැනි ගත්කතුවරුන් ගේ ආභාසය ලැබුවා."

මගේ දැනීමේ හැටියට මරියානාගේ කෘතීන් හෝ කෙටිකතාවක් හෝ මෙතෙක් සිංහලට නැඟී නැත. ඇය දැන් බුකර් සම්මාන නිර්දේශිත කෙටිකතා කාරියක නිසා මේ එයට සුදුසුම කාලයයි.

කිලිටි ළමයා කතාව මුලින්ම පළ වූයේ 'මැක්ස්වීනිස් 46' නමැති සඟරාවක ය. එහි ලතින් අමෙරිකානු විශේෂ කලාපය සඳහා අපරාධ තේමාවේ (crime) කෙටිකතා එවන ලෙස ඒ රටවල ලේඛක ලේඛිකාවන් දහතුන් දෙනෙකුට ආරාධනා කෙරිණි. එහෙත් ලැබුණු නිර්මාණ බහුතරයක් ගැන කර්තෘ මණ්ඩලය සතුටට පත් වූයේ නැත. සඟරාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ ඩැනියෙල් ගම්බර් තෝරාගත් කෙටිකතා කිහිපයක් රැගෙන ගියේ ගෙදර යන අතර දුම්රියේදී කියවීමටය. පසුව ඔහු මෙසේ සඳහන් කළේය.

"මම මරියානා ගේ 'කිලිටි ළමයා' කතාව කියවන්න පටන් ගත්තා. එය කොතරම් තදින් මගේ සිතට වැදුණා ද කියතොත්: මම බහින දුම්රිය පොළ පහු වුණා, දැනුණේ නෑ."

**කපිල කුමාර කාලිංග**

# අර්ධද්වීපයක කඳුළු





වෙසක් මහා සුළඟ හුරුපුරුදු අපට මේ අකල් වැසි අරුමයකි. තවදුරටත් සරුංගල් සිහින නොදකින මගේ කොල්ලන් වෙසක් සුළං පතා උන්නේ දැයි නොදනිමි. ගගන සරන සරුංගලයක සාඩම්බර හිමිකරුවකු වන්නට වයස බාධාවක් නොවේ. එහෙත් තවමත් සිය මාරක හස්තයෙන් ලෝකයේ බොටුව හිර කරගෙන හිඳින කොරෝනා වසංගතය අප සියලු දෙනාගේම සිහින සැහැසි ලෙස උදුරා ගනියි. අප සියල්ලට පෙර පණ නල ගලවා ගත යුතුව තිබේ.

ඒ ඈත අතීතයේ අන්ධකාර ගිරි ලෙන මැද ගුගුරන අහස හෝ දලුලන පොළොව පිළිබඳ මෙලෝ හසරක් නොදැන බියෙන් සැකයෙන් බඩ සා නිවා ගැනීමේ ඒකායන පරමාර්ථයෙන් හෙබියා වූ අපේ මුතුන් මිත්තන් පරිද්දෙන් ම අපට ද කුටුම්බය තුළ සිරගත වන්නට සිදු වී තිබීම කවර නම් උත්ප්‍රාසයක් ද? එකම සංසිද්ධිය නැවත නැවතත් සිදු වන බව කියවේ.

කෙසේ වෙතත් හැල්මේ දිව ගිය ලෝකය මඳකට නවතා ලන්නට සොබාදහම මිනිසා මත පැමිණ වූ මේ දඬුවම කොතෙක් ක්‍රෑර ද යන වග අපේ අසල්වැසියා දිනෙන් දින මොහොතින් මොහොත අපට පමණක් නොව මුළු ලොවටම පසක් කර දෙයි. ඒ මහා ඛේදවාචකයන් සසලව ඇල දියට බට සැණින් මහ වැස්සක් ඇද හැලිණි.

"ඇළට වහින කොට කොච්චර ලස්සන ද?" කෑගසමින් ඇළ කණ්ඩියේ සිට දියට පනින්න තරම් දඟකාර කොල්ලන්ට මම තරවටු නොකළෙමි. එක් බඳු රූ සොබා දරන නිවුන්නන් කෙළිලොල් වන කල ඔවුන් උස් මහත් කර ගන්නට මා විඳි වෙහෙස සිහිපත්ව දෙනෙතට කඳුළු උනයි. නාන්නට සහ රෙදි පෙරෙදි සෝදන්න පමණක් නොව කඳුළු සලන්නට ද ඇළ තරම් කදිම තැනක් තවත් තිබිය හැකි ද?

වරෙක ඒ ලොව ප්‍රකට හාස්‍ය රංගධරයාණන් වන චාලි චැප්ලින් කී කියුමක් සිහියට නැඟෙයි:

"මම වැස්සේ ඇවිද යන්න කැමැත්තෙමි. මන්ද යත්: එවිට කිසිවකුටත් මගේ දෑසින් ගලා හැලෙන කඳුළු නොපෙනෙන බැවිනි."



හුදු හාස්‍යයෙන් රසිකයා පිනවන්න නොව; හාස්‍යයට ඔබ්බෙහි මනුෂ්‍යත්වය සහ මිනිසා පෙනෙන පීඩාවන් විදහා පාමින් ප්‍රඥාව අවදි කළ ඒ අසහාය රංගන ශිල්පියා කී පරිද්දෙන් ම මම ද ඇළට කැමැත්තෙමි.

දුඃඛ දෝමනස්සයන් සිතෙහි සිර කොට නොගෙන නෙතින් වැගිරිය යුතුය. ඒ සඳහා ඇළට වඩා සුදුසු අන් තැනක් නොවෙයි. මගේ දරුවන් දැකිය යුත්තේ මගේ සිනාවන් මිස කඳුළ නොවේ.

වැස්සේ ඇළේ පිහිනන හා එකිනෙකා හඹා යන කොල්ලන්ට හොරෙන් මා කඳුළු සලන්නේ අපේ ආදරණීය අසල්වැසියා අද මුහුණ පා සිටින ඛේදවාචකය විඳ දරා ගත නුහුණු බැවිනි.

කටියාව මහජන පුස්තකාලයෙන් මා කියවූ 'අසිරිමත් ඉන්දියාව' නම් කෘතිය මා තුළ ජනිත කළේ මෙතෙකැයි කිව නොහැකි තරමේ ඉන්දීය අනුරාගයකි. ප්‍රකට ලේඛක ඒ.ඇල්. බාෂාම්ගේ 'අසිරිමත් ඉන්දියාව' මගේ ජීවිතය වෙනස් කළ කෘති අතුරින් එකකි.

බුදු දහම ඇතුළු අනේක දෑ අපට දුන් ඉන්දියාවේ සිය ගණන් වන ජාතීන් හා ආගමිකයන් වෙතින් මා දුටු ඒ සංස්කෘතික විවිධත්වය ද විචිත්‍රත්වය ද අනෙකා ඉවසන්නට මට මහෝපකාරි වූවා නිසැකය.

කොරෝනා වසංගතයට ගොදුරුව මිය යන බහුතරයකට ඔක්සිජන් ලැබුණේ නම් එකී මරණ සංඛ්‍යාවෙන් අඩක් පමණ අඩු කර ගත හැකිව තිබුණේ යැයි මාධ්‍ය ඔස්සේ වෛද්‍යවරු පවසති.

ඔක්සිජන්!

තුරක මහිමය එයයි. හරිත පැහැය රස රහස එයයි. ඇළ ද අප ද තෙමා දමමින් ඇද හැලෙන වැස්සට මං පාදන්නේ තුරක් මිස අන් කුමක් ද?

පරිසරය නොතකා හැල්මේ දිව ගිය මිනිසා ඔක්සිජන් යැද වැලපෙන්නේ නම් අප ශිෂ්ටාචාරයේ විද්‍යාවේ හා තාක්ෂණයේ පිහිටෙන් අත්පත් කරගත් ලෝකයේ අරුතක් ඇද්ද?

අවසානයේ නිරුවත් සත්‍යය හමුවේ අප පිළිබඳ අප විළි වැද හැකිළෙමු. ඉරට, හඳට, ගසට, පොළොවට, ගඟට දණ නමස්කාර කළ අපේ ආදිතම මුතුන් මිත්තන් හෙළා දකින්න අපට තවදුරටත් නොහැකිය.

"හරි ලස්සනයි නේද අම්මේ? වැහි බින්දු වතුරට වැටෙන කොට දිලිසෙනවා!"


මගෙ බාලයා අපමණ සතුටින් කෑගැසුවේය. "මැණික් කැට වගේ..." සිවු වැන්නා ද සිය නිවුන් සොහොයුරා සමග එකඟ විය.

"වතුර බින්දුවක් වටිනවා, මැණික් ආකරයකට වඩා. ඒත් ඒක තේරුම් ගන්න කොට පරක්කුයි. ජීවිතයයි මරණයයි තීන්දු කරන්න ඔක්සිජන් සමත් වන බව අපට මෙච්චර කල් අමතක වෙලා තිබ්බා වගේ තමයි."

මම ළතැවුලෙන් කීවෙමි.

**ශාන්ති දිසානායක**

## කැදැල්ලේ නෙත



# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# රික්සෝවෙන් ඉස්කෝලෙට

## මතක පොතෙන්

පුංචි කාලෙ මතක් වෙනව මට මං ඉස්කෝලෙ ගිය. මං ඒ දවස්වල ගියේ එතකොට වැල්ලවත්තෙ තිබුණු, ඇලීතියා එකට. ඇලීතියාවට මාව දාපු දවසෙ අපෙ අම්මට හිගින්ස් මැතිණිය පොතක් දුන්නා. පොතේ නම 'වන පස මල'. අකුරු එකතු කරල කියවන්න පුළුවන් කාලෙ ඉඳල මාත් කියවනව ඒ පොත. ඕල්කොට් මහත්තයගෙ ඡායාරූපයක් තිබුණ පිටුවක් පිරෙන්නම. තව හුඟාක් ලිපි මහප්පරාණත් එක්ක. මං ඒ ඉස්කෝලෙ හිටියෙ තුන්වෙනි පන්තිය අවසාන වෙනකං විතරයි. පෞද්ගලික ඉංගිරිසි ඉස්කෝලයක් නිසා ගානත් ටිකක් සැරයි. ගෙවාගන්නත් අමාරු වෙන්නැති අපෙ අම්මලාට.

පළමු දවස් දෙක අම්ම එක්ක ඉස්කෝලේ ගියාට; ඊළඟට යන්න වුණේ රික්සෝවෙන්. රික්සෝව ඇදගෙන දිව්වෙ සුප්පයියා. මහ පාන්දර රික්සෝවෙ සැප ආසනේ මාවයි තවත් ගෑනු ළමයෙක්වයි ඉන්දවගෙන, විදුලියක් වගේ මහා වේගයෙන් දුවනව මහ වාහන අතෝරක් නැතුව යන ගාලුපාර දිගේ. දෙහිවල ඉඳං වැල්ලවත්තට; ආයෙ දවල් එකොළහෙ කණිසමට වැල්ලවත්තෙ ඉඳං දෙහිවලට. දවස් පහේම රික්සෝ අයියා, ඒ කියන්නෙ, නඩරාසා සුප්පයියා, දුවනව ඉහින් කණින් දාඩිය පෙරාගෙන. රික්සෝවත් ඇදගෙන මිනිස් අස්පයෙක් වගේ. සෙරෙප්පු දෙක එහා මෙහා වෙන හින්දා, ලේස් පටියකින් කකුල් දෙක සෙරෙප්පු දෙකට වෙලාගෙන. මහ වැස්ස ගිනියං අව්ව ගැන ගනිච්චියක් නෑ රික්සෝ අයියට. අන්තිමට අපිව අරන් ඇවිත් අපිව පරෙස්සමට බාලා තමයි විවේකයක් ගන්නෙ. බොක්සිං බැනියම; පෙඟිල උතුරන තරමට, මහ දාඩිය කන්දරාවකින් උඩුකය වැහිලා. අනේ අපෙ රික්සෝ අයිය...

දූවිල්ල එනවට අපිව රැකගන්න රික්සෝ අයියා අපි ඉඳගෙන ඉන්න සීට් එකට ඉස්සරහින් දානවා ආවරණයකුත්. යද්දි වැහි රැල්ලක්වත් වැටුණොත් දාන්නෙ ඒ ආවරණයමයි. ඒත් වැස්සටත් තෙමීගෙන දූවිල්ලත් රොද බැඳගෙන, සුප්පයියා දුවනව; පිම්මේම දුවනව. වෙලාවට ඉස්කෝලෙට අරන් යන්න අපිව.

දැනට රික්සෝවෙ බරයි අපේ බරයි අරන් අනේ දුවන දිවිල්ලක්. හති දාගෙන දුවගෙන ඇවිදින් යන්තම් කඩේ ළඟ නවත්තනව රික්සෝව. අපිවත් බස්සවනව. අපේ ගේ ළඟමයි ඉන්නෙ මං එක්කම ඉස්කෝලෙ යන මගෙ පුංචි ගමන් සගයත්. ඒ හින්දා තවත් දුරකට දුවන්න ඕන නෑ රික්සෝ අයියට.

ඊට පස්සේ ඔහු නිවී සැනසිල්ලෙම බොනව කිරි තේ වතුර එකක්. "සුම්මා තේ තන්නි වේනම්." සුප්පයියා එහෙම කියන්නෙ අතේ තියෙන කාසි ඉතුරු කරගන්න කියල දන්නව අපෙ අම්මා. "පාල් තේ තන්නි." අම්මවත් ආච්චිවත් සුප්පයියාගෙන් මේ වෙලාවට සල්ලි ගන්නෙ නෑ. රික්සෝ අයියා ඔළුවෙ බැඳගත්ත ජටා ලේන්සුවෙන් ඔළුවෙ පිරිච්ච දාඩියයි ඇඟපතේ දාඩියයි පිහදගන්නෙ සතුටු හිනාවකින්. "එත්තින මනි හාමිනේ?" ඇගේ මූණේ හිනාවක් විතරයි. සල්ලි ගන්නෙ නෑ ඔහුගෙන්. "මෙත්ත පෙරිය උපහාරම්"

පාසල් ගිහින් එන හැමදාටමත් මේ කතාබහ ගලාගෙන යනව නිස්කාන්සුවෙම.

රික්සෝවෙ මේ කුලිය හැරුණම තවත් තියෙනවා රාජකාරි ඇතිපදම් අපේ රික්සෝවෙ අයියට.

රික්සෝ අයියා රික්සෝව ගාල් කරන්නෙ පට්ටිය වත්තෙ. එතැන කරදරයක් නෑ කාටවත්ම. රොද්‍රිගෝ මහත්තයමයි අවසර දුන්නෙ සුප්පයියට පට්ටියෙ ගෙදර ඉඩක් සෙවනකට.

රික්සෝ අයියා, ඇවිත් තියෙන්නෙ දකුණු ඉන්දියාවෙ ඉඳල කියලයි අපෙ අම්මල කියන්නෙ. ඒ ඇවිත් තියෙන්නෙ පීනගෙනලු. කඩේට යන එන අය ඔහුට කියන්නෙ 'කල්ලතෝනියා' කියල. මහා සාගරය පීනගෙන එන අයට වෙන්නැති එහෙම කියනව ඇත්තෙ කියලයි පුංචි මට හිතුණෙ. නැවෙන්, අහසෙන් එන අයට විතරක් කියනව ඇති සුද්දො කියල. ඒදවස්සල මට හිතුණෙ එහෙමයි. රික්සෝ අයිය අපේ සිංහල කැඩිකැඩී කතා කරද්දි, හරි අපූරුයි අහන් ඉන්න! අම්මලට හොඳට දෙමළ කතා කරන්න පුළුවන් හින්දා රික්සෝ අයියගෙ වචන උච්චාරණය ගැන ඒ හැටි වග විභාගයක් නම් වුණේම නෑ. කීර කොටුවෙ උන්න වැන්දඹු 'කන්දයියා අම්මගෙ' ගෙදරට යන්න එන්න පටන් ගත්තට පස්සෙ ඔහු එහේම බින්න බැස්ස. ඒක එහෙම වෙච්ච එක කොච්චර හොඳ ද?

කාලය චුට්ට චුට්ට ඉගිල්ලෙනව සුප්පයියාට ඉස්සර වගේම කුලී දුවන්න, කකුල්වලින් අශ්වයා වගෙ පියාඹන්න, ගාලුපාරෙ ඉඩකඩ හම්බු වෙනව. කකුල් දෙකට පින්සිද්ධ වෙන්න හම්බ වෙන කුලියෙන් මලියෙන් තමයි උන්දෑ ජීවිතේ ගැට ගහගන්නෙ. ඒත් මහ මොකද්දෝ අන්ධකාර කලදවසක් උදා වුණා රටටම වගේ.

පාටට, ජාතියට, භාෂාවට එදිරිවාදිව රටම කැලඹෙන්න ගත්තෙ උන්හිටිගමන්. වෙල්වනායගම් මහත්තය දෙමළ ජාතිය වෙනුවෙන් කෑගහනව එක පැත්තකින්. සිංහල අය සඟ, වෙද, ගුරු පරපුරේ උදවිය එයාලගෙ අයිතිවාසිකම් උදෙසා සටන් වැදෙනව තවත් පැත්තකින්. ගරුතර සංඝ රත්නයත් බුදුන් වහන්සේගෙ දේශනා පතුරවනවා රට සන්සුන් කරන්න.

ඒත් අපේ අය ලේ කෝපයෙන් උරණ වෙලා වගේ. ජාති ආලයෙන් ඔද වැඩිලා... කැති පොලු මුගුරු අරන් සටනට වැදිලා... වාහනවල ශ්‍රී සටහන් කරන්නටයි පොරකන්නෙ.

නිසංසල සාමකාමී සුන්දර ජීවිත රටාව මුළුමනින්ම ඉරිතළලා. එකට බැඳුණු ආදරණීය මිනිස් ප්‍රජාව නන්නත්තාර වෙලා වගේ. රටම කොහේවත් නැති ලේ පිපාසාවකින් ආතුර වෙල වගේ.

කැති ගහන්න බලාගෙන දුවන් එනවා. පාටින් විතරක් වෙනස් වුණු තවත් මනුස්ස කැලතක් හොයාගෙන.

හයර් යන්න වාහනයක් හොයාගන්න බැරි වුණු දවසක, කොළඹ මහ ඉස්පිරිතාලෙටම එක පිම්මේම ඉගිළුණ සුප්පය්යා නිසා දරුපැටියකුයි අම්මෙකුයි බේරගන්න පුළුවන් වුණ හැටි එදත් කතා වුණා ගමේ අය. ඒ වුණාට ඒ ඔක්කෝම, කලකෝලාහල මැද්දෙ කාට කාටත් අමතකයි වගේ.

"කෝ... කෝ... අර කල්ලතෝනියා හාමිනේ, කොහෙද ඌ?"

මිනිස්සු වෛරයෙන් ඔත්පළ වෙලා. උන්මාද වෙලා. අහිංසකම අහිංසක මනුස්සයෙක්ව හොයනව කැති ගාන්න.

රික්සෝ අයියා හැංගුණේ අපේ වත්ත පිටි පස්සෙ උස පොල් ගහට නැගලා. මිනිස්සුන්ට සැක හිතිලා ආව අපේ වත්ත පිටිපස්සටත්. කවුරුවත් හිටියෙ නෑ පේන්න. අම්මා ජාති ආලයෙන් පිරිච්ච සේනාවට ඇඹුල් ඇතුව දේශනා කරල පන්න ගත්තා වත්තෙන්. ඒත් උන් එතනිං නැවතුණේ නෑ. හොයාගෙන හොයාගෙන ගිහින් පට්ටිය වත්තෙ ගාල් කරපු රික්සෝවට භූමිතෙල් දාල ගිනි තිබ්බා. "අනේ ඒ මනුස්සය හරි හම්බු කරන් කාපු එක නේද මේ නොසණ්ඩාලයො ගිනි තිබ්බෙ!" ආච්චිලා අම්මලා නොසෑහෙන්න දෙස් දෙවොල් තිබ්බා; ජාති ආලෙන් පිරුණ සේනාවට. එහෙව් එකේ සුප්පයියගෙ ජීවිතේ ඔහොම බේරිච්ච එකයි වටින්නෙ, වෙන මොකුත් ආපදාවක්ම නොවී. අපේ ගෙදර කවුරුත් වගෙ හිත හදා ගත්තෙ එහෙම හිතල.

හෙමින් සීරුවෙ ගහෙන් බැහැල ගෙයි පිළිකන්නට ආපු රික්සෝ අයියට රාත්‍රි එකට දෙකට විතර කෑම වේල දුන්නෙ අපේ ගෙදරින්.

තවත් කාලයක්ම ගියා රටම සන්සුන් වෙන්න. පස්සෙ පස්සෙ ඒ සන්සුන් බවත් එක්කම තමන් අතින්ම වුණු වැරැද්ද ගැන හිතිල හැමෝම එකතු වෙල සුප්පයියට අලුත් රික්සෝවක් අරන් දුන්නා රස්සාව කරගෙන යන්න. අපේ ආච්චිලා, මාමලා, අම්මලා ඔක්කෝම වගෙ ඒ පින්කමට හොඳටෝම දායක වුණා.

**ලක්ෂ්මී බෝම්බුවල**





# සුදෝ මගේ එන්න අනේ හායි හායි හායි

# ප්‍රේම තටාකයෙන් ඇසුණු සිනමා ගීතාවලිය



විකසිත රෑ හතට මා තේරූ ගී හත පිළිබඳවත් මා සමග පිළිසඳරේ යෙදුණු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉනූෂා වීබැද්ද සොහොයුරිය ගැනත් පසුගිය සතියේ ලියවුණු මතක සටහන කියවා තිබූ සහෘදයෙක් මගෙන් ප්‍රශ්නයක් අහනවා.

"ඇයි පහුගිය දවසක ලක්හඬ ප්‍රේම තටාකයේ මොනිකා සේරසිංහ සමග පරණ චිත්‍රපට සින්දු ගැන කළ වැඩසටහන ගැන මොකුත් නොලියන්නෙ?"

ඇත්ත නේන්නම්. ප්‍රේම තටාකය අද්දරදී අපේ සිනමාවෙ පළමුවැනි දශකයෙ තිරගත වුණු චිත්‍රපට අතරින් තෝරා ගත් ගීත දහහතරක් ගැන මොනිකා මා සමග කතාබහට එකතු වුණේ ගුවන් විදුලියෙ ඉනූෂා වගේම ඉතා හොඳ පෙර සූදානම්කින් හා කියවීමකින් පසුව බවයි මට හැඟුණෙ. ලක් හඬ ගුවන්විදුලියෙන් ප්‍රචාරය කෙරෙන ප්‍රේම තටාකය වැඩ සටහනට ආරාධිතයා විසින් තෝරා දිය යුත්තෙ ප්‍රේමය විෂය කොට ගත් ගීත වීම විශේෂත්වයක්. මීට පෙර අවස්ථා දෙකක දීම මොනිකාගෙන් ලද ඇරියුමට අනුව ඉතා අපහසුවෙන් ප්‍රේම ගීත රාශියක්ම තෝරා දුන් බව මතකයි. පහුගිය අවුරුද්දෙ මැද ඉඳල වගේ මොනිකා සැලසුම් කරල ඉදිරිපත් කරන ප්‍රේම තටාකය සතියෙ දවස් පහකම ලක් හඬින් ප්‍රචාරය වන අසන්නන් ප්‍රිය කරන වැඩසටහනක්. මීට පෙර අවස්ථා දෙකකදී පමණ ප්‍රේමණීය ගීත සමග මොනිකා හා කතා බහ කොට තිබුණත් පසුගිය දිනෙක යළි ගීත තෝරා දෙන්නැයි ඉල්ලීමක් කළ මොහොතේ මා මොනිකාට යෝජනා කළේ අපි මේ වතාවෙ චිත්‍රපට ගීත පමණක් තෝරමු කියලයි. ඒ චිත්‍රපට ගීතත් අපේ සිනමාවෙ පළමු දශකයෙ (1947-1956) තිරගත වුණු චිත්‍රපටවලින් පමණක් තෝරා ගමු යයි මා කළ යෝජනාවට මොනිකා එකඟ වුණේ පසු වැඩසටහනක දී චිත්‍රපට ගීතයේ විකාශය පිළිබඳ ඉතිරි දශක කීපයක ගීත ගැන කතාබහකට ඉඩ වෙන් කරගන්න හිතල වගේ.

මේ දශකයේ තිරගත වූ චිත්‍රපට බහුතරයක් ඉන්දියාවේදී රූපගත වීම හා ඉන්දීය අධ්‍යක්ෂවරුන්ගේ චිත්‍රපට වීමත් කැපී පෙනෙනවා. මේ සමයේ සිනමාව කලාවකට වඩා හුදු ව්‍යාපාරයක් ලෙස සැලකූ බව පෙනෙන්ට තියෙනව. දේශීය සිනමාවක කලාත්මක ඇරඹුම 1956 රේඛාව සමග සිදු වූ බව කිව යුත්තක් නොවේ. චිත්‍රපට පුරා ද්‍රවිඩ හා හින්දි ආභාසය නොඅඩුව තිබුණා වගේම චිත්‍රපටවලට නැතුවම බැරි වූ ගීත තුළ ද හින්දි හා ද්‍රවිඩ තනු, හා අනුකරණාත්මක සංගීතයද ඇතුළත්ව තිබුණා. මේ අවාසනාවන්ත තත්ත්වය තුළ ස්වතන්ත්‍ර ගීත සාහිත්‍යයක් බිහි වීම වෙනුවට ප්‍රබන්ධකයන්ට සිදු වුණේ ඔවුන්ට දෙනු ලැබූ හින්දි හෝ ද්‍රවිඩ ගී තනුවකට වචන එබ්බවීම පමණයි. ඒ වුණත් අසෝකමාලා, සැඟවුණ පිළිතුර, එදා රෑ චිත්‍රපට සඳහා මොහමඩ් ගවුස් ද, අහංකාර ස්ත්‍රී හා මාතලන් සඳහා ආර්. මුත්තුසාමි ද ස්වතන්ත්‍ර ගී තනු නිර්මාණය කළ බව අප දන්නවා. මේ සටහනෙහි ශීර්ෂය අදාළ දශකයේ චිත්‍රපට ගීත සාහිත්‍යය පිළිබඳ ඉඟියක් සැපයෙන ගීත ඛණ්ඩයක්. සිංහල සිනමා වංශ කතාවේ පස්වන චිත්‍රපටය ලෙස 1948 දී තිරගත වූ වැරදුණු කුරුමාණමෙහි මේ ප්‍රේම ගීතය ගයන්නී එවකට නිළි රජින ලෙස විරුදාවලී ලත් ගායිකා රුක්මණී දේවි. ජීවන්ලාල් නන්දන කීර්තිගේ ගේය කාව්‍ය සංකල්පනාව සී.එන්. පාණ්ඩුරංගන් (ඉන්දීය ජාතික ) සමග බී.එස්. පෙරේරා (ශ්‍රී ලාංකික) විසින් සංගීතවත් කරනවා.

**මෝරනවා ප්‍රේමේ හදේ**
**නිලම්බරේ තාරපති සේ හායි හායි හා**
**චන්ද්‍රා මගේ, මා ඔබගේ - ශ්‍රීමතී චන්ද්‍රා මගේ**
**නාඹර මා විනොද හදවතේ**
**බබලනවා ශ්‍රියාව ඇඳි ඔබේ**
**සුදෝ මගේ එන්න අනේ - හායි හායි හා**
**සීනෙන් පෙනේ**
**රූපෙ ඔබේ රාත්‍රියේ චන්ද්‍රා මගේ**

හදවතේ ප්‍රේමය මෝරයි. කෙසේ ද යත් නිල් අහසේ පැයූ චන්ද්‍රයා ලෙසය. එය අපට වැටහේ. එහෙත් හායි හායි කියන්නේ කුමකට ද? ඇගේ හදවත නාඹරය. විනෝදය. නාඹර හදවත්, විනෝද හදවත් ඇත්තේ කොහිද? අනේ මගේ සුදෝ එන්න හායි හායි. ඇගේ සිතෙහි ප්‍රේමයට අධිපති දෙවි රජා ඔබ ද සුදෝ? ප්‍රේම ජලය ඇත්තේ රන් කොතලේය. එය ඔබට පූජාකරමි.

හායි හායි කියනා පෙම්වතියන්, නාඹර, විනෝද හදවත් ඇත්තියන්, ප්‍රේමයට අධිපති දෙවි රජාට සුදා කියමින් අමතන පෙම්වතියන් අපගේ මුල් කාලීන චිත්‍රපට ගීත සාහිත්‍යය තුළ හමු වූ බව සිහිපත් කළා. ප්‍රේමණීය ඇමතුමක් මෙහි කොතැනක හෝ වේ ද?

පැරැණි චිත්‍රපට ප්‍රේම ගීතාවලිය වර්ණවත් කළ මොහමඩ් ගවුස් සංගීතඥයාගේ ස්වතන්ත්‍ර තනුවකට ඩී.ටී. ප්‍රනාන්දු රචකයා ලියූ අසෝකමාලා චිත්‍රපටයේ මේ ගීතයෙන් මගේ තෝරාගැනීම ඇරඹුණේ. ස්වතන්ත්‍ර තනුව මෙන්ම ගේය පද රචනය ද කලාත්මකයි. ඉන්දීය ගායිකා භාග්‍යරතී විසින් ගායනා කළ ද ගීත සංකල්පනාව අපූරුය. සංකල්ප රූප සහිතයි. විචිත්‍රයි.



**ශාන්ත මේ රාත්‍රියේ**
**චන්ද්‍රාකාන්ති දේ ආලෝකේ**
**ආයේ ආයේ සිත ප්‍රබෝධ වේ**
**සිසිල ආවෙ ප්‍රීතිය මෝරා**
**යෞවන ප්‍රේමේ සදා**
**හා... ආ... කුමුදුනී නැග තරංග සිනා**
**ආයේ ආයේ සිත ප්‍රබෝධ වේ**
**ශාන්ත මේ රාත්‍රියේ**

මෙබඳු ගීතයක් ඉඳ හිට හමු වූවත් මේ දශකය පුරා (1947-1956) තිරගත වී ඇති චිත්‍රපට 39ට ඇතුළත් වූ හාරසියයකට අධික ගීත සංඛ්‍යාවෙන් බහුතර ප්‍රේම ගීත රචනා සාහිත්‍යයික ගුණයෙන් හීන ඕළාරික ප්‍රේම යාදිනි ස්වරූපයේ බොළඳ රචනා. අත්දැකීම් වශයෙන් හෝ අපූර්ව ගුණයෙන්, කාව්‍යාත්මක බසකින් රචනා වූ ගීතයක් හමු වුණි නම් ඉතා කලාතුරකින්.

ප්‍රේමය විෂයය කොට ගත් විනෝදාත්මක ගීතයක් ද මගේ තෝරාගැනීමට එක් වූයේ එදවස ගීත වට්ටෝරුවට ඇතුළත් වූ ජොසී මනප්පු වැනි චරිත සඳහා ලියවුණු ගීතයක් ලෙසයි. වැරදුණු කුරුමානම චිත්‍රපටයේ ජොසී මනප්පු වෙනුවට බබයියා හා මෙරායා ලෙස මේ යුග ගීතය ගැයුවේ එඩී ජයමාන්න හා ජෙමිණි කාන්තාය.

**පායන සඳ වට කර තරුව වගේ මූණ පෙනේ දිලිසෙන ආලේ**
**ආදර බඹර කෝකිල ගමන නිසා හිත වැටුණා ඔබෙ හොඳ කාලේ**
**තාලෙට අඩිය තියමු පම් පම් ගා ෂෝක් එකේ**
**බැඳල කසාදේ**
**ඒ දැක ගැහැනු පිරිමි අපේ දිහා රවා බලයි**
**මගෙ සුදු මැණිකේ**
**සෝබන ළපටි කෙහෙල් දල්ල වගේ ගෙයි මුල්ලේ**
**ගැහැනු හැදෙන්නේ**
**ඒ දුටු කපටි පිරිමි අප රවටා මහ පාරේ**
**සිගා යවන්නේ**
**මේබව නොදැන ලොවේ අපරාදේ ගෑනුන්ටයි**
**වැරදි කියන්නේ**
**මා පැණි වරක මදුල ටිකිරි සුදා ඔබ නැහැනේ**
**එහෙම කරන්නේ**

තාලෙට අඩිය තියමු පම් පම් ගා ෂෝක් එකේ බැඳල කසාදේ, සෝබන ළපටි කෙහෙල් දල්ල, මා පැණි වරක මදුල ටිකිරි සුදා වැනි වදන්වල ශබ්ද ධ්වනියට එහා ගිය අරුතක් ජනනය වෙන්නෙ නෑ.





ප්‍රේම තටාකයට මවිසින් තෝරා දුන් පැරණි චිත්‍රපට ප්‍රේම ගීත අතර අද දක්වාම අතිශය ජනප්‍රිය ගී රැසක් තිබුණා. ඒවායේ අරුත නොව ගායනය, තනුව, සංගීත නිර්මාණය හේතුකොට ගෙන රසික මතකයෙන් ඇත් නොවූ ගීත කිහිපයක් ලෙස හඳුන්වා දුන්නා. මෙම ගීත සඳහා පසුබිමින් තිරයේ දිස්වුණු නළු නිළි ජවනිකා බොහෝ ප්‍රේක්ෂකයන්ගේ මතකයෙන් ඇත්ව ගොස් නැති බව කියන්නට පුළුවන්. ඒ කාලයේ ජනප්‍රිය තාරකා වුණු රුක්මණී දේවී, ශාන්ති ලේඛා, ෆ්ලොරිඩා ජයලත්, ක්ලැරිස් ද සිල්වා, ඩොමී ජයවර්ධන, හර්බි සෙනෙවිරත්න, හර්බට් එම්. සෙනෙවිරත්න, ස්ටැන්ලි පෙරේරා, ප්‍රේම් ජයන්ත්, එඩී ජයමාන්න, ශර්ලි බලයිත්, මේබල් බලයිත්, හියුගෝ ප්‍රනාන්දු, මාක් සමරනායක, රීටා රත්නායක, අරුණ ශාන්ති, ආනන්ද ජයරත්න, රවීන්ද්‍ර රූපසේන, ලීනා ද සිල්වා, සිරිමතී රසාදරී, ශර්ලි ගුණවර්ධන ආදීන්ගේ රඟපෑම්වලට ප්‍රේක්ෂකයන් ආදරය කළ බව සිහිපත් කළා. මේ අය වෙනුවෙන් පසුබිමින් ගීත ගායනා කළ නිළි ගායිකා රුක්මණී දේවී, ලතා වල්පොල, ධර්මදාස වල්පොල, ජී.එස්.බී. රාණි පෙරේරා, මොහිදීන් බෙග්, අමරදේව, එච්.ආර්. ජෝතිපාල, සුසිල් ප්‍රේමරත්න, හරුන් ලන්ත්‍රා, සිසිර සේනාරත්න, කේ.රාණි, ජමුනාරාණි, ඉන්ද්‍රානි විජේබණ්ඩාර ආදී ගායක ගායිකාවන් ගායනා කළේ හින්දි තනුවක් ද ද්‍රවිඩ තනුවක් ද යන්න නරඹන්නන්ට, ශ්‍රාවකයන්ට ප්‍රශ්නයක් වුණේ නෑ. ඔවුන් මේ ගායක ගායිකාවන්ට ආදරය කළා. අද දක්වාම ජනප්‍රිය වී ඇති ගීත කීපයක් ප්‍රේම තටාකයේ මොනිකාගේ කතාබහට මා යොමු කළා.

ප්‍රේම තටාකය අද්දර දී ලක් හඬ ශ්‍රාවකයන් වෙනුවෙන් මා තෝරා ගත් මේ චිත්‍රපට ගීතවලට ආසා නොකරන රසිකයෙක් ඇති කියල මට හිතන්න බෑ. සමහර මුල් ගීත වෙනුවට අලුත් ගායක ගායිකාවො ගායනා කළ ගීත වුණත් අහන්න අපි ආසයි. ඉෂාක් බෙග්, සමිතා, උරේෂා, දම්මිකා, වගේ අලුත් පරම්පරාවෙ කීප දෙනෙක්ම මේ ගීත අපේ මතකයෙන් ඈත් කරන්නෙ නෑ. ඕලු මලේහි සුදෝ සුදෝ, පෙම් ලෝක රාජිණී, හොඳ හොඳම වේය,

## වෑද්වස සොඳුරුමය

මැවිලා පෙනේවි රූපේ, මගේය ප්‍රේම මාලිනී, පෙම් රැල්ල නගී, ජීවන මේ ගමන සංසාරේ, ආදර නදිය ගලා, සිරිය මෙ සාරා, ඕලු නෙළුම් නෙරිය රඟාලා තමයි මගේ අනෙක් ප්‍රේමණීය චිත්‍රපට ගීත. සුජාතා චිත්‍රපටයෙ ඩොමී ජයවර්ධන එක්ක ශාන්ති ලේඛා රඟපාපු දර්ශනය මම මතක් කළා. පෙම් රැල්ල නගී ගල් තැල්ලෙ වදී කියන ගීතය එක්ක. ප්‍රේම ජයන්ත් ෆ්ලොරිඩා සැඩ සුළං ජවනිකාව මතක් කළා.

රේඛාවෙ ආනන්ද වීරකෝන්ට සිසිර සේනාරත්න ඕලු නෙළුම් නෙරිය රඟාලා ගායනා කළ රූප රාමුව. එච්.ආර්.ජෝතිපාල චිත්‍රපට පසුබිම් ගායකයෙක් විදියට අප හඳුනාගත්ත සුරතලී චිත්‍රපටයෙ ආනන්ද ජයරත්න සිරියමෙ සාරා කියමින් රඟ පෑ දර්ශනය. අපේ මතකයෙ තියෙන මේ ගීත බොහොමයක් එක්ක ඒ චිත්‍රපට ජවනිකාවල රඟ පෑ නළු නිළියන් මතක් වෙනවා. කැලෑහඳේ ස්ටැන්ලි පෙරේරා (ජෝන් ජයපාල) රුක්මණී දේවී (මාලිනී) මගේය ප්‍රේම මාලිනී වෙනුවෙන් මොහිදීන් බෙග් රුක්මණී ගායනා කළ යුග ගීතය, අමතක වෙන්නෙ කොහොම ද; එදා චිත්‍රපටය බලපු වැඩිහිටි සිනමා ලෝලියෙකුට?

**මගේය ප්‍රේම මාලිනී**
**ඔබේය මාව රාජිණී**
**අගේ වූ ස්ත්‍රී රත්නෙකී**
**සොබා දහම් මැවූ දයා**

මේ ප්‍රේම ගීතයෙහි නැත්තේම ප්‍රේමයේ සුකුමාරත්වය, චමත්කාරය නොවෙද? කුලේ, ධනේ, බලේ, ස්ත්‍රී රත්නෙකී, වැනි වදන්වලින් මතුකෙරෙන ප්‍රේමණීය හැඟීමක් ඇද්ද කියා අසන්නට සිදුවෙනවා. සිංහල සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යය රේඛාව වුණා වගේම මේ දශකයේ සිනමා ගීතයෙත් කඩඉමක් සටහන් කළ ගීත රේඛාවේ තිබුණා. සුනිල් සාන්තගෙ ස්වතන්ත්‍ර තනු, බී.එස්. පෙරේරගෙ සංගීත සංයෝජනය, අධ්‍යක්ෂණය හා පසුබිම් සංගීතය වගේම මර්සලින් ජයකොඩි පියනමගේ ගේය කාව්‍ය කල්පනාත් සිනමාවෙ මුල් දශකයෙ අග භාගයෙදි චිත්‍රපට ගීතයේ නැවුම් මුහුණුවර සටහන් කළ බව මතක් කළා.

**ඕළු නෙළුම් නෙරිය රඟාලා**
**කිකිණි හඬන වලා නගාලා**
**ගඟුල් තොටිල්ලේ - මල් ඇතිරිල්ලේ**
**මගේ කුඩා ඔරුව හබල් ගා**
**යමු නැළැවිල්ලේ - නැළැවිල්ලේ**
**ඇදී ඇදී යන්නෑ නදී රිදී තොටිල්ලේ**

චිත්‍රපට ගීතයකින් නැවුම් මිහිරක් ආස්වාදයක් ලද්දේ රේඛාවේ ගීත ලියූ මර්සලීන් ජයකොඩි පියනමගේ ගීතවත් ගේය සංකල්පනාවලින් බව යළි යළිත් කිව යුතු නෑ. ගීත සංකල්පනා වගේම ගී තනු, සංගීතය මේ දශකයේ සිංහල සිනමා ගීතය වෙනස් කළා.

මොනිකා සේරසිංහ වගේ නිවේදිකාවක, නිෂ්පාදිකාවක සමග ප්‍රේම තටාකය අද්දර ඉඳගෙන ගී තෝරා රස විඳින්නට ලැබීම ආස්වාදජනක අත්දැකීමක්. මගේ තේරීම් අතරට ඇ එකතු කරන ඌන පූරණ අර්ථවත්. වැඩ සටහනට එළියක් එකතු කරන්නක්.

**බුද්ධදාස ගලප්පත්ති**

# සමනල කන්දේ සිට ත්‍රිකුණාමලය දක්වා මහවැලි ගඟේ ඉවුරු දෙපස පැළ 167,500ක් සිටුවනවා

## ඇමැති මහින්ද අමරවීර

මහවැලි ගඟ ආරම්භ වන සමනල කන්දේ සිට ත්‍රිකුණාමලය දක්වා කිලෝමීටර් 335ක මහවැලි ගඟේ ඉවුරු දෙපස පැළ 167,500ක් රෝපණය කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසීය.

ගං ඉවුරු ඛාදනය වැළැක්වීම මෙන්ම ගං ඉවුරුවල සංරක්ෂණ කලාප නම් කිරීමේ වැඩ පිළිවෙළෙහි පළමු පියවර වශයෙන් රෝපණය කෙරෙන මෙම පැළවලින් 80%ක් කුඹුක් පැළ වන අතර 20%ක් උණ පැළ බව අමාත්‍යවරයා සඳහන් කළේය.

අමාත්‍ය මහින්ද අමරවීර මහතා මෙසේ පැවසුවේ ඊයේ (6) මහවැලි ගංගාවේ ඉවුරු ඛාදනය වැළැක්වීම සඳහා ගං ඉවුරු දෙපස උණ පැළ හා කුඹුක් පැළ රෝපණය කිරීමේ වැඩ සටහන ආරම්භ කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය හා ටෝකියෝ සිමෙන්ති සමාගම එක්ව අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමෙන් අනතුරුවය.

පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා සහ ටෝකියෝ සිමෙන්ති සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ආර්. එස්. ඥානම් මහතා ඊට අත්සන් තැබූ අතර එම අවස්ථාවට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පාලන ආර්. ඒ. ආර්. රූපසිංහ මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.

මෙහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද කීවේය.

කිලෝමීටර් 335ක් දිග ලංකාවේ දිගම ගංගාව වන මහවැලි ගංගා ද්‍රෝණියම ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට උණ පැළ හා කුඹුක් පැළ



රෝපණය කිරීමේ දැවැන්ත ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගතවීම අද සිදු කළා. මේ සඳහා පූර්ණ අනුග්‍රහය දක්වන්නේ අපේ රටේ දශක කිහිපයක සිට ව්‍යාපාරික කටයුතු කරන කීර්තිමත් ආයතනයක් වන ටෝකියෝ සිමෙන්ති සමාගමයි.

එහි කළමනාකාර අධ්‍යක්ෂ එස්. ආර්. ඥානම් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට පළමුව මගේ ස්තුතිය පළ කරනවා. ජනාධිපතිතුමන් පසුගිය සතියේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර තිබෙන්නේ, ගංගාධාර සංරක්ෂණය සඳහා කුඹුක් පැළ හා මී පැළ වැනි රුක්රෝපණ කටයුතු ආරම්භ කරන කියායි. මේ අනුව ගංඉවුරු ඛාදනය වැළැක්වීම මෙන්ම ගං ඉවුරුවල සංරක්ෂණ කලාප නම් කිරීමේ වැඩ පිළිවෙළක් අප ක්‍රියාත්මක කරනවා. මහවැලි ගඟේ සමස්ත ගං ද්‍රෝණිය වර්ග කිලෝමීටර් 10,448ක්. අපේ රටේ දැවැන්තම වාරි ව්‍යාපෘති හා කෘෂිකාර්මික කලාප මහවැලි ගංගා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකයි.

# උතුරු නැඟෙනහිර සංචාරයකට එන්න

## දෙමළ ජාතික සන්ධානය තමිල්නාඩු නව මහ ඇමැතිට කියයි

**උතුරු පළාත් විශේෂ- රසුල දිල්හාර ගමගේ**



ඉන්දියාවේ තමිල්නාඩුවේ නව මහ ඇමැතිවරයා වශයෙන් දිවුරුම් දුන් ඩී.එම්.කේ. පක්ෂයේ නායක එම්.කේ. ස්ටාර්ලින් මහතාට උතුරේ සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් සුබ පැතුම් යවා ඇති අතර, දෙමළ ජාතික සන්ධානය ඔහුට උතුරු - නැඟෙනහිර පළාත්වල සංචාරයකටද ආරාධනා කර තිබේ.

දෙමළ ජාතික සන්ධානය වෙනුවෙන් සුබ පැතුම් එක් කරණ මාවෙයි සේනාධිරාජා හිටපු මන්ත්‍රීවරයා ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නය විසඳීමට මැදිහත් වෙන්නැයි ඉල්ලා ඇත.

දෙමළ ජාතික සන්ධානයේම වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වම් අඩෛයිකලනාදන් මහතා යැවූ සුබ පැතුමේ සඳහන් කර ඇත්තේ මුළු ලෝකයේම දෙමළ නායකයා වීමට හැකියාව ඇති නිසා ස්ටාර්ලින් යන නාමය ඒ ස්ථානයට රැගෙන ඒමට උත්සාහ කරන ලෙසයි.

දෙමළ ජාතික සන්ධානයේ සෙසු දේශපාලනඥයෝද වෙන් වෙන් වශයෙන් ස්ටාර්ලින් නව මහ ඇමතිවරයාට සුබ පතා තිබේ.

දෙමළ ජනතා සන්ධානයේ නායක සී.වී. විග්නේස්වරන් මහතාද, ඊ.පී.ආර්.එල්.එෆ්. නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා ද, ප්ලොට් නායක ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතාද හා තවත් කීප දෙනෙකුද සුබ පතුම් එක්කොට තිබේ.

ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මහතාද නව මහ ඇමැතිවරයාට සුබපැතුම් යවා ඇති අතර, එය ඉතා සුවිශේෂ කාරණයක් වන්නේ අමාත්‍යවරයා සමඟ ඉන්දියාව දැඩි ලෙස විරසක වී සිටීම හේතුවෙනි.

# ආණ්ඩුවේ අකාර්යක්ෂම වැඩපිළිවෙළින් ජනතාව අතර සැක - බිය මතු වෙලා

## පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි

**පහන් විජේසේකර**



ආණ්ඩුවේ අකාර්යක්ෂම වැඩපිළිවෙළ නිසා ජනතාවට බියෙන් හා අවිශ්වාසයෙන් ජීවත් වීමේ තත්ත්වයක් උදා වී ඇති බව සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මහතා පැවසීය.

කොරෝනා මර්දනය සම්බන්ධයෙන් ආණ්ඩුව විවිධ ක්‍රියාමාර්ග ගත්ත ද, ඉන් ජනතාව බේරා ගැනීමට ආණ්ඩුවට ඇති වුවමනාව ක්‍රමයෙන් අඩු වන බව විපක්ෂනායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට එක් වෙමින් මන්ත්‍රීවරයා කීවේය.

නිසි පරීක්ෂාවකින් තොරව පැණියක් හඳුන්වා දී භයානක තත්ත්වයක් ඇති වීම සම්බන්ධයෙන් කමිටුවක් පත් කර විමර්ශනයක් කළ යුතු බව ද හෙතෙම පෙන්වා දුන්නේය.

# කොවිඩ්වලින් රට මුදා ගන්න යෞවන සමාජ ව්‍යාපාරයේ තරුණ පිරිස යොදා ගන්නවා

## ඇමැති නාමල් රාජපක්ෂ

**ටී.කේ. මහින්ද - වැලිගම සමූහ**



කොවිඩ් ව්‍යවසනයෙන් රට මුදා ගන්න යෞවන සමාජ ව්‍යාපාරයේ තරුණ, තරුණියන් එක් කර ගනිමින් ඇඳන් දසදහසක් හා ඔක්සිජන් ලබා දීමේ මධ්‍යස්ථාන 13ක් රට පුරා ආරම්භ කිරීමට ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ කඩිනමින් පියවර ගන්නා බව තරුණ කටයුතු, ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය එක්ව 'හුස්ම යදින මිනිසුන් වෙනුවෙන් තාරුණ්‍යයේ දායකත්වය ලබා දෙමු' යන්න තේමා කර ගනිමින් ඇඳන් සකස් කිරීමේ ක්‍රියාන්විතයේ මාතර වැඩසටහන නිරීක්ෂණය කිරීමට ( 9) වැලිගම ප්‍රදේශයේ චාරිකාවකට එක් වීමෙන් අනතුරුව, මාධ්‍යවේදීන් නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් තව දුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පැවසීය.

තාවකාලික ගොඩැනැගිලි යොදා ගනිමින් මෙම ක්‍රියාන්විතය ආරම්භ කරනවා. ස්වේච්ඡාවෙන් කටයුතු කරන තරුණයන් මේ ව්‍යවසනයෙන් රට මුදා ගන්න කටයුතු කරනවා. වගකිව යුතු පුරවැසියන් ලෙසත් අප වගකීමෙන් කටයුතු කළ යුතුයි. යෞවන සමාජ ව්‍යාපාරය, වෘත්තීය සමිති හා පොදුජන පෙරමුණ ඇඳන් දස දහසක් හැදීමේ වැඩපිළිවළ ක්‍රියාත්මක කරනවා. දින හතරක් තුළ මෙය අවසන් කිරීම අපේ බලාපොරොත්තුවයි. මේ වන විට සකස් කළ ඇඳන් යොමු කිරීමේ කටයුතු අප ඉක්මනින් ආරම්භ කරනවා. රටේ ජනතාවත් මෙම වැඩපිළිවළට කඩිනමින් ප්‍රතිචාර දක්වා තිබෙනවා.

එන්නත් කිරීමේ වැඩපිළිවෙළ අප ආරම්භ කර තිබෙනවා. ඉතාම ක්‍රමානුකූලව එය ක්‍රියාත්මක කරනවා. එන්නත් කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රම වේදයක් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා ලෝකයේ තියෙන ක්‍රමවේද වගේම, අපේ රටේ සෞඛ්‍ය අංශ ක්‍රියාත්මක කරන වැඩපිළිවළත් අන්තර්ගතයි. එන්නත් දිය හැකි සියලු දෙනාටම අප එන්නත් දීමට රජය කටයුතු කරනවා. දැඩි සත්කාරයන්හි ඇඳන් වැඩි කළ යුතු යැයි මතයක් තිබෙනවා. ඒ අනුව ඇඳන් අවශ්‍ය රෝහල් හඳුනාගෙන ඇඳන් වැඩිකිරීමට කටයුතු කරනවා. තරුණයන් සකස් කරන ඇඳන් ඒ මධ්‍යස්ථානවලට ලබා දෙන්නත් පියවර ගන්නවා. කොවිඩ් අභියෝගයට මුහුණ දෙන්න අපට හැකියාවක් තිබෙනවා. දේශපාලන අධිකාරිය විදිහටත්, පුරවැසියන් ලෙසත් අප ඒ සඳහා මැදිහත් විය යුතුයි. මෙහි යම් බාධාවන් තිබේනම්, යම් ක්‍රමවේදයන් භාවිතා කරමින් එය වළක්වා ගත යුතුයි. තරුණ පරම්පරාව මේ සඳහා මැදිහත්ව කටයුතු කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක අප සහයෝගයෙන් කටයුතු කරනවා. ඇතැමුන් මහ මඟ වැටී තිබෙන බවට සමාජ මාධ්‍යවල යනවා. එහෙම දෙයක් තිබෙනවානම් ආණ්ඩුවක් ලෙස අප එය සොයා බැලිය යුතුයි. ජනතාව ආරක්ෂා කර ගැනීමට අප කටයුතු කළ යුතුයි. සෞඛ්‍ය අංශ, ආරක්ෂක නිලධාරීන්, රාජ්‍ය අංශය තමන්ගේ ජීවිතය නොතකා කොවිඩ් ව්‍යවසනයට මුහුණ දෙන්න කටයුතු කරනවා. රජය වගකීමෙන් කටයුතු කරනවා. මෙතරම් ව්‍යවසනයක් තිබියදීත් ඇතැමුන් සාද පැවැත්වීමට කටයුතු කරනවා. ඒ අය පසුවදා මුහුණු පොතේ රජයට බනිනවා. වගකීමෙන් කටයුතු කර කොවිඩ් මර්දනයට අවශ්‍ය සහාය ලබා දෙන්නැයි මේ අයගෙන් මා ඉල්ලා සිටිනවා. රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක, ජාතික තරුණ සේවා සභාවේ සභාපති දමිත් වික්‍රමසිංහ, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති පුෂ්පකුමාර බැට්ටගේ, හිටපු පළාත් සභා මන්ත්‍රී අරුණ ගුණරත්න, වැලිගම ප්‍රාදේශීය ලේකම් සුමිත් ශාන්ත, ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂ දුෂාන් හෙට්ටිආරච්චි, දකුණු පළාත් අධ්‍යක්ෂ ජනක හෙට්ටිආරච්චි, සහකාර අධ්‍යක්ෂ චන්ද්‍රසිරි වනිගසිංහ, මාතර දිස්ත්‍රික් යෞවන සමාජ බල මණ්ඩල සභාපති සදීප් තාරක යන මහත්වරු මෙම අවස්ථාවට සහභාගි වූහ

# රසායනික පොහොර ගෙන්වීම නතර කිරීම ඉතා හොඳයි එහෙත් ස්ථිර විකල්පයක් නැති වීම ගැටලුවක්

## සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ උප සභාපති සුනන්ද කුමාර නවරත්න



**මාතලේ දිස්ත්‍රික් සමූහ**

රසායනික පොහොර මෙන්ම කෘෂි යෙදවුම් ආනයනය නොකිරීමට රජය තීරණය කිරීම රටට වැඩදායක ක්‍රියාමාර්ගයක්. එහෙත් ඒ සඳහා වෙනත් විකල්පයක් ගොවි ජනතාවට හඳුන්වාදීමට රජයට මෙතෙක් නොහැකි වී තිබෙනවා. ඒ නිසා මෙවර සියලු කෘෂි වගාවන් අවදානමකට පත්විය හැකි බව සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ උප සභාපති සුනන්ද කුමාර නවරත්න මහතා පැවැසීය.

මෙයින් ගොවියා කබලෙන් ළිපට වැටීමේ අවදානමක් පවතින බව ද හෙතෙම කීවේය.

හෙතෙම එසේ පැවැසුවේ පෙරේදා (9) මඩාටුගම කොටාගල ප්‍රදේශයේ සිදුව ඇති වගා විනාශය පිළිබඳ සොයා බැලීමෙන් අනතුරුව පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද සඳහන් කළේය.

ජනාධිපතිවරයා මෙන්ම විෂයභාර ඇමැතිවරයා ද ලොව පළමු වරට රසායනික පොහොර මෙන්ම කෘෂි යෙදවුම් ඉවත් කළ ලොව එකම රට ලංකාව බව ප්‍රකාශ කළත්, අද සිදු වී ඇත්තේ එයින් රජයේ නොහැකියාව ප්‍රදර්ශනය කිරීමක්. අද වන විට ගොවියා අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා. යල් කන්නයේ වී වපුරා සති දෙක තුනක් ගත වුණත් කිසිම පොහොරක් නෑ. වෙනත් ආහාර බෝග වගාවන්ටත් කිසිදු පොහොරක් යෙදවීමට මෙතෙක් ගොවීන්ට ලැබී නෑ. කාබනික පොහොර වගාවන්ට යොදන්න කියා රජය කියනවා. එහෙත් කාබනික පොහොර ගන්න තැනක් නෑ.

රජයට අද සිදුව තිබෙන්නේ භාණ්ඩාගාරයේ මුදල් නොමැතිකමයි.

මේ වන විට ගොවීන් සිය වගාවන් සඳහා යොදන්නේ දෙමුහුන් කෘෂි බීජයි. අද වන විට දේශීය බීජ කිසිවක් රටේ නෑ. පසද සකස්ව තිබෙන්නේ මේ ආනයනියක බීජ වගාවටයි. ඒ නිසා රසායනික පොහොර ඒ සඳහා අත්‍යවශ්‍යයි. කාබනික පොහොර කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවීම හොඳයි. නමුත් එය කළ යුත්තේ ගහෙන් ගෙඩි එන්නාක් මෙන් නොවේ. පියවරෙන් පියවරටයි. මේ රටේ කාබනික පොහොර විද්‍යානුකූලව නිෂ්පාදනය කරන තැනක් තවම දැක ගන්නට ලැබී නෑ.

එවන් පසුබිමක රජය, කාබනික පොහොර ගැන මේ දොඩවන්නේ කුමක් දැයි යන්න සමස්ත ගොවි ජනතාවටම ප්‍රශ්නයක්. අද වන විට ගොවියා මුහුණපා සිටින බරපතළ ප්‍රශ්නය වී ඇත්තේ පොහොර ගැනීමයි. මේ නිසා ඇතැම් ගොවීන්ට සිය වගාවන් අතහැර දැමීමට සිදු වෙලා. ගොවි ජනතාවගෙන් බහුතරයක් අද බැංකුවලට මෙන්ම පොලීකරුවන්ට ණයකරුවන් වෙලා. ඔවුන් කනකර අභරණ බැංකුවලට උකස් කර තමයි මේ සියලු වගාවන් සිදු කර තිබෙන්නේ. අසරණ ගොවියා මේ තත්ත්වයෙන් ගලවා ගැනීමට ගොවියාට අවශ්‍ය පොහොර ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය පහසුවෙන් ගැනීමට හැකි මාර්ගයක් රජය වහා සකසා දිය යුතුයි. එසේ නොවුවහොත් සමස්ත ගොවි ජනතාව ඒකරාශී කර දැඩි විරෝධතාවක් රට පුරා ආරම්භ කරනවා.

# කොරෝනා ආරක්ෂක පත්‍රිකා සිංහලෙන් පමණයි

## උතුරු-නැ'හිර ජනතාව අසීරුවේ

## පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන්



**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

කොරෝනා රෝගයෙන් ආරක්ෂා වීම සඳහා උතුරේ වැසියන්ට ලබා දෙන විස්තර පත්‍රිකාවලින් බොහොමයක් සිංහල භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති නිසා එම පළාත්වල දෙමළ ජනතාව දැඩි පීඩාකාරී තත්වයකට පත්ව ඇතැයි දෙමළ ජාතික සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් මහතා පැවසීය.

මන්ත්‍රීවරයා කොළඹ සිට යාපනයේ මාධ්‍යවේදීන්ට ප්‍රකාශ කළේ තමන් මේ බව පාර්ලිමේන්තුවේදී පවා ප්‍රකාශ කර ඇතත් රටේ පවතින ද්විභාෂා නීතිය තවමත් ක්‍රියාත්මක නොවන බවයි.

රටේ පාර්ලිමේන්තුව තුළත් ද්වි භාෂා නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. මුළු රටම අවදානම් තත්ත්වයකට මුහුණ පා සිටින මේ අවස්ථාවේදීත් කොරෝනා රෝගයෙන් ආරක්ෂා වීම සඳහා උතුරේ වැසියන්ට නිකුත් කර ඇති බොහෝ පත්‍රිකා මුද්‍රණය කර ඇත්තේ සිංහල භාෂාවෙන් පමණයි.

උතුරේ සිටින වැසියන්ගෙන් වැඩි දෙනා නූගත් අයයි. ඔවුන්ට ඔවුන්ගේ භාෂාවෙන් එන ගැඹුරු වචන සහිත පත්‍රිකා කියවීමට හකියාවක් නැතිව තිබෙද්දී සිංහල භාෂාවෙන් ලැබෙන පත්‍රිකා කොහෙත්ම කියවා ගැනීමට හැකියාවක් නැහැ.

මා මේ අවස්ථාවේදී ජාතිවාදී අදහස් ප්‍රකාශ කිරීමක් කරනවා නෙවෙයි. මිනිස්සු සියලු දෙනා දැඩි සේ බියට පත්ව සිටින අවස්ථාවක, ඔවුන්ට සිංහල භාෂාවෙන් පමණක් මුද්‍රණය කළ පත්‍රිකා දීම ඔවුන් තවත් බියට පත් කිරීමක්. රජයත්, සෞඛ්‍ය අංශත් මේ ගැන අවධානය යොමු කර කටයුතු කරණු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා යැයිද සුමන්තිරන් මන්ත්‍රීවරයා මෙහිදී පැවසීය.



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දවසේ රාහු කාලය

සවස 3.12 සිට 04.46 දක්වා   අලුයම 03.10 සිට 04.27 දක්වා

## දින තත්ත්වය

මේෂ රවි 28 භාග බක් අව අමාවක තිථිය ලත් කුජ දින ඉර උදාව 5.54ට ඉර බැසීම 6.19 ට බෙරණ නැකත රාත්‍රී 11.33 න් ගෙවී කැති නැකත ලබයි. බක් අව අමාවක තිථිය දවස පුරාම යෙදී පවතී. සෞභාග්‍යය යෝගය රාත්‍රී 10.43 න් ගෙවී ශෝභන යෝගය ලබයි. චතුෂ්පාද කරණය දහවල් 11.14 න් ගෙවී නාගකරණය ලබා පවතී.

විෂ කලාව - පෙකණිය / අමෘත කලාව - මාපටැගිල්ල

මරු සිටින දිසාව - බටහිර / යෝගිනී - ඊසාන / සුබ දිශාව - නැගෙනහිර

## හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**
05.54 සිට 06.54 දක්වා - කුජ හෝරාව
06.54 සිට 07.54 දක්වා - රවි හෝරාව
07.54 සිට 08.54 දක්වා - සිකුරු හෝරාව
08.54 සිට 09.54 දක්වා - බුධ හෝරාව
09.54 සිට 10.54 දක්වා - සඳු හෝරාව
10.54 සිට 11.54 දක්වා - සෙනසුරු හෝරාව

**සවස**
11.54 සිට 12.54 දක්වා - ගුරු හෝරාව
12.54 සිට 01.54 දක්වා - කුජ හෝරාව
01.54 සිට 02.54 දක්වා - රවි හෝරාව
02.54 සිට 03.54 දක්වා - සිකුරු හෝරාව
03.54 සිට 04.54 දක්වා - බුධ හෝරාව
04.54 සිට 05.54 දක්වා - සඳු හෝරාව

**රාත්‍රී**
05.54 සිට 06.54 දක්වා - සෙනසුරු හෝරාව
06.54 සිට 07.54 දක්වා - ගුරු හෝරාව
07.54 සිට 08.54 දක්වා - කුජ හෝරාව
08.54 සිට 09.54 දක්වා - රවි හෝරාව
09.54 සිට 10.54 දක්වා - සිකුරු හෝරාව
10.54 සිට 11.54 දක්වා - බුද හෝරාව

**අලුයම**
11.54 සිට 12.54 දක්වා - සඳු හෝරාව
12.54 සිට 01.54 දක්වා - සෙනසුරු හෝරාව
01.54 සිට 02.54 දක්වා - ගුරු හෝරාව
02.54 සිට 03.54 දක්වා - කුජ හෝරාව
03.54 සිට 04.54 දක්වා - රවි හෝරාව
04.54 සිට 05.54 දක්වා - සිකුරු හෝරාව

**බබාට නමක්**

මෙදින රාත්‍රී 11.33 දක්වා බෙරණ නැකත යෙදී ඇති නිසා එතෙක් උපදින දරුවන්ට ලි, ලු, ලෙ, ලො අකුරු ද ඉන්පසු කැති නැකත උදාවන නිසා එතැන් සිට උපදින දරුවන්ට අ, ඉ, උ, එ අකුරු ද දිනට අනුව ක, ඛ, ග,ඝ යන අකුරු ද මුල්කොට දරුවාට නමක් දැමීම සුබයි.



## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - සුබ අසුබ සම වේ

මේෂ ලග්නයට අනුව අද ඔබට සුබ අසුබ සමසේ බුක්ති විඳීමට සිදුවන අතර එදිනෙදා ජීවිතයේ කාර්යබහුල බවක් ද දක්නට ලැබේ. තම අසල්වාසීන්ගෙන් සිදුවන දෝෂාරෝපණ තත්ත්වයක් ද දක්නට ලැබේ. කෙසේ වුව ද ඉතා සිහි බුද්ධියෙන් යුතුව කටයුතු කිරීමට වගා බලා ගන්න.

### වෘෂභ ලග්නය - සුබවාදී තීන්දු තීරණ ගනී

වෘෂභ ලග්නයට අනුව අද ඔබට සුබ වෙයි. ඒ අනුව දැඩි අධිෂ්ඨානය සිතට දැනෙන දිනයක් නිසා බොහෝ සුබවාදී තීන්දු තීරණ ගනු ඇත. තම විවාහ ස්ථානගත කටයුතු පැහැර හැරෙන නමුත් ඔබට තම ඥාතීන් වෙතින් ලැබෙන සහයෝගය අනුව එය ද සමබර කර ගැනීමට අවස්ථාව උදාවේ.

### මිථුන ලග්නය - හිස සම්බන්ධ ආපදා

මිථුන ලග්නයට අනුව අද ඔබට ජලාශ්‍රිත කටයුතුවලින් ආපදා පෙන්වනු ඇත. වැලි ගොඩ දැමීම් හෝ ධීවර කටයුතුවල නියැළෙන අය ප්‍රවේශම් විය යුතුය. හිස සම්බන්ධ අපල උපද්‍රව පවතී. විවාහ ගැටලු මතු කෙරෙනු ඇත. සිතේ තදබල කේන්තිය ආවේගය මතුවීම නිසා අන් අයගේ සිත් කළ කිරෙන වචන ඔබ මුවින් පිටවීමට ඉඩ ඇත.

### කටක ලග්නය - අනාගත සැලසුමකට සිත

කටක ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ අනාගත සැලසුමකට හිත යොමු කරන දිනකි. තම බිරිඳ හෝ ස්වාමියාගේ පාර්ශ්වයෙන් සහයෝගය ලැබේ. තම දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද නිසි වේලාවට කරගෙන යාමට තමාට දැඩි පරිශ්‍රමයක් කැපවීමක් දරන්නට සිදුවේ. මවු පාර්ශ්වයේ කෙනෙකුගේ සහයෝගය ලැබෙනු ඇත.

### සිංහ ලග්නය - දේපළ හිමිකම්

සිංහ ලග්නයට අනුව අද ඔබට සුබයි. ඒ රැකියාව උසස්වන ලකුණු නිසයි. තම වෘත්තීය ගරුත්වය රැකගෙන ප්‍රධානීන්ගේ ප්‍රසාදය දිනාගෙන ඉදිරියට යා හැකි බව තහවුරු වේ. කලක් තමාට සතුරුව සිටි අයකු මිතුරුවීම නිසා දැඩි අධිෂ්ඨානය සිතට දැනෙනු ඇත. කෙසේ නමුදු තම පෙර පිං මහිමය මතුවීමෙන් ලැබීම් අතර දේපළකට හිමිකම් කියයි.

### කන්‍යා ලග්නය - කාර්ය බහුල දිනක්

කන්‍යා ලග්නයට අනුව අද ඔබට තම ගෘහ ජීවිතය කාර්යබහුල වන අතර තම මවට හෝ පියාට සිදුවන අසනීපයකදී ඒ වෙනුවෙන් දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවේ. ඒ වෙනුවෙන් දුරබැහැර පෙදෙසකට යාමට ද සිදුවනු ඇත. තුනටියේ ආපදා උපද්‍රව පෙන්වන නිසා කල්පනාකාරී වන්න. එහෙත් තමාට කලක් තිස්සේ පැවති කරදර අතර ණය මුදලකින් නිදහස්වීමට පුළුවන් වේ.

### තුලා ලග්නය - ආයෝජනයකට සැලසුම්

තුලා ලග්නයට අනුව අද දින තම ව්‍යාපාර සඵල වනු ඇත. අධිෂ්ඨානය මත බොහෝ සුබවාදී අනාගතයකට ප්‍රවිෂ්ඨවීමට සුදුසු ආයෝජනයකට සැලසුම් සකස් වේ. ඔබේ හිත මිතුරන් සමඟ නව ආර්ථික ක්‍රමෝපායයක් ක්‍රියාත්මක කෙරෙනු ඇත. ආදායම මෙන්ම වියදම ද ඉහළ යා හැකි නිසා ඉතා ප්‍රවේශම් ලෙස කටයුතු කරන්න.

### වෘශ්චික ලග්නය - හුදෙකලා බවින් කල් ගෙවයි

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට තම කටයුතු බහුලවීම තුළ සැලසුම් කඩාකප්පල් වන බවක් පෙනෙන්නට තිබේ. තම අදහස් ක්‍රියාත්මක කිරීමේදී හුදෙකලා වීම හෝ අන් අයගෙන් බැහැර වී දුරස් වී කටයුතු කිරීමට සිදුවේ. එදිනෙදා තම සමාජ සේවා කටයුතු නතර කිරීමට සිදුවන අතර තම වෘත්තීය කටයුතු කෙරේ මුල්තැන දීමට සිදුවේ.

### ධනු ලග්නය - ඥාති පාර්ශ්වයෙන් විරෝධතා

ධනු ලග්නයට අනුව තම ජීවිතයේ බොහෝ දුර යාමට අත හිත දුන් අයකු තමා වෙතින් දුරස්වීම නිසා සිතට වේදනා දෙන තත්ත්වයකි. යුග දිවියේ විවිධ ගැටලු මතභේද මතු කෙරේ. තම කුලයට නිලයට විවිධ බාධා මතු වේ. ඥාති පාර්ශ්ව වෙතින් විරෝධතා එල්ල වන අතර පවත්වාගෙන ආ ආදර සබඳතාවයක් දෙදරා යන ලකුණු පෙනේ.

### මකර ලග්නය - ආගමික කටයුත්තකට මුල් තැන

මකර ලග්නයට අනුව අද ඔබට සුබ ආර්ථික පසුබිමකට කරුණු යෙදේ. වාහන ලාභ, නව නිවාස ලාභ මතු කෙරේ. නිවසේ චාම් උත්සවයක් හෝ ආගමික කටයුත්තක් සඳහා ප්‍රධාන තැනක් දෙනු ලබයි. පූජ්‍ය පක්ෂයේ ප්‍රසාදය ප්‍රශංසාව ලැබෙන දිනකි. ආගමික සහජීවනය හොඳින් සිතට දැනෙන දිනකි.

### කුම්භ ලග්නය - තරග විභාග ජය

කුම්භ ලග්නයට අනුව අද ඔබට ලැබීම් අතින් සුබ වේ. වැය ශීර්ෂය ඉහළ ගිය ද ලැබීම් අතින් ද උසස් බවක් උසුලන නිසා බිය විය යුතු නැත. තරග විභාග ජයග්‍රහණ සම්මුඛ පරීක්ෂණ ජය හිමිවීම හා රැකියා ස්ථානගත අභිවෘද්ධිය සඵල වෙයි. දිනපතා තමාට උවටැන් කළ අය වෙතින් තව තවත් ඇප උපකාර හිමිවේ.

### මීන ලග්නය - නිවසේ අලුත්වැඩියා කටයුත්තක්

මීන ලග්නයට අනුව අද ඔබට තම නිවසේ අලුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් අධික පිරිවැයක් දරන්නට සිදුවේ. තම දේපළ සුරක්ෂිත කර ගැනීමට ගන්නා පියවරක් ලෙස වැට මායිම් සකස් කිරීම වැනි කටයුතුවල නිරතවන දිනකි. තම දුවා දරුවා සමඟ එම කටයුතු කෙරේ වැඩි කැපවීමක් ද කෙරෙන දිනකි. පාදයේ වළලුකර ආශ්‍රිත උවදුරු පවතී.

# රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ යෝජනා 5 ක්‍රියාත්මක කිරීමට ජනපතිගේ අනුමැතිය

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය ආසාදිතයන් අවම කර ගැනීම සහ ආසාදිතයන්ට ඉතා සාර්ථක ලෙස ප්‍රතිකාර ලබාදීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉදිරිපත් කළ යෝජනා 5 ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාගේ අනුමැතිය ලැබී ඇත. රෝග ලක්ෂණ සහිත සහ රහිත රෝගීන් දෙකොටසම රෝහල්වලට ඇතුළත් කිරීම නිසා රෝහල් ධාරිතාව ඉක්මවා ගොස් ඇති බවත් රෝග ලක්ෂණ නොමැති සහ සංකූලතා නොමැති ආසාදිතයන් නිවසේ සිට බලා ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ සායනික වෛද්‍ය නිලධාරීන්ගේ අධීක්ෂණයට යටතේ ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් සැකසිය යුතු බවත් සංගමය ඉදිරිපත් කළ යෝජනා අතර පවතියි.

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මාර්ගෝපදේශනයක් සකස් කළ යුතු බවත් ඉක්මවා යන සෞඛ්‍ය ධාරිතාව කළමනාකරණය එමඟින් සිදු කළ යුතු බවත් එම යෝජනාවන් අතර වේ. වසංගත රෝග විද්‍යා ඒකකය ප්‍රමාදයකින් තොරව රෝග ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු, රෝගයේ ස්වාභාවය සම්බන්ධ දත්ත, රෝගීන් ව්‍යාප්තිය සිතියම්ගත කිරීම ඇතුළු නිවැරදි දත්තා වාර්තා ඉදිරිපත් නොකිරීම තුළින් උද්ගතව ඇති ගැටලුව ද ජනාධිපතිවරයාට පෙන්වා දීමට සංගමය පියවර ගෙන තිබේ.

ආසාදිතයන් වාර්තා වීම අවම කර ගැනීම සඳහා දිස්ත්‍රික් අතර සංචරණ සීමා පැනවීම වැදගත් බවටත් එන්නත්කරණ වැඩපිළිවෙළ විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව කාර්යක්ෂම සිදු කිරීම වැදගත් බවටත් මෙහිදී යෝජනා ඉදිරිපත් කර තිබේ. මේ යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යවරිය සමඟ සාකච්ඡාවක් අද (11) පවත්වන බව සංගමයේ ලේකම් වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු මහතා පැවසුවේය.

# කාර්යාලවල සේවක පිරිස් එක්රැස්වී ආහාර නොගන්න

## පොලිස් මූලස්ථානය

**නුවන් කොඩිකාර සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

ආයතන, කර්මාන්ත ශාලා හෝ කාර්යාලවල සේවය කරන පිරිස් එකට එකතු වී ආහාර පාන නොගන්නා ලෙස පොලිස් මූලස්ථානය සියලුම සේවක සේවිකාවන්ගෙන් ඉල්ලා සිටියි.

ආහාරපාන ගැනීමේදී මුහුණු ආවරණ ඉවත් කිරීමට සිදුවන නිසා විශාල පිරිසක් එකට එකතු විම නිසා කොවිඩ් 19 රෝගය පැතිර යා හැකි බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

ආයතනවල සේවය කරන පිරිස් ආදාළ පරිශ්‍රයන් තුළදීත් මුහුණු ආවරණ පැළඳීම, දුරස්ථභාවය තබා ගැනීම අනිවාර්යයෙන්ම සිදු කළයුතු අතර අදාළ පරිශ්‍රයන් තුළ සිටින පිරිස්වල ශරීර උෂ්ණත්වය වරින් වර පරීක්ෂා කිරීමට හා දෑත් සේදීමට අවශ්‍ය පහසුකම ලබා දීමට ආයතන ප්‍රධානින් කටයුතු කළ යුතු බව නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා සඳහන් කළේය.

# දීඝවාපියේ කැණීම්වලදී මැටි බරණියක් හමු වෙයි



**උපාලි කරුණාරත්න**

දීඝවාපිය ස්තූප කැණීම්වලදී මැටි භරණියක් හමු වී තිබේ.

මෙය මැටි තැටියක් උඩ මුනින් අතට නැවූ මැටි බරණියක් වන අතර එහි තිබූ පස් ඉවත් කර ඇති අතර, එහි ද්‍රව්‍යාත්මකව කිසිවක් තිබී නොමැත. මෙහි කාලවකවානුව පිළිබඳ විශ්ලේෂණය කිරීමට නියමිත අතර, ඒ අනුව ඉදිරියේදී මෙම මැටි බරණිය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම මැටි බරණිය හමු වී ඇත්තේ ස්තූපයට මීටර් එකසිය පනහනක් පමණ දුරින් පිහිටි පොලිස් මුරපොළ පිහිටි ඉඩමේදීය.



පකිස්තානයේ බුදුදහම ප්‍රචාරය කිරීමට එම රජයේ ආරාධනයෙන් නොබෝදා පකිස්තානයේ සංචාරයේ යෙදුණු මහානායක හිමිවරුන්ගේ සංචාරයට අදාළ ඡායාරූප ඇල්බමය මාලදිවයින ජනරජයේ හිටපු ජනාධිපති උපදේශක හා ජ්‍යෙෂ්ඨ දේශපාලන උපදේශක ආචාර්ය අසේල වික්‍රමසිංහ මහතා ගංගාරාම විහාරවාසී කිරින්දේ අස්සජි හිමියන්ට පිළිගැන්වූ අයුරු. ශ්‍රී ලංකා පකිස්තාන නියෝජ්‍ය මහ කොමසාරිස් තෙන්වීර් අහමඩ් මහතා ද මෙහි වෙයි.

ඡායාරූපය - සුදත් මලවීර



කෝවිඩ් 19 වසංගතය හමුවේ ඇන්ටිජන් පරීක්ෂණ කර ගැනීමට ඇල්පිටිය මූලික රෝහල වෙත පැමිණේ ජනතාවට අදාළ පරිශ්‍රයේ වාඩිවීමට පහසුකම් නොමැති නිසා ඊට අවශ්‍ය පුටු රෝහල් කාර්ය මණ්ඩලය වෙත භාරදීමට හිටපු පළාත් සභා මන්ත්‍රී දුල්ෂාන් කාරියවසම් මහතා ඊයේ (10) කටයුතු කළේය.

ඡායාරූපය - දික්වැල්ලේ තිලකරත්න ගාල්ල උතුර සමූහ

# මුල්ලේරියාව - අයිඩීඑච් - නවගමුව - ලුණාව තාවකාලික රෝහල් කාමර කොරෝනා රෝගී ඇඳන් 10,000ක ව්‍යාපෘතිය ඇරැඹෙයි



කොරෝනා රෝගීන් සඳහා දැනට තිබෙන ඇඳන් ප්‍රමාණයට අමතරව ඇඳන් 10,000ක් නිර්මාණය කිරීමට රජය කටයුතු ආරම්භ කර ඇත. එයින් ඇඳන් 5000ක් කොළඹ දිස්ත්‍රික්කයට වෙන් කිරීමට කටයුතු යොදා ඇති අතර, ඊයේ දිනයේ මුල්ලේරියාව, අයි. ඩී. එච්, නවගමුව හා ලුණාව රෝහලවල තාවකාලික රෝහල් කාමර ඉදිකිරීම ආරම්භ විය. එම කටයුතු කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සංවර්ධන කමිටු සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ප්‍රදීප් උදුගොඩ මහතා හා කොළොන්නාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රධාන සංවිධායක අජිත් සුබසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. මුල්ලේරියාව රෝහල් අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ප්‍රියන්ත කරුණාරත්න මහතා හා නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය මුදිතා පෙරේරා මහත්මිය ඇතුළු සෞඛ්‍ය අංශය සමඟ ඒ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ද පැවැත්විණි.

ඡායාරූපය - ප්‍රින්ස් ගුණසේකර

# පී.සී.ආර් ප්‍රතිඵල ප්‍රමාද වීමෙන් දිනකට නව රෝගීන් 5000ක්

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

දැනට සිදුකර ඇති පී.සී.ආර්. සාම්පලවල ප්‍රතිඵල ප්‍රමාද වීම හේතුවෙන් දිනකට නව රෝගීන් 5000කට වැඩි පිරිසක් රෝගයට ගොදුරුවීමේ අවදානමක් පවතින බව සෞඛ්‍ය අංශ පෙන්වා දෙයි.

සති දෙකක පමණ කාලයක සිට ලබාගෙන ඇති පී.සී.ආර්.සාම්පල අතුරින් 25,000කට වැඩි ප්‍රමාණයක පරීක්ෂණ කටයුතු අවසන් කර ගත නොහැකිව රසායනාගාර තුළ පවතින බවත් මේ හේතුවෙන් රෝග ව්‍යාප්තිය දිනෙන් දින ඉහළ යන බවත් සෞඛ්‍ය අංශ ප්‍රධානීන් අවධාරණය කරයි.

පී.සී.ආර්. පරීක්ෂාවට ලක්ව නිවෙස්වල සිටින ඇතැම් පුද්ගලයන් රෝගීන් බවට පත්ව ඇති බවට තමන්ට තොරතුරු ලැබී ඇතැයි සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා පැවසීය.

සෞඛ්‍ය නීතිවලට පටහැනිව යමින් පී.සී. ආර්. සිදුකර නිවෙස්වලට වී සිටින පුද්ගලයන් නොයෙක් දෛනික ක්‍රියාවල ද නිරතවීම නිසා රෝගය දරුණු ලෙස පැතිරෙන බව ද ඔහු සඳහන් කරයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් සංජීව මුණසිංහ මහතා රසායනාගාර සේවා අධ්‍යක්ෂවරයා කැඳවා වහාම මේ පී.සී.ආර්. පරීක්ෂණ සිදුකර ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙසත් රසායනාගාර තුළ එක්රැස්වී තිබෙන පී.සී.ආර්. සාම්පල සති දෙකක් ඇතුළත පරීක්ෂා කර අදාළ වාර්තාව නිකුත් කරන ලෙසත් දැනුම් දී තිබේ.

දසත
දස අත ම එක තැන

හැටන් මධ්‍යම විශේෂ





# මහගම විමල නායක හිමිගේ ජන්ම දිනයට ගැබිනි මව්වරුන්ට උපකරණ

හැටන් ශ්‍රී නිග්‍රෝධාරාමාධිපති මධ්‍යම පළාත් ප්‍රධාන සංඝනායක පූජ්‍ය මහගම විමල නායක හිමිගේ ජන්ම දිනය නිමිති කරගෙන ප්‍රදේශයේ ගැබිනි මවුවරුන්ට අවශ්‍ය ද්‍රව්‍ය බෙදා දීමක් පසුගියදා (05) දින සිදු කරන ලදි. පූජ්‍ය මහගම විමල නායක හිමිගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් මේ උපකරණ බෙදා දීම සෞඛ්‍ය උපදෙස් මත හැටන් ශ්‍රී නිග්‍රෝධාරාම විහාරස්ථානයේදී සිදු කළ අතර දරු ප්‍රසූතිය සඳහා ගැබිනි මවක් රෝහල්ගත වන විට අවශ්‍ය ද්‍රව්‍ය අඩංගු කට්ටල 32ක් එම මව්වරුන්ට බෙදා දීම සිදු කරන ලදි.



බී. ඩබ්. ඩී. ධර්මකීර්ති - තලාව සමූහ

## කට්ටිපැන්න සැකකරු කුඩුත් එක්ක මාට්ටු

අධිකරණය මඟහරිමින් හෙරොයින් ජාවාරමේ නිරත වූ සැකකරුවකු මේ මස හෙට (12) දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට තඹුත්තේගම මහෙස්ත්‍රාත් නුවන් කෞෂල්‍ය මහතා නියෝග කර තිබේ.

මෙසේ රක්ෂිත බන්ධනාගාරගත කර ඇත්තේ කටියාව යාය 9 පදිංචි අයෙකි. හෙරොයින් ජාවාරම් හා සොරකම් සම්බන්ධයෙන් අධිකරණයේ පවරා ඇති නඩුවලට පෙනී නොසිටීම හේතුවෙන් මොහුට අධිකරණය මඟින් වරෙන්තු තුනක් නිකුත් කර තිබියදී මාස දෙකක කාලයක් අධිකරණය මඟහැර සිටි අයෙක් බව එප්පාවල පොලිසිය අධිකරණයට ප්‍රකාශ කර සිටියේය. කලක් යුද හමුදාවේ සේවය කර ඉන් ඉවත් වූ අයෙක් වන සැකකරු විවාහක බිරියට අමතරව තවත් කාන්තාවක් සමඟද ජීවත් වෙන්නෙක් බවත් එම කාන්තාවන් දෙදෙනාට මොහුට දාව දරුවන්ද සිටිනා බවත් සඳහන් කළ පොලිසිය මොහුගෙන් එප්පාවල අවට ප්‍රදේශවාසීන්ට මහත් හිරිහැරයක් සිදු වන බව ද අධිකරණයට දන්වා සිටියේය. සෙල්ෆි ඡායාරූප ගනිමින්, හෙරෝයින් පානය කරමින්, අනියම් බිරිය ද රැගෙන ස්කූටි වර්ගයේ යතුරුපැදියකින් බුල්නෑව දෙසට ගමන් කරමින් සිටියදී දැඩි පරිශ්‍රමයක් යොදා සැකකරු අත්අඩංගුවට ගත් බව එප්පාවල පොලිසිය අධිකරණයට කියා සිටියේය. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සැකකරු සතුව හෙරොයින් ග්‍රෑම් 2යි මිලිග්‍රෑම් 650ක් තිබී සොයාගෙන ඇත.

ආර්. එම්. විජේරත්න - හාලිඇල සමූහ

## බදුල්ලේ සංවර්ධනය විය යුතු ග්‍රාමීය පාලම් ගණන 739ක්

මාර්ග සංවර්ධනයත් සමඟ සංවර්ධනය විය යුතු ග්‍රාමීය පාලම් 739ක් සහ ඒදඬු 191ක් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පවතින බව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රකාශ කළේය.

බදුල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන ඉලක්ක සම්බන්ධව එම කාර්යාලය මඟින් සැකසුණු වාර්තාවකින් අනාවරණය වන පරිදි දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම සංවර්ධනය කළ යුතු තත්ත්වයේ ග්‍රාමීය පාලම් ඇති අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15න් 12ක මේ වන විටත් පාලම් වෙනුවට ඒදඬු භාවිතා වේ. කොට්ඨාස මට්ටමෙන් ගත් කල සංවර්ධනය විය යුතු වැඩිම ග්‍රාමීය පාලම් සංඛ්‍යාවක් ඇත්තේ හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේය. එම සංඛ්‍යාව 108කි. එසේම සංවර්ධනය විය යුතු ඒදඬු වැඩිම ප්‍රමාණයක් ඇත්තේ මහියංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේය. එම කොට්ඨාසයේ ඇති ග්‍රාමීය ඒදඬු ගණන 60කි. බණ්ඩාරවෙල කොට්ඨාසයේ ඒදඬු 41ක් හා හාලිඇළ කොට්ඨාසයේ ඒදඬු 25ක්ද සංවර්ධනය විය යුතුව පවතී.

එස්. ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

## පොහොර බෑග් 18ක දුම් කුඩු කිලෝ 444ක්

අලවතුගොඩ පොලිස් වසමේ අකුරණ 7 කණුව ප්‍රදේශයේ ගරාජයක සඟවා තිබූ දුම් කුඩු කිලෝග්‍රෑම් 444ක් සොයා ගැනීමට අලවතුගොඩ පොලිසිය සමත් වී තිබේ. ලද තොරතුරක් මත සිදු කළ වැටලීමකදී පොහොර බෑග් 18ක අසුරා තිබී ඇති මේ දුම් කුඩු තොගය සමඟ එක් සැකකරුවකුද අත්අඩංගුවට ගෙන තිබේ. දුම් කුඩු තොගය සමඟ අත්අඩංගුවට ගත් පුද්ගලයා ඊයේ (05) දින මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

අලවතුගොඩ පොලිසියේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ඉලංගසිංහ මහතාගේ උපදෙස් මත උ.පො.ප. රූබී මාරසිංහ, පො.කො. (50604) සනත් ඇතුළු නිලධාරීහු පිරිසක් වැටලීමට එක් වූහ.

මිහිර විජේසේකර - මාරවිල සමූහ

# පොල් ලෙලි ගහන්න ගිය කාන්තාව අකුණු සැර වැදී මිය යයි

ආණමඩුව තෝනිගල ප්‍රදේශයේ පොල් ගෙඩියක් ලෙලි ගැසීමට ගිය කාන්තාවක් අකුණු සැර වැදී පසුගියදා (07) මියගොස් තිබේ. මෙසේ මියගොස් ඇත්තේ වයස අවුරුදු 30ක එක් දරු මවකි. මේ කාන්තාව පොල් ගෙඩිය ලෙලි ගැසීමට සූදානම් වන අවස්ථාවේ විශාල ශබ්දයක් නගමින් අකුණු සැර වැදී ඇති බව සිද්ධිය ඇසින් දුටුවෝ පවසා සිටිති. සිද්ධිය වන අවස්ථාවේ ඒ අසල සිටි තවත් කාන්තාවක් දැඩි කම්පනයට පත්ව ආණමඩුව රෝහලට ඇතුළත් කර ඇත.

අකුණු සැර වැදුනු කාන්තාව ප්‍රදේශවාසීන් විසින් ආණමඩුව රෝහලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති අතර එම අවස්ථාවේදී ඇය මියගොස් ඇති බව වෛද්‍යවරුන් පවසා තිබේ. සිද්ධිය වූ ස්ථානය ආසන්නයේ ජංගම දුරකතන සංනිවේදන කුලුනක් ද පිහිටා ඇතැයි ප්‍රදේශවාසීහු පවසා සිටිති.



ජී. අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය



## යට ඇඳුමේ සඟවාගෙන ජයටම හෙරොයින් බිස්නස්

හෙරොයින් මිලිග්‍රෑම් 3,180ක් සමඟ පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට මොනරාගල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරිහු පිරිසක් පසුගියදා (04) සමත් වූහ. සැකකරු මොනරාගල සියඹලාණ්ඩුව පාරේ සිරිමයුරපුර වැලියාය ප්‍රදේශයේ පදිංචි 22 හැවිරිදි අයෙකි. ස්ථානාධිපතිවරයාට ලැබුණු තොරතුරක් මත මේ වැටලීම සිදු කර තිබූ අතර සැකකරුගේ යට ඇඳුමේ සඟවාගෙන තිබියදී මේ හෙරොයින් තොගය සොයාගෙන තිබේ.

බිබිල ප්‍රදේශයෙන් රැගෙන එන මේ හෙරොයින් අතුරු මාර්ගයක් හරහා නිවෙසට රැගෙන එන බවත් ඒවා මොනරාගල ප්‍රදේශයේ විවිධ පුද්ගලයන්ට අලෙවි කරනා බවත් මීට සතියකට පමණ පෙර හෙරොයින් මිලිග්‍රෑම් 180ක් සමඟ මේ පුද්ගලයා පොලිස් අත්අඩංගුවට පත්වී ඇති බවත් වැටලීම සිදු කළ නිලධාරියකු පැවසීය. සැකකරු හා අත්අඩංගුවට ගත් හෙරොයින් තොගය මොනරාගල පොලිස් ස්ථානයට භාර දී තිබේ.

ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියන්ත ප්‍රේමතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් පොලිස් සැරයන් නිහාල් (34386), කුසුම්සිරි (5956), සිරිවර්ධන (1649), පොලිස් කොස්තාපල් කයිලේන්ද්‍රන් (73742), රුවන් (69244) යන නිලධාරීහු මේ වැටලීමට එක් වූහ.

කේ. එස්. හැන්නදි - රාගම සමූහ

## කැලණි වන්දනා නඩයක තුන්රෝද රිය උස්සලා



කැලණි වන්දනාවේ පැමිණි පිරිසක් ඒ අසල නවතා ගිය ත්‍රිරෝද රථයක් පැහැරගෙන ගොස් දින පහක කාලයක් තුළ වැලිවේරිය ඉඹුල්ගොඩ ප්‍රදේශයේ ලඳු කැලෑවක සඟවා තිබියදී කැලණිය පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් සොයාගෙන ඇත. තමන් කැලණි විහාරස්ථානය වන්දනාමාන කරගෙන පැමිණෙන විට තමන් පැමිණි ත්‍රිරෝද රථය නවතා තිබූ ස්ථානයෙන් පැහැරගෙන ගොස් ඇතැයි එහි හිමිකරු විසින් කැලණිය පොලිසියේ අපරාධ අංශයට කරනා ලද පැමිණිල්ලකට අනුව මහාමාර්ගයේ පිහිටි ආරක්ෂිත කැමරා දත්ත සියයකට වැඩි සංඛ්‍යාවක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ත්‍රිරෝද රථය සොයාගෙන ඇති අතර ඒ වන විට එහි වටිනා අමතර කොටස් ගලවා වෙනත් ස්ථානවලට අලෙවි කර තිබී ඇත.

ත්‍රිරෝද රථය පැහැරගෙන ගිය පුද්ගලයා සහ ඔහුට සහාය දුන් පුද්ගලයන් දෙදෙනකු අත්අඩංගුවට ගත් පොලිසිය සැකකරුවන්ගෙන් ගත් තොරතුරු මත ඒ වන විට අලෙවි කර තිබූ අමතර කොටස්ද සොයාගෙන ඇත. සැකකරුවන් තිදෙනාම තදින්ම මත්කුඩු පානයට ඇබ්බැහි වූවන් බවත් ඔවුන් පැහැරගත් ත්‍රිරෝද රථයේ කොටස් ගලවා අලෙවි කර එම මුදලින් මත්කුඩු පානය කර ඇති බවත් පොලිසිය ප්‍රකාශ කළේය. පසුගිය කාලය තුළ මෙලෙස ත්‍රිරෝද රථ කිහිපයක් කැලණි විහාරස්ථානය අසලදී පැහැරගෙන ගොස් තිබූ බවත් හිමිකරුවන් වාහනය නවතා විහාරස්ථානය වෙත යනතෙක් සැඟවී බලා සිට මෙලෙස ත්‍රිරෝද රථ පැහැරගන්නා බවත් පොලිසිය ප්‍රකාශ කර සිටියේය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනා පසුගියදා (04) මහර අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රධාන සැකකරුට මුදලින් රුපියල් ලක්ෂ දෙකක ඇපයක් සහ සහාය දුන් දෙදෙනාට රුපියල් 20,000ක බැගින් මුදල් ඇප තබනා ලෙස අධිකරණය නියෝග කර ඇත.

කැලණිය පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුගත් වල්පොල මහතාගේ උපදෙස් මත අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක නුවන් සංජීව, උප පොලිස් පරීක්ෂක නිමල්, පොලිස් සැරයන්වරුන් වන (43954) ගුණසේකර, (37218) ගාමිණී, පොලිස් කොස්තාපල් (23628) ධනුෂ්ක යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ

## ඉරිදාට තිබුණු බළන්ගොඩ සතිපොළ දැන් සෙනසුරාදා

බළන්ගොඩ නගර සභාව මඟින් පවත්වාගෙන යන බළන්ගොඩ නගරයේ ඉරිදා සතිපොළ මේ සතියේ සිට සෙනසුරාදා දිනවල පැවැත්වීමට තීරණය කළ බව නගර සභාවේ සභාපති චාමික ජයමිණ විමලසේන මහතා පැවසීය. පවතින කෝවිඩ් - 19 වසංගත තත්ත්වයත් සමඟ ජනතාව එක්රොක් වීම අවම කිරීම සඳහා එම තීරණය ගත් බව ඒ මහතා පැවසීය.

නගරයෙන් පිට උප නගර ආශ්‍රිතව සෙනසුරාදා දිනවල ග්‍රාමීයව විශාල සති පොළවල් ප්‍රමාණයක් පැවැත්වෙන බැවින් නගරයේ සතිපොළද එදිනට පැවැත්වීම තුළින් වෙළෙන්දන් සහ ජනතාව එක් එක් සතිපොළවල්වලට බෙදී යන බවද ඔහු කීය. නැතහොත් වෙනදා මෙන් නගරයේ සතිපොළ ඉරිදා දිනයේදී පවත්වන්නේ නම් ග්‍රාමීය ප්‍රදේශවල සෙනසුරාදා සතිපොළට එන වෙළෙන්දන් සහ ජනතාව නැවත ඉරිදා සතිපොළටද පැමිණීම හේතුවෙන් විශාල ජනතාවක් නගරයේ සතිපොළට එකතු වන බව ද සභාපතිවරයා කියා සිටියේය. පවතින කෝවිඩ් වසංගතය ව්‍යප්ත වීම පාලනය කිරීම සඳහ එම තීරණය ගත් බවත් සෑම සෙනසුරාදා දිනකම නගරසභාවේ සතිපොළ පැවැත්වීමට නියමිත බවත් ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේය.

මහානාම විතානගේ - මල්වාන සමූහ

# කිරිබත්ගොඩ හොර සම්බාහන මධ්‍යස්ථානයක් වටලයි

අන්තර්ජාලය මඟින් දැන්වීම් ප්‍රචාරය කොට සම්බන්ධ වන ගැනුම්කරුවන් සඳහා ආයුර්වේද බලපත් නැතිව නිරෝධායන නීති උල්ලංඝනය කරමින් කිරිබත්ගොඩ පොලිස් වසමේ ටයර් හන්දිය අසල පවත්වාගෙන ගිය සම්බාහන මධ්‍යස්ථානයක් කිරිබත්ගොඩ පොලිසිය මඟින් ඉකුත්දා (03) පස්වරුවේ වටලන ලදි. මෙහිදී එහි සිටි කළමනාකරු සමඟ කාන්තාවක් හා සේවා ලබා ගැනීමට පැමිණ සිටි පිරිමි පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

සම්බාහන මධ්‍යස්ථානයට පැමිණෙන පුද්ගලයන් රුපියල් පන්දහසක මුදලක් ගෙවා එයට ඇතුළු විය යුතු අතර ඉන්පසුව ඔවුන් විසින් තමන්ගේ කැමැත්ත අනුව තෝරා ගන්නා කාන්තාවන්ට ඔවුන් ඉල්ලන මුදල ගෙවිය යුතුය. අත්අඩංගුවට ගන්නා ලද මේ තිදෙනා මහර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

කිරිබත්ගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රදීප් කුමාර මහතාගේ උපදෙස් අනුව දූෂණ මර්දන විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක මනෝජ් සංජය යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

බී. ඩබ්ලිව්. ඩී. ධර්මකීර්ති - තලාව සමූහ

# ගල්නෑවේ අබලන් මාර්ග සංවර්ධනයට මිලියන 1,120ක්

ගල්නෑව ප්‍රදේශයේ අබලන් මාර්ග සංවර්ධනයට රුපියල් මිලියන 1,120ක මුදල් ප්‍රතිපාදන ලැබී ඇති බව ගල්නෑව ප්‍රාදේශීය සභාවේ සභාපති ඩබ්ලිව්. එම්. චන්ද්‍රතිලක මහතා පැවසීය. ඒ අනුව මේ කොට්ඨාසයේ කිලෝමීටර 62ක දුර ප්‍රමාණයක් කාපට් අසුරා සකස් කරනා බවත් සමහර මාර්ගවල වැඩ මේ වන විටත් ආරම්භ කර ඇති බවත් සභාපතිවරයා සඳහන් කළේය.

හඳුන්ගම සිට නෑගම හරහා පලාගල දක්වා මාර්ගය කලංකුට්ටිය යුද හමුදා කඳවුර අසල සිට මීගලෑව දක්වා පරණ පාර, වලස්වැව සිට මහමෙව්නාව දක්වා මාර්ගය, දකුණු සියඹලන්ගමුව - මොරගොල්ලාගම ප්‍රධාන මාර්ගයේ සිට හබරවත්ත දක්වා මාර්ගය ඇතුළු ගල්නෑව නගරයෙන් පිටත ඇතුල් මාර්ග රැසක් සංවර්ධනය වන බව චන්ද්‍රතිලක මහතා පැවසීය.

උතුරුමැද පළාත් හිටපු ප්‍රධාන අමාත්‍ය රංජිත් සමරකෝන් හා ඉඩම් අමාත්‍ය එස්. එම්. චන්ද්‍රසේන යන මහත්වරුන්ගේ සම්බන්ධීකරණයෙන් මේ ප්‍රතිපාදන ලැබුණු බව ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

# බණ්ඩාරවෙල මහ විදුහලට උසස් පෙළින් විශිෂ්ට ජයක්

අ.පො.ස උසස් පෙළ විභාගයෙන් බණ්ඩාරවෙල මහ විදුහලේ සිසු සිසුවියන් 779 දෙනකු මෙවර විශ්වවිද්‍යාල වරම් ලබා තිබෙනා බව විදුහල්පති ඩී. එම්. රණතුංග මහතා පැවසීය.

2020 වසරේදී විභාගයට සිසු සිසුවියන් 955 දෙනකු ඉදිරිපත් වී ඇති අතර එයින් ජීවවිද්‍යා අංශයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රථමයා ලෙස ආර්. ජී. අයේෂා චතුරාංගනී සහ දිස්ත්‍රික් තුන්වැනියා ලෙස ඩී. එම්. දීපෂිකා ඔවිනි දිසානායක සිසුවිය හිමිකරගෙන තිබෙනා අතර වාණිජ අංශයෙන් දිස්ත්‍රික්කයේ දෙවන ස්ථානය ඒ. ඉමාෂා සෙව්වන්දි ධර්මරත්නට හිමිව ඇත. එයට අමතරව සියලුම විෂය ධාරාවන්ගෙන් දිස්ත්‍රික්කයේ 1-10 අතර ස්ථාන රැසක් පාසලට ලැබී තිබෙනා අතර ඉතිහාසයේ ප්‍රථම වරට මෙවර පාසලට අතිවිශිෂ්ට විභාග ප්‍රතිඵල ලැබී තිබෙනා බව විදුහල්පති ඩී. එම්. රණතුංග මහතා පැවසීය.

ජස්ටින් පතිරගේ - බද්දේගම මධ්‍යම විශේෂ

## පාර මැද ලියුම් පෙට්ටි මාරයා



බද්දේගම නගරයේ වසර තුනකට වැඩි කාලයක සිට සාදාගෙන යනු ලබන මේ වන විටත් නිම කර නැති බස් නැවතුම්පළ ඉදිරිපිට ඇති මරුකපොල්ල (ලියුම් පෙට්ටිය) හේතුවෙන් අනතුරු සිදුවීමට පෙර ඉවත් කරන ලෙස ප්‍රදේශවාසීහු ඉල්ලා සිටිති. මෙහි දැක්වෙන්නේ නගරය මැද ඇති ලියුම් පෙට්ටියයි.

# මත්තලට පැමිණි ගුවන් යානයක් හදිසි පරීක්ෂාවට

මහින්ද අලුත්ගෙදර

මත්තල, රාජපක්ෂ අනතර්ජාතික ගුවන් තොටුපළ වෙත පැමිණි ගුවන් යානාවක් සිවිල් ගුවන්සේවා අධිකාරියේ හදිසි පරීක්ෂාවකට ලක්කර තිබේ.

ගුවන්සේවා ක්ෂේත්‍රයේ යහ පැවැත්ම රඳා පවතිනුයේ එහි ආරක්ෂාව සහ නිරුපද්‍රිතතාව (Security & Safety) මත වන අතර, එම නිසා එම අංශ දෙක නිරතුරුවම නියාමනයට ලක් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වන බවත්, එහි වගකීම භාරව ඇත්තේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට බවත් එම අධිකාරිය පෙන්වා දෙයි.

වත්මන් කොවිඩ් තත්ත්වය හමුවේ ගුවන් ප්‍රවාහන කර්මාන්තය පවත්වාගෙන යෑම අභියෝගයක් වූවද එය හමුවේ ගුවන්සේවා මෙහෙයුම් කටයුතු නිසි ප්‍රමිතීන් යටතේ පවත්වාගෙන යෑමේ ජාතික මෙහෙවර වෙනුවෙන් සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරුන් දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරයි.

කසකස්තානයේ සිට ඔස්ට්‍රේලියාව බලා පියාසර කරමින් තිබූ ඔස්ට්‍රේලියානු CGGAviation සමාගමට අයත් ලියාපදිංචි අංක VH-ZKG දරන Cessna 208B මාදිලියේ ගුවන් යානාව මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපොළ වෙත තාක්ෂණික නැවතුමක් සහ කාර්යමණ්ඩල විවේක ගැන්වීමක් වෙනුවෙන් පැමිණි අතර, ඒ අනුව එම යානාව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ, ගුවන්සේවා පරික්ෂකවරුන්ගේ හදිසි සෝදිසි කිරීමකට ලක් විය.

මෙම හදිසි සෝදිසි කිරීමේ දී, නිසි ගුවන්සේවා ප්‍රමිතීන් ආරක්ෂා කරගනිමින් සෞඛ්‍ය අංශ හඳුන්වා දී ඇති කොවිඩ් ව්‍යාප්ති පාලන වැඩසටහනට අනුගත වෙමින් එම ගුවන් කාර්යමණ්ඩලය කටයුතු කරන බවද, අනුමත උපකරණ පමණක් රැගෙන ගුවන් යානාව ශ්‍රී ලංකාවට අයත් ගුවන් කලාපයේ පියාසර කළ බවද තහවුරු වී ඇත.




සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී කපිතාන් තේමිය අබේවික්‍රම මහතාගේ උපදෙස් මත සිවිල් ගුවන්සේවා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පී. ඒ. ජයකාන්ත මහතාගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ගුවන් ආරක්ෂක, ගුවන් යෝග්‍යතා, ගුවන් සංචරණ සහ ගුවන් මෙහෙයුම් යන අංශයන් නියෝජනය වන පරිදි, ගුවන් යානාව හදිසි සෝදිසි කිරීම සඳහා එක්වූ එරංග දසනායක, ඉසුරු වෙන්ඩකෝන්, දනුල ජයරත්න, ඉසුරු සරත්චන්ද්‍ර සහ කෞතිෂා කරුණාරත්න යන සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරුන් නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් එම සෝදිසි කිරීම සිදුකර තිබෙන බව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සඳහන් කරයි.

## සෑම දිස්ත්‍රික්කයකම කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවනවා

### ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා

සුභාෂිණී සේනානායක



සෑම දිස්ත්‍රික්කයක් ආවරණය වන පරිදි ගොඩනැගිලි ලබාගෙන ඒවා රෝහල් බවට පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.

එමෙන්ම සීදුවේ පිහිටි පෞද්ගලික ඇඟලුම් කර්මාන්ත ශාලා පරිශ්‍රයක් කොවිඩ් ආසාදිතයන්ට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස සැකසීමේ අවසන් අදියරේ පවතින බවද යුද හමුදාපතිවරයා පැවැසීය.

යුද්ධ හමුදාව සහ යුද හමුදා සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් එහි ඉදිකිරීමේ කටයුතු මේ වන විට සිදු කෙරමින් පවතින අතර, එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින් ඒ මහතා මේ බව කියා සිටියේය.

සියලුම සෞඛ්‍ය පහසුකම්වලින් සමන්විත ශ්‍රී ලංකාවේ වැඩිම ධාරිතාවකින් යුතු නවීනතම රෝහලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතින අතර, මෙම රෝහල නවීනතම සෞඛ්‍ය පහසුකම්වලින් සමන්විතය. වෙනත් සායන කටයුතු වෙනුවෙන් ද භාවිතා කළ හැකිවීම මෙහි විශේෂත්වයකි.

මෙම රෝහල ශ්‍රී ලංකා යුද හමුදාවේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් පැය 24 පුරා කඩිනමින් ඉදිකිරීමේ කටයුතු සිදු කෙරේ.

රෝහලේ සියලු ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියන්විත මධ්‍යස්ථාන ප්‍රධානී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා සහ ශ්‍රී ලංකා යුද හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අවස්ථාවේ. මෙම රෝහලේ කටයුතු කඩිනමින්, ක්‍රමවත්ව සිදු කිරීමට අදාළ බලධාරීන්ට උපදෙස් ලබා දුන්හ.

## හඳුනා ගත් ප්‍රදේශවලට රජයේ ඔසුසලින් නිවෙසටම බෙහෙත්

නුවන් කොඩිකාර

රට තුළ පවතින කොරෝනා තත්ත්වය සැලකිල්ලට ගනිමින් හඳුනා ගත් ප්‍රදේශ කිහිපයක පුද්ගලයන්ට අවශ්‍ය ඖෂධ ඇනවුම් කර නිවෙස් වෙත ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙළක් සකස් කර ඇති බව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පවසයි.

ඒ අනුව කොළඹ 1 ජනතාවට 070 1 90 27 40 යන අංකයෙන් ද, කොළඹ 4 ප්‍රදේශයේ ජනතාවට 070 1 90 27 41 සහ කොළඹ 7 ප්‍රදේශයේ ජනතාවට 070 1 90 27 42 අංකය ඇමතීමෙන් ද ඖෂධ ඇනවුම් කළ හැකි බව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විශේෂඥ වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහතා පැවසීය.

ගම්පහ ප්‍රදේශයේ ජනතාව 070 1 90 27 73 දුරකථන අංකයෙන්, මහනුවර ප්‍රදේශයේ ජනතාව 070 1 90 27 37 අංකයෙන්, පේරාදෙණිය ප්‍රදේශයේ ජනතාව 070 1 90 27 39 අංකයෙන් සහ කුරුණෑගල ප්‍රදේශයේ ජනතාව 070 1 71 83 18 අංකය ද අමතා ඖෂධ ඇනවුම් කළ හැකි බව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහන් කරයි.

## 'දිය මත විශේෂ මෙහෙයුම්' මැයෙන් එස්ටීඑෆ් එකට නව ඒකකයක්



භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

ශ්‍රී ලංකා පොලීසියේ, විශේෂ කාර්ය බළකාය වෙත 'දියමත විශේෂ මෙහෙයුම් ඒකකය' නමින් නව ඒකකයක් පිහිටුවා තිබේ.

විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් 16 දෙනකුගෙන් යුතුව එම බළකාය පිහිටුවා ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

විවිධ ප්‍රදේශවල ජලය හා ජලාශ ආශ්‍රිතව සිදුකරන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමට ඉදිරියේ දී නව ඒකකයේ සහාය ලබා ගැනීමට නියමිතය.

දිය මත විශේෂ මෙහෙයුම් ඒකකය සඳහා බෝට්ටු පුහුණුවද ලබා දී ඇති අතර, මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය හා ශ්‍රී ලංකා මෝටර් බෝට්ටු සංගමයේ සහාය ලබා දී තිබේ.



## කොවිඩ්වලට ගොදුරු වූ ඉන්දියානුවන්ට සෙත් පතා මෙරටදී පින්කම්

මහින්ද අලුත්ගෙදර

කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත්ව සිටින ඉන්දීය ජනතාවට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් ශ්‍රී ලංකාව පුරා විවිධ ආගමික වැඩසටහන් රැසක් සංවිධාන කර තිබේ.

විවිධ ආගම්වලට අයත් මෙම ආශිර්වාදාත්මක වැඩසටහන් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර පවතින සහෝදරත්වයේ සහ සබඳතාවේ සැබෑ පිළිබිඹුවක් බව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය පවසයි.

අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය පසුගිය (8) දා පස්වරු 5.30 සිට 6.30 දක්වා රට පුරා බහු ආගමික 'විශ්ව ආශිර්වාද පූජාවක්' සංවිධානය කර තිබුණු අතරථ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ගංගාරාම විහාරස්ථානයේ පැවති විශේෂ වැඩසටහනකට සහභාගි විය. එහිදී රතන සූත්‍ර සහ පිරිත් දේශනාවක් පැවැත්විණි. ජපාන සහ වියට්නාම තානාපතිවරු සහ තවත් රාජ්‍යතාන්ත්‍රිකයෝ රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

මහාම්‍රිතුංජය මහා යාගය ශ්‍රී ලංකාවේ ඊස්වරම් කෝවිල් පහේදීම එකම අවස්ථාවේදී පැවැත් විණි. නගුලීස්වරම් කෝවිලේ බලධාරීන් මෙන්ම කොන්ඩවිල් අයියප්පා සහ මාවිද්දපුරම් කන්දසාමි කෝවිල්හි බලධාරීන්ද ඉන්දියාවට සහයෝගය පළ කරමින් ජනාධිපති රාම් නාත් කෝවින්ද් මහතාට සහ අගමැති මෝදී මහතාට ආමන්ත්‍රණය කළ ලිපි යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් එස්. බාලචන්ද්‍රන් මහතාට බාර දුන්නේය.

යාපනයේ කතෝලික දේවස්ථානයවල ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව සහ සියලු ලෝවැසි ජනතාව වෙනුවෙන් පැයක දේව මෙහෙයක් පැවැත් වූ අතර, මීට සමගාමීව පෞද්ගලික නිවාසවල ද විශේෂ යැදුම් පැවැත්විණි.

මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියාවේ සහෝදර ජනතාව සමඟ ශක්තිමත්ව රැඳී සිටීම වෙනුවෙන් සහ මෙම දුෂ්කර සමයේ දී දක්වන කාරුණිකභාවයට ශ්‍රී ලංකා සමාජයේ සියලු කණ්ඩායම්වලට හෘදයංගම කෘතවේදීත්වය පළ කරන අතර, එය මහත්සේ අගය කරන බවද ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය පැවසීය.

## මත්ලෝලීන් පුනරුත්ථාපනය කරන සේනපුර මධ්‍යස්ථානයේ ධාරිතාව පුළුල් කිරීමට පියවර

සුභාෂිණී සේනානායක

මෙරට තරුණ පරපුර සහ ආර්ථිකය ගිල ගනිමින් සිටින මත්ද්‍රව්‍ය උවදුර මැඩලීමට මතට ඇබ්බැහි වූ තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීමට සේනපුර පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ධාරිතාව තවත් පුළුල් කිරීමට පියවර ගනිමින් සිටින බව මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ප්‍රධානී මේජර් ජෙනරාල් දර්ශන හෙට්ටිආරච්චි මහතා දිනමිණට පැවසීය.

මේ වන විට පවතින ධාරිතාව තවත් රැඳවූවන් 500ක් පුනරුත්ථාපන කිරීමට හැකි වන පරිදි එහි ධාරිතාව පුළුල් කරන බව කියා සිටි ඒ මහතා ඉදිරි දෙසතිය තුළ එහි කටයුතු අවසන් කරන බවද කීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මතින් තොර රටක් සංකල්පය යටතේ මෙම මධ්‍යස්ථානයට තවත් රැඳවූවන් 500ක් ඇතුළත් කිරීමට හැකි වන පරිදි එහි සංවර්ධන කටයුතු සිදු කිරීමට යුද හමුදාපති ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා උපදෙස් ලබා දී තිබේ.

අධිකරණ නියෝග මත මෙම මධ්‍යස්ථානය තවත් පුළුල් කිරීමට පියවර ගෙන තිබේ.

## ශ්‍රී ලංකන් කෙයාර්ස් වෙතින් කොළඹ ජාතික රෝහලට කෘත්‍රිම ශ්වසන යන්ත්‍ර

මහින්ද අලුත්ගෙදර



පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන කොළඹ ජාතික රෝහලට කෘත්‍රිම ශ්වසන යන්ත්‍ර ලබාදීම සඳහා ශ්‍රීලංකන් කෙයාර්ස් පියවර ගෙන තිබේ.

ඒ අනුව පවත්නා වසංගතය හේතුවෙන් දැඩි අවශ්‍යතාවන් සපුරාලන ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ආයතනික සමාජ වගකීම් අංශයවන ශ්‍රී ලංකන් කෙයාර්ස් පසුගියදා කොළඹ ජාතික රෝහල වෙත කෘත්‍රිම ශ්වසන යන්ත්‍ර ප්‍රදානය කළේය. ප්‍රධාන ප්‍රතිකාර මධ්‍යස්ථානවල කොවිඩ් -19 රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ යාමක් දක්නට ලැබෙන අවස්ථාවක, රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා ප්‍රමාණවත් සම්පත් නොතිබීමේ අභියෝගයට ජාතික රෝහල මුහුණ දී සිටින අතර, වර්තමාන වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා රටේ සෞඛ්‍ය අංශය කරන විශිෂ්ට සේවයට උපහාරයක් ලෙස ශ්‍රී ලංකන් කෙයාර්ස් මේ ආකාරයෙන් සිය සහයෝගය දී තිබේ. මෙම පරිත්‍යාගය සඳහා අරමුදල් සපයනු ලැබුවේ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ දායකත්වයෙන් වන අතර ඔවුන් ගුවන් සේවය මුහුණ දී ඇති අනිවාර්ය වැටුප් අඩු කිරීම් හේතුවෙන් ඇතිවන අභියෝග සහ දුෂ්කරතා මධ්‍යයේ වුවද මෙවැනි ජාතික ප්‍රයත්නයක් ඉටුකිරීමට අත්වැල් බැඳගෙන ඇත.

පවතින වසංගත සමයේ දී පවා, ශ්‍රී ලංකන් කෙයාර්ස් සමාජයේ අඟහිඟකම් ඇති සහ වරප්‍රසාද නොලත් අංශ වෙත අඛණ්ඩව අතහිතදීම් සිදු කරන අතර, ඒ අනුව පසුගියදා මහරගම සී.සී.සී නිවාසයට අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීම සහ Little Hearts අරමුදලට සහයෝගය දී තිබේ.



## දෙපා වාරු ළමයි වගේ ගණන් හැදුවෙ මා

### ගණිත අංශයෙන් උ පෙළ සමත් වූ රත්ගම දේවපතිරාජයේ රන්දික විරාජ් සතුටු කඳුළු වගුරයි

හිනිදුම විශේෂ - රවීන්ද්‍ර ලියනගේ

රත්ගම දේවපතිරාජ ජාතික පාසලේ රන්දික විරාජ් ද සොයිසා සිසුවා උපතින්ම දෙපා අහිමි වූවත් සරසවි වරම් ලබා ගැනීමට තරම් වාසනාවන්ත වූ දිරිය පුතෙකු වීමට සමත් වී තිබේ .

පසුගිය දා ප්‍රතිඵල නිකුත්වූ අ පො ස උසස් පෙළ විභාගයෙන් රන්දික විරාජ්, ගණිත අංශයෙන් බී සාමර්ථයක් සහ සී සාමාර්ථ දෙකක් ලබා මෙසේ විශිෂ්ට ප්‍රතිඵල පෙන්වා ඇත.

රත්ගම, රත්න උදාගම පදිංචිව සිටින රන්දික විරාජ් තිදෙනකුගෙන් යුත් පවුලේ බාලයායි.

රන්දිකගේ පියා, නිමල් ද සොයිසා (56) අදහස් දක්වමින් මෙසේ කීවේය. උපතින්ම දෙපා හරියාකාරව නොවැඩුණු මගේ පුතා පහේ පන්තිය දක්වා ගියේ ගල්කෙමිනාව තිලක විද්‍යාලයටයි. පාසල ළඟම තිබුණු නිසා දිනපතාම අම්මාගේ කරපිටින් තමයි පුතා පාසලට ගියේ.



හයේ පන්තියෙන් පසුව පුතා රත්ගම දේවපතිරාජ ජාතික පාසලට ඇතුළත් කළා. ඊට පස්සේ ත්‍රීවීලරයකින් ගිහින්, මගේ කරපිටින් තමයි පාසල් ගියේ. මට දරුවන් තුන් දෙනෙක් ඉන්නවා. මේ දරුවන් ලොකු මහත් කළේ ගල් කඩලායි.දැන් මට අතපය වාරු නැහැ. දරුවට හොඳට ඉගැන්වීම තමයි මගේ එකම බලාපොරොත්තුව වුණේ. දැන් ඒක මල්ඵල ගැන්වී තිබෙනවා. මට හුගාක් සතුටුයි.

**විදුහල්පති කේ.සෑම් ද සිල්වා මහතා** - මේ දරුවාට පියාගේ අසාමාන්‍ය කැපකිරීමක් තිබුණා. දරුවා ඉගෙන ගැනීමට පුදුම විදියට මහන්සි වුණා. ඒ කැපකිරීම ඇති හැකි දරුවන්ට හොඳ ආදර්ශයක්. අපි පාසලේ සියලු පහසුකම් ලබා දුන්නා. දරුවාගේ ආකල්ප, ගතිගුණ ඉතාම ඉහළයි. හැකි සෑම අවස්ථාවකම අතිරේක ඉගැන්වීම් ලබා දුන්නා. දරුවාගේ අනාගත ජයග්‍රහණ නිබඳව අපි ප්‍රාර්ථනා කරනවා.

**රන්දික විරාජ් සිසුවා**- මගේ ජයග්‍රහණයට සහෝදර යාළුවන්ගෙන් ලැබුණු සහයෝගය විශාලයි. මට කොපමණ අඩුපාඩු තිබුණත් ඉගෙනීම හරියට කළා. ඉස්කෝලේ විදුහල්පති සර් ඇතුළු ආචාර්ය මණ්ඩලයම මාව තනි නොකර මට හැම සහයෝගයක්ම ලබා දුන්නා. අතිරේක පන්තිවල රාජිත මෙන්ඩිස්, රොහාන් බණ්ඩාර, ජනක කුලතුංග, නිහාල් වීරසිංහ යන සර්ලා අය කිරීමක් නැතිව මට අධ්‍යාපනය ලබා දුන්නා. මගේ අනාගත බලාපොරොත්තුව විශ්වවිද්‍යාල කථිකාචාර්ය වරයෙක් වීමයි. කොපමණ කරදර බාධක තිබුණත් කැපවීම සහ අධිෂ්ඨානය තිබෙනවා නම් ඕනෑම ජයග්‍රණයක් ලබා ගන්න පුළුවන්.

# ධීවර අමාත්‍යාංශය

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

## ලංසුපත් කැඳවීමයි

01. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) ජලජ සම්පත් හා ජලජීවී කර්මාන්තය සංවර්ධනය සහ කළමනාකරණය සඳහා 1998 අංක 53 දරන ජාතික ජලජීවී වගා සංවර්ධන පනත යටතේ ස්ථාපනය කරන ලද ආයතනයකි.

පහත සඳහන් කාර්ය ක්‍රියාත්මක කර සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් මුද්‍රා තබන ලද ලංසු එවන ලෙසට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (මහා පරිමාණ) සභාපති විසින් ආරාධනා කරනු ලබයි.

| කොන්ත්‍රාත්තුවේ නම අංකය සහ ඉදිකිරීම් කාලය | අරමුදලේ ලැබීමේ ප්‍රභවය | අවම CIDA ශ්‍රේණිය | ලංසු ඇපකරය හා වලංගු කාලය (රු.) | ලංසු ඇපකරය වලංගු කාලය දක්වා | ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රු.) | මුදල (අවිනිශ්චිත වියදම් හා වැට් බදු නොමැතිව) ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීම සඳහා (මාස 06) 2021/SP/DAM/01 | ශ්‍රී ලංකා රාජ්‍ය | C3 - C4 වාරිමාර්ග / ජල සම්පාදන පමණි | 1,000,000.00 දින 121 | 01.10.2021 | 14,000/- | 61.29 |

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.naqda.gov.lk වෙත පිවිසෙන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය,**
**නො. 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.**

2021.05.11

---

කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝතමීපුර ග්‍රාම සේවා වසමේ 51/1, ගෝතමී පාර, බොරැල්ල, කොළඹ 08 ලිපිනයේ පදිංචි **නවගමුවගේ හරින්ද පෙරේරා** වන මම අද දින පටන් **නවගමුවගේ තිලංග ධනංජිත් පෙරේරා** ලෙස භාවිත කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට,**
**නවගමුවගේ තිලංග ධනංජිත් පෙරේරා**

---

## වාසගම ඇතුල් කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 609, පොල්ගොල්ල ග්‍රාම නිලධාරී වසමේ අංක 7C, සරසවි මාවත, පොල්ගොල්ල කටුගස්තොට මහනුවර ලිපිනයේ පදිංචි **පරාක්‍රම කුඩා බංඩාර ඒකනායක** වන මම මින් ඉදිරියට **ඒකනායක මුදියන්සේලාගේ පරාක්‍රම කුඩා බණ්ඩාර ඒකනායක** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

**මෙයට**
**ඒකනායක**
**මුදියන්සේලාගේ පරාක්‍රම කුඩා බණ්ඩාර ඒකනායක**

---

# සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය

## ලංසු සඳහා ආරාධනයයි

සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය වෙනුවෙන් සමිතියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දැක්වෙන අයිතමය සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | ICTAD අවශ්‍ය අවම ශ්‍රේණිය | ආපසු ගෙවනු ලබන තැන්පතු | ආපසු නොගෙවනු ලබන තැන්පතු |
|---|---|---|---|---|---|
| 01. | 21/5/(1) | බොරැල්ල කෝප්සිටි ගොඩනැගිල්ල නවීකරණය | C 7 | 25,000/- | 5,000/- |

01. ඉහත කාර්ය සඳහා ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
02. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩි විස්තර සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතියේ ගරු සභාපතිතුමාගෙන් විමසා දැනගත හැකිය. (දුරකථන අංකය : 0112593592)
03. ආපසු නොගෙවනු ලබන රු. 5,000/- ගෙවීමෙන් අනතුරුව මැයි මස 11 දින සිට මැයි මස 18 දින දක්වා ටෙන්ඩර් පත් රාජකාරි දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතිය, අංක 562, ගාලු පාර, කොළඹ 3 හි පිහිටි ප්‍රධාන කාර්යාලයේ පරිපාලන අංශයෙන් ලබාගත හැක.
04. ටෙන්ඩර්පත් මුල් පිටපත සහ අනු පිටපත ලෙස පිළියෙල කර මුද්‍රා තබා 2021 මැයි මස 21 දින ප.ව. 2.00 ට පෙර සභාපති, සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතිය, අංක 562, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට එවීමෙන් හෝ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ ගෙනවිත් දීමෙන් ඉදිරිපත් කළ හැකිය.
05. ලැබී ඇති ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය වන 2021 මැයි 21 දින ප.ව. 2.00 ට විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසු ඉදිරිපත් කළ හෝ ඉදිරිපත් කළ අයගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**සභාපති,**
**සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය.**
**දුරකථන අංකය : 0112593592.**

---

# හෝමාගම ප්‍රාදේශීය සභාව

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරුවන් / අනුමත ස්වේච්ඡා සංවිධාන / සැපයුම්කරුවන් හා නිෂ්පාදකයින්ගෙන් **2021.06.01 දින ප.ව. 3.00** දක්වා මා විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

**සැ.යු.** **2021 වර්ෂය සඳහා පෙර ලියාපදිංචි වූ ආයතන නැවත ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.**

සියලුම ඉල්ලුම්පත්‍ර තම ආයතන (ඇත්නම්) ලිපිනය හා අනෙකුත් විස්තර සමග ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. පහත දැක්වෙන ආකෘතිය පරිදි අදාළ ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ **"සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2021"** ලෙස සටහන් කළ යුතුය.

සියලුම සැපයුම් හා සේවා සඳහා **රු. 1,000.00 ක** මුදලක් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තු ලෙස ගෙවිය යුතු අතර, ඒ සඳහා වූ ගාස්තු මුදලින් හෝ **"සභාපති, හෝමාගම ප්‍රාදේශීය සභාව"** නමට ලියන ලද චෙක්පතක් ඔබගේ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

සියලුම කොන්ත්‍රාත්කරුවන් **රු. 1,000.00 ක** මුදලක් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තුවක් ගෙවිය යුතුය. සාර්ථක කොන්ත්‍රාත්කරුවන් බවට සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. (ICTAD) ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වටිනාකම සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

**භාණ්ඩ සැපයුම්**

01. පරිගණක සහ උපාංග, මුද්‍රණ යන්ත්‍ර සහ ෆැක්ස් යන්ත්‍ර සහ වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර
02. කාර්යාල උපකරණ, යතුරු ලියන, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, කැල්කියුලේටර් සහ එකතු කිරීමේ යන්ත්‍ර
03. කාර්යාල මේස, පුටු සහ උපකරණ (දැව, යකඩ, ප්ලාස්ටික්, වානේ)
04. බර වැඩ යන්ත්‍ර අමතර කොටස් (බැකෝ ලෝඩරය / මෝටර් ග්‍රේඩරය)
05. ළමා උද්‍යාන සඳහා ක්‍රීඩා උපකරණ
06. කායවර්ධන උපකරණ
07. ක්‍රීඩා උපකරණ
08. සමරු ඵලක (කළු ගල් නිර්මාණ ඇතුළුව)
09. කොඩි, කෘත්‍රිම සැරසිලි ආදිය
10. තිර රෙදි, මේස රෙදි සහ මදුරු දැල්
11. කාර්යාල අත්බෑග් වැහි කබා සහ කුඩ
12. පාවහන් / ආරක්ෂිත පාවහන්, ගම්බූට් හා වැහි කබා
13. පෙර පාසල් නිල ඇඳුම් මසා සැපයීම
14. නිල ඇඳුම් සඳහා රෙදි
15. සේවක නිල ඇඳුම් මසා සැපයීම හා ටී-ෂර්ට් සහ නිල ඇඳුම් පළඳනා
16. පාසල් ළමුන් සඳහා වතුර බෝතල් සහ කෑම පෙට්ටි, පාසල් බෑග්, කුඩ
17. රබර් සීල් සැකසීම
18. පාපැදි තහඩු වර්ග සැපයීම
19. ඉදල්, කොසු, බාල්දි, කුඩ, මොබ් සහ පොලිසැග් බෑග්
20. කෘමිනාශක, වල්නාශක සහ පළිබෝධනාශක සැපයීම
21. කාර්යාල තිර රෙදි මසා නිමකර සවිකර දීම / කුෂන් වැඩ
22. තණ පිඩලි, කොහු බත් සහ පොහොර
23. මදුරු තෙල් ඉසීමේ යන්ත්‍ර, ධූමායන යන්ත්‍ර වැනි උපකරණ
24. තණකොළ කපන යන්ත්‍ර ඇතුළු උද්‍යාන අලංකරණ උපකරණ හා උපාංග
25. සබන්, පවිත්‍ර කාරක සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය
26. ජල පවිත්‍ර කාරක සහ ජලය පිරිසිදු කිරීමේ උපකරණ
27. පානීය ජල බෝතල්
28. යන්ත්‍රෝපකරණ සහ වාහන අමතර කොටස්
29. ගිනි නිවන යන්ත්‍ර සහ උපකරණ, ආරක්ෂක උපකරණ, ඇස් ආවරණ (Goggles) රබර් අත්වැසුම් (Rubber Gloves)
30. සියලුම දැව වර්ග
31. කළුගල් සහ ඔප මට්ටම් කරන ලද කළුගල් (මිරිස් ගල්)
32. යකඩ බඩු, ගොඩනැගිලි ද්‍රව්‍ය
33. පී.වී.සී. කෝටඩ් දැල්
34. ජලනල උපකරණ හා උපාංග
35. ටයිල්
36. සියලුම තීන්ත
37. පාපැදි
38. ට්‍රැක්ටර් රථ අමතර කොටස්
39, ටයර් සහ ටියුබ්
40. වාහන අමතර කොටස්
41. අත් කරත්ත
42. වෛද්‍ය උපකරණ
43. ගෘහ විදුලි උපකරණ

**සේවා සැපයීම**

01. මුද්‍රණ කටයුතු සහ පොත් බැඳීම
02. වාහන සේවා කිරීම
03. i. වාහන අලුත්වැඩියාව
    ii. ත්‍රිරෝද රථ අලුත්වැඩියාව
04. පැස්සුම් හා වැද්දුම් වැඩ
05. ශ්‍රම සේවා (පුහුණු / නුපුහුණු)
06. පරිගණක යන්ත්‍ර නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම
07. මිනුම් කටයුතු සඳහා
08. පරිගණක මෘදුකාංග සංවර්ධනය, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.
09. උත්සව සඳහා හා සභාවට අවශ්‍ය අවස්ථාවල ආහාරපාන සැකසීම
10. බර වැඩ සඳහා වන යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව (බැකෝ ලෝඩර්, මාර්ග තලනය, මෝටර් ග්‍රේඩරය ආදිය)
11. උද්‍යාන අලංකාරය
12. ගස් කැපීම හා ඉවත් කිරීම
13. ගස් කපන හා තණකොළ කපන යන්ත්‍ර අලුත්වැඩියාව
14. ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර අලුත්වැඩියාව
15. වේදිකා ඇතුළු උත්සව භාණ්ඩ සැපයීම
16. විදුලි උත්පාදක යන්ත්‍ර කුලියට සැපයීම (කි. වො. 10)
17. විදුලි වැඩ, පෙදරේරු වැඩ, පයිප්ප වැඩ, වඩු කර්මාන්තය
18. ට්‍රැක්ටර් / ට්‍රේලර් අලුත්වැඩියාව / අමතර කොටස් සැපයීම
19. ආදාහනාගාර නඩත්තු සේවා සැපයීම
20. නීති උපදෙස් සේවා සැපයීම
21. ගෘහ උපකරණ සැලසුම් සේවා, සේවා සැපයීම්, (වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු විය යුතුය)
22. ව්‍යුහාත්මක හා වරලත් ඉංජිනේරු සේවා සැපයීම
23. ගොඩනැගිලි, මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කටයුතු
24. උත්සව සඳහා වේදිකා සැරසිලි
25. වේවැල් පුටු විවීම
26. කාර්යාල වානේ ගෘහ භාණ්ඩ අලුත්වැඩියාව
27. සුනඛ කරපටි සැපයීම
28. පරිගණක මෘදුකාංග සංවර්ධනය, ස්ථාපිත කිරීම හා උපදේශනාත්මක සේවා
29. කාර්යාලයීය උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම
30. යතුරු ලියන, කැල්කියුලේටර්, ඩුප්ලිකේටින් සහ එකතු කිරීමේ යන්ත්‍ර අලුත්වැඩියා
31. ඡායාරූප ගැනීම සහ වීඩියෝකරණය
32. ඩිජිටල් බැනර් සහ ස්ටිකර් මුද්‍රණ කටයුතු
33. පින්තූර රාමු කිරීම සහ දැන්වීම් පුවරු සෑදීම
34. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට සැපයීම හා ආලෝකකරණය කුලියට සැපයීම
35. කුලී පදනම මත උත්සව භාණ්ඩ සැපයීම
36. ක්‍රීඩා උපකරණ හා පෙර පාසල් උපකරණ අලුත්වැඩියා හා නඩත්තුව
37. ගිනි නිවීමේ පද්ධති, ස්වයංක්‍රීය හා අතින් ක්‍රියාකරන ගිනි සංඥා ක්‍රම නඩත්තු කිරීම
38. ආරක්ෂණ උපකරණ හා ගිනි නිවාරණ උපකරණ අලුත්වැඩියා
39. වායුසමන යන්ත්‍ර සපයා සවි කිරීම
40. ස්ප්ලිට් මාදිලියේ වායු සමීකරණ යන්ත්‍ර හා ශීතකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම
41. පරණ පුවත්පත් මිලදී ගැනීම
42. නිල හැඳුනුම්පත් සකස් කිරීම
43. නිල ඇඳුම් මසා නිම කිරීම (ඕවරෝල්)
44. යන්ත්‍ර මගින් සිදු කරන එන්ජින් අලුත්වැඩියා කටයුතු කිරීම (ස්ලිව් සවි කිරීම, ක්‍රෑන්ක් කැපීම, බෝර් කිරීම හා අනෙකුත් අලුත්වැඩියා කටයුතු කිරීම)
45. හයිඩ්‍රොලික් හෝස් / උපකරණ අලුත්වැඩියා කටයුතු
46. වාහන කුෂන් අලුත්වැඩියා
47. වාහන වීදුරු හා දෙර ලොක් ඇතුළු ඊට සම්බන්ධ කොටස් අලුත්වැඩියාව
48. වාහන වායු සමීකරණ අලුත්වැඩියාව
49. වාහන රේඩියේටර් අලුත්වැඩියාව
50. ඉන්ජෙක්ටර් පොම්ප අලුත්වැඩියාව
51. ක්ලච් ප්ලේට්, බ්‍රේක් ලයිනර් ඇලවීම් කටයුතු
52. සියලු වාහන ටයර් නැවත පිරවීම
53. ස්පීඩෝ මීටර් අලුත්වැඩියාව
54. වාහන කේබල් වර්ග අලුත්වැඩියාව
55. යකඩ තහඩු නැවීම හා කැපීමේ කටයුතු

**කොන්දේසි :**

01. ඉහත සැපයුම් හා සේවා / කොන්ත්‍රාත් එක් එක් වර්ගයන් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත්‍ර ගාස්තු ගෙවීම කළ යුතුය.
02. ලියාපදිංචි සුදුසුකම් ඇති ඕනෑම සැපයුම්කරුවකුට / කොන්ත්‍රාත්කරුවකුට ඉදිරිපත් විය හැකි අතර, ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සාමාන්‍යයෙන් මාස 06 ක කාලයක් තුළ වෙනස් නොකරන ස්ථාවර තත්ත්වයක තබාගැනීම කළ යුතුය.
03. අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන්ට / කොන්ත්‍රාත්කරුවන්ට පරිබාහිරව වෙනත් සැපයුම්කරුවන්ගෙන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවාවන් සඳහා මිල ගණන් ලබාගැනීමේ අයිතිය හෝමාගම ප්‍රාදේශීය සභාව සතුව පවතී. තවද, සැපයුම්කරුවන් දින 30 ක කාලසීමාවක් සඳහා ණය බිල්පත් මත ද්‍රව්‍ය හා සේවාවන් සැපයීමට එකඟ විය යුතුය.

**හෝමාගම ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වන සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් සඳහා තිබිය යුතු නිර්ණායක,**

01. සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම එක් එක් සේවා වෙනුවෙන් වෙන වෙනම විය යුතුය.
02. එකම සැපයුම්කරුවෙකු / කොන්ත්‍රාත්කරුවකු සේවාවන් එකකට වඩා වැඩි සේවා ගණනක ලියාපදිංචිය අවශ්‍ය කරන්නේ නම්, එක් එක් සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තු ගෙවිය යුතුය.
03. සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරගැනීමෙන් සභාවට සපයාගත යුතු සේවාවන් ඔවුන්ගෙන් පමණක්ම ලබාගත යුතුය යනුවෙන් වන අයිතිවාසිකමක් ඔවුන්ට නොවිය යුතුය.
04. භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී අදාළ භාණ්ඩය හෝ සේවාව සපයාගනු ලබන්නේ කාගෙන්ද යන්න නිශ්චය කිරීමට තීරණය ඇගයීම් කමිටුවක නිර්දේශ මත ටෙන්ඩර් මණ්ඩලය හා සභාපති විසින් අවස්ථානෝචිත පරිදි තීරණය කරනු ඇත.
05. සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය
06. තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකය
07. සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය

**ආදර්ශ අයදුම්පත්‍රය**

**හෝමාගම ප්‍රාදේශීය සභාව**

**2021 වර්ෂයට සැපයුම්කරුවකු / කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත්‍රය**

01. සැපයුම්කරුගේ / කොන්ත්‍රාත්කරුගේ ආයතනයේ නම : ..............................
02. සැපයුම්කරුගේ / කොන්ත්‍රාත්කරුගේ ආයතනයේ ලිපිනය : ..............................
03. දුරකථන අංකය :
    i. ස්ථාවර දුරකථන අංකය : ..............................
    ii. ජංගම දුරකථන අංකය : ..............................
04. ඊමේල් ලිපිනය : ..............................
05. ෆැක්ස් අංකය : ..............................
06. ව්‍යාපාර ලියාපදිංචි අංකය : ..............................
07. ව්‍යාපාරයේ ස්වභාවය : ..............................
08. ලියාපදිංචි කළ යුතු භාණ්ඩ / සේවාවන්වල කාණ්ඩය : ..............................
09. ගිණුම් පවත්වාගෙන යන බැංකුවේ නම : ..............................
10. ණය පහසුකම් සැපයිය හැකි කාලසීමාව : ..............................
11. සාර්ථක කොන්ත්‍රාත්කරුවකු බවට සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලිඛිත සාක්ෂි : ..............................
12. ICTAD ආයතනයේ ලියාපදිංචි නම් ලියාපදිංචි අංකය : ..............................
13. වැට් (VAT) බදු අංකය (ඇතොත්) :..............................
14. සැපයුම්කරුවකු / කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා ගාස්තුව : රු. 1,000/-

ඉහත මුදල, මුදලින් / අංක .............................. දරන චෙක්පත මගින් ගෙවන අතර, මා / අප විසින් සඳහන් කරන ලද විස්තර සියල්ලම නිවැරදි බවත්, හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් පනවනු ලබන කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි කරගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**දිනය** : ..............................
**අයදුම්කරුගේ නම** : ..............................
**අයදුම්කරුගේ අත්සන හා නිල මුද්‍රාව** : ..............................

---

**සම්පත් චමින්ද ජයසිංහ**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව, හෝමාගම.**

**දිනය : ........................**
**හෝමාගම ප්‍රාදේශීය සභාව.**



# ටොම්සන් මහත්තයා

## දකුණට ආචාරය

"මට නම් අද පුදුම සන්තෝෂයක්!" කියා කියමින් ටොම්සන් මහත්තයා ගෙදරට ගොඩ වුණේය.

"ඒ මොකද ටොම්සන් මහත්තයා...? මොකක් ද ඒ තරම් තියෙන සන්තෝෂේ? ටිකක් පැහැදිලි කරලා කියමුකෝ..." කියමින් ඇම්බන් මහත්තයා සාලයේ ඉඳ ගත්තේය.

"දකුණු පළාත් සභාවට ගුරුවරු බඳවා ගන්නවා... ඒකයි සන්තෝෂේ... මුල ඉඳලම දකුණු පළාත් සභාවේ උපාධිධාරී ගුරු පත්වීම් දෙන කොට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට ගුරුවරු බඳවා ගත්තේ නෑ."

"ඒ මොකද ටොම්සන් මහත්තයා... ඒක ඉතින් උසස් පෙළ ජනප්‍රිය විතරක් නෙවෙයි හොඳ විෂයයක් නේ... ඒ මොකද ඒකට ගුරුවරු බඳවා නොගත්තේ..." කියා උන්නැහේ පුදුමයෙන් ඇසුවේය.

"ඒක අහන්න ඕනෑ අර රජ්ජුරුවන්ගේ පුත්‍රයාගෙන්... ඒ කාලේ අධ්‍යාපනේ භාරව හිටියේ රජ පුතෙක් නේ... ඒ මනුස්සයාට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය කියන නම ඇහුණත් ඇති... ගැරඬියාට ලාම්පුතෙල් ගෑවුණා වාගේ... ඔය විෂයය පාසලට දීලා මේ වෙන කොට අවුරුදු දහයකටත් වැඩි නේ... ඒ වුණාට ඔන්න මේ සැරේ තමයි යාන්තම් ඒ විෂයයට ගුරුවරු බඳවා ගන්නේ... ඒකට නම් අපි ආචාර කරන්න ඕනෑ... මං දන්නේ නෑ ඒ තීරණේ ගැන ගරු නම්බුව දෙන්න ඕනෑ කාටද කියලා... කාට වුණත් කමක් නෑ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"ඇ ටොම්සන් මහත්තයා... අර රජ පුතෙක් ගැන කීවේ මොකක් ද? මට ඒක තේරුණේ නෑ... " කියා ඇම්බන් මහත්තයා කීවේය.

"මේකනේ ඇම්බන් මහත්තයා... ඔය කතන්තරේ බොහොම කල් ගිය එකක්... මීට අවුරුදු ගාණකට ඉස්සෙල්ලා ඔය කලා ගුරුවරු බඳවා ගන්න උපාධිධාරීන්ගෙන් අයදුම් පත්‍ර කැඳෙව්වා... එතකොට ජනසන්නිවේදනය උපාධිධාරීන්ටත් අයදුම් කරන්න පුළුවන් වුණා... එතකොට හොරණ ශ්‍රීපාලියේ ජනමාධ්‍ය විෂයයෙන් විශේෂ උපාධිය ලබාපු දකුණු පළාතේ උපාධිධාරීන් අයදුම් කළා. ඒ ගොල්ලෝ විභාගයටත් පෙනී සිටියා... ඒ වුණාට සම්මුඛ පරීක්ෂණයේදී රාජ්‍ය සේවා කොමිසමේ නිලධාරීන් කිව්වේ මොනවා ද?" කියා ටොම්සන් මහත්තයා බරපතළ ලෙස ඇසුවේය.

"දන්නේ නෑනේ... ටොම්සන් මහත්තයාම කියන්න..." කියා උන්නැහේ කීවේය.

"සම්මුඛ පරීක්ෂණයේදී කිව්වේ අපි ඉල්ලුවේ ජනසන්නිවේදන උපාධිධාරීන්... ඔය ගොල්ලෝ ජනමාධ්‍ය උපාධිධාරීන්... ඒ හින්දා ගන්න බෑ කිව්වා..."

ඇම්බන් මහත්තයා 'හොක් හොක්' ගා සිනා සුණේය.

"ඇයි ඇම්බන් මහත්තයා හිනා වෙන්නේ... මේක අඬන්න වැඩක් නේ..." කියා උන්නැහේ කීවේය.

"මේකනේ උන්නැහේ... ජනසන්නිවේදනය උපාධියයි ජනමාධ්‍ය උපාධියයි එක සමානයි කියලා තේරුම් ගන්න බැරි නිලධාරීන් තමයි එතකොට දකුණු රාජ්‍ය සේවා කොමිසමේ හිටියේ.. අන්තිමට මේ අහිංසක උපාධිධාරීන් අලුත්කඩේ උසාවිය ළඟත් උද්ඝෝෂණයක් කෙරුවා... අන්තිමේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවකුත් දැම්මා... කොහොමිත් හරි ජනමාධ්‍ය උපාධිධාරීන් ප්‍රාථමික ගුරුවරුන් හැටියට බඳවා ගෙන වැඩේ ගොඩ දා ගන්න පුළුවන් වුණා..." කියා ටොම්සන් මහත්තයා අතීත කතාව කීවේය.

"මේවා හරි විහිළු වැඩනේ ටොම්සන් මහත්තයා... මේ රටේ ගුරුවරු බඳවා ගන්න පොදු ක්‍රමයක් නැතිව පළාත්වලට කැමති කැමති හැටියට ද සුදුසුකම් ඉල්ලන්නේ..." කියා උන්නැහේ ඇසුවේය.

"ඒවා එහෙම තමයි... දැන් පළාත් සභාවලට ලැබුණු බලය එහෙම තමයි පාවිච්චි කළේ... එතකොට පේන දේ තමයි පළාත් සභාවලින් මේ රටට වෙච්චි සෙතක් නෑ කියන එක තවත් තහවුරු වෙන එක... ඔය රජ්ජුරුවන්ගේ පුතා නිසා අද වෙන තෙක් දකුණු පළාතේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය සංවර්ධනය වෙලා නෑ... පුදුම අවාසනාවක්... ඒ වුණාට මේ සැරේ නම් ඒ කොඩිවිනේ ඉවර කරපු එක ගැන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිසමට අපේ ආචාරය!" කියා ටොම්සන් මහත්තයා නැඟිට හුරේ තිබ්බේය.

ඒ අස්සේ පාරේ ගිය මහත්තයෙක් සාලයට කඩා වැදුණේය. බැලූ බැල්මටම ඒ නම් ඉස්කෝලේ මහත්තයෙක් බව ටොම්සන් මහත්තයාටත්, උන්නැහේටත්, ඇම්බන් මහත්තයාටත් වැටහිණි.

"හප්පච්චියේ... මේ අර අපේ ඉස්කෝලේ මහත්තයා නේ... එන්න.. එන්න.. අපි ඉතින් ඉස්කෝලේ මහත්තුරුන්ට හරිම ගරු කරනවා නේ... අපේ ළමයින්ගේ ඇස් පාදන්නේ තමුන්නාන්සේලා නේ... ඉතින් මේ කොහේ යන ගමන් ද?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

"මම නං මේ ඉස්කෝලෙට ගිහිල්ලා එන ගමන්... මට ඇහුණා මුන්නැහේගේ ජය ඝෝෂාව... ඒකයි මං ගොඩ වුණේ... දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිසම සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනයයි, ජනමාධ්‍යයයි ප්‍රධාන විෂයයක් විදිහට හදාරපු උපාධිධාරීන්ට ඒ විෂයයට ගුරු පත්වීම් දෙන්න තීරණය කරපු එක නම් විශිෂ්ට දෙයක්... ඕකේ පැති දෙකක් තියෙනවා ටොම්සන් මහත්තයා..." කියා ඉස්කෝලේ මහත්තයා කීවේය.

"ඒ මොකක්ද පැති... ගුරු වෘත්තියේ පැතිත් තියෙනවා ද?" කියා උන්නැහේ පුදුමයෙන් ඇසුවේය.

ඉස්කෝලේ මහත්තයා මඳ සිනහවක් නැගුවේය.

"මේක නේ උන්නැහේ... දැන් ඔය විෂය නිර්දේශයේම තියෙනවා ලංකාවේ ජනසන්නිවේදනය පටන් ගත්තු ඔස්තාද්ලාගේ පම්පෝරිය ගහලා... අවුරුදු පණහකට කිට්ටු වෙනතුරු ජනසන්නිවේදන උපාධිධාරීන්ටම කියලා රැකියාවක් හදලා දෙන්න ඔය ඔස්තාද්ලාට බැරි වුණා... දැන් අනුන්ගේ සීනි කිරනවා... අපි තමයි මේකේ අයිතිකාරයෝ කියලා... ඉස්කෝලෙට ඔය විෂයය ඇතුලු කරපු හින්දා දැන් දෙයියනේ කියලා ජනසන්නිවේදන ජනමාධ්‍ය උපාධිධාරීන්ට යන්න වෘත්තියක් තියෙනවා..."

"එතකොට අනිත් පැත්ත මොකක් ද?"

"අනිත් පැත්ත තමයි ඔය ඔස්තාද්ලා රැල එකතුවෙලා සන්නිවේදන විෂයය හප කරලා දාපු එක... දැවැන්ත මාධ්‍ය කර්මාන්තයක් නැති රටේ ජනසන්නිවේදනය උගන්නනවා විශ්විද්‍යාලවල... ජීවිතයට අවශ්‍ය විෂයයක් හැටියට පාසලට දුන්නේ ජනසන්නිවේදන නෙවෙයි සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය... ඔස්තාද්ලා එකතු වෙලා සිලබස් එක හප කරලා දැම්මා... අර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලේ උදවිය එහෙම හප කරපු සිලබස් එක අනුමත කළා. දැන් ඒක භාරව ඉන්නේ කුඩම්මලා... ගුරුවරු නන්නත්තාර වෙලා... ළමයි දැනටම සාමාන්‍ය පෙළ අත් ඇරලා... උසස් පෙළ අලුත් ගුරුවරුන් දන්නේ නෑ මොනවාද උගන්නන්නේ කියලා... විශ්වවිද්‍යාලේ ඉගෙන ගත්ත දේවල් ගෙඩිය පිටින් උගන්නනවා... ඒක තමයි අනිත් පැත්ත.... ඕං එහෙනං මං ගියා..." කියමින් ඉස්කෝලේ මහත්තයා යන්න ගියේය.

**බන්දුල පී. දයාරත්න**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# අසූ වසරකට පසු තවමත් තරුණ සිටිසන් කේන්






මහා සිනමාකරුවකු වීම කොයි හැටි වෙතත් සිනමාකරුවකු ලෙස පවතින්න නම් ඔහු එක්තරා ආකාරයක ගල් ආඳකු විය යුතුයැයි වතාවක් පැවසුවේ වර්තමාන ලෝකයේ සිටින විශිෂ්ට සිනමාකරුවකු වන මාර්ටින් ස්කෝර්සිස් විසිනි. ඔහු එසේ පවසන ලද්දේ ඕර්සන් වෙල්ස් ගැනය. වෙල්ස්ගේ උපන් දිනයෙන් අවුරුදු 106 පිරුණේ පසුගිය මැයි මස 6 වන දාට ය. ඔහු විසින් බිහිකරන ලද ලෝක සිනමාවේ ශ්‍රේෂ්ඨතම සිනමා නිර්මාණයක් ලෙස සැලකෙන සිටිසන් කේන් චිත්‍රපටයට අවුරුදු 80 පිරුණේ මැයි පළමු වනදාය.

සිනමාකරුවකු හැටියට ඉතාම ළාබාල වියේදී එනම් අවුරුදු 26දී තමන්ගේ මුල්ම සිනමා කෘතිය ගොඩනගන්නට තරම් වෙල්ස් විශිෂ්ටයකු වූයේ කෙසේදැයි විමසා බැලීම වෙනම කටයුත්තකි. එහෙත් තම අග්‍රගණ්‍ය සිනමා නිර්මාණයෙන් පසු ඔහුට විඳින්නට සිදුවූ බොහෝ අවමාන ද බොහෝ අවලාද ද විශාලය. කොටින්ම හොලිවුඩ් සිනමාවේ දොරටු ද ඔහුට විවර වුණේ යන්තමිනි. ඔහු සිනමා ව්‍යාපාරය නමැති කළුගලේ ඔළුව හප්පා ගැනීමට කැමති ජාතියේ සිනමාකරුවෙකි. යස ඉසුරු හෝ වෙනත් තාන්නමාන්න නොතැකූ ඔහුට, තම ජීවිතයේ එකම අභිලාෂය වූ යහපත් සිනමා කෘතීන් බිහි කිරීම නිසාම අනේකවිධ කම්කටොලු විඳින්නට සිදු විය.

ඔහු ද කලක් අමරිකාව අතහැර ජීවත් වූවේය. අවසාන චිත්‍රපටය නිර්මාණය කරන්නට ඔහු යළිත් ඇමෙරිකාවට ආවද චිත්‍රපටය අවසාන කිරීමට පෙර ඔහු මිය ගියේය.

1985 ඔක්තෝබර් මස 10 වන දා මිය ගිය ඕර්සන් වෙල්ස් ගේ අවසාන චිත්‍රපටය චිත්‍රගත තිරගත වූයේ 2018 වසරේදීය. The Other Side of the Wind නමැති ඒ චිත්‍රපටය වසර 23ක්; ලංකාවේ වචනයෙන් කියන්නේ නම් චිත්‍රපට පෝලිමේ තිබුණේය. විසිතුන් වසරකට පසු වැනිස් සිනමා උළෙලේ විශේෂ දර්ශනයක් පැවැත්වූ වූවාට පසුව netflix මගින් මේ චිත්‍රපටය ලොව පුරා ලොව පුරා බෙදාහැරීම භාරගන්නා ලදී. චිත්‍රපටය තිරගත කරන්නට මෙපමණ කලක් ගතවීම ගැන අපේ සිනමාවේ ඇතැමුන්ගේ අඬෝ වැඩියාවන් ලෝකයේ සෙසු සිනමාවත් සමග සසඳද්දී සරල කාරණා බව පැහැදිලි කරන්නට එය හොඳම උදාහරණයකි. එපමණක් නොව අකිර කුරසෝවා ට ජපානයේ දී නිෂ්පාදකයකු සොයාගන්නට බැරිව වසර ගණනාවක් ගත විය. අවසානයේදී ඔහුගේ විශිෂ්ටත්වය දුටු ස්ටීවන් ස්පිල්බර්ග් සහ ජෝර්ජ් ලූකස් මැදිහත් නොවන්නට කැගමුෂා හැදෙන්නට ඉඩ නොතිබිණ. තර්කොව්ස්කිට තමා උපන් සෝවියට් දේශය අතහැර යන්නට සිදුවිය. ෆෙලිනි තම රට අත්හැර ගියේය. ඉන්ග්මාර් බර්ග්මාන් ස්වීඩනයෙන් ඉවත්ව ගියේය. චාලි චැප්ලින් ජීවිතය ආරක්ෂා කර ගත්තේ ස්විට්සර්ලන්තයේ පදිංචියට යාමෙන් පමණකි. එපමණක් නොව අපේ මහා සිනමාවේදී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ට සිය අවුරුදු 50 තුළ නිර්මාණය කරන්නට ඉඩකඩ ලැබුණේ චිත්‍රපට 19ක් පමණි.

26 වන උපන් දිනයට ඔන්න මෙන්න කියා තිබියදී නිර්මාණය කරන ලද චිත්‍රපටය ද 80 වසරකට පසුවත් විශිෂ්ට චිත්‍රපටයක් වන්නේ කෙසේ ද?

සිටිසන් කේන් නම් මේ මහා සිනමා නිර්මාණය මිනිසකුගේ ජීවිතය අභ්‍යන්තරය සොයා යන අපූර්ව කතාන්දරයකි. චිත්‍රපටය ඇරැඹෙන්නේ මහා මන්දිරයකිනි. මේ මහා මන්දිරයේ දැවැන්ත උද්‍යාන හා එහි ඇති අන් සියලු දේවල් නිරීක්ෂණය කරද්දී මෙහි නැති දෙයක් නැත. මේ නම් දිව්‍ය ලෝකයක්මය අපට සිතේ. මේ මන්දිරයේ කවුළුවකින් එබී බලන කළ මරණ මංචකයේ වැටී සිටින මිනිසෙක් අපට හමුවේ. ඔහු චාර්ල්ස් ෆොස්ටර් කේන්ය. හේ එසේ මෙසේ මිනිසකු නොවේ. ඇමරිකානු පුවත්පත් ලෝකයේ දැවැන්තම අධිරාජ්‍යයාය. රිදී හැන්ද කටේ තියාගෙන උපන් මිනිසා දැන් ඒ සියල්ල අතහැර තම අවසන් හුස්ම වා තලයට මුසු කරන්නට සූදානම්ය. ඕනෑම මිනිසකු ම ජීවිතයේ අවසාන මොහොතේ මතු කරන හැඟීම් මතු භවය සඳහා වැදගත් වන්නේ යැයි බෞද්ධයන් වූ අප විශ්වාස කරමු. එබැවින් එළඹි සිහියෙන් යුතුව අවසාන මොහොතට මුහුණ දීමට අපි සමහර විට ඇප කැපවී කටයුතු කරමු. මේ සියල්ල අතහැර යන මොහොතේ ඔහුගේ මුවගින් පිටවන්නේ එක් වදනකි. 'රෝස් බඩ්' නැතහොත් 'රෝස කැකුළ' යි. මෙතරම් මහ ධනස්කන්ධයකට හිමිකම් කිවූ මිනිසකු රෝස කැකුළක් ගැන සිහිපත් කොට සිය ජීවිතය අවසාන කරන්නේ ඇයි? මේ වූ කලී අපූර්ව ආත්ම කථනයක මුල පිරුමකි.

රෝස කැකුළ ගැන ඔහු සිහිපත් කරන්නේ චිත්‍රපටය ආරම්භක මිනිත්තු 2යි තප්පර 32ක් ගෙවුණ තැනය.

පුවත්පත් ලෝකයේ මේ මහා මිනිසාගේ මරණය මරණ දැන්වීමකින් පමණක් කෙළවර කරන්නට ආයතනයේ කතුවරයා කැමති නැත. ඔහු තම පුවත්පත් වාර්තාකරුවකු මෙතනට කැඳවන්නේ ඔහු ගැන තවදුරටත් සොයා බලන්නටය. මේ අවසාන මොහොතේ විසිවූ රෝස කැකුළේ වගතුග සොයන්නය. රෝස කැකුළ යනු ඔහුගේ ආදරය ද? ඔහුගේ ජීවිතය ද? නැතහොත් කවරක් ද? වර්තා කරු; ජෙරී තොම්සන් මේ පුංචි කාරණාව සොයන්නට පස්දෙනකු මුණගැසෙයි. මේ පස් දෙනා කේන්ගේ ජීවිතය පිළිබඳව අතීතාවර්ජනයක යෙදෙන්නේ, නැතහොත් ඔහු පිළිබඳව අනාවරණය කරන්නේ අපූර්ව ආකාරයටය. ඔහුට මුලින්ම හමුවන චරිතය වන තැචර් බැංකු හිමිකරුවෙකි. එපමනක් නොව ඔහු කේන්ගේ භාරකාරයාය. අති විශාල ධනස්කන්ධයක් උපයා ගත් කේන්ගේ


Orson Welles







මෑණියන් මේ බූදලය සහිතව සියලු වත්කම් කේන් වෙත පවරා දෙන්නට ප්‍රථම භාර කර ඇත්තේ ඔහුටය. අවුරුදු විසි පහේදී මේ සියල්ල තැචර් ගෙන් මිදී කේන් ට හමුවෙයි. මේ සා මහා ධනස්කන්ධයකට මේ මිනිසා කවරක් කරනු ඇද්ද? ඇතැම්විට නිකං හම්බවෙන ධනය එක රැයෙන් විනාශ කර දමන්නට දක්ෂ මිනිසුන් අප අතර ඇත. එහෙත් කේන් එබන්දකු නොවේ. ඔහු කරන්නේ අපට හිතාගන්නවත් බැරි වැඩකි. ඒ වන විට අලෙවිකර ගන්නට බැරිව තිබූ Inquirer නම් පුවත්පත මිලට ගැනීමය. එය මිලට ගෙන ඕපාදූප ඇතුළු පාඨකයන් කියවන්නට කැමති බොහෝ දෑ එකතු කර එය අලෙවි කරගත හැකි පුවත්පතක් බවට පරිවර්තනය කිරීමය. පුවත්පත් අධිරාජ්‍ය නම් දැවැන්ත අධිරාජ්‍යයෙහි Inquirer පුවත්පත දැවැන්ත රාජ්‍ය කොටසක් බවට පත් කරන්නට ඔහු ඊළඟට සමත් වෙයි.

ධනය උපතින්ම ලැබූ මිනිසකු ධනය සමග ඊළඟට සොයන්නේ බලයයි. මේ බලය සඳහා ඔහු ගත යුත්තේ ඉලක්ක සහගත මාර්ගයකි. එබැවින් ඊළඟට සිදු වන්නේ ඔහුගේ විවාහය යි. මේ විවාහය පිළිබඳව හෙළි කරන්නේ කේන්ගේ සාමාන්‍යාධිකාරීවරයාව සිටි bernstein ය. කේන් විවාහය සිදුකර ගන්නේ එසේ මෙසේ කෙනකු සමග නොවේ.

එවකට ඇමරිකානු ජනාධිපතිවරයාගේ ලේලිය වන එමිලි නෝර්ටන් සමගය. කේන්, නෝර්ටන් සමග වන විවාහයට එකම අවශ්‍යතාව ධනය සොයාගත් මිනිසකුගේ ඊළඟ අවශ්‍යතාවයි. එතැනින් එහාට ඔහුගේ ජීවිතයේ ආදරයක් එළඹෙන්නේ සුසාන් ඇලෙක්සැන්ඩර් නම් පියානෝ වාදන ශිල්පිනිය සමගය. පුවත්පත් ලෝකයේ බලය සමග අමරිකානු බලය සොයන්නට නම් නිව්යෝර්ක් නගරයේ මහ පුටුවට තරග වදින කේන්ට එරෙහිව මඩ ප්‍රචාරය ආරම්භ කරන්නේ මේ ආදර පලහිලව්ව සමගය. ඒ සමග විවාහය දෙදරා යයි. විවාහයෙන් වෙන් වෙන භාර්යාවත් පුතුත් රිය අනතුරකට ගොදුරුව මිය යයි.

කේන් ගේ ජීවිතයේ බේදවාචකයක් වන්නේ මෙතැනින්ය. සුසාන්ගේ ජීවිතයේ ගොඩනැංවීමේ අභිලාශයෙන් යුතුව කේන් මහා මන්දිරයක් ද මිලට ගනී. මහ මන්දිරයක් වුවද එය නිවෙසක් කරන්න සුසාන් අපොහොසත් වෙයි.

ජීවිතය හෝ ආදරය පිළිබඳ අරගලයක යෙදෙන සුසාන් එම නිවසින් ඉවත්ව ඉවත්ව යයි. මේ මේ මහා මන්දිරයෙන් ඉවත්ව යන්නට කේන් අපොහොසත් වෙයි. අපේ පුවත්පත් කලාවේදී තොම්සන් ට සුසාන් හමු වන්නේ රාත්‍රී සමාජ ශාලාවක් පවත්වාගෙන යන්නියක හැටියටය. ඇය ඔහු ගැන තවත් ජීවිත විවරණයක යෙදෙයි.

අප සමහර විට බරපතළ ලෙස දිනා ගත් දේට වඩා අහිමි වූ කුඩා දෙයකට තිබෙන ආදරය විශාලය. හරියටම ප්‍රේම කතාන්දරයක් වැනිය. දිනාගත් ප්‍රේමයකට වඩා අහිමි ප්‍රේමයක් මුළු ජීවිතය පුරා හදවත පාරන අවස්ථා එමටය. කේන්ගේ ජීවිතය තුළ මිනිසුන්ගේ අභ්‍යන්තරය සැඟව පවතී. කේන්ගේ සමීපතමයන් පස් දෙනාම කියන ආකාරයකට මේ සියල්ල එක්කොට ගොඩනගන තනි රූපය කියවන්නට ඉඩ ලැබෙන්නේ ඔවුනට නොවේ.

එය පරිබාහිර ව සිට මේ නරඹන ප්‍රේක්ෂක අපටය. Orson Welles අපට කියා දෙන්නේ එහෙමය. වෙල්ස්, සිය මුල්ම චිත්‍රපටය නිර්මාණය කරන්නට පෙර විවිධ අන්දමින් දස්කම් පෑවේය. පුදුමය නම් සිටිසන් කේන් සඳහා දර්ශන තලයට යන තුරුම ඔහු කිසිවිටෙකත් සිනමා දර්ශන තලයකට හෝ ආසාවකට වත් නො ගිය මිනිසකු වීමය. එහෙත් එයට වසර දෙකකට පෙර ඔහු ඇමෙරිකානු ගුවන් විදුලි ශ්‍රාවකයන් අන්දමන්ද කළේය.

ඒ, එච්.ජී. වේල්ස් ගේ The War of the Worlds ඇසුරෙන් ගුවන් විදුලි නාටකයක් නිර්මාණය කරමිනි. ගුවන් විදුලි නාට්‍ය ශ්‍රවණය කල ශ්‍රාවකයෝ පිටසක්වළින් එන ආක්‍රමණිකයන් ගැන බිය වී ගෙවල් දොරවල් අතහැර පලා ගිය බව පුවත්පත්වල වාර්තා විය.

කේන් තම චිත්‍රපටය සඳහා පාදක කර ගත්තේ එවකට ඇමෙරිකාවේ පුවත්පත් අධිරාජයා වූ William Randolph Hearst ගේ ජීවිත කතාව බව සුප්‍රකට රහසක් විය. මේ දුටු Hearst චිත්‍රපටය නිෂ්පාදනය කළ R.K.O radio pictures සමාගමට විරුද්ධව අධිකරණයේ පිහිට පැතුවේය. පලක් වූයේ නැත. චිත්‍රපටය හැදූ සම්පූර්ණ වියදම දරා චිත්‍රපටය මිලදීගෙන හේ විනාශ කරන්නට තැත් කළත් RKO සමාගම චිත්‍රපටය එසේ ගිනි දෙවියාට පුදන්නට කැමති වූයේ නැත. එබැවින් මේ මහා සිනමා කෘතිය ලෝකයට ඉතුරු විය.



COME AND SEE

සිටිසන් කේන් තිරගත වූ වසරේ එය හොඳම චිත්‍රපටය ඇතුළු සම්මාන කිහිපයකට නාමයෝජනා ලැබුව ද දිනාගත්තේ ඇකඩමි සම්මාන උලෙළේ හොඳම තිර නාටකයට හිමි සම්මානය පමණි. එහෙත් සම්මානයකින් සිනමා කෘතියක වාර්ෂික අගය නිර්මාණයක් කරනවා මෙන්ම එය ශ්‍රේෂ්ඨත්වයට පත් කරන්නේ කලාතුරකිනි. අපේ රටේ ගම්පෙරළිය සරසවිය සම්මානය දිනා ගත් අවස්ථාව එබඳු පුරුදු දුර්ලභ අවස්ථාවකි. එහෙත් බොහෝ විට සිනමා කෘති ශ්‍රේෂ්ඨත්වයට පත් කරන්නේ කාලයත් සමඟය. සිටිසන් කේන් චිත්‍රපටය කාලයත් සමග ශ්‍රේෂ්ඨත්වයට පත් වූ චිත්‍රපටයකි. වසර 50 කට වැඩි කාලයක් මුළුල්ලේ බ්‍රිතාන්‍ය සිනමා ආයතනය මඟින් ලොව පුරා සිනමා විචාරකයන්ගේ හොඳම චිත්‍රපට 10 තේරීමේ අවස්ථාවේදී සිටිසන් කේන් එම චිත්‍රපට දහය අතරට ඇතුළත් වෙයි.

මිනිස් ජීවිතයේ ඇති අඳුරු අහුමුලු ස්පර්ශ කරන විට ඔවුන්ගෙන් සැබෑ ජීවිතය හඳුනා ගන්නා විට ඒ තරම් සුන්දර දෙයක් මුණ නොගැසෙනු ඇත. ඒ තරම් අභිරහසක් කිසිදු ත්‍රාසජනක පුවතක හෝ අනාවරණය වන්නේ නැත. රෝස කැකුළ යනු මේ මහා ධනස්කන්ධය සහිත මිනිසාගේ කුඩා කල සෙල්ලම් බඩුවක තිබූ ලේබලයකැයි අප දැනගන්නේ ගිනි දෙවියාට පුදන්නට ඔන්න මෙන්න තිබියදී ය. එය කිසිවකුට වැදගත් නැත. එහෙත් කේන්ට වැදගත්ය. කෙනකුට ජීවිතේ නොවැදගත් වන බොහෝ දේ තව කෙනකුට වැදගත් වන්නට ඇත අපගේ දෙපල අතර ආදරණීය වශයෙන් රැක ගන්නා කිසිදු වාණිජමය වශයෙන් වටිනාකමක් නැති බොහෝ වස්තු සම්භාරයක් ඇති බව අපේ හදවතට තට්ටු කර කියන මේ තරුණ සිනමාකරුවා, එකල කියා සිටියේ ඇත්තටම ජීවිතය යනු කවරෙක් දැයි සිතන්නට බල කරමිනි.

සිටිසන් කේන් අවුරුදු අසූවක් ගත වුවත් තවමත් තරුණයැයි හැඟෙන්නේ ඒ හින්දාමය. ඇය 'නොව පැරණිය වන රමණිය' වර්ගයේය. තවත් අවුරුදු ගණනාවකදී එය අලුත් ඇසකින් කියවන්නට අපට ඉඩ කඩ සැලසෙයි. සිටිසන් කේන් සර්වකාලින අගයක් ගන්නේ එහෙමය.

**අරුණ ගුණරත්න**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# කනත්තේ කොල්ලා



"වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය
සිරිධම්ම දහම් පාසල...
ත්‍යාග සඳහා කාරුණික අනුග්‍රහය
ඉඩම් හිමි වැවිලිකරු
බන්දුල ජයමාන්න මැතිතුමා"

පන්සලේ මකර තොරණ පසෙකින් සවි කොට ඇති විශාල බැනරයෙහි ලොකු අකුරින් එලෙස ලියවී තිබේ. වසර ගණනාවක සිටම ගමේ පන්සලේ බොහෝ වැඩ කටයුතුවලදී බන්දුල ජයමාන්න නමැති ඔහුගේ දායකත්වය නොමසුරුව ලැබේ.

අපේ ගම් පළාතේ උදවියට එය නුහුරු නුපුරුදු නමක් නොවේ. ප්‍රදේශයෙහි මඟුලකට, මරණයකට, පිරිතකට, දානයකට ඔහු නැතොත් එය මහත් අඩුවක් සේ දැනෙන තරමට දැන් හේ අගනා පුද්ගලයෙකි.

සැබවින්ම ඔහු ඉඩම් හිමියෙකි; වැවිලිකරුවෙකි. ධනවතෙකි. දානපතියෙකි.

පන්සලට, පාසලට, පල්ලියට මෙන්ම කෝවිලට ද ඔහු අතිශයින් වැදගත් පුද්ගලයෙකි.

මට ඔහු අවසන් වරට මුණ ගැසුණේ අපගේ පැරණි ගුරුවරයකුගේ මළගමෙහිදී ය. ඒ දැනට වසර තුන හතරකට කලිනි. මැදිවියෙහි අග භාගයට ආසන්නව සිටිය ද ඔහු ඉතා ප්‍රිය මනාප පුද්ගලයකුව සිටියේය. මනා ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි හේ තරුණයෙක් සේ කඩිසරයෙක් ද වූයේය.

"අම්මා ඉන්නෙ මල්ලිගෙ ගෙදර. එයා දැන් හමුදාවෙ මේජර් කෙනෙක්."

ඔහු කීවේ සතුටිනි.

"අපි පුංචි කාලෙ එකට ඉස්කෝලෙ ගිය හැටි මට අමතක නෑ."

සිය අලුත්ම හයිබ්‍රිඩ් රථයට ගොඩවෙමින් ඔහු කෙටියෙන් කීවේ ඉතා දිග කතාවකි.

බන්දුලත්, මමත් පාසල් ගියේ එකටය. අප උගත්තේ එකම පංතියේය. පාසලේ සිට ආපසු ආවේ ද එකටය. ඊට ද විශේෂ හේතුවක් නොතිබුණා නොවේ.

"අපේ බන්දු වෙන කා එක්කවත් ඉස්කෝලෙ යන්ඩ කැමති නෑ. සමහර ළමයි එයාව පාච්චල් කරනවලු. 'කනත්තෙ කොල්ලා' කියල නමකුත් කියනවලු."

එක්ව පාසැල් යන අපේ කණ්ඩායම අතරට බන්දු එක්වෙද්දී ප්‍රේමලතා නැන්දා පවසන්නීය. අපේ අක්කාත්, මාත් ඇතුළුව අපේ කණ්ඩායමේ හය දෙනෙක් සිටියෝය.

"අනේ දරුවනේ, බන්දුට අද පැන්සලක් නෑ. වැඩිපුර පැන්සලක් තියේනම් දෙනව ද?"

හිටි හැටියේ දිනෙක ඔහුට එවැනි අඩුපාඩුකම් ද මතුවිය.

අප කවුරුන්ගේ හෝ අත අමතර පැන්සලක් නොවේ නම් කාගේ හෝ දිග පැන්සලක් නිර්ලෝභීව දෙකට කැඩේ.

කුඩා බන්දුගේ අත ඉඳිආප්ප සියයක් සහිත ඉඳිආප්ප බේසමකි. එය පාසැලේ කැන්ටිමට ය. අප ඉඳිආප්ප බේසම මාරුවෙන් මාරුවට ගෙන ගියේ අපගේ කුඩා මිතුරාට සහයෝගයක් හැටියටය.

ප්‍රේමලතා නැන්දාගේත් බන්දුලගේත් ඔහුගේ කුඩා සොහොයුරාගේත් ජීවිත පැවැත්ම රැඳී තිබුණේ මේ ඉඳිආප්ප බේසම මතය.

"කනත්තෙ හිටියා වුණත් මං කාටවත් අත පාන්නෙ නෑ. මං කොහොම හරි මගෙ අහිංසකයො දෙන්නට උගන්නගන්නවා. ළිඳට වැටුණු මිනිහා ළිං කටින්ම ගොඩ එන්ඩ එපායැ."

ඇය ඒ දිනවල නිතර කීවාය.

කනත්ත යනු, ඒ අවදියේ අපගේ කුඩා සිත් භීතියෙන් හිරිවට්ටන වචනයකි. ඒ වදන ඇසෙද්දී අපට සිහිවූයේ දත් විලිස්සාගත් මහසෝනාය. ඇස් රතු ම රතු රීරියකාය. නැත හොත් අත දරුවකු වඩාගත් මෝහිනීය.

"මිනී කනත්තෙ හොල්මන් නැද්ද?"

වතාවක් පන්තියේ මිතුරකු බන්දුලගෙන් ඇසුවේය.

"නෑ, අපි තුන්දෙනාගෙන් කවුරුවත් කවදාවත් හොල්මනක් දැකල නෑ. රෑට නරි හූ කියනව අපේ ගේ ළඟටම ඇවිත්. එතකොටනම් අපේ මල්ලි ටිකක් බය වෙනව. එච්චරයි."


ඔවුනට සොහොන් පිටිය බිය ගෙන දෙන තැනක් නොවීය.

*   *   *

"බන්දුලලා කනත්තේ ගෙදරක පදිංචියට වැටුණේ කොහොම ද?"

එකල මට එය මහත් පැනයක් විය.

"එයාලා කලින් පදිංචි වෙලා ඉඳලා තියෙන්නෙ වෙන ගමක. ඒ ළමයින්ගෙ තාත්තා ගෙදරට වෙන ගෑනු කෙනෙක් එක්කන් ආවලු. ඒක නිසා ප්‍රේමලතා ළමයි දෙන්නත් ඇරන් මේ ගමට ඇවිත්. මෙහේ ඈගේ නෑදෑයො ඉන්න නිසා. ඒත් හැමදාම නෑදෑයන්ගෙ ගෙවල්වල ඉන්න එක ප්‍රශ්නයක් නෙ. ගමේ කීප දෙනෙක් එකතු වෙලා කනත්ත කෙළවරේ පැලක් අටවල දීල තියෙන්නෙ ඒකයි."



එහෙන් මෙහෙන් කනින් කොනින් ප්‍රේමලතා නැන්දා ගැන මා දැන ගත් කතාව එවැන්නකි.

නොවරදවාම දිනපතා අප සමග පාසල් යන බන්දු හිටිහැටියේ දෙදිනක්ම පාසල් නාවේය.

"බන්දුට අසනීපයක් ද දන්නෙ නෑ. අපි ගිහින් බලලා එමු."

පාසැල හමාරව ආපසු එමින් ගමනේදී අපේ කණ්ඩායමේ අයෙක් යෝජනා කළේය.

"අපෝ මේ මද්දහනෙ කනත්තෙ හොල්මන් හිටියොත්?"

අයෙක් පසුබා සිටියේය. කනත්ත කෙළවරේ ඇතැයි පවසන බන්දුලලාගේ නිවස දකින්නට මම නම් කලක සිටම මහත් වුවමනාවෙකින් පෙළුණෙමි.

අපි කනත්තට පිවිසෙන දිගු පඩිපෙළ නැග නා නා ප්‍රකාර සොහොන් කොත් අතරින් ද අලුත තැනූ මිනී වළක් පසු කරමින් ද භූමිය කෙළවරෙහි වූ කුඩා අතු පැළකට ළඟා වූයෙමු.

ඒ කුඩා පැල්පතෙහි වහලය පමණක් නොව බිත්ති ද පොල් අතු ය. ගෙබිම තරමක් උස් කොට ගොම මැටි ගා තිබිණි. හුරුබුහුටි ගෙමිදුලෙහි සරුවට වැවී තිබූ කහ සහ තැඹිලි පැහැ දහස්පෙති මල් යායත් සුදු සහ දම් පැහැති කූඩලු මල් ගොන්නත් මේ සොහොන් පිටියේ මායිම වග අපට අමතක කරලූයේය.

අප යන විට බන්දුල සුවෙන් සිටියේය. එහෙත් ඔහුගේ මව අසනීපයෙනි. ඔහු පාසල් නොගොස් සිටියේ සිය මව ආරක්ෂා කරනු පිණිසය.

"මට උණක් හැදුණා. දැන් ලොකු අමාරුවක් නෑ. මේ දරුව මාව බලාගන්ඩයි ගෙදර නැවතුණේ."

නිවසෙහි වූ එකම එක මේසය මත එක් කෙළවරෙක දරුවන් දෙදෙනාගේ පොත් ගොනු දෙක පිළිවෙලට අසුරා තිබිණි. ඇඳුම් කැඩුම් සහිත සූට්කේසය ඇතුළු තවත් අඩුම කුඩුම රැසක් මේසයේ එහා කොනේය.

පොල් අතු බිත්තියේ තැන තැන අලවා තිබුණේ පත්තර කැබලිවලින් කපාගත් නොයෙකුත් පින්තූර සහ කුඩා ලිපිය. බන්දුල පංතියේ සිංහල කාලපරිච්ඡේදයේදී කියවූ ලිපි කිහිපයක් ද ඒ අතර විය.

"මෙයාට පත්තර කෑල්ලක් පෙන්නන්ඩ බෑ. පිටි, සීනි ඔතාගෙන එන පත්තර කෑලි එහෙම පිටින්ම කියවනව. ඉන්පස්සෙ හොඳයි කියල හිතෙන ඒව කපල බිත්තියෙ අලෝනව."

බන්දුලගේ මව පැවසුවේ කිසියම් සතුටකිනි.

යටි රැවුළක් සහ දෙකම්මුල් වළ ගැසුණු කෙට්ටු මුහුණක් සහිත ඒබ්‍රහම් ලින්කන් ඇමෙරිකානු ජනාධිපති තුමාගේ පින්තූරයටත් ඔහුගේ ජීවිත කතාවටත් බන්දුල බොහෝ සේ ප්‍රිය කළා විය යුතුය.

"ඒබ්‍රහම් ලින්කන් ඇමරිකාවෙ 18 වෙනි ජනාධිපතිතුමා. පුංචි කාලෙ තාත්තගෙ ගොවිතැන් වැඩට උදවු වුණා ලු. තාත්තත් එක්ක දර පැලුවලු. පැල්පතක ඉපදිලා හුඟක් දුක් විඳලා ඉහළටම ගිය ජන නායකයෙක්. අන්තිමට නැවතුණේ ධවල මන්දිරයෙ."

බන්දුල අපට අපූරු පාඩමක් ද කියා දුන්නේය.

පසු කලෙක ඔවුනට කොළනි ඉඩමක් ලැබුණේ ගම්වැසියන් කිහිප දෙනකුගේ මැදිහත් වීමෙනි.

එහෙත් ප්‍රේමලතා නැන්දා ඉඳිආප්ප වෙළෙඳාම අත් නොහැරියාය. දරුවන් දෙදෙනා ද ඉගෙනුම අත් නොහැර උසස් පෙළ දක්වාම පවත්වාගෙන ගියෝය.

කුමක් හෝ හේතුවක් නිසා බන්දුල රජයේ රැකියාවක්ම සොයමින් කාලය කා දැමුවේ නැත.

අක්කර කාලක් වූ කොලනි ඉඩමේ තේ වගාවක් ආරම්භ කළ හේ අද ඉඩම් හිමි වැවිලිකරුවෙකි.

උසස් පෙළ දක්වා උගත් නමුදු ඔහු ප්‍රිය කළේ ව්‍යාපාරික අංශයයි.

"පැල්පතෙන් ධවල මන්දිරයට ගිය ජන නායකයා."

බන්දුල කුඩා කල ඔහු නිවැසි නිවසේ පොල් අතු බිත්තියේ අලවා තිබූ ඒ කුඩා ලියවිල්ල දැවැන්ත ශක්තියක් වී අදටත් ඔහුගේ ජීවිතය පසුපස සැඟවී ඇතැයි මට සිතේ.

**සුනිලා විජේසිංහ**

## අම්මේ මං ගෑනියෙක් ගෙනාවා



කොන්ද රිදෙනවා බං රෙදි හෝදල
කොයි කාලෙක ඉඳලා ද මේ සුමේ
දැන් රස්සාවක් කරන එකේ උඹ
මේක කියන එක වැරැද්දක් නෙමේ
රෙදි හෝදන මැෂිමක් ගෙන ආවොත්
නරක ද කොහෙවත් නැති එකේ ගමේ
කරදඹු උස් වෙනකොට මහ උදවිය
නිදහස් කරනා එක තමයි ක්‍රමේ

සති ගානක හිට මැසිවිලි නගනා
අම්මා නිතරම කරයි කරච්චල්
එක අතකට ඒ වයසක උන්දෑ
කොහොම කරන්න ද මේව මේච්චල්
උන්දැව මරවල වැඩ ගන්නව යැයි
ගමේ උනුත් මට කරයි සමච්චල්
හනික ගිහින් මැසිමක් ගැන හෙවුවේ
වෙන්න බැරි නිසයි උන්ට පාච්චල්

එක පාරෙන් ගෙවනව නම් මේකට
ඔක්කොම වෙන්නේ පනස් දෙදාහයි
අවුරුද්දෙන් ගෙවනවනම් දෙන්නම්
එක වාරිකයක් ටිකක් වැඩි තමයි
සබන් ගාල නම් හෝදන්නට බෑ
රෙදි හෝදන ලික්විඩ් එක විතරයි
මාසෙ ලයිට් බිල ඩිංගක් වැඩි වෙයි
කාලෙ ඉතුරු වෙන හින්දා ලාබයි

ඒ කොනටත් මේ කොනටත් හිතලා
ඒකට යන වියදම් ගැන බැලුවා
ඕක විතරයෑ ගෙදරට තව කොයි
තරමක් දේ ඕනැද සිහි කෙරුවා
ඔක්කොම කරන්ට් එකෙන් කර
ගත්තම එන වියදම මට දරන්න
බැරුවා
තව ඩිංගක් දුර හිතුවම ඔළුවට
කදිම උපායක් එබිකම් කෙරුවා

කන්න ටිකක් දෙන එක ඇරුණම
අවුරුද්දට ඇඳුමක් ඇති බව කීවා
කැන්දන් ගිය පසු ලුණුයි බතුයි හරි
කන්නම් කියලා හසරැලි පෑවා
ගන්න මඟුල් මොකටද බර වියදම්
කොහොමත් ඕනෑ නැති වැඩ ඕවා
ඔන්න පොතේ අස්සන් දෙක ගහලම
අම්මේ මං ගෑනියෙක් ගෙනාවා

**දිල්රූ ජයසේකර**

## සටන මැදට යන අහිංසකයෝ



යම් කෙනකු ඔබේ නීරෝගි කුඩා දරුවාව පැහැරගෙන ගොස් කොරෝනා රෝගීන් සිටින වාට්ටුවක් තුළට දමා අගුළු දැමුව හොත් ඔබට එය කොහොම දැනේවි ද?

මෙය කියවන විටත් ඔබේ හිත කලබල වෙන්නට ඇත. ඔව්.... ඒ හිතන්නට වත් අමාරු දෙයකි. එහෙත් දවසක ඔබටම ඔබේ නීරෝගි දරුවාව කොරෝනා රෝගීන් සිටින වාට්ටුවකට දමා දොරගුළු වසන්න සිදු විය හැකිය.

මෙය විහිළුවක් නොවේ. මේ වන විටත් මෙසේ කරන්නට සිදු වූ අම්මලා තාත්තලා බොහෝ දෙනකු මට මුණගැසී තිබේ.

දැනට ඇති නීතිය අනුව කොරෝනා පරීක්ෂණය පොසිටිව් වී කොරෝනා රෝගියකු යැයි දැනගත් විට අනිවාර්යෙන් රෝහලකට යන්නට සිදු වේ. එවිට රෝගි අම්මලාට රෝහලට යන්නට වෙන්නේ තමන්ගෙ හය හතර නොතේරෙන පොඩි දරුවා ද රැගෙනය. බොහෝ විට ඒ වනවිට දරුවා නීරෝගිය.

මඳක් සිතන්න. කිසිදු ලෙඩක් රෝගයක් නැති දරුවකු මාරාන්තික විය හැකි, බෝ වන ලෙඩක් ඇති ලෙඩුන් ගොඩක් සිටින වාට්ටුවක් තුළට දමා වසන්නට සිදු වන විට ඒ අම්මට කුමක් සිතෙනු ඇද්ද?

වඩාත්ම කනගාටුදායක තත්වය වන්නේ තමන්ටම තම දරුවා එතැනට රැගෙන යන්නට සිදු වීමය.

බොහෝ වෙලාවට අම්මා කොවිඩ් පොසිටිව් වන විට තාත්තාත් පොසිටිව් වී සිටිනවා විය හැකිය. දෙදෙනාට යන්නට වන්නේ රෝහල් දෙකකටය. ඒ වනවිට දරුවාට ලෙඩේ බෝ වෙලාද නැද්ද කියා කිසිවකු දන්නෙ නැත. එබැවින් එබඳු නිරෝධායනය වන දරුවකු ළඟ තබා ගන්නට කෙනකු සොයා ගන්නට නොහැකිය. බොහෝ විට දරුවාට රෝගය බෝ වෙන්නේ රෝහලේදී ය. දරුවන් ඇඳන් අල්ලති. අත් කටේ දමති. කෙසේ වුවත් වාට්ටුවක් තුළ වේශාල වයිරස් රාශියක් තිබේ.

ඇතැම් විට තත්ත්වය ඉතා භයානක ය.

මඳක් සිතන්න.

කොවිඩ් පොසිටිව් අම්මා කෙනකු නීරෝගි දරුවන් දෙන්නකු රැගෙන රෝහලට යයි. අම්මා දවස් දහයක් සිටිය යුතු රෝහලේය.

දරුවෝ දෙදෙනා නෙගටිව් නිසා ද දවස් ගණනාවක් කොරෝනා වාට්ටුවක සිටින නිසා ද ඔවුන්ගේ පීසීආර් පරීක්ෂණ කරන්නට සිදු වේ. ඔවුන් ඇතුළත් වී සත්වැනි දවස පමණ විතර එක දරුවෙක් පොසිටිව් වෙයි. දැන් ඒ දරුවා තව දවස් දහයක් රෝහලේ සිටිය යුතුය.

නැවතත් රෝගී අම්මා දවස් දහයක් රෝහලේ සිටින්නේ දරු දෙදෙනා ද සමඟිනි. ඒ අතර ඉතිරු දරුවා ද දිගින් දිගටම පරීක්ෂාවට ලක් වෙයි. අන් කළ හැකි යමක් නැත.

එහෙත් ඉතිරු දරුවා දිගටම නෙගටිව් නම් ඒ දරුවාව අම්මා සමඟ නිවෙසට යවයි.

මේ වන විට ගෙදර නිරෝධායනය වෙමින් සිටි පියා රෝගය වැලඳී රෝහල්ගත වී ඇත.

අම්මා නිවසට විත් දින දහයකින් ඉතිරි දරුවාට ද රෝගය වැලඳී ඇති බව පෙනෙන්නට තිබේ.

එවිට අම්මා නැවත රෝහලට යා යුතුය. දරු දෙදෙනා සමග අම්මා තවත් දින 10ක් රෝහලේ සිටිය යුතුය.

සිතන්න.

අම්මා කෙනකු සහ දරුවකු වෙනම තබා ගන්නට තරම් පහසුකමක් තිබුණා නම් මේ නීරෝගි දරුවන්ගෙන් රෝගී වන කිහිප දෙනෙක් බේරගන්නට තිබුණා නොවේ ද?. එහෙත් අප ඒ තරම් වාසනාවන්ත නැත.

රෝගය වැලඳෙන දරුවකුගේ ජීවිතයට කුමක් හෝ සිදු වුවහොත් අම්මා කෙනකුට එය දැනෙන ආකාරය අපට සිතා ගන්නටවත් හැකි ද ?

ඇහැලේපොළ කුමාරිහාමිට තම දරුවා වංගෙඩියක දමා කොටන්නට සිදු වූ විට දැනෙන හැඟීම මෙහිදීත් දැනෙනවා විය යුතුය.

එහෙත් එහෙම දැනෙනවා නම් දරුවන් සිටින මව්පියන් මේ තරම් රෝගයට ගොදුරු වන දේවල් සිදු කරයි ද?

මෙය ගෙතූ කතාවකැයි කෙනකුට සිතෙන්නට පුළුවන. එහෙත් සැබැවින්ම මෙය "හරි අමුතු ලෙඩකි."

බේරෙන්නට ද හැකිය.

**නුවන් තොටවත්ත**



බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර

'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න
'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්,
ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
baddaramalla@lakehouse.lk

2021 මැයි 11 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.

# බද්දරමල්ල

සතියේ 'තුන පහ' මඩිස්සලේ




# බුකර් සම්මානයට මාන බලන කිලිටි ළමයා






ආජන්ටිනාවේ දකුණුදිග සිට එන දුම්රිය බුවනෝස් අයර්ස් නගරයට ඇතුළු වූයේ කොන්ස්ටිසියෝන් නම් පෙදෙස හරහාය. දිගු කලකට ඉහත එය නගරයේ කුලීන පැලැන්තියේ උදවියගේ වාසභූමිය විය. එහෙත් 1887දී දකුණේ සිට පැතිරෙන්න වූ කහ උණ වසංගතයෙන් ගැලවෙනු පිණිස, නගරවාසී සියල්ලෝ ගෙවල් දොරවල් අත්හැර වෙනත් ප්‍රදේශයන්ට පලා ගියහ. ඔවුන්ගෙන් ආපසු පැමිණියේ පවුල් කීපයක් පමණි.

එසේ පැමිණි ඇතැම් ධනවත් වෙළෙන්දෝ අතහැරදැමූ නිවාස මිල දී ගත්හ. තවත් සමහරු පාළු මන්දිර හෝටල් බවට හැරවූහ. ඇතැම් නිවාස වැඩිහිටි නිවාස බවට පත් කෙරිණි. පැරණි තත්ත්වයට පත් නොවූ නගරයෙන් වැඩි කොටසක් පාළු වී ජරාවාස වූයේය.

මේ නගරයේ එක් මන්දිරයක් නීතිඥයන්ගේ කාර්යාල සඳහා යොදා ගැනිණි. පසුව එය දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් බවට පත් විණි. අවසානයේ මන්දිරය සංචාරක සඟරාවක කාර්යාලය සඳහා කුලියට ගැනුණ ද දෙවසරකට පසුව එය ද වැසී ගියේය.

දැන් එහි පදිංචිව සිටින්නේ කලකට පෙර මේ මන්දිරයේ විසූ ධනවත් ව්‍යාපාරිකයාගේ මිනිපිරියක වන කාන්තා විලාසිතා සඟරාවක ග්‍රැෆික් ශිල්පිනියක වශයෙන් කටයුතු කරන තරුණියකි.

මට මෙවර ඔබට එම තරුණිය හඳුන්වා දීමට සිතුණේ, 2021 බුකර් සාහිත්‍ය සම්මානය සඳහා නිර්දේශිත the danger of smoking in the bed නමැති කෙටි කතා සංග්‍රහයේ කතුවරිය වන ආර්ජන්ටිනියානු ජාතික මරියානා එන්රිකේස් (Mariana Enriquez) ගේ dirty kids (කිලිටි ළමයා) කෙටිකතාවෙනි. කතාව කියන්නිය ලෙස ඇය යොදාගෙන ඇති බැවිනි. පරිකල්පිත චරිතයක් වුව ද ඇගේ දෘෂ්ටිකෝණයෙන් අපට දක්වන්නෙ ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් හී සැබෑ සමාජයෙහි එක් පැතිකඩකි.

මේ කතාව ඇතුළත් වන්නේ මරියානා එන්රිකේස්ගේ things we lost in the fire නමැති කෙටිකතා සංග්‍රහයටය. මරියානා එන්රිකේස් යනු මහත් ප්‍රතිභාවකින් යුත් සූර කෙටිකතා කාරියක බව සනාථ කිරීමට 'කිලිටි ළමයා' පමණක් වුව ද සෑහේ.

කතිකාව හැරුණු විට මෙහි එන ප්‍රධාන චරිත තුන වන්නේ වීදි කෙළවරක දිවි ගෙවන නිවෙස් අහිමි කාන්තාවක් සහ ඇගේ පුතා යැයි හැඟවෙන කුඩා පිරිමි ළමයෙක් ද ලලා නමැති කේශ විලාසිතා ශිල්පිනියක් ද පමණි. කතාව කියන ග්‍රැෆික් ශිල්පිනිය ඇයගේ නිවෙසේ සිට දිස් වන දර්ශනයක් මෙසේ විස්තර කරයි; කෙටිකතා මාධ්‍ය තුළදී පවා මාරියා ඉතා නිර්ලෝභී ලෙස තම අවකාශය යොදාගනිමින් පරිසරය හා චරිත වර්ණනයෙහි යෙදෙයි:

"මෙම වීදියේ ජනයා බොහෝ සේ විසූ ය. එහෙත් මගේ නිවෙසේ සිට කිලෝමීටර දෙකක් පමණ දුරින් පිහිටි ප්ලාසා කොංග්‍රසේ ප්‍රදේශයෙහි තරම් විසල් ජනගහනයක් එහි නොවීය. එහි ඇති රජයේ ගොඩනැඟිලි පවා නොතකා ඒවා ඉදිරිපස මිනිස්සු පදිංචිව සිටියහ.

සෑම රාත්‍රියකම කුඩා ස්වෙච්ඡා කණ්ඩායම් පැමිණ නිවාස අහිමි මේ දිළිඳු ජනයාට ආහාරපාන බෙදා දුන්හ. ඇතැම් අය ළමයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සීත ඍතුවේ පොරවන කම්බිලි බෙදා දීම ගිම්හානයේ නම් සීත ජලය ලබා දීම වැනි කටයුතුවල යෙදුණහ.

මගේ නිවෙස ඉදිරිපිට ලැලි ගසා වසා ඇති සිල්ලර වෙළෙඳසල අසල පදිකවේදිකාවෙහි තරුණ ගැහැනියක් හා ඇයගේ පිරිමි දරුවා වාසය කළහ. මාස කීපයක ගැබිනියක වූ ගැහැනිය මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වී සිටියාය. අවුරුදු පහක් පමණ වයසැති ළමයා පාසල් නොගියේය. ඒ වෙනුවට ඔහු කළේ සාන්තුවරයකුගේ රුව සහිත කාඩ්පතක් විකිණීමය. ඉතා කිලිටි පෙනුමෙන් යුත් ළමයා වෙතින් දුගඳක් ද හැමීය. සෙම් සොටු සහිත නාසයෙන් යුතු ඔහු උමං දුම්රිය මාර්ගයේ සිටින කුඩා ළමයින් හා එක්ව දුම්පානය කරයි. නිතරම රවාගෙන සිටින ළමයා කතා කරන්නේ බැරෑඩි ගොරහැඬි හඬිනි."

ග්‍රැෆික් ශිල්පිනිය හා ඒ පිරිමි ළමයා අතර දැනහැඳුනුම්කමක් තිබුණ ද එය ඉඳහිට කෙරෙන වචනයකට දෙකකට සීමා වූවකි. ඇය ඉදිරිපස නිවෙසේ සිටින්නිය බව ළමයා දනී. එක් දිනක් අනපේක්ෂිත දෙයක් සිදු වෙයි. තරුණිය එය මෙසේ පවසයි:

"එක් රාත්‍රියක ආහාර ගෙන අවසන් වූ පසු නිවෙසේ සීනුව නාද වන්නට විය. එය මට නුහුරු දෙයක් විය. ලලා හැරණු විට වෙනත් කිසිවකු මා හමු වන්න මෙහි එන්නේ නැත. ලලාට පාළු දැනෙන ඇතැම් දිනවල රාත්‍රිය ගෙවා දැමීමට මගේ නිවෙසට පැමිණෙයි. එවන් රාත්‍රී කාලයන්හි අප විස්කි බොමින් සාම්ප්‍රදායික මෙක්සිකානු ගීතවලට සවන් දෙමින් කාලය ගෙවන්නෙමු. කෙසේ වෙතත් මධ්‍යම රාත්‍රියේ දොර සීනුව නාද කළත් කිසි කෙනකු තම දොර අරින්නේ නැත. එහෙත් ඒ කවුරුන් දැයි දැනගැනීමට ජනේලයෙන් එබී බැලූ මා දුටුවේ කුඩා කොලුවාය. මම දොර හැරියෙමි. ළමයා එතෙක් වේලා අඬමින් සිටි බව පෙනී යන්නේ ඔහුගේ අපිරිසුදු මුහුණේ ඇති වියළී ගිය කඳුළු ඉරි නිසාය.

"මොකක් ද ප්‍රශ්නෙ?"

මම ඇසුවෙමි.

"අම්ම ආවෙ නෑ."

ඔහුගේ හඬේ රළුපරළු බව මඳක් නැතිව ගොස් ඇති සෙයකි. එහෙත් එම හඬ ද අවුරුදු 5ක ළමයකුගෙ හඬට නොගැළපිණි.

"ඉතින් ඔයාට බයද?"

"මට බඩගිනියි."

ඉන් පසු තරුණිය ඔහුගේ කුස පිරෙන්නට කෑම බීම දී මැදියම් රැය තෙක් විවෘත ආපන ශාලාවකට ගොස් අයිස්ක්‍රීම් ද රැගෙන දෙයි. පිටතට යද්දී ළමයා තම අපිරිසුදු අතින් තරුණියගේ අත අල්ලා ගනියි. ඇය ඊට විරුද්ධත්වයක් නොපායි.

කිලිටි ළමයා ගත කරන ජීවිතය ගැන තරුණිය කෙරෙහි උපදින්නේ සානුකම්පිත හැඟීමකි. ඔහුව නාවා පිරිසුදු කොට පාසලකට යවා හදා-වඩා ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවීම ගැන ඇය දුක් වෙයි.

කෙසේ වෙතත් තරුණියගේ අනුකම්පාව, ළමයාගේ මත්ලෝලි මවට නම් රුස්සන්නේ නැත. ඇය තරුණියට පරුෂ වචනයෙන් බැණ වදියි; විටෙක කැඩුණු බෝතලයකින් පහර දීමට උත්සාහ කරයි. ගැහැනිය ඇය වෙත කඩා පනින්නේ කොන්ද කැඩී වේදනාවෙන් පසු වන බැල්ලියක මෙනි. එහෙත් මේ මොහොතේ ළමයා තමා නාඳුනන්නාක් මෙන් පසෙකට වී බලා සිටීම තරුණිය තුළ උපදවන්නේ අමනාපයකි.

මේ කතාව නිමා වන්නේ ළමයා සහ මවගේ අතුරුදන් වීමෙනි. විකෘති කාමුකයකුගේ අතවරයට ලක් වූ ළමයා ගෙල සිඳ මරා දමා ඇතැයි තරුණියට සැල වෙයි. එහෙත් රූපවාහිනී ප්‍රවෘත්ති නරඹන ඇයට එසේ මරා දමා ඇත්තේ වෙනත් ළමයකු බව හෙළි වෙයි. ඉන් පසු තරුණිය ළමයා සෙවීමට උත්සාහ ගනියි. මත්ලෝලි ගැහැනිය පවසන්නේ තමාට ළමයින් නොසිටි බවයි!

ගැහැනිය ගැන පොලීසියට පැමිණිලි කොට, ළමයා තම භාරයට ගෙන හදා වඩා ගැනීමට තිබුණා නොවේ දැයි තරුණිය පසුතැවිලි වෙයි. කිසියම් මොහොතක කිලිටි ළමයා තම නිවෙසේ දොර සීනුව නාද කරනු ඇතිය, යන බලාපොරොත්තුව පමණක් තරුණියට ඉතිරි වෙයි.

බුවනෝස් අයර්ස් නගරය ආසන්න කම්කරු පන්තියේ බහුලව විසූ ජනාකීර්ණ පෙදෙස්වල ළමා කාලය ගත කළ මරියානා එන්රිකේස්ට තම අත්දැකීම් මේ කතාව ලිවීමෙහි පසුබිම් වූ බව නිසැකය. අනෙක් අතට පුවත්පත් කලාවේදිනියක වශයෙන් ඇය නිතර තම සංකීර්ණ සමාජයේ තර්ක දෙස නිරීක්ෂණාක්ෂියෙන් පසු වන්නියකි. ඉතාලියේ සිට ආජන්ටිනාවට සංක්‍රමණය වූ පවුලකට අයත් තම මිත්තණිය ද හොඳ කතා කියන්නියක බව මරියානා සඳහන් කර ඇත.

නවකතා දෙකක් ද කෙටි කතාවක් ද කෙටිකතා සංග්‍රහ දෙකක් ද පළ කර ඇති මරියානා එන්රිකේස් පැජිනා (Pagina) පුවත්පතේ කලා හා සංස්කෘතික විශේෂාංග පිළිබඳ නියෝජ්‍ය කර්තෘවරිය ද වෙයි.

තම පරපුරේ සියලු ලේඛිකාවන් බිහිව ඇත්තේ ආඥාදායක පාලන කාලයක් තුළ බව පවසන මරියානා කිසිවකුට එහි බලපෑමෙන් මිදිය නොහැකි යයි කියයි. පේරු කොලම්බියා වැනි ලතින් ඇමෙරිකානු රටවල මෙන් සිවිල් යුද්ධවල අත්දැකීම් නොලැබුවත් කලාපයේ දේශපාලන ගැටුම්වල බලපෑම තම නිර්මාණ තුළට ද පිවිසෙන බව ඇය කියයි.

"මා ලතින් අමෙරිකානු ලේඛිකාවක්. ඒ නිසා මගේ කලාපයම තමා මගේ සාහිත්‍යයේ පිළිබිඹු වන්නේ. එහෙත් සන්ත්‍රාසමය ශානරයේ කතා ලිවීමට ප්‍රියකරන මා එහිදී ෂර්ලි ජැක්සන්, ස්ටෙෆාන් කින්ග්, එච්.පී. ලව් ක්‍රාෆ්ට් වැනි ගත්කතුවරුන් ගේ ආභාසය ලැබුවා."

මගේ දැනීමේ හැටියට මරියානාගේ කෘතීන් හෝ කෙටිකතාවක් හෝ මෙතෙක් සිංහලට නැඟී නැත. ඇය දැන් බුකර් සම්මාන නිර්දේශිත කෙටිකතා කාරියක නිසා මේ එයට සුදුසුම කාලයයි.

කිලිටි ළමයා කතාව මුලින්ම පළ වූයේ 'මැක්ස්වීනිස් 46' නමැති සඟරාවක ය. එහි ලතින් අමෙරිකානු විශේෂ කලාපය සඳහා අපරාධ තේමාවේ (crime) කෙටිකතා එවන ලෙස ඒ රටවල ලේඛක ලේඛිකාවන් දහතුන් දෙනෙකුට ආරාධනා කෙරිණි. එහෙත් ලැබුණු නිර්මාණ බහුතරයක් ගැන කර්තෘ මණ්ඩලය සතුටට පත් වූයේ නැත. සඟරාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ ඩැනියෙල් ගම්බර් තෝරාගත් කෙටිකතා කිහිපයක් රැගෙන ගියේ ගෙදර යන අතර දුම්රියේදී කියවීමටය. පසුව ඔහු මෙසේ සඳහන් කළේය.

"මම මරියානා ගේ 'කිලිටි ළමයා' කතාව කියවන්න පටන් ගත්තා. එය කොතරම් තදින් මගේ සිතට වැදුණා ද කියතොත්: මම බහින දුම්රිය පොළ පහු වුණා, දැනුණේ නෑ."

**කපිල කුමාර කාලිංග**



# අර්ධද්වීපයක කඳුළු

## කැදැල්ලක නෙත



වෙසක් මහා සුළඟ හුරුපුරුදු අපට මේ අකල් වැසි අරුමයකි. තවදුරටත් සරුංගල් සිහින නොදකින මගේ කොල්ලන් වෙසක් සුළං පතා උන්නේ දැයි නොදනිමි. ගගන සරන සරුංගලයක සාඩම්බර හිමිකරුවකු වන්නට වයස බාධාවක් නොවේ. එහෙත් තවමත් සිය මාරක හස්තයෙන් ලෝකයේ බොටුව හිර කරගෙන හිඳින කොරෝනා වසංගතය අප සියලු දෙනාගේම සිහින සැහැසි ලෙස උදුරා ගනියි. අප සියල්ලට පෙර පණ නල ගලවා ගත යුතුව තිබේ.

ඒ ඈත අතීතයේ අන්ධකාර ගිරි ලෙන මැද ගුගුරන අහස හෝ දලුලන පොළොව පිළිබඳ මෙලෝ හසරක් නොදැන බියෙන් සැකයෙන් බඩ සා නිවා ගැනීමේ ඒකායන පරමාර්ථයෙන් හෙබියා වූ අපේ මුතුන් මිත්තන් පරිද්දෙන් ම අපට ද කුටුම්බය තුළ සිරගත වන්නට සිදු වී තිබීම කවර නම් උත්ප්‍රාසයක් ද? එකම සංසිද්ධිය නැවත නැවතත් සිදු වන බව කියවේ.

කෙසේ වෙතත් හැල්මේ දිව ගිය ලෝකය මඳකට නවතා ලන්නට සොබාදහම මිනිසා මත පැමිණ වූ මේ දඬුවම කොතෙක් ක්‍රෑර ද යන වග අපේ අසල්වැසියා දිනෙන් දින මොහොතින් මොහොත අපට පමණක් නොව මුළු ලොවටම පසක් කර දෙයි. ඒ මහා ඛේදවාචකයන් සසලව ඇල දියට බට සැණින් මහ වැස්සක් ඇද හැලිණි.

"ඇළට වහින කොට කොච්චර ලස්සන ද?" කෑගසමින් ඇළ කණ්ඩියේ සිට දියට පනින්න තරම් දඟකාර කොල්ලන්ට මම තරවටු නොකළෙමි. එක් බඳු රූ සොබා දරන නිවුන්නන් කෙළිලොල් වන කල ඔවුන් උස් මහත් කර ගන්නට මා විඳි වෙහෙස සිහිපත්ව දෙනෙතට කඳුළු උනයි. නාන්නට සහ රෙදි පෙරෙදි සෝදන්න පමණක් නොව කඳුළු සලන්නට ද ඇළ තරම් කදිම තැනක් තවත් තිබිය හැකි ද?

වරෙක ඒ ලොව ප්‍රකට හාස්‍ය රංගධරයාණන් වන චාලි චැප්ලින් කී කියුමක් සිහියට නැගෙයි:

"මම වැස්සේ ඇවිද යන්න කැමැත්තෙමි. මන්ද යත්: එවිට කිසිවකුටත් මගේ ඇසින් ගලා හැලෙන කඳුළු නොපෙනෙන බැවිනි."



හුදු හාස්‍යයෙන් රසිකයා පිනවන්න නොව; හාස්‍යයට ඔබ්බෙහි මනුෂ්‍යත්වය සහ මිනිසා පෙනෙන පීඩාවන් විදහා පාමින් ප්‍රඥාව අවදි කළ ඒ අසහාය රංගන ශිල්පියා කී පරිද්දෙන් ම මම ද ඇළට කැමැත්තෙමි.

දුඃඛ දෝමනස්සයන් සිතෙහි සිර කොට නොගෙන නෙතින් වැගිරිය යුතුය. ඒ සඳහා ඇළට වඩා සුදුසු අන් තැනක් නොවෙයි. මගේ දරුවන් දැකිය යුත්තේ මගේ සිනාවන් මිස කඳුළු නොවේ.

වැස්සේ ඇළේ පිහිනන හා එකිනෙකා හඹා යන කොල්ලන්ට හොරෙන් මා කඳුළු සලන්නේ අපේ ආදරණීය අසල්වැසියා අද මුහුණ පා සිටින ඛේදවාචකය විඳ දරා ගත නුහුණු බැවිනි.

කටියාව මහජන පුස්තකාලයෙන් මා කියවූ 'අසිරිමත් ඉන්දියාව' නම් කෘතිය මා තුළ ජනිත කළේ මෙතෙකැයි කිව නොහැකි තරමේ ඉන්දීය අනුරාගයකි. ප්‍රකට ලේඛක ඒ.ඇල්. බාෂාම්ගේ 'අසිරිමත් ඉන්දියාව' මගේ ජීවිතය වෙනස් කළ කෘති අතුරින් එකකි.

බුදු දහම ඇතුළු අනේක දෑ අපට දුන් ඉන්දියාවේ සිය ගණින් වන ජාතීන් හා ආගමිකයන් වෙතින් මා දුටු ඒ සංස්කෘතික විවිධත්වය ද විචිත්‍රත්වය ද අනෙකා ඉවසන්නට මට මහෝපකාරි වූවා නිසැකය.

කොරෝනා වසංගතයට ගොදුරුව මිය යන බහුතරයකට ඔක්සිජන් ලැබුණේ නම් එකී මරණ සංඛ්‍යාවෙන් අඩක් පමණ අඩු කර ගත හැකිව තිබුණේ යැයි මාධ්‍ය ඔස්සේ වෛද්‍යවරු පවසති.

ඔක්සිජන්!

තුරක මහිමය එයයි. හරිත පැහැය රස රහස එයයි. ඇළ ද අප ද තෙමා දමමින් ඇද හැලෙන වැස්සට මං පාදන්නේ තුරක් මිස අන් කුමක් ද?

පරිසරය නොතකා හැල්මේ දිව ගිය මිනිසා ඔක්සිජන් යැද වැලපෙන්නේ නම් අප ශිෂ්ටාචාරයේ විද්‍යාවේ හා තාක්ෂණයේ පිහිටෙන් අත්පත් කරගත් ලෝකයේ අරුතක් ඇද්ද?

අවසානයේ නිරුවත් සත්‍යය හමුවේ අප පිළිබඳ අප විළි වැද හැකිළෙමු. ඉරට, හඳට, ගසට, පොළොවට, ගඟට දණ නමස්කාර කළ අපේ ආදිතම මුතුන් මිත්තන් හෙළා දකින්න අපට තවදුරටත් නොහැකිය.

"හරි ලස්සනයි නේද අම්මේ? වැහි බින්දු වතුරට වැටෙන කොට දිලිසෙනවා!"

මගෙ බාලයා අපමණ සතුටින් කෑගැසුවේය. "මැණික් කැට වගේ..." සිවු වැන්නා ද සිය නිවුන් සොහොයුරා සමග එකඟ විය.

"වතුර බින්දුවක් වටිනවා, මැණික් ආකරයකට වඩා. ඒත් ඒක තේරුම් ගන්න කොට පරක්කුයි. ජීවිතයයි මරණයයි තීන්දු කරන්න ඔක්සිජන් සමත් වන බව අපට මෙච්චර කල් අමතක වෙලා තිබ්බා වගේ තමයි."

මම ළතැවුලෙන් කීවෙමි.

**ශාන්ති දිසානායක**

දිනමිණ
2021 මැයි 11 අඟහරුවාදා

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ





# රික්සෝවෙන් ඉස්කෝලෙට

## මතක පොතෙන්

පුංචි කාලෙ මතක් වෙනව මට මං ඉස්කෝලෙ ගිය. මං ඒ දවස්වල ගියේ එතකොට වැල්ලවත්තෙ තිබුණු, ඇලීතියා එකට. ඇලීතියාවට මාව දාපු දවසෙ අපෙ අම්මට හිගින්ස් මැතිණිය පොතක් දුන්නා. පොතේ නම 'වන පස මල'. අකුරු එකතු කරල කියවන්න පුළුවන් කාලෙ ඉඳල මාත් කියවනව ඒ පොත. ඕල්කොට් මහත්තයගෙ ඡායාරූපයක් තිබුණ පිටුවක් පිරෙන්නම. තව හුගාක් ලිපි මහප්පරාණත් එක්ක. මං ඒ ඉස්කෝලෙ හිටියෙ තුන්වෙනි පන්තිය අවසාන වෙනකං විතරයි. පෞද්ගලික ඉංගිරිසි ඉස්කෝලයක් නිසා ගානත් ටිකක් සැරයි. ගෙවාගන්නත් අමාරු වෙන්නැති අපෙ අම්මලාට.

පළමු දවස් දෙක අම්ම එක්ක ඉස්කෝලේ ගියාට; ඊළගට යන්න වුණේ රික්සෝවෙන්. රික්සෝව ඇදගෙන දිව්වෙ සුප්පයියා. මහ පාන්දර රික්සෝවෙ සැප ආසනේ මාවයි තවත් ගැනු ළමයෙක්වයි ඉන්දවගෙන, විදුලියක් වගේ මහා වේගයෙන් දුවනව මහ වාහන අතෝරක් නැතුව යන ගාලුපාර දිගේ. දෙහිවල ඉඳං වැල්ලවත්තට; ආයෙ දවල් එකොළහෙ කණිසමට වැල්ලවත්තෙ ඉඳං දෙහිවලට. දවස් පහේම රික්සෝ අයිය, ඒ කියන්නෙ, නඩරාසා සුප්පයිය, දුවනව ඉහින් කණින් දාඩිය පෙරාගෙන. රික්සෝවත් ඇදගෙන මිනිස් අස්පයෙක් වගේ. සෙරෙප්පු දෙක එහා මෙහා වෙන හින්දා, ලේස් පටියකින් කකුල් දෙක සෙරෙප්පු දෙකට වෙලාගෙන. මහ වැස්ස ගිනියං අව්ව ගැන ගනිච්චියක් නෑ රික්සෝ අයියට. අන්තිමට අපිව අරන් ඇවිත් අපිව පරෙස්සමට බාලා තමයි විවේකයක් ගන්නෙ. බොක්සිං බැනියම; පෙගිල උතුරන තරමට, මහ දාඩිය කන්දරාවකින් උඩුකය වැහිලා. අනේ අපෙ රික්සෝ අයිය...

දූවිල්ල එනවට අපිව රැකගන්න රික්සෝ අයියා අපි ඉඳගෙන ඉන්න සීට් එකට ඉස්සරහින් දානවා ආවරණයකුත්. යද්දි වැහි රැල්ලක්වත් වැටුණොත් දාන්නෙ ඒ ආවරණයමයි. ඒත් වැස්සටත් තෙමීගෙන දූවිල්ලත් රොද බැඳගෙන, සුප්පයියා දුවනව; පිම්මේම දුවනව. වෙලාවට ඉස්කෝලෙට අරන් යන්න අපිව.

දැනට රික්සෝවෙ බරයි අපේ බරයි අරන් අනේ දුවන දිවිල්ලක්. හති දාගෙන දුවගෙන ඇවිදින් යන්තම් කඩේ ළග නවත්තනව රික්සෝව. අපිවත් බස්සවනව. අපේ ගේ ළගමයි ඉන්නෙ මං එක්කම ඉස්කෝලෙ යන මගෙ පුංචි ගමන් සගයත්. ඒ හින්දා තවත් දුරකට දුවන්න ඕන නෑ රික්සෝ අයියට.

ඊට පස්සේ ඔහු නිවී සැනසිල්ලෙම බොනව කිරි තේ වතුර එකක්. "සුම්මා තේ තන්නි වේනම්." සුප්පයියා එහෙම කියන්නෙ අතේ තියෙන කාසි ඉතුරු කරගන්න කියල දන්නව අපෙ අම්මා. "පාල් තේ තන්නි." අම්මවත් ආච්චිවත් සුප්පයියාගෙන් මේ වෙලාවට සල්ලි ගන්නෙ නෑ. රික්සෝ අයියා ඔළුවෙ බැඳගත්ත ජටා ලේන්සුවෙන් ඔළුවෙ පිරිච්ච දාඩියයි ඇඟපතේ දාඩියයි පිහදගන්නෙ සතුටු හිනාවකින්. "එත්තින මනි හාමිනේ?" ඇගේ මූණේ හිනාවක් විතරයි. සල්ලි ගන්නෙ නෑ ඔහුගෙන්. "මෙත්ත පෙරිය උපහාරම්"

පාසල් ගිහින් එන හැමදාටමත් මේ කතාබහ ගලාගෙන යනව නිස්කාන්සුවෙම.

රික්සෝවෙ මේ කුලිය හැරුණම තවත් තියෙනවා රාජකාරි ඇතිපදම් අපේ රික්සෝවෙ අයියට.

රික්සෝ අයියා රික්සෝව ගාල් කරන්නෙ පට්ටිය වත්තෙ. එතැන කරදරයක් නෑ කාටවත්ම. රොද්‍රිගෝ මහත්තයමයි අවසර දුන්නෙ සුප්පයියට පට්ටියෙ ගෙදර ඉඩක් සෙවනකට.

රික්සෝ අයියා, ඇවිත් තියෙන්නෙ දකුණු ඉන්දියාවෙ ඉඳල කියලයි අපෙ අම්මල කියන්නෙ. ඒ ඇවිත් තියෙන්නෙ පීනගෙනලු. කඩේට යන එන අය ඔහුට කියන්නෙ 'කල්ලතෝනියා' කියල. මහා සාගරය පීනගෙන එන අයට වෙන්නැති එහෙම කියනව ඇත්තෙ කියලයි පුංචි මට හිතුණේ. නැවෙන්, අහසෙන් එන අයට විතරක් කියනව ඇති සුද්දො කියල. ඒදවස්සල මට හිතුණෙ එහෙමයි. රික්සෝ අයිය අපේ සිංහල කැඩිකැඩී කතා කරද්දි, හරි අපූරුයි අහන් ඉන්න! අම්මලට හොඳට දෙමළ කතා කරන්න පුළුවන් හින්දා රික්සෝ අයියගෙ වචන උච්චාරණය ගැන ඒ හැටි වග විභාගයක් නම් වුණේම නෑ. කීර කොටුවෙ උන්න වැන්දඹු 'කන්දයියා අම්මගෙ' ගෙදරට යන්න එන්න පටන් ගත්තට පස්සෙ ඔහු එහේම බින්න බැස්ස. ඒක එහෙම වෙච්ච එක කොච්චර හොඳ ද?

කාලය චුට්ට චුට්ට ඉගිල්ලෙනව සුප්පයියාට ඉස්සර වගේම කුලී දුවන්න, කකුල්වලින් අශ්වයා වගෙ පියාඹන්න, ගාලුපාරෙ ඉඩකඩ හම්බු වෙනව. කකුල් දෙකට පින්සිද්ධ වෙන්න හම්බ වෙන කුලියෙන් මලියෙන් තමයි උන්දෑ ජීවිතේ ගැට ගහගන්නෙ.

ඒත් මහ මොකද්දෝ අන්ධකාර කලදවසක් උදා වුණා රටටම වගේ.

පාටට, ජාතියට, භාෂාවට එදිරිවාදිව රටම කැලඹෙන්න ගත්තෙ උන්හිටිගමන්. වෙල්වනායගම් මහත්තය දෙමළ ජාතිය වෙනුවෙන් කෑගහනව එක පැත්තකින්. සිංහල අය සඟ, වෙද, ගුරු පරපුරේ උදවිය එයාලගෙ අයිතිවාසිකම් උදෙසා සටන් වැදෙනව තවත් පැත්තකින්. ගරුතර සංඝ රත්නයත් බුදුන් වහන්සේගෙ දේශනා පතුරවනවා රට සන්සුන් කරන්න.

ඒත් අපේ අය ලේ කෝපයෙන් උරණ වෙලා වගේ. ජාති ආලයෙන් ඔද වැඩිලා... කැති පොලු මුගුරු අරන් සටනට වැදිලා... වාහනවල ශ්‍රී සටහන් කරන්නටයි පොරකන්නෙ.

නිසංසල සාමකාමී සුන්දර ජීවිත රටාව මුළුමනින්ම ඉරිතළලා. එකට බැඳුණු ආදරණීය මිනිස් ප්‍රජාව නන්නත්තාර වෙලා වගේ. රටම කොහේවත් නැති ලේ පිපාසාවකින් ආතුර වෙල වගේ.

කැති ගහන්න බලාගෙන දුවන් එනවා. පාටින් විතරක් වෙනස් වුණු තවත් මනුස්ස කැලතක් හොයාගෙන.

හයර් යන්න වාහනයක් හොයාගන්න බැරි වුණු දවසක, කොළඹ මහ ඉස්පිරිතාලෙටම එක පිම්මේම ඉගිළුණ සුප්පය්‍යා නිසා දරුපැටියකුයි අම්මෙකුයි බේරගන්න පුළුවන් වුණ හැටි එදත් කතා වුණා ගමේ අය. ඒ වුණාට ඒ ඔක්කෝම, කලකෝලාහල මැද්දෙ කාට කාටත් අමතකයි වගේ.

"කෝ... කෝ... අර කල්ලතෝනියා හාමිනේ, කොහෙද ඌ?"

මිනිස්සු වෛරයෙන් ඔත්පළ වෙලා. උන්මාද වෙලා. අහිංසකම අහිංසක මනුස්සයෙක්ව හොයනව කැති ගාන්න.

රික්සෝ අයියා හැංගුණේ අපේ වත්ත පිටි පස්සෙ උස පොල් ගහට නැගලා. මිනිස්සුන්ට සැක හිතිලා ආව අපේ වත්ත පිටිපස්සටත්. කවුරුවත් හිටියෙ නෑ පේන්න. අම්මා ජාති ආලයෙන් පිරිච්ච සේනාවට ඇඹුල් ඇතුව දේශනා කරල පන්න ගත්තා වත්තෙන්. ඒත් උන් එතනිං නැවතුණේ නෑ. හොයාගෙන හොයාගෙන ගිහින් පට්ටිය වත්තෙ ගාල් කරපු රික්සෝවට භූමිතෙල් දාල ගිනි තිබ්බා. "අනේ ඒ මනුස්සය හරි හම්බු කරන් කාපු එක නේද මේ නොසණ්ඩාලයො ගිනි තිබ්බෙ!" ආච්චිලා අම්මලා නොසෑහෙන්න දෙස් දෙවොල් තිබ්බා; ජාති ආලෙන් පිරුණ සේනාවට. එහෙව් එකේ සුප්පයියගෙ ජීවිතේ ඔහොම බේරිච්ච එකයි වටින්නෙ, වෙන මොකුත් ආපදාවක්ම නොවී. අපේ ගෙදර කවුරුත් වගෙ හිත හදා ගත්තෙ එහෙම හිතල.

හෙමින් සීරුවෙ ගහෙන් බැහැල ගෙයි පිළිකන්නට ආපු රික්සෝ අයියට රාත්‍රි එකට දෙකට විතර කෑම වේල දුන්නෙ අපේ ගෙදරින්.

තවත් කාලයක්ම ගියා රටම සන්සුන් වෙන්න. පස්සෙ පස්සෙ ඒ සන්සුන් බවත් එක්කම තමන් අතින්ම වුණු වැරැද්ද ගැන හිතිල හැමෝම එකතු වෙල සුප්පයියට අලුත් රික්සෝවක් අරන් දුන්නා රස්සාව කරගෙන යන්න. අපේ ආච්චිලා, මාමලා, අම්මලා ඔක්කෝම වගෙ ඒ පින්කමට හොඳටෝම දායක වුණා.

**ලක්ෂ්මී බෝම්බුවල**



# සුදෝ මගේ එන්න අනේ හායි හායි හායි

# ප්‍රේම තටාකයෙන් ඇසුණු සිනමා ගීතාවලිය



විකසිත රෑ හතට මා තේරූ ගී හත පිළිබඳවත් මා සමග පිළිසඳරේ යෙදුණු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉනූෂා වීබැද්ද සොහොයුරිය ගැනත් පසුගිය සතියේ ලියවුණු මතක සටහන කියවා තිබූ සහෘදයෙක් මගෙන් ප්‍රශ්නයක් අහනවා.

"ඇයි පහුගිය දවසක ලක්හඬ ප්‍රේම තටාකයේ මොනිකා සේරසිංහ සමග පරණ චිත්‍රපට සින්දු ගැන කළ වැඩසටහන ගැන මොකුත් නොලියන්නෙ?"

ඇත්ත නේන්නම්. ප්‍රේම තටාකය අද්දරදී අපේ සිනමාවෙ පළමුවැනි දශකයෙ තිරගත වුණු චිත්‍රපට අතරින් තෝරා ගත් ගීත දහහතරක් ගැන මොනිකා මා සමග කතාබහට එකතු වුණේ ගුවන් විදුලියෙ ඉනූෂා වගේම ඉතා හොඳ පෙර සූදානමකින් හා කියවීමකින් පසුව බවයි මට හැඟුණේ. ලක් හඬ ගුවන්විදුලියෙන් ප්‍රචාරය කෙරෙන ප්‍රේම තටාකය වැඩ සටහනට ආරාධිතයා විසින් තෝරා දිය යුත්තෙ ප්‍රේමය විෂය කොට ගත් ගීත වීම විශේෂත්වයක්. මීට පෙර අවස්ථා දෙකක දීම මොනිකාගෙන් ලද ඇරියුමට අනුව ඉතා අපහසුවෙන් ප්‍රේම ගීත රාශියක්ම තෝරා දුන් බව මතකයි. පහුගිය අවුරුද්දෙ මැද ඉඳල වගේ මොනිකා සැලසුම් කරල ඉදිරිපත් කරන ප්‍රේම තටාකය සතියෙ දවස් පහකම ලක් හඬින් ප්‍රචාරය වන අසන්නන් ප්‍රිය කරන වැඩසටහනක්. මීට පෙර අවස්ථා දෙකකදී පමණ ප්‍රේමණීය ගීත සමග මොනිකා හා කතා බහ කොට තිබුණත් පසුගිය දිනෙක යළි ගීත තෝරා දෙන්නැයි ඉල්ලීමක් කළ මොහොතේ මා මොනිකාට යෝජනා කළේ අපි මේ වතාවෙ චිත්‍රපට ගීත පමණක් තෝරමු කියලයි. ඒ චිත්‍රපට ගීතත් අපේ සිනමාවෙ පළමු දශකයෙ (1947-1956) තිරගත වුණු චිත්‍රපටවලින් පමණක් තෝරා ගමු යයි මා කළ යෝජනාවට මොනිකා එකඟ වුණේ පසු වැඩසටහනක දී චිත්‍රපට ගීතයේ විකාශය පිළිබඳ ඉතිරි දශක කීපයක ගීත ගැන කතාබහකට ඉඩ වෙන් කරගන්න හිතල වගේ.

මේ දශකයේ තිරගත වූ චිත්‍රපට බහුතරයක් ඉන්දියාවේදී රූපගත වීම හා ඉන්දීය අධ්‍යක්ෂවරුන්ගේ චිත්‍රපට වීමත් කැපී පෙනෙනවා. මේ සමයේ සිනමාව කලාවකට වඩා හුදු ව්‍යාපාරයක් ලෙස සැලකූ බව පෙනෙන්ට තියෙනව. දේශීය සිනමාවක කලාත්මක ඇරඹුම 1956 රේඛාව සමග සිදු වූ බව කිව යුත්තක් නොවේ. චිත්‍රපට පුරා ද්‍රවිඩ හා හින්දි ආභාසය නොඅඩුව තිබුණා වගේම චිත්‍රපටවලට නැතුවම බැරි වූ ගීත තුළ ද හින්දි හා ද්‍රවිඩ තනු, හා අනුකරණාත්මක සංගීතයද ඇතුළත්ව තිබුණා. මේ අවාසනාවන්ත තත්ත්වය තුළ ස්වතන්ත්‍ර ගීත සාහිත්‍යයක් බිහි වීම වෙනුවට ප්‍රබන්ධකයන්ට සිදු වුණේ ඔවුන්ට දෙනු ලැබූ හින්දි හෝ ද්‍රවිඩ ගී තනුවකට වචන එබ්බවීම පමණයි. ඒ වුණත් අසෝකමාලා, සැඟවුණ පිළිතුර, එදා රෑ චිත්‍රපට සඳහා මොහමඩ් ගවුස් ද, අහංකාර ස්ත්‍රී හා මාතලන් සඳහා ආර්. මුත්තුසාමි ද ස්වතන්ත්‍ර ගී තනු නිර්මාණය කළ බව අප දන්නවා. මේ සටහනෙහි ශීර්ෂය අදාළ දශකයේ චිත්‍රපට ගීත සාහිත්‍යය පිළිබඳ ඉඟියක් සැපයෙන ගීත ඛණ්ඩයක්. සිංහල සිනමා වංශ කතාවේ පස්වන චිත්‍රපටය ලෙස 1948 දී තිරගත වූ වැරදුණු කුරුමාණමෙහි මේ ප්‍රේම ගීතය ගයන්නී එවකට නිළි රජින ලෙස විරුදාවලී ලත් ගායිකා රුක්මණී දේවි. ජීවන්ලාල් නන්දන කීර්තිගේ ගේය කාව්‍ය සංකල්පනාව සී.එන්. පාණ්ඩුරංගන් (ඉන්දීය ජාතික ) සමග බී.එස්. පෙරේරා (ශ්‍රී ලාංකික) විසින් සංගීතවත් කරනවා.

**මෝරනවා ප්‍රේමේ හදේ**
**නිලම්බරේ තාරපති සේ හායි හායි හා**
**චන්ද්‍රා මගේ, මා ඔබගේ - ශ්‍රීමතී චන්ද්‍රා මගේ**
**නාඹර මා විනොද හදවතේ**
**බබලනවා ශ්‍රියාව ඇඳි ඔබේ**
**සුදෝ මගේ එන්න අනේ - හායි හායි හා**
**සීනෙන් පෙනේ**
**රූපෙ ඔබේ රාත්‍රියේ චන්ද්‍රා මගේ**

හදවතේ ප්‍රේමය මෝරයි. කෙසේ ද යත් නිල් අහසේ පැයූ චන්ද්‍රයා ලෙසය. එය අපට වැටහේ. එහෙත් හායි හායි කියන්නේ කුමකට ද? ඇගේ හදවත නාඹරය. විනෝදය. නාඹර හදවත්, විනෝද හදවත් ඇත්තේ කොහිද? අනේ මගේ සුදෝ එන්න හායි හායි. ඇගේ සිතෙහි ප්‍රේමයට අධිපති දෙවි රජා ඔබ ද සුදෝ? ප්‍රේම ජලය ඇත්තේ රන් කොතලේය. එය ඔබට පූජාකරමි.

හායි හායි කියනා පෙම්වතියන්, නාඹර, විනෝද හදවත් ඇත්තියන්, ප්‍රේමයට අධිපති දෙවි රජාට සුදා කියමින් අමතන පෙම්වතියන් අපගේ මුල් කාලීන චිත්‍රපට ගීත සාහිත්‍යය තුළ හමු වූ බව සිහිපත් කළා. ප්‍රේමණීය ඇමතුමක් මෙහි කොතැනක හෝ වේ ද?

පැරණි චිත්‍රපට ප්‍රේම ගීතාවලිය වර්ණවත් කළ මොහමඩ් ගවුස් සංගීතඥයාගේ ස්වතන්ත්‍ර තනුවකට ඩී.ටී. ප්‍රනාන්දු රචකයා ලියූ අසෝකමාලා චිත්‍රපටයේ මේ ගීතයෙන් මගේ තෝරාගැනීම ඇරඹුණේ. ස්වතන්ත්‍ර තනුව මෙන්ම ගේය පද රචනය ද කලාත්මකයි. ඉන්දීය ගායිකා භාග්‍යරතී විසින් ගායනා කළ ද ගීත සංකල්පනාව අපූරුය. සංකල්ප රූප සහිතයි. විචිත්‍රයි.

**ශාන්ත මේ රාත්‍රියේ**
**චන්ද්‍රාකාන්තී දේ ආලෝකේ**
**ආයේ ආයේ සිත ප්‍රබෝධ වේ**
**සිසිල ආවෙ ප්‍රීතිය මෝරා**
**යෞවන ප්‍රේමේ සදා**
**හා... ආ... කුමුදුනී නැග තරංග සිනා**
**ආයේ ආයේ සිත ප්‍රබෝධ වේ**
**ශාන්ත මේ රාත්‍රියේ**

මෙබඳු ගීතයක් ඉඳ හිට හමු වුවත් මේ දශකය පුරා (1947-1956) තිරගත වී ඇති චිත්‍රපට 39ට ඇතුළත් වූ හාරසියයකට අධික ගීත සංඛ්‍යාවෙන් බහුතර ප්‍රේම ගීත රචනා සාහිත්‍යික ගුණයෙන් හීන ඕළාරික ප්‍රේම යාදිනි ස්වරූපයේ බොළඳ රචනා. අත්දැකීම් වශයෙන් හෝ අපූර්ව ගුණයෙන්, කාව්‍යාත්මක බසකින් රචනා වූ ගීතයක් හමු වුණි නම් ඉතා කලාතුරකින්.

ප්‍රේමය විෂයය කොට ගත් විනෝදාත්මක ගීතයක් ද මගේ තෝරාගැනීමට එක් වූයේ එදවස ගීත වට්ටෝරුවට ඇතුළත් වූ ජොසී මනප්පු වැනි චරිත සඳහා ලියවුණු ගීතයක් ලෙසයි. වැරදුණු කුරුමානම චිත්‍රපටයේ ජොසී මනප්පු වෙනුවට බබයියා හා මෙරායා ලෙස මේ යුග ගීතය ගැයූවේ එඩී ජයමාන්න හා පේමිණි කාන්තාය.

**පායන සඳ වට කර තරුව වගේ මූණ පෙනේ දිලිසෙන ආලේ**
**ආදර බඹර කෝකිල ගමන නිසා හිත වැටුණා ඔබෙ හොඳ කාලේ**
**තාලෙට අඩිය තියමු පම් පම් ගා ෂෝක් එකේ බැඳල කසාදේ**
**ඒ දැක ගැහැනු පිරිමි අපේ දිහා රවා බලයි මගෙ සුදු මැණිකේ**
**සෝබන ළපටි කෙහෙල් දල්ල වගේ ගෙයි මුල්ලේ ගැහැනු හැදෙන්නේ**
**ඒ දුටු කපටි පිරිමි අප රවටා මහ පාරේ සිගා යවන්නේ**
**මේබව නොදැන ලොවේ අපරාදේ ගෑනුන්ටයි වැරදි කියන්නේ**
**මා පැණි වරක මදුල ටිකිරි සුදා ඔබ නැහැනේ එහෙම කරන්නේ**

තාලෙට අඩිය තියමු පම් පම් ගා ෂෝක් එකේ බැඳල කසාදේ, සෝබන ළපටි කෙහෙල් දල්ල, මා පැණි වරක මදුල ටිකිරි සුදා වැනි වදන්වල ශබ්ද ධ්වනියට එහා ගිය අරුතක් ජනනය වෙන්නෙ නෑ.







ප්‍රේම තටාකයට මවිසින් තෝරා දුන් පැරණි චිත්‍රපට ප්‍රේම ගීත අතර අද දක්වාම අතිශය ජනප්‍රිය ගී රසක් තිබුණා. ඒවායේ අරුත නොව ගායනය, තනුව, සංගීත නිර්මාණය හේතුකොට ගෙන රසික මතකයෙන් ඈත් නොවූ ගීත කිහිපයක් ලෙස හඳුන්වා දුන්නා. මෙම ගීත සඳහා පසුබිමින් තිරයේ දිස්වුණු නළු නිළි ජවනිකා බොහෝ ප්‍රේක්ෂකයන්ගේ මතකයෙන් ඈත්ව ගොස් නැති බව කියන්නට පුළුවන්. ඒ කාලයේ ජනප්‍රිය තාරකා වුණු රුක්මණී දේවී, ශාන්ති ලේඛා, ෆ්ලොරිඩා ජයලත්, ක්ලැරිස් ද සිල්වා, ඩොමී ජයවර්ධන, හර්බි සෙනෙවිරත්න, හර්බට් එම්. සෙනෙවිරත්න, ස්ටැන්ලි පෙරේරා, ප්‍රේම් ජයන්ත්, එඩී ජයමාන්න, ශර්ලි බ්ලයිත්, මේබල් බ්ලයිත්, හියුගෝ ප්‍රනාන්දු, මාක් සමරනායක, රීටා රත්නායක, අරුණ ශාන්ති, ආනන්ද ජයරත්න, රවීන්ද්‍ර රූපසේන, ලීනා ද සිල්වා, සිරිමතී රසාදරී, ශර්ලි ගුණවර්ධන ආදීන්ගේ රඟපෑම්වලට ප්‍රේක්ෂකයන් ආදරය කළ බව සිහිපත් කළා. මේ අය වෙනුවෙන් පසුබිමින් ගීත ගායනා කළ නිළි ගායිකා රුක්මණී දේවී, ලතා වල්පොල, ධර්මදාස වල්පොල, ජී.එස්.බී. රාණි පෙරේරා, මොහිදීන් බෙග්, අමරදේව, එච්.ආර්. ජෝතිපාල, සුසිල් ප්‍රේමරත්න, හරුන් ලන්ත්‍රා, සිසිර සේනාරත්න, කේ.රාණි, ජමුනාරාණි, ඉන්ද්‍රානි විජේබණ්ඩාර ආදී ගායක ගායිකාවන් ගායනා කළේ හින්දි තනුවක් ද ද්‍රවිඩ තනුවක් ද යන්න නරඹන්නන්ට, ශ්‍රාවකයන්ට ප්‍රශ්නයක් වුණේ නෑ. ඔවුන් මේ ගායක ගායිකාවන්ට ආදරය කළා. අද දක්වාම ජනප්‍රිය වී ඇති ගීත කීපයක් ප්‍රේම තටාකයේ මොනිකාගේ කතාබහට මා යොමු කළා.

ප්‍රේම තටාකය අද්දර දී ලක් හඬ ශ්‍රාවකයන් වෙනුවෙන් මා තෝරා ගත් මේ චිත්‍රපට ගීතවලට ආසා නොකරන රසිකයෙක් ඇති කියල මට හිතන්න බෑ. සමහර මුල් ගීත වෙනුවට අලුත් ගායක ගායිකාවො ගායනා කළ ගීත වුණත් අහන්න අපි ආසයි. ඉෂාක් බෙග්, සමිතා, උරේෂා, දම්මිකා, වගේ අලුත් පරම්පරාවෙ කීප දෙනෙක්ම මේ ගීත අපේ මතකයෙන් ඈත් කරන්නෙ නෑ. ඕලු මලේහි සුදෝ සුදෝ, පෙම් ලෝක රාජිනී, හොඳ හොඳම වේය,

# විදවස සොඳුරුමය

මැවිලා පෙනේවි රූපේ, මගේය ප්‍රේම මාලිනී, පෙම් රැල්ල නගී, ජීවන මේ ගමන සංසාරේ, ආදර නදිය ගලා, සිරිය මෙ සාරා, ඕලු නෙළුම් නෙරිය රගාලා තමයි මගේ අනෙක් ප්‍රේමණීය චිත්‍රපට ගීත. සුජාතා චිත්‍රපටයෙ ඩොමී ජයවර්ධන එක්ක ශාන්ති ලේඛා රඟපාපු දර්ශනය මම මතක් කළා. පෙම් රැල්ල නගී ගල් තැල්ලෙ වදී කියන ගීතය එක්ක. ප්‍රේම ජයන්ත් ෆ්ලොරිඩා සැඩ සුළං ජවනිකාව මතක් කළා.

රේඛාවෙ ආනන්ද වීරකෝන්ට සිසිර සේනාරත්න ඕලු නෙළුම් නෙරිය රඟාලා ගායනා කළ රූප රාමුව. එච්.ආර්.ජෝතිපාල චිත්‍රපට පසුබිම් ගායකයෙක් විදියට අප හඳුනාගත්ත සුරතලී චිත්‍රපටයෙ ආනන්ද ජයරත්න සිරියමෙ සාරා කියමින් රඟ පෑ දර්ශනය. අපේ මතකයෙ තියෙන මේ ගීත බොහොමයක් එක්ක ඒ චිත්‍රපට ජවනිකාවල රඟ පෑ නළු නිළියන් මතක් වෙනවා. කැලෑහඳේ ස්ටැන්ලි පෙරේරා (ජෝන් ජයපාල) රුක්මණී දේවී (මාලිනී) මගේය ප්‍රේම මාලිනී වෙනුවෙන් මොහිදීන් බෙග් රුක්මණී ගායනා කළ යුග ගීතය, අමතක වෙන්නෙ කොහොම ද; එදා චිත්‍රපටය බලපු වැඩිහිටි සිනමා ලෝලියෙකුට?

**මගේය ප්‍රේම මාලිනී**
**ඔබේය මාව රාජිනී**
**අගේ වූ ස්ත්‍රී රත්නෙකී**
**සොබා දහම් මැවූ දයා**

මේ ප්‍රේම ගීතයෙහි නැත්තේම ප්‍රේමයේ සුකුමාරත්වය, චමත්කාරය නොවෙද? කුලේ, ධනේ, බලේ, ස්ත්‍රී රත්නෙකී, වැනි වදන්වලින් මතුකෙරෙන ප්‍රේමණීය හැඟීමක් ඇද්ද කියා අසන්නට සිදුවෙනවා. සිංහල සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යය රේඛාව වුණා වගේම මේ දශකයේ සිනමා ගීතයෙත් කඩඉමක් සටහන් කළ ගීත රේඛාවේ තිබුණා. සුනිල් සාන්තගෙ ස්වතන්ත්‍ර තනු, බී.එස්. පෙරේරගෙ සංගීත සංයෝජනය, අධ්‍යක්ෂණය හා පසුබිම් සංගීතය වගේම මර්සලීන් ජයකොඩි පියනමගේ ගේය කාව්‍ය කල්පනාත් සිනමාවෙ මුල් දශකයෙ අග භාගයෙදි චිත්‍රපට ගීතයේ නැවුම් මුහුණුවර සටහන් කළ බව මතක් කළා.

**ඕළු නෙළුම් නෙරිය රඟාලා**
**කිකිණි හඬන වලා නඟාලා**
**ගඟුල් තොටිල්ලේ - මල් ඇතිරිල්ලේ**
**මගේ කුඩා ඔරුව හබල් ගා**
**යමු නැළැවිල්ලේ - නැළැවිල්ලේ**
**ඇදී ඇදී යන්නැ නදී රිදී තොටිල්ලේ**

චිත්‍රපට ගීතයකින් නැවුම් මිහිරක් ආස්වාදයක් ලද්දේ රේඛාවේ ගීත ලියූ මර්සලීන් ජයකොඩි පියනමගේ ගීතවත් ගේය සංකල්පනාවලින් බව යළි යළිත් කිව යුතු නෑ. ගීත සංකල්පනා වගේම ගී තනු, සංගීතය මේ දශකයේ සිංහල සිනමා ගීතය වෙනස් කළා.

මොනිකා සේරසිංහ වගේ නිවේදිකාවක, නිෂ්පාදිකාවක සමග ප්‍රේම තටාකය අද්දර ඉඳගෙන ගී තෝරා රස විඳින්නට ලැබීම ආස්වාදජනක අත්දැකීමක්. මගේ තේරීම් අතරට ඈ එකතු කරන ඌන පූරණ අර්ථවත්. වැඩ සටහනට එළියක් එකතු කරන්නක්.

**බුද්ධදාස ගලප්පත්ති**

# ටොම්සන් මහත්තයා



## දකුණට ආචාරය

"මට නම් අද පුදුම සන්තෝෂයක්!" කියා කියමින් ටොම්සන් මහත්තයා ගෙදරට ගොඩ වුණේය.

"ඒ මොකද ටොම්සන් මහත්තයා...? මොකක් ද ඒ තරම් තියෙන සන්තෝෂේ? ටිකක් පැහැදිලි කරලා කියමුකෝ..." කියමින් ඇම්බන් මහත්තයා සාලයේ ඉඳ ගත්තේය.

"දකුණු පළාත් සභාවට ගුරුවරු බඳවා ගන්නවා... ඒකයි සන්තෝෂේ... මුල ඉඳලම දකුණු පළාත් සභාවේ උපාධිධාරී ගුරු පත්වීම් දෙන කොට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට ගුරුවරු බඳවා ගත්තේ නෑ."

"ඒ මොකද ටොම්සන් මහත්තයා... ඒක ඉතින් උසස් පෙළ ජනප්‍රිය විතරක් නෙවෙයි හොඳ විෂයයක් නේ... ඒ මොකද ඒකට ගුරුවරු බඳවා නොගත්තේ..." කියා උන්නැහේ පුදුමයෙන් ඇසුවේය.

"ඒක අහන්න ඕනෑ අර රජ්ජුරුවන්ගේ පුත්‍රයාගෙන්... ඒ කාලේ අධ්‍යාපනේ භාරව හිටියේ රජ පුතෙක් නේ... ඒ මනුස්සයාට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය කියන නම ඇහුණත් ඇති... ගැරඬියාට ලාම්පුතෙල් ගෑවුණා වාගේ... ඔය විෂයය පාසලට දීලා මේ වෙන කොට අවුරුදු දහයකටත් වැඩි නේ... ඒ වුණාට ඔන්න මේ සැරේ තමයි යාන්තම් ඒ විෂයයට ගුරුවරු බඳවා ගන්නේ... ඒකට නම් අපි ආචාර කරන්න ඕනෑ... මං දන්නේ නෑ ඒ තීරණේ ගැන ගරු නම්බුව දෙන්න ඕනෑ කාටද කියලා... කාට වුණත් කමක් නෑ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"ඈ ටොම්සන් මහත්තයා... අර රජ පුතෙක් ගැන කීවේ මොකක් ද? මට ඒක තේරුණේ නෑ..." කියා ඇම්බන් මහත්තයා කීවේය.

"මේකනේ ඇම්බන් මහත්තයා... ඔය කතන්තරේ බොහොම කල් ගිය එකක්... මීට අවුරුදු ගාණකට ඉස්සෙල්ලා ඔය කලා ගුරුවරු බඳවා ගන්න උපාධිධාරීන්ගෙන් අයදුම් පත්‍ර කැඳෙව්වා... එතකොට ජනසන්නිවේදනය උපාධිධාරීන්ටත් අයදුම් කරන්න පුළුවන් වුණා... එතකොට හොරණ ශ්‍රීපාලියේ ජනමාධ්‍ය විෂයයෙන් විශේෂ උපාධිය ලබාපු දකුණු පළාතේ උපාධිධාරීන් අයදුම් කළා. ඒ ගොල්ලෝ විභාගයටත් පෙනී සිටියා... ඒ වුණාට සම්මුඛ පරීක්ෂණයේදී රාජ්‍ය සේවා කොමිසමේ නිලධාරීන් කිව්වේ මොනවා ද?" කියා ටොම්සන් මහත්තයා බරපතළ ලෙස ඇසුවේය.

"දන්නේ නෑනේ... ටොම්සන් මහත්තයාම කියන්න..." කියා උන්නැහේ කීවේය.

"සම්මුඛ පරීක්ෂණයේදී කිව්වේ අපි ඉල්ලුවේ ජනසන්නිවේදන උපාධිධාරීන්... ඔය ගොල්ලෝ ජනමාධ්‍ය උපාධිධාරීන්... ඒ හින්දා ගන්න බෑ කිව්වා..."

ඇම්බන් මහත්තයා 'හොක් හොක්' ගා සිනා සුණේය.

"ඇයි ඇම්බන් මහත්තයා හිනා වෙන්නේ... මේක අඬන්න වැඩක් නේ..." කියා උන්නැහේ කීවේය.

"මේකනේ උන්නැහේ... ජනසන්නිවේදනය උපාධියයි ජනමාධ්‍ය උපාධියයි එක සමානයි කියලා තේරුම් ගන්න බැරි නිලධාරීන් තමයි එතකොට දකුණු රාජ්‍ය සේවා කොමිසමේ හිටියේ.. අන්තිමට මේ අහිංසක උපාධිධාරීන් අලුත්කඩේ උසාවිය ළඟත් උද්ඝෝෂණයක් කෙරුවා... අන්තිමේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවකුත් දැම්මා... කොහොමත් හරි ජනමාධ්‍ය උපාධිධාරීන් ප්‍රාථමික ගුරුවරුන් හැටියට බඳවා ගෙන වැඩේ ගොඩ දා ගන්න පුළුවන් වුණා..." කියා ටොම්සන් මහත්තයා අතීත කතාව කීවේය.

"මේවා හරි විහිළු වැඩනේ ටොම්සන් මහත්තයා... මේ රටේ ගුරුවරු බඳවා ගන්න පොදු ක්‍රමයක් නැතිව පළාත්වලට කැමති කැමති හැටියට ද සුදුසුකම් ඉල්ලන්නේ..." කියා උන්නැහේ ඇසුවේය.

"ඒවා එහෙම තමයි... දැන් පළාත් සභාවලට ලැබුණු බලය එහෙම තමයි පාවිච්චි කළේ... එතකොට පේන දේ තමයි පළාත් සභාවලින් මේ රටට වෙච්චි සෙතක් නෑ කියන එක තවත් තහවුරු වෙන එක... ඔය රජ්ජුරුවන්ගේ පුතා නිසා අද වෙන තෙක් දකුණු පළාතේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය සංවර්ධනය වෙලා නෑ... පුදුම අවාසනාවක්... ඒ වුණාට මේ සැරේ නම් ඒ කොඩිවිනේ ඉවර කරපු එක ගැන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිසමට අපේ ආචාරය!" කියා ටොම්සන් මහත්තයා නැඟිට හුරේ තිබ්බේය.

ඒ අස්සේ පාරේ ගිය මහත්තයෙක් සාලයට කඩා වැදුණේය. බැලු බැල්මටම ඒ නම් ඉස්කෝලේ මහත්තයෙක් බව ටොම්සන් මහත්තයාටත්, උන්නැහේටත්, ඇම්බන් මහත්තයාටත් වැටහිණි.

"හප්පච්චියේ... මේ අර අපේ ඉස්කෝලේ මහත්තයා නේ... එන්න.. එන්න.. අපි ඉතින් ඉස්කෝලේ මහත්තුරුන්ට හරිම ගරු කරනවා නේ... අපේ ළමයින්ගේ ඇස් පාදන්නේ තමුන්නාන්සේලා නේ... ඉතින් මේ කොහේ යන ගමන් ද?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

"මම නං මේ ඉස්කෝලෙට ගිහිල්ලා එන ගමන්... මට ඇහුණා මුන්නැහේගේ ජය ඝෝෂාව... ඒකයි මං ගොඩ වුණේ... දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිසම සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනයයි, ජනමාධ්‍යයයි ප්‍රධාන විෂයයක් විදිහට හදාරපු උපාධිධාරීන්ට ඒ විෂයයට ගුරු පත්වීම් දෙන්න තීරණය කරපු එක නම් විශිෂ්ට දෙයක්... ඕකේ පැති දෙකක් තියෙනවා ටොම්සන් මහත්තයා..." කියා ඉස්කෝලේ මහත්තයා කීවේය.

"ඒ මොකක්ද පැති... ගුරු වෘත්තියේ පැතිත් තියෙනවා ද?" කියා උන්නැහේ පුදුමයෙන් ඇසුවේය.

ඉස්කෝලේ මහත්තයා මඳ සිනහවක් නැගුවේය.

"මේක නේ උන්නැහේ... දැන් ඔය විෂය නිර්දේශයේම තියෙනවා ලංකාවේ ජනසන්නිවේදනය පටන් ගත්තු ඔස්තාද්ලාගේ පම්පෝරිය ගහලා... අවුරුදු පණහකට කිට්ටු වෙනතුරු ජනසන්නිවේදන උපාධිධාරීන්ටම කියලා රැකියාවක් හදලා දෙන්න ඔය ඔස්තාද්ලාට බැරි වුණා... දැන් අනුන්ගේ සීනි කිරනවා... අපි තමයි මේකේ අයිතිකාරයෝ කියලා... ඉස්කෝලෙට ඔය විෂයය ඇතුලු කරපු හින්දා දැන් දෙයියනේ කියලා ජනසන්නිවේදන ජනමාධ්‍ය උපාධිධාරීන්ට යන්න වෘත්තියක් තියෙනවා..."

"එතකොට අනිත් පැත්ත මොකක් ද?"

"අනිත් පැත්ත තමයි ඔය ඔස්තාද්ලා රැල එකතුවෙලා සන්නිවේදන විෂයය හප කරලා දාපු එක... දැවැන්ත මාධ්‍ය කර්මාන්තයක් නැති රටේ ජනසන්නිවේදනය උගන්නනවා විශ්වවිද්‍යාලවල... ජීවිතයට අවශ්‍ය විෂයයක් හැටියට පාසලට දුන්නේ ජනසන්නිවේදන නෙවෙයි සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය... ඔස්තාද්ලා එකතු වෙලා සිලබස් එක හප කරලා දැම්මා... අර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලේ උදවිය එහෙම හප කරපු සිලබස් එක අනුමත කළා. දැන් ඒක භාරව ඉන්නේ කුඩම්මලා... ගුරුවරු නන්නත්තාර වෙලා... ළමයි දැනටම සාමාන්‍ය පෙළ අත් ඇරලා... උසස් පෙළ අලුත් ගුරුවරුන් දන්නේ නෑ මොනවාද උගන්නන්නේ කියලා... විශ්වවිද්‍යාලේ ඉගෙන ගත්ත දේවල් ගෙඩිය පිටින් උගන්නනවා... ඒක තමයි අනිත් පැත්ත.... ඕං එහෙනං මං ගියා..." කියමින් ඉස්කෝලේ මහත්තයා යන්න ගියේය.

**බන්දුල පී. දයාරත්න**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# අසූ වසරකට පසු තවමත් තරුණ සිටිසන් කේන්






මහා සිනමාකරුවකු වීම කොයි හැටි වෙතත් සිනමාකරුවකු ලෙස පවතින්න නම් ඔහු එක්තරා ආකාරයක ගල් ආඳකු විය යුතුයැයි වතාවක් පැවසුවේ වර්තමාන ලෝකයේ සිටින විශිෂ්ට සිනමාකරුවකු වන මාර්ටින් ස්කොර්සිස් විසිනි. ඔහු එසේ පවසන ලද්දේ ඕර්සන් වෙල්ස් ගැනය. වෙල්ස්ගේ උපන් දිනයෙන් අවුරුදු 106 පිරුණේ පසුගිය මැයි මස 6 වන දාට ය. ඔහු විසින් බිහිකරන ලද ලෝක සිනමාවේ ශ්‍රේෂ්ඨතම සිනමා නිර්මාණයක් ලෙස සැලකෙන සිටිසන් කේන් චිත්‍රපටයට අවුරුදු 80 පිරුණේ මැයි පළමු වනදාය.

සිනමාකරුවකු හැටියට ඉතාම ළාබාල වියේදී එනම් අවුරුදු 26දී තමන්ගේ මුල්ම සිනමා කෘතිය ගොඩනගන්නට තරම් වේල්ස් විශිෂ්ටයකු වූයේ කෙසේදැයි විමසා බැලීම වෙනම කටයුත්තකි. එහෙත් තම අග්‍රගණ්‍ය සිනමා නිර්මාණයෙන් පසු ඔහුට විඳින්නට සිදුවූ බොහෝ අවමාන ද බොහෝ අවලාද ද විශාලය. කොටින්ම හොලිවුඩ් සිනමාවේ දොරටු ද ඔහුට විවර වුණේ යන්තමිනි. ඔහු සිනමා ව්‍යාපාරය නමැති කළුගලේ ඔළුව හප්පා ගැනීමට කැමති ජාතියේ සිනමාකරුවෙකි. යස ඉසුරු හෝ වෙනත් තාන්නමාන්න නොතැකූ ඔහුට, තම ජීවිතයේ එකම අභිලාෂය වූ යහපත් සිනමා කෘතීන් බිහි කිරීම නිසාම අනේකවිධ කම්කටොලු විඳින්නට සිදු විය.

ඔහු ද කලක් අමරිකාව අතහැර ජීවත් වූවේය. අවසාන චිත්‍රපටය නිර්මාණය කරන්නට ඔහු යළිත් ඇමෙරිකාවට ආවද චිත්‍රපටය අවසාන කිරීමට පෙර ඔහු මිය ගියේය.

1985 ඔක්තෝබර් මස 10 වන දා මිය ගිය ඕර්සන් වෙල්ස් ගේ අවසාන චිත්‍රපටය චිත්‍රගත තිරගත වූයේ 2018 වසරේදීය. The Other Side of the Wind නමැති ඒ චිත්‍රපටය වසර 23ක්; ලංකාවේ වචනයෙන් කියන්නේ නම් චිත්‍රපට පෝලිමේ තිබුණේය. විසිතුන් වසරකට පසු වැනිස් සිනමා උළෙලේ විශේෂ දර්ශනයක් පැවැත්වූ වූවාට පසුව netflix මගින් මේ චිත්‍රපටය ලොව පුරා ලොව පුරා බෙදාහැරීම භාරගන්නා ලදී. චිත්‍රපටය තිරගත කරන්නට මෙපමණ කලක් ගතවීම ගැන අපේ සිනමාවේ ඇතැමුන්ගේ අඬෝ වැඩියාවන් ලෝකයේ සෙසු සිනමාවත් සමග සසඳද්දී සරල කාරණා බව පැහැදිලි කරන්නට එය හොඳම උදාහරණයකි. එපමණක් නොව අකිර කුරසෝවා ට ජපානයේ දී නිෂ්පාදකයකු සොයාගන්නට බැරිව වසර ගණනාවක් ගත විය. අවසානයේදී ඔහුගේ විශිෂ්ටත්වය දුටු ස්ටීවන් ස්පීල්බර්ග් සහ ජෝර්ජ් ලූකස් මැදිහත් නොවන්නට කැගමුෂා හැදෙන්නට ඉඩ නොතිබිණ. තර්කොව්ස්කිට තමා උපන් සෝවියට් දේශය අතහැර යන්නට සිදුවිය. ෆෙලිනි තම රට අත්හැර ගියේය. ඉන්ග්මාර් බර්ග්මාන් ස්වීඩනයෙන් ඉවත්ව ගියේය. චාලි චැප්ලින් ජීවිතය ආරක්ෂා කර ගත්තේ ස්විට්සර්ලන්තයේ පදිංචියට යාමෙන් පමණකි. එපමණක් නොව අපේ මහා සිනමාවේදී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ට සිය අවුරුදු 50 තුළ නිර්මාණය කරන්නට ඉඩකඩ ලැබුණේ චිත්‍රපට 19ක් පමණි.

26 වන උපන් දිනයට ඔන්න මෙන්න කියා තිබියදී නිර්මාණය කරන ලද චිත්‍රපටය ද 80 වසරකට පසුවත් විශිෂ්ට චිත්‍රපටයක් වන්නේ කෙසේ ද?

සිටිසන් කේන් නම් මේ මහා සිනමා නිර්මාණය මිනිසකුගේ ජීවිතය අභ්‍යන්තරය සොයා යන අපූර්ව කතාන්දරයකි. චිත්‍රපටය ඇරඹෙන්නේ මහා මන්දිරයකිනි. මේ මහා මන්දිරයේ දැවැන්ත උද්‍යාන හා එහි ඇති අන් සියලු දේවල් නිරීක්ෂණය කරද්දී මෙහි නැති දෙයක් නැත. මේ නම් දිව්‍ය ලෝකයක්මය අපට සිතේ. මේ මන්දිරයේ කවුළුවකින් එබී බලන කළ මරණ මංචකයේ වැටී සිටින මිනිසෙක් අපට හමුවේ. ඔහු චාර්ල්ස් ෆොස්ටර් කේන්ය. හේ එසේ මෙසේ මිනිසකු නොවේ. ඇමරිකානු පුවත්පත් ලෝකයේ දැවැන්තම අධිරාජ්‍යයාය. රිදී හැන්ද කටේ තියාගෙන උපන් මිනිසා දැන් ඒ සියල්ල අතහැර තම අවසන් හුස්ම වා තලයට මුසු කරන්නට සූදානම්ය. ඕනෑම මිනිසකු ම ජීවිතයේ අවසාන මොහොතේ මතු කරන හැඟීම් මතු භවය සඳහා වැදගත් වන්නේ යැයි බෞද්ධයන් වූ අප විශ්වාස කරමු. එබැවින් එළඹි සිහියෙන් යුතුව අවසාන මොහොතට මුහුණ දීමට අපි සමහර විට ඇප කැපවී කටයුතු කරමු. මේ සියල්ල අතහැර යන මොහොතේ ඔහුගේ මුවගින් පිටවන්නේ එක් වදනකි. 'රෝස් බඩ්' නැතහොත් 'රෝස කැකුළ' යි. මෙතරම් මහ ධනස්කන්ධයකට හිමිකම් කිවූ මිනිසකු රෝස කැකුළක් ගැන සිහිපත් කොට සිය ජීවිතය අවසාන කරන්නේ ඇයි? මේ වූ කලී අපූර්ව ආත්ම කථනයක මුල පිරුමකි.

රෝස කැකුළ ගැන ඔහු සිහිපත් කරන්නේ චිත්‍රපටය ආරම්භක මිනිත්තු 2යි තප්පර 32ක් ගෙවුණ තැනය.

පුවත්පත් ලෝකයේ මේ මහා මිනිසාගේ මරණය මරණ දැන්වීමකින් පමණක් කෙළවර කරන්නට ආයතනයේ කතුවරයා කැමති නැත. ඔහු තම පුවත්පත් වාර්තාකරුවකු මෙතනට කැඳවන්නේ ඔහු ගැන තවදුරටත් සොයා බලන්නටය. මේ අවසාන මොහොතේ විසිවූ රෝස කැකුළේ වගතුග සොයන්නය. රෝස කැකුළ යනු ඔහුගේ ආදරය ද? ඔහුගේ ජීවිතය ද? නැතහොත් කවරක් ද? වර්තා කරු; ජෙරී තොම්සන් මේ පුංචි කාරණාව සොයන්නට පස්දෙනකු මුණගැසෙයි. මේ පස් දෙනා කේන්ගේ ජීවිතය පිළිබඳව අතීතාවර්ජනයක යෙදෙන්නේ, නැතහොත් ඔහු පිළිබඳව අනාවරණය කරන්නේ අපූර්ව ආකාරයටය. ඔහුට මුලින්ම හමුවන චරිතය වන තැචර් බැංකු හිමිකරුවෙකි. එපමනක් නොව ඔහු කේන්ගේ භාරකාරයාය. අති විශාල ධනස්කන්ධයක් උපයා ගත් කේන්ගේ



Orson Welles







මෑණියන් මේ බූදලය සහිතව සියලු වත්කම් කේන් වෙත පවරා දෙන්නට ප්‍රථම භාර කර ඇත්තේ ඔහුටය. අවුරුදු විසි පහේදී මේ සියල්ල තැචර් ගෙන් මිදී කේන් ට හමුවෙයි. මේ සා මහා ධනස්කන්ධයකට මේ මිනිසා කවරක් කරනු ඇද්ද? ඇතැම්විට නිකං හම්බවෙන ධනය එක රැයෙන් විනාශ කර දමන්නට දක්ෂ මිනිසුන් අප අතර ඇත. එහෙත් කේන් එබන්දකු නොවේ. ඔහු කරන්නේ අපට හිතාගන්නවත් බැරි වැඩකි. ඒ වන විට අලෙවිකර ගන්නට බැරිව තිබූ Inquirer නම් පුවත්පත මිලට ගැනීමය. එය මිලට ගෙන ඕපාදූප ඇතුළු පාඨකයන් කියවන්නට කැමති බොහෝ දෑ එකතු කර එය අලෙවි කරගත හැකි පුවත්පතක් බවට පරිවර්තනය කිරීමය. පුවත්පත් අධිරාජ්‍ය නම් දැවැන්ත අධිරාජ්‍යයෙහි Inquirer පුවත්පත දැවැන්ත රාජ්‍ය කොටසක් බවට පත් කරන්නට ඔහු ඊළඟට සමත් වෙයි.

ධනය උපතින්ම ලැබූ මිනිසකු ධනය සමග ඊළඟට සොයන්නේ බලයයි. මේ බලය සඳහා ඔහු ගත යුත්තේ ඉලක්ක සහගත මාර්ගයකි. එබැවින් ඊළඟට සිදු වන්නේ ඔහුගේ විවාහය යි. මේ විවාහය පිළිබඳව හෙළි කරන්නේ කේන්ගේ සාමාන්‍යාධිකාරීවරයාව සිටි bernstein ය. කේන් විවාහය සිදුකර ගන්නේ එසේ මෙසේ කෙනකු සමග නොවේ.

එවකට ඇමරිකානු ජනාධිපතිවරයාගේ ලේලිය වන එමිලි නෝර්ටන් සමගය. කේන්, නෝර්ටන් සමග වන විවාහයට එකම අවශ්‍යතාව ධනය සොයාගත් මිනිසකුගේ ඊළඟ අවශ්‍යතාවයි. එතැනින් එහාට ඔහුගේ ජීවිතයේ ආදරයක් එළඹෙන්නේ සුසාන් ඇලෙක්සැන්ඩර් නම් පියානෝ වාදන ශිල්පිනිය සමගය. පුවත්පත් ලෝකයේ බලය සමග අමරිකානු බලය සොයන්නට නම් නිව්යෝර්ක් නගරයේ මහ පුටුවට තරග වදින කේන්ට එරෙහිව මඩ ප්‍රචාරය ආරම්භ කරන්නේ මේ ආදර පලහිලව්ව සමගය. ඒ සමග විවාහය දෙදරා යයි. විවාහයෙන් වෙන් වෙන භාර්යාවත් පුතුත් රිය අනතුරකට ගොදුරුව මිය යයි.

කේන් ගේ ජීවිතයේ ඛේදවාචකයක් වන්නේ මෙතැනින්ය. සුසාන්ගේ ජීවිතයේ ගොඩනැංවීමේ අභිලාශයෙන් යුතුව කේන් මහා මන්දිරයක් ද මිලට ගනී. මහ මන්දිරයක් වුවද එය නිවෙසක් කරන්න සුසාන් අපොහොසත් වෙයි.

ජීවිතය හෝ ආදරය පිළිබඳ අරගලයක යෙදෙන සුසාන් එම නිවසින් ඉවත්ව ඉවත්ව

COME AND SEE

යයි. මේ මේ මහා මන්දිරයෙන් ඉවත්ව යන්නට කේන් අපොහොසත් වෙයි. අපේ පුවත්පත් කලාවේදී තොම්සන් ට සුසාන් හමු වන්නේ රාත්‍රී සමාජ ශාලාවක් පවත්වාගෙන යන්නියක හැටියටය. ඇය ඔහු ගැන තවත් ජීවිත විවරණයක යෙදෙයි.

අප සමහර විට බරපතළ ලෙස දිනා ගත් දේට වඩා අහිමි වූ කුඩා දෙයකට තිබෙන ආදරය විශාලය. හරියටම ප්‍රේම කතාන්දරයක් වැනිය. දිනාගත් ප්‍රේමයකට වඩා අහිමි ප්‍රේමයක් මුළු ජීවිතය පුරා හදවත පාරන අවස්ථා එමටය. කේන්ගේ ජීවිතය තුළ මිනිසුන්ගේ අභ්‍යන්තරය සැඟව පවතී. කේන්ගේ සමීපතමයන් පස් දෙනාම කියන ආකාරයකට මේ සියල්ල එක්කොට ගොඩනගන තනි රූපය කියවන්නට ඉඩ ලැබෙන්නේ ඔවුනට නොවේ.

එය පරිබාහිර ව සිට මේ නරඹන ප්‍රේක්ෂක අපටය. Orson Welles අපට කියා දෙන්නේ එහෙමය. වේල්ස්, සිය මුල්ම චිත්‍රපටය නිර්මාණය කරන්නට පෙර විවිධ අන්දමින් දස්කම් පෑවේය. පුදුමය නම් සිටිසන් කේන් සඳහා දර්ශන තලයට යන තුරුම ඔහු කිසිවිටෙකත් සිනමා දර්ශන තලයකට හෝ ආසාවකට වත් නො ගිය මිනිසකු වීමය. එහෙත් එයට වසර දෙකකට පෙර ඔහු ඇමෙරිකානු ගුවන් විදුලි ශ්‍රාවකයන් අන්දමන්ද කළේය.

ඒ, එච්.ජී. වේල්ස් ගේ The War of the Worlds ඇසුරෙන් ගුවන් විදුලි නාටකයක් නිර්මාණය කරමිනි. ගුවන් විදුලි නාට්‍ය ශ්‍රවණය කල ශ්‍රාවකයෝ පිටසක්වළින් එන ආක්‍රමණිකයන් ගැන බිය වී ගෙවල් දොරවල් අතහැර පලා ගිය බව පුවත්පත්වල වාර්තා විය.

කේන් තම චිත්‍රපටය සඳහා පාදක කර ගත්තේ එවකට ඇමෙරිකාවේ පුවත්පත් අධිරාජයා වූ William Randolph Hearst ගේ ජීවිත කතාව බව සුප්‍රකට රහසක් විය. මේ දුටු Hearst චිත්‍රපටය නිෂ්පාදනය කළ R.K.O radio pictures සමාගමට විරුද්ධව අධිකරණයේ පිහිට පැතුවේය. පලක් වූයේ නැත. චිත්‍රපටය හැදූ සම්පූර්ණ වියදම දරා චිත්‍රපටය මිලදීගෙන හේ විනාශ කරන්නට තැත් කළත් RKO සමාගම චිත්‍රපටය එසේ ගිනි දෙවියාට පුදන්නට කැමති වූයේ නැත. එබැවින් මේ මහා සිනමා කෘතිය ලෝකයට ඉතුරු විය.

සිටිසන් කේන් තිරගත වූ වසරේ එය හොඳම චිත්‍රපටය ඇතුළු සම්මාන කිහිපයකට නාමයෝජනා ලැබුව ද දිනාගත්තේ ඇකඩමි සම්මාන උළෙලේ හොඳම තිර නාටකයට හිමි සම්මානය පමණි. එහෙත් සම්මානයකින් සිනමා කෘතියක වාර්ෂික අගය නිර්මාණයක් කරනවා මෙන්ම එය ශ්‍රේෂ්ඨත්වයට පත් කරන්නේ කලාතුරකිනි. අපේ රටේ ගම්පෙරළිය සරසවිය සම්මානය දිනා ගත් අවස්ථාව එබඳු පුරුදු දුර්ලභ අවස්ථාවකි. එහෙත් බොහෝ විට සිනමා කෘති ශ්‍රේෂ්ඨත්වයට පත් කරන්නේ කාලයත් සමඟය. සිටිසන් කේන් චිත්‍රපටය කාලයත් සමග ශ්‍රේෂ්ඨත්වයට පත් වූ චිත්‍රපටයකි. වසර 50 කට වැඩි කාලයක් මුළුල්ලේ බ්‍රිතාන්‍ය සිනමා ආයතනය මඟින් ලොව පුරා සිනමා විචාරකයන්ගේ හොඳම චිත්‍රපට 10 තේරීමේ අවස්ථාවේදී සිටිසන් කේන් එම චිත්‍රපට දහය අතරට ඇතුළත් වෙයි.

මිනිස් ජීවිතයේ ඇති අඳුරු අහුමුලු ස්පර්ශ කරන විට ඔවුන්ගෙන් සැබෑ ජීවිතය හඳුනා ගන්නා විට ඒ තරම් සුන්දර දෙයක් මුණ නොගැසෙනු ඇත. ඒ තරම් අභිරහසක් කිසිදු ත්‍රාසජනක පුවතක හෝ අනාවරණය වන්නේ නැත. රෝස කැකුළ යනු මේ මහා ධනස්කන්ධය සහිත මිනිසාගේ කුඩා කල සෙල්ලම් බඩුවක තිබූ ලේබලයකැයි අප දැනගන්නේ ගිනි දෙවියාට පුදන්නට ඔන්න මෙන්න තිබියදී ය. එය කිසිවකුට වැදගත් නැත. එහෙත් කේන්ට වැදගත්ය. කෙනකුට ජීවිතේ නොවැදගත් වන බොහෝ දේ තව කෙනකුට වැදගත් වන්නට ඇත අපගේ දේපල අතර ආදරණීය වශයෙන් රැක ගන්නා කිසිදු වාණිජමය වශයෙන් වටිනාකමක් නැති බොහෝ වස්තු සම්භාරයක් ඇති බව අපේ හදවතට තට්ටු කර කියන මේ තරුණ සිනමාකරුවා, එකල කියා සිටියේ ඇත්තටම ජීවිතය යනු කවරෙක් දැයි සිතන්නට බල කරමිනි.

සිටිසන් කේන් අවුරුදු අසූවක් ගත වුවත් තවමත් තරුණයැයි හැඟෙන්නේ ඒ හින්දාමය. ඇය 'නොව පැරණිය වන රමණිය' වර්ගයේය. තවත් අවුරුදු ගණනාවකදී එය අලුත් ඇසකින් කියවන්නට අපට ඉඩ කඩ සැලසෙයි. සිටිසන් කේන් සර්වකාලීන අගයක් ගන්නේ එහෙමය.

**අරුණ ගුණරත්න**

2021 මැයි 11 අඟහරුවාදා
දිනමිණ
බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

# කනත්තේ කොල්ලා




"වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය
සිරිධම්ම දහම් පාසල...
ත්‍යාග සඳහා කාරුණික අනුග්‍රහය
ඉඩම් හිමි වැවිලිකරු
බන්දුල ජයමාන්න මැතිතුමා"

පන්සලේ මකර තොරණ පසෙකින් සවි කොට ඇති විශාල බැනරයෙහි ලොකු අකුරින් එලෙස ලියවී තිබේ. වසර ගණනාවක සිටම ගමේ පන්සලේ බොහෝ වැඩ කටයුතුවලදී බන්දුල ජයමාන්න නමැති ඔහුගේ දායකත්වය නොමසුරුව ලැබේ.

අපේ ගම් පළාතේ උදවියට එය නුහුරු නුපුරුදු නමක් නොවේ. ප්‍රදේශයෙහි මඟුලකට, මරණයකට, පිරිතකට, දානයකට ඔහු නැතොත් එය මහත් අඩුවක් සේ දැනෙන තරමට දැන් හේ අගනා පුද්ගලයෙකි.

සැබවින්ම ඔහු ඉඩම් හිමියෙකි; වැවිලිකරුවෙකි. ධනවතෙකි. දානපතියෙකි.

පන්සලට, පාසලට, පල්ලියට මෙන්ම කෝවිලට ද ඔහු අතිශයින් වැදගත් පුද්ගලයෙකි.

මට ඔහු අවසන් වරට මුණ ගැසුණේ අපගේ පැරණි ගුරුවරයකුගේ මළගමෙහිදී ය. ඒ දැනට වසර තුන හතරකට කලිනි. මැදිවියෙහි අග භාගයට ආසන්නව සිටිය ද ඔහු ඉතා ප්‍රිය මනාප පුද්ගලයකුව සිටියේය. මනා ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි හේ තරුණයෙක් සේ කඩිසරයෙක් ද වූයේය.

"අම්ම ඉන්නෙ මල්ලිගෙ ගෙදර. එයා දැන් හමුදාවෙ මේජර් කෙනෙක්."

ඔහු කීවේ සතුටිනි.

"අපි පුංචි කාලෙ එකට ඉස්කෝලෙ ගිය හැටි මට අමතක නෑ."

සිය අලුත්ම හයිබ්‍රිඩ් රථයට ගොඩවෙමින් ඔහු කෙටියෙන් කීවේ ඉතා දිග කතාවකි.

බන්දුලත්, මමත් පාසල් ගියේ එකටය. අප උගත්තේ එකම පංතියේය. පාසලේ සිට ආපසු ආවේ ද එකටය. ඊට ද විශේෂ හේතුවක් නොතිබුණා නොවේ.

"අපේ බන්දු වෙන කා එක්කවත් ඉස්කෝලෙ යන්ඩ කැමති නෑ. සමහර ළමයි එයාව පාච්චල් කරනවලු. 'කනත්තෙ කොල්ලා' කියල නමකුත් කියනවලු."

එක්ව පාසැල් යන අපේ කණ්ඩායම අතරට බන්දු එක්වෙද්දී පේ්‍රමලතා නැන්දා පවසන්නීය. අපේ අක්කාත්, මාත් ඇතුළුව අපේ කණ්ඩායමේ හය දෙනෙක් සිටියෝය.

"අනේ දරුවනේ, බන්දුට අද පැන්සලක් නෑ. වැඩිපුර පැන්සලක් තියේනම් දෙනව ද?"

හිටි හැටියේ දිනෙක ඔහුට එවැනි අඩුපාඩුකම් ද මතුවිය.

අප කවුරුන්ගේ හෝ අත අමතර පැන්සලක් නොවේ නම් කාගේ හෝ දිග පැන්සලක් නිර්ලෝභීව දෙකට කැඩේ.

කුඩා බන්දුගේ අත ඉඳිආප්ප සියයක් සහිත ඉඳිආප්ප බේසමකි. එය පාසැලේ කැන්ටිමට ය. අප ඉඳිආප්ප බේසම මාරුවෙන් මාරුවට ගෙන ගියේ අපගේ කුඩා මිතුරාට සහයෝගයක් හැටියටය.

පේ්‍රමලතා නැන්දාගේත් බන්දුලගේත් ඔහුගේ කුඩා සොහොයුරාගේත් ජීවිත පැවැත්ම රැඳී තිබුණේ මේ ඉඳිආප්ප බේසම මතය.

"කනත්තෙ හිටියා වුණත් මං කාටවත් අත පාන්නෙ නෑ. මං කොහොම හරි මගෙ අහිංසකයො දෙන්නට උගන්නගන්නවා. ළිඳට වැටුණු මිනිහා ළිං කටින්ම ගොඩ එන්ඩ එපායැ."

ඇය ඒ දිනවල නිතර කීවාය.

කනත්ත යනු, ඒ අවදියේ අපගේ කුඩා සිත් භීතියෙන් හිරිවට්ටන වචනයකි. ඒ වදන ඇසෙද්දී අපට සිහිවූයේ දත් විලිස්සාගත් මහසෝනාය. ඇස් රතු ම රතු රීරියකාය. නැත හොත් අත දරුවකු වඩාගත් මෝහිනීය.

"මිනි කනත්තෙ හොල්මන් නැද්ද?"

වතාවක් පන්තියේ මිතුරකු බන්දුලගෙන් ඇසුවේය.


"නෑ, අපි තුන්දෙනාගෙන් කවුරුවත් කවදාවත් හොල්මනක් දැකල නෑ. රෑට නරි හූ කියනව අපේ ගේ ළඟටම ඇවිත්. එතකොටනම් අපේ මල්ලි ටිකක් බය වෙනව. එච්චරයි."

ඔවුනට සොහොන් පිටිය බිය ගෙන දෙන තැනක් නොවීය.

* * *

"බන්දුලලා කනත්තේ ගෙදරක පදිංචියට වැටුණෙ කොහොම ද?"

එකල මට එය මහත් පැනයක් විය.



"එයාලා කලින් පදිංචි වෙලා ඉඳලා තියෙන්නෙ වෙන ගමක. ඒ ළමයින්ගෙ තාත්තා ගෙදරට වෙන ගෑනු කෙනෙක් එක්කන් ආවලු. ඒක නිසා පේ්‍රමලතා ළමයි දෙන්නත් ඇරන් මේ ගමට ඇවිත්. මෙහේ ඇගේ නෑදෑයො ඉන්න නිසා. ඒත් හැමදාම නෑදෑයන්ගෙ ගෙවල්වල ඉන්න එක ප්‍රශ්නයක් නෙ. ගමේ කීප දෙනෙක් එකතු වෙලා කනත්ත කෙළවරේ පැලක් අටවල දීල තියෙන්නෙ ඒකයි."

එහෙන් මෙහෙන් කනින් කොනින් පේ්‍රමලතා නැන්දා ගැන මා දැන ගත් කතාව එවැන්නකි.

නොවරදවාම දිනපතා අප සමග පාසල් යන බන්දු හිටිහැටියේ දෙදිනක්ම පාසල් නාවේය.

"බන්දුට අසනීපයක් ද දන්නෙ නෑ. අපි ගිහින් බලලා එමු."

පාසැල හමාරව ආපසු එමින් ගමනේදී අපේ කණ්ඩායමේ අයෙක් යෝජනා කළේය.

"අපෝ මේ මද්දහනෙ කනත්තෙ හොල්මන් හිටියොත්?"

අයෙක් පසුබා සිටියේය. කනත්ත කෙළවරේ ඇතැයි පවසන බන්දුලලාගේ නිවස දකින්නට මම නම් කලක සිටම මහත් වුවමනාවෙකින් පෙළුණෙමි.

අපි කනත්තට පිවිසෙන දිගු පඩිපෙළ නැග නා නා ප්‍රකාර සොහොන් කොත් අතරින් ද අලුත තැනූ මිනී වළක් පසු කරමින් ද භූමිය කෙළවරෙහි වූ කුඩා අතු පැළකට ළඟා වුයෙමු.

ඒ කුඩා පැල්පතෙහි වහලය පමණක් නොව බිත්ති ද පොල් අතු ය. ගෙබිම තරමක් උස් කොට ගොම මැටි ගා තිබිණි. හුරුබුහුටි ගෙමිදුලෙහි සරුවට වැවී තිබූ කහ සහ තැඹිලි පැහැ දහස්පෙති මල් යායත් සුදු සහ දම් පැහැති කූඩලු මල් ගොන්නත් මේ සොහොන් පිටියේ මායිම වග අපට අමතක කරලූයේය.

අප යන විට බන්දුල සුවෙන් සිටියේය. එහෙත් ඔහුගේ මව අසනීපයෙනි. ඔහු පාසල් නොගොස් සිටියේ සිය මව ආරක්ෂා කරනු පිණිසය.

"මට උණක් හැදුණා. දැන් ලොකු අමාරුවක් නෑ. මේ දරුව මාව බලාගන්ඩයි ගෙදර නැවතුණේ."

නිවසෙහි වූ එකම එක මේසය මත එක් කෙළවරෙක දරුවන් දෙදෙනාගේ පොත් ගොනු දෙක පිළිවෙලට අසුරා තිබිණි. ඇඳුම් කැඩුම් සහිත සූට්කේසය ඇතුළු තවත් අඩුම කුඩුම රැසක් මේසයේ එහා කොනේය.

පොල් අතු බිත්තියේ තැන තැන අලවා තිබුණේ පත්තර කැබලිවලින් කපාගත් නොයෙකුත් පින්තූර සහ කුඩා ලිපිය. බන්දුල පංතියේ සිංහල කාලපරිච්ඡේදයේදී කියවූ ලිපි කිහිපයක් ද ඒ අතර විය.

"මෙයාට පත්තර කෑල්ලක් පෙන්නන්ඩ බෑ. පිටි, සීනි ඔතාගෙන එන පත්තර කෑලි එහෙම පිටින්ම කියවනව. ඉන්පස්සෙ හොඳයි කියල හිතෙන ඒව කපල බිත්තියෙ අලෝනව."

බන්දුලගේ මව පැවසුවේ කිසියම් සතුටකිනි.

යටි රැවුළක් සහ දෙකම්මුල් වළ ගැසුණු කෙට්ටු මුහුණක් සහිත ඒබ්‍රහම් ලින්කන් ඇමෙරිකානු ජනාධිපති තුමාගේ පින්තූරයටත් ඔහුගේ ජීවිත කතාවටත් බන්දුල බොහෝ සේ ප්‍රිය කළා විය යුතුය.

"ඒබ්‍රහම් ලින්කන් ඇමරිකාවෙ 18 වෙනි ජනාධිපතිතුමා. පුංචි කාලෙ තාත්තගෙ ගොවිතැන් වැඩට උදවු වුණා ලු. තාත්තත් එක්ක දර පැලුවලු. පැල්පතක ඉපදිලා හුගක් දුක් විඳලා ඉහළටම ගිය ජන නායකයෙක්. අන්තිමට නැවතුණේ ධවල මන්දිරයෙ."

බන්දුල අපට අපූරු පාඩමක් ද කියා දුන්නේය.

පසු කලෙක ඔවුනට කොළනි ඉඩමක් ලැබුණේ ගම්වැසියන් කිහිප දෙනකුගේ මැදිහත් වීමෙනි.

එහෙත් පේ්‍රමලතා නැන්දා ඉඳිආප්ප වෙළෙඳාම අත් නොහැරියාය. දරුවන් දෙදෙනා ද ඉගෙනුම අත් නොහැර උසස් පෙළ දක්වාම පවත්වාගෙන ගියෝය.

කුමක් හෝ හේතුවක් නිසා බන්දුල රජයේ රැකියාවක්ම සොයමින් කාලය කා දැමුවේ නැත.

අක්කර කාලක් වූ කොලනි ඉඩමේ තේ වගාවක් ආරම්භ කළ හේ අද ඉඩම් හිමි වැවිලිකරුවෙකි.

උසස් පෙළ දක්වා උගත් නමුදු ඔහු ප්‍රිය කළේ ව්‍යාපාරික අංශයයි.

"පැල්පතෙන් ධවල මන්දිරයට ගිය ජන නායකයා."

බන්දුල කුඩා කල ඔහු නිවැසි නිවසේ පොල් අතු බිත්තියේ අලවා තිබූ ඒ කුඩා ලියවිල්ල දැවැන්ත ශක්තියක් වී අදටත් ඔහුගේ ජීවිතය පසුපස සැඟවී ඇතැයි මට සිතේ.

**සුනිලා විජේසිංහ**

---

## අම්මේ මං ගෑනියෙක් ගෙනාවා



ගී කොළම

කොන්ද රිදෙනවා බං රෙදි හෝදල
කොයි කාලෙක ඉඳලා ද මේ සුමේ
දැන් රස්සාවක් කරන එකේ උඹ
මේක කියන එක වැරැද්දක් නෙමේ
රෙදි හෝදන මැෂිමක් ගෙන ආවොත්
නරක ද කොහෙවත් නැති එකේ ගමේ
කරදඬු උස් වෙනකොට මහ උදවිය
නිදහස් කරනා එක තමයි ක්‍රමේ

සති ගානක හිට මැසිවිලි නගනා
අම්මා නිතරම කරයි කරච්චල්
එක අතකට ඒ වයසක උන්දෑ
කොහොම කරන්න ද මේව මේච්චල්
උන්දැව මරවල වැඩ ගන්නව යැයි
ගමේ උනුත් මට කරයි සමච්චල්
හනික ගිහින් මැසිමක් ගැන හෙවුවේ
වෙන්න බැරි නිසයි උන්ට පාච්චල්

එක පාරෙන් ගෙවනව නම් මේකට
ඔක්කොම වෙන්නේ පනස් දෙදාහයි
අවුරුද්දෙන් ගෙවනවනම් දෙන්නම්
එක වාරිකයක් ටිකක් වැඩි තමයි
සබන් ගාල නම් හෝදන්නට බෑ
රෙදි හෝදන ලික්විඩ් එක විතරයි
මාසෙ ලයිට් බිල ඩිංගක් වැඩි වෙයි
කාලෙ ඉතුරු වෙන හින්දා ලාබයි

ඒ කොනටත් මේ කොනටත් හිතලා
ඒකට යන වියදම් ගැන බැලුවා
ඕක විතරයෑ ගෙදරට තව කොයි
තරමක් දේ ඕනැද සිහි කෙරුවා
ඔක්කොම කරන්ට එකෙන් කර
ගත්තම එන වියදම මට දරන්න
බැරුවා
තව ඩිංගක් දුර හිතුවම ඔළුවට
කදිම උපායක් එබිකම් කෙරුවා

කන්න ටිකක් දෙන එක ඇරුණම
අවුරුද්දට ඇඳුමක් ඇති බව කීවා
කැන්දන් ගිය පසු ලුණුයි බතුයි හරි
කන්නම් කියලා හසරලි පෑවා
ගන්න මඟුල් මොකටද බර වියදම්
කොහොමත් ඕනෑ නැති වැඩ ඕවා
ඔන්න පොතේ අස්සන් දෙක ගහලම
අම්මේ මං ගෑනියෙක් ගෙනාවා

**දිල්රූ ජයසේකර**

---

# සටන මැදට යන අහිංසකයෝ



යම් කෙනකු ඔබේ නීරෝගී කුඩා දරුවාව පැහැරගෙන ගොස් කොරෝනා රෝගීන් සිටින වාට්ටුවක් තුළට දමා අගුළු දැමුව හොත් ඔබට එය කොහොම දැනේවි ද?

මෙය කියවන විටත් ඔබේ හිත කලබල වෙන්නට ඇත. ඔව්.... ඒ හිතන්නට වත් අමාරු දෙයකි. එහෙත් දවසක ඔබටම ඔබේ නීරෝගී දරුවාව කොරෝනා රෝගීන් සිටින වාට්ටුවකට දමා දොරගුළු වසන්න සිදු විය හැකිය.

මෙය විහිළුවක් නොවේ. මේ වන විටත් මෙසේ කරන්නට සිදු වූ අම්මලා තාත්තලා බොහෝ දෙනකු මට මුණගැසී තිබේ.

දැනට ඇති නීතිය අනුව කොරෝනා පරීක්ෂණය පොසිටිව් වී කොරෝනා රෝගියකු යැයි දැනගත් විට අනිවාර්යෙන් රෝහලකට යන්නට සිදු වේ. එවිට රෝගී අම්මලාට රෝහලට යන්නට වෙන්නේ තමන්ගෙ හය හතර නොතේරෙන පොඩි දරුවා ද රැගෙනය. බොහෝ විට ඒ වනවිට දරුවා නීරෝගිය.

මඳක් සිතන්න. කිසිදු ලෙඩක් රෝගයක් නැති දරුවකු මාරාන්තික විය හැකි, බෝ වන ලෙඩක් ඇති ලෙඩුන් ගොඩක් සිටින වාට්ටුවක් තුළට දමා වසන්නට සිදු වන විට ඒ අම්මට කුමක් සිතෙනු ඇද්ද?

වඩාත්ම කනගාටුදායක තත්වය වන්නේ තමන්ටම තම දරුවා එතැනට රැගෙන යන්නට සිදු වීමය.

බොහෝ වෙලාවට අම්මා කොවිඩ් පොසිටිව් වන විට තාත්තාත් පොසිටිව් වී සිටිනවා විය හැකිය. දෙදෙනාට යන්නට වන්නේ රෝහල් දෙකකටය. ඒ වනවිට දරුවාට ලෙඩේ බෝ වෙලාද නැද්ද කියා කිසිවකු දන්නෙ නැත. එබැවින් එබඳු නිරෝධායනය වන දරුවකු ළඟ තබා ගන්නට කෙනකු සොයා ගන්නට නොහැකිය. බොහෝ විට දරුවාට රෝගය බෝ වෙන්නේ රෝහලේදී ය. දරුවන් ඇඳන් අල්ලති. අත් කටේ දමති. කෙසේ වුවත් වාට්ටුවක් තුළ වෛශාල වයිරස් රාශියක් තිබේ.

ඇතැම් විට තත්ත්වය ඉතා භයානක ය.

මඳක් සිතන්න.

කොවිඩ් පොසිටිව් අම්මා කෙනකු නීරෝගි දරුවන් දෙන්නකු රැගෙන රෝහලට යයි. අම්මා දවස් දහයක් සිටිය යුතු රෝහලේය.

දරුවෝ දෙදෙනා නෙගටිව් නිසා ද දවස් ගණනාවක් කොරෝනා වාට්ටුවක සිටින නිසා ද ඔවුන්ගේ පීසීආර් පරීක්ෂණ කරන්නට සිදු වේ. ඔවුන් ඇතුළත් වී සත්වැනි දවස පමණ විතර එක දරුවෙක් පොසිටිව් වෙයි. දැන් ඒ දරුවා තව දවස් දහයක් රෝහලේ සිටිය යුතුය.

නැවතත් රෝගී අම්මා දවස් දහයක් රෝහලේ සිටින්නේ දරු දෙදෙනා ද සමගිනි. ඒ අතර ඉතිරු දරුවා ද දිගින් දිගටම පරීක්ෂාවට ලක් වෙයි. අන් කළ හැකි යමක් නැත.

එහෙත් ඉතිරු දරුවා දිගටම නෙගටිව් නම් ඒ දරුවාව අම්මා සමග නිවෙසට යවයි.

මේ වන විට ගෙදර නිරෝධායනය වෙමින් සිටි පියා රෝගය වැලඳී රෝහල්ගත වී ඇත.

අම්මා නිවසට විත් දින දහයකින් ඉතිරි දරුවාට ද රෝගය වැලඳී ඇති බව පෙනෙන්නට තිබේ.

එවිට අම්මා නැවත රෝහලට යා යුතුය. දරු දෙදෙනා සමග අම්මා තවත් දින 10ක් රෝහලේ සිටිය යුතුය.

සිතන්න.

අම්මා කෙනකු සහ දරුවකු වෙනම තබා ගන්නට තරම් පහසුකමක් තිබුණා නම් මේ නීරෝගි දරුවන්ගෙන් රෝගී වන කිහිප දෙනෙක් බේරගන්නට තිබුණා නොවේ ද?. එහෙත් අප ඒ තරම් වාසනාවන්ත නැත.

රෝගය වැලඳෙන දරුවකුගේ ජීවිතයට කුමක් හෝ සිදු වුවහොත් අම්මා කෙනකුට එය දැනෙන ආකාරය අපට සිතා ගන්නටවත් හැකි ද ?

ඇහැලේපොළ කුමාරිහාමිට තම දරුවා වංගෙඩියක දමා කොටන්නට සිදු වූ විට දැනෙන හැඟීම මෙහිදීත් දැනෙනවා විය යුතුය.

එහෙත් එහෙම දැනෙනවා නම් දරුවන් සිටින මව්පියන් මේ තරම් රෝගයට ගොදුරු වන දේවල් සිදු කරයි ද?

මෙය ගෙතූ කතාවකැයි කෙනකුට සිතෙන්නට පුළුවන. එහෙත් සැබැවින්ම මෙය "හරි අමුතු ලෙඩකි."

බේරෙන්නට ද හැකිය.

**නුවන් තොටවත්ත**



බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර
'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න
'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්,
ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
baddaramalla@lakehouse.lk

2021 මැයි 11 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.